


Scanned by CamScanner

# 1 වන පරිච්ඡේදය

කොග්ගල වූ කලි එක් පැත්තකින් මුහුදින් ද අනික් පැත්තෙන් සුන්දර නදියකින් ද සීමා වුණු බිම් තීරයකි. පීත්ත පටියක් සේ දිවෙන ගාලු–මාතර පාරින් වෙන් කරනු ලැබූ මෙහි වෙරළබඩ වනාහි, ගමෙහි සුලභ ගෙයක මිදුලට හෝ ආලින්දයට හෝ සමකළ යුත්තකි. ගාලු–මාතර පාර ළඟින් ම දිවෙන රේල් පාර, පස් කන්දක් මතුයෙහි හොවන ලද, පටන්ගැන්ම හෝ කෙළවර හෝ නොදක්නා හැකි, හිණක් වැන්න. පස් ගොඩ ගැසීමෙන් තනන ලද රේල් පාර බිමින් ද මහාපාරින් ද අඩි කීපයක් උස් වූවකි. පස් කැපීමෙන් හැරුණු අගල්, රේල් පාර දෙපැත්තෙහි තැනින් තැන දක්නා හැකි ය. බෝක්කුවක් අසල වන අගලක්, ඇතැම් විට ඕලු නෙළුම් හා මසුන් ද සහිත කුඩා විලක විලාසය ගනියි.

ගමක් වශයෙන් කොග්ගල, අවුරුදු හත් අට දහසක් වත් පැරණි-යයි කියන ලකුණු, පොළොව යට මිස උඩ නොදක්නා ලැබේ; බිම් කඩක් වශයෙන් ඒ ගම අවුරුදු කෝටි ගණනක් පැරණියයි කියන්නේ, රේල් පාර අයිනෙහි පිහිටි පර්වතයකි. 'හිරිගල් දේවාලය' 'දේවාලේ ගල' යන නම්වලින් ගැමියන් හඳුන්වන. මේ මහ ගල වූ කලි වෘක්ෂ–ලතා පවා පහළ වීමට පෙර පටන් මේ පෙදෙසෙහි වූ විපර්යාසයන් දකිමින් නො සෙල්වී සිටින්නකි. ඩයිනමයිටයෙන් වුව ද පිපිරවිය නොහැකි මහ රුක් කඳක් සේ, පතුරු එක්වීමෙන් හැදුණු මේ මහ හිරිගල, මිනිසුන් වාසයට පටන් ගත් තැන් සිට ඔවුන්ගේ සොම්නස්, දොම්නස්, හැඬීම්, වැලපීම් යන ආදිය සිතින් හා ඇසින් හා කනින් ද කොරව දුටුවෙකි; ඇසූ-වෙකි. පළින් පළ දක්නා ලැබෙන පිපිරුම් විවර, අවුරුදු දහස් ගණන් තිස්සේ මේ හිරි ගල, අව්වෙන් හා වැස්සෙන් ද ලත් පීඩන-යන්ගේ ලකුණු ය. මේ පිපිරුම් අස්සේ පිරුණු පසෙහි පැළ වුණු පඳුරු දැඩි තියඟින් හා වැස්සෙන් ද ගල ආරක්ෂා කිරීම, කළ ගුණ සැලකීමක් වැන්න. විවරයන් අස්සෙහි පිරුණු ඒ පස වූ කලි අව්වෙන් තැවී වැස්සෙන් පෙඟී පිපිරෙන ගෙවෙන මේ මහ ගලෙහිම කුඩු ය.

මුළු ගම එකම රුක් ගොමුවක් කරන පොල් ගස් හා අනික් ගස් කොළන් ද වැඩී මල් ඵල ගන්වා මහලු වී විනාශ වෙයි. සත්තු කලක් ජීවත්ව සිට මියෙති. මිනිස්සු තුගත්කමින් ද දැඩි දිළිඳු-කමින් ද තමන්ගේ වරදින් හා ජගත් ශක්තියෙන් මිරිකී මිරිකී පීඩා විඳිමින් සිට මියෙති. අවුරුදු ලක්ෂ ගණනකට පෙර වූ විපර්යා-සයන් මෙන්, මිනිසුන්ගේ වාසයක් වූ තැන් පටන් ගමෙහි වූ විපර්යාසයන් හා විනාශයන් ද දුටු මේ මහ හිරිගල ගැමියන් විසින් **'දේවාලේ ගල' යන නමින් හඳුන්වනු ලැබීම කොතරම් උචිත ද?**

Scanned by CamScanner

ඉෂ්ට අනිෂ්ට ශක්තිය හැඟවුණු දෛව බලයක් පිළිබඳ හැඟීම, ගැමියන් තුළ පමණක් නොව, උගත් මිනිසුන් තුළ ද ඇත්තේ ය. සමහර ගැමියෝ, ඒ බලය, ගලට අරක් ගත් දේවතාවකු කෙරෙහි ඇතැයි දකිති. 'දේවාලේ ගල' යන නම ඒ මහ හිරිගලට ගැමියන් ඇරූඪ් කෙළේ එහෙයිනි. ඇතැම් උගත්තු ඒ බලය ග්‍රහයන් කෙරෙහිත් කර්ම බලයක් කෙරෙහිත් ඇතැයි දකිති. තමන්ගේ දුක, සැප, හැඬීම්, වැලපීම් යන ආදිය දකිමින් අසමින් ආදි යුගයක සිට නොසැලී සිටින මේ මහ හිරිගලෙහි, ඒ ඉෂ්ටානිෂ්ට බලය ඇතැයි දකින ගැමියෝ, අනුමානයට වඩා ප්‍රත්‍යක්ෂයට ගරු කරන්නෝ ය.

මේ මහ හිරිගලෙහි වම් පැත්තේ ගම්සබා පාර දෙසට දික් වූ තල්ල, ඒ ගල මුල නිතැතින් හැදුණු කුඩා ගල් තලයක් සෙවණ කරයි. එසේ සෙවණ කරන ලද මේ ගල් තලය, එහි පැමිණ දෙවියන් යදින පුදන ගැමියන්ට පුදසුනකි. ඔවුහු, ගලට අරක් ගත් දේවතාවා තෙලින් මලින් පිදූහ. මේ ගල් තලය උඩ හෝ ඒ අසල වූ රිටි හතරක් උඩ හෝ තබන ලද පාන් පැලක වූ පහනක්, ගුහාව එළිය කරමින් දල්වෙනු, එකල හවස් වරුවේ ඒ ගල අසලින් ගිය කවුරුත් දුටහ.

පැපොල් පළුවක පොල් තෙල් වැක්කිරීමෙන් සාදන ලද ඒ පහන දවස් පතා දල්වූවෝ නූගත් ගැමියෝ ය; විශේෂයෙන් ගැමි ගැහැනු ය. අඳුර පැතිරෙත් ම ගැමියෙක් පහන දල්වා, රෝගාතුරව ඉන්නා තම දරුවා මරු ගෙන් ගලවා දෙන ලෙස යදියි. තවත් දවසක ගැහැනියක් ඈත පෙදෙසකට වෙළෙඳාම පිණිස ගිය තම සැමියා රැක දෙන ලෙස කන්නලව් කරයි; තමාට හතුරු කම් කළ ගැමියකු විනාශ කරන ලෙස යදින ගැමියකුගේ කන්නලව්වක් ද ඒ ගම්සබා පාර ඔස්සේ ගමන් කරන එකකුට ඇසෙයි. තවත් විටක එහි දක්නා ලද්දේ තමාගේ එළදෙන හෝ මිදුලේ කෙසෙල් ගසේ කැන හෝ සොරා ගත් සොරකු අකාමකා දමන ලෙස දණ බිම ඇනගෙන යදින පුදන ගැහැනියකි. තමාට වඳ ගැහැනියකැයි තවත් ගැමි ගැහැනියක විසින් නින්දා කරනු ලැබූ මැද වියෙහි වූ ගැහැනියක වරක් මේ ගල් තලෙහි මිරිස් දමා අඹරමින්, තමාට නින්දා කළ ඒ ගැහැනිය 'ඇඹරි ගොම ගෑවී' යා යුතුයයි කියනු දුටු මහල්ලෙක් තවමත් ගමෙහි වෙසෙයි.

මේ ගල පිටිපස වූ බෝවිටියා, අඹනගිරියා, ගදපාන, බුරුල්ල වල් බෙලි, බලුදන්, මාදන්, කඳුරු, යන ආදි ගසින් හෙවුණු කුඩා වන රොදකින් ඔබ්බෙහි පිහිටි විශාල ගෙයක් වෙයි. එහි බිත්ති-යක් අඩි දෙකක් පමණ ඝන ය. පරණ වීම නිසා දුඹුරට හුරු කළුවට හැරුණු කොස් ලී උළුවහු හා කවුළු ද බිත්තිවලට සරිලන පරිදි උසින් මහතින් විශාල ය; දැඩිය. ආලින්දයෙහි වහල් තලය

Scanned by CamScanner

උසුලාගත් කොස් ලී සැණූ කුඩා දරුවකුට බැදිය නොහැකි තරම් මහත් ය. පරාලයක් මෙකල වාසල මැදුරක බාල්කයකට කුඩා නොවේ. ඕලන්දක්කාරයන් මුහුදුබඩ පෙදෙස් හැරයාමට පෙර තනවන ලද්දක්යයි කිව යුතු මේ ගෙයි වෙසෙන්නෝ ද කුලයෙන් පැරණියෝ ය; දැඩියෝ ය. අව වැසි සුළං හා කාලය ද නිසා වන පීඩාවන්, මෙකල තනනු ලබන ගෙයකට වඩා දැඩිව, පරණ වූ මේ ගෙය උසුලයි. එවැනි පීඩා දිගු කලක් නොසැලී දැඩිව උසුලන ලද බව කියන සලකුණු මේ ගෙයි උළුවහුවල ද බිත්තිවල ද සුලභ ය.

ගෙය ද එහි වෙසෙන්නෝ ද වර්තමාන ගමට නො ගැළපෙන, වද වී ගෙන යන අචේතනික සචේතනික වස්තූන්ගේ පරම්පරාවක අවසානයෝ ය. කාල විපර්යාසය නිසා වන දැඩි පීඩාවන්ට මේ ගෙය ඔරොත්තු දෙන්නාක් මෙන් එහි වෙසෙන්නෝ ද සමාජ විපර්යාසයන් නිසා වන පීඩාවන්ට ඔරොත්තු දෙන දැඩි කුල-මානය ඇත්තෝ ය. කොතරම් දැඩි වුවත් විශාල වුවත් මේ ගෙය ''තව අවුරුදු පනහකින් හැටකින් ජරාජීර්ණව අභාවයට යන්නේ ය.'' යන හැඟීම ගෙය දෙස බලන බුද්ධිමතකු තුළ පහළ වෙයි. ප්‍රකෘතිමත් කිරීමෙන් පොළොන්නරුවේ නටබුන් විහාරයකට නව ජීවනය දිය නොහැකියා සේ මේ ගෙයට ද ප්‍රතිසංස්කරණයෙන් නව ජීවනයක් දිය නොහැකියයි වැටහෙන බැවිනි. එහෙත් ගෙයි වෙසෙන්නන්ගේ පරපුර ද අභාවයට යෙතියි යන අනුමානය පහළ වන්නේ ඔවුන් ගේ වගතුග විමසන බුද්ධිමතකු තුළ ය.

යට කියවුණු ගෙය 'මහ ගෙදර' යන නමින් ද ගෙය පිහිටි අක්කර දෙකක් පමණ විශාල ඉඩම 'මහ ගෙයි වත්ත' යන නමින් ද ගැමියන් අතර ප්‍රකට ය. මහ ගෙදර වෙසෙන දොන් අදිරියන් කයිසාරුවත්තේ මුහන්දිරම්, ගමෙහි උසස් පැරණි පරපුරකින් පැවත එන්නෙකි. බිරිඳ ද වැඩි වියපත් වූ දෙදෙනෙක් ද බාල වියෙහි වූ පුතෙක් ද ඔහුට වෙති. මොවුන්ගේ වගතුග කීම මෙහි පටන් ගැනෙන්නේ 1904 අප්‍රේල් මාසයේ සිංහල අවුරුද්දට දෙ-තුන් දවසකට පෙර මහ ගෙදර පවත්වන ලද උත්සවයකිනි. එය ගමෙහි අනිත් කිසිවකුගේ ගෙදර පැවැත්වෙන්නක් නොව, කයිසාරුවත්තේ මුහන්දිරම්ගේ ගෙදර පමණක් අවුරුද්දකට වරක් පැවැත්වෙන්නකි.

'වළන් පොඩිවල ඉවීම' යන නමින් පවුලේ නෑයන් අතර ප්‍රකට මේ උත්සවයට මෙදින මුහන්දිරම්ගේ දූවරු දෙදෙනා හා ඔහුගේ සහෝදරයාගේ දූවරු ද විවාහ වුණු පුත්තු හා ඔවුන්ගේ භාර්යාවෝ ද හවුල් වූහ. මේ පවුල් දෙකේ දූන් හා පුතුන් හා පවත්වන මේ හවුල් කෑමට කැඳවන ලද එකම පිටස්තරයා වූ කලී විසිපස් ඇවිරිදි තරුණයෙකි. ඔහු සතියකට දෙතුන් වරක් මහ ගෙදරට පැමිණ මුහන්දිරම්ගේ දූන් දෙදෙනාට ඉංගිරිසි බස උගන් වන්නෙකි.

Scanned by CamScanner

ගමේ ඇතැමුන් ඔහු 'ඉස්කෝලේ මහත්තයා' යන නමින් හඳුන්වන ලද නමුත්, මුහන්දිරම්ගේ බිරිඳ ද දූන් ද හැඳින්වූයේ 'පියල්' යන නමිනි.

පසළොස් දෙනකු හෝ විසි දෙනකු හෝ උදෙසා අවුරුදු පතා පැවැත්වෙන මේ මඟුල් කෑමට 'වළන් පොඩි වල ඉවීම' යන නම ආරූඪ වූයේ කෙසේද? ටික යන අරුත් ඇති පැරණි පදය මෙකල ගැමියන් අතර 'බොහෝ' යන අරුත් ඇති 'හුඟ' යන පදයට පෙරළෙනාක් මෙන් 'වළන් පොඩිවල ඉවීම' ඒ නමින් ම, මහ වළන්වල ඉවීමක් වි ය.

සිංහල අවුරුද්ද නිමිත්තෙන් අවුරුද්දකට දෙතුන් දවසකට කලින් කුඹල්කාරයන් ගමේ ප්‍රධාන පවුල් තුන හතරකට අලුත් වළන් කඳ බැගින් ගෙනැවිත් දීම, පෙර සිට පැවැත එන සිරිතකි. වලන් කත් ගෙනෙන කුඹල්කාරයෝ බතින් ද අනතුරුව රස කැවිලියෙන් ද සංග්‍රහ ලබති. වළන් කත් වෙනුවට ඔවුන් ලබන්නේ සහල්, පොල්, මිරිස්, ලුණු, කැවුම්, අතිරස යන ආදියයි. ඔවුහු ඉතා සන්තෝෂයෙන් ඒ ද්‍රව්‍ය ගෙන ගොස් අඹු-දරුවන් සමඟ අවුරුදු කති. කුඹල්කාරයෝ වළන් කත් සමඟ පොඩි වළන් අඩුක්කුව බැගින් ද ගෙනෙති. මේ පොඩි වළන් කුඩා දැරියන් උදෙසා ය. මහ ගෙදර කුඩා දැරියන් නැති බැවින්, නන්දා, මීට අවුරුදු හයකට පමණ පෙර මේ පොඩි වළන් අඩුක්කුවෙහි වූ හැළියෙහි, හාල් කාලක් සෝද ගරා දැමීමෙන් බතක් ද අනිත් පොඩි වළන්වල ව්‍යංජන කිහිපයක් ද ඉවූවා ය. ඈ ඒ බතින් ටික ටික මවටත් අවුරුදු තෑගි ගෙන පැමිණි බාප්පාගේ දූන් දෙදෙනාටත් පිළිගැන්නුවා ය. මෙසේ පොඩි වළන් වල උයන ලද බත, ඊළඟ අවුරුද්දෙහි උයන ලද්දේ මහ වළන්වල ය. පවුල් දෙකේ වැඩිහිටියන්ගෙන් සත පනහ, රුපියල බැගින් එකතු කොටගෙන අවුරුද්දක් පාසා කරන මේ හවුල් කෑම වූ කලී කයිසාරුවත්තේ පවුල් දෙක අතර දැන් ඉතා පැරණි කුල සිරිතක් වැන්න.

මුහන්දිරම්ගේ ගෙයි සාලයෙහි පැදුරු මතුයෙහි එළන ලද සුදු රෙද්දක් උඩ බත් දීසි දෙකක් ද ව්‍යංජන සහිත පිඟන් රාශියක් ද මෙදින දක්නා ලදි. මුහන්දිරම් සහ ඔහුගේ බිරිඳ ද ඔහුගේ සහෝදරයා හා බිරිඳ ද හැර පවුල් දෙකේ අනිත් සියල්ලෝම මෙදින ඒ බඳුන් වටා අරමිණියා ගොතාගෙන වාඩි වී, කෙසෙල් කොළවල ආහාර අනුභව කළහ. පවුල්වල මහල්ලන්, බාල-යන්ගේ මේ මඟුල් කෑමට හවුල් නොවූයේ තමනුත් ඔවුන් සමඟ කෑමට වාඩි වීම ඔවුන්ගේ කෙළි කවට කථාවට බාධාවක් වන බැවිනි. මවුපියන් ඉදිරියෙහි කෙළි කවට කතාව ගැමි දරුවන්ට නුහුරු ය.

Scanned by CamScanner

නන්ද අන්‍යයන් සමඟ කෑමට වාඩි වූ නමුත් අනුලා වාඩි නොවූවා ය. ඈ මෙහෙකාරියකගේ ද මෙහෙකාරයකුගේ ද උදව් ඇතිව, ආහාර අනුභව කරන්නන්ට සංග්‍රහ කළා ය. ව්‍යංජන තසිමත් හැන්දත් අතින් ගෙන, ආහාර අනුභව කරන්නන් වටා යෙමින් ඔවුන් ළඟ පාත් වී හෝ ඇතැම් විට දණ ඇනගෙන හෝ මාළු–පිනි බෙදීම, අනුලාට, ඔවුන් හා එක්ව ආහාර අනුභවයට වැඩි සන්තෝෂයක් වී ය.

ආහාර අනුභවයෙන් පසු මවු–පියන් හැර අනික් සියල්ලෝම දෙපිළකට බෙදී පංචි කෙළින්ට වූහ. පොරයකට එකකු සත දහය බැගින් දමා කරන ඒ කෙළිය, අවුරුද්ද ළංවත්ම, ගමේ ගෙයක් පාසා දකින්නට ලැබෙන්නකි. මෙදින එක් පිළක් වෙනුවෙන් පංචි පෙනෙහි 'අය' තබන ලද්දේ අනුලා විසිනි. අනික් පිළෙහි 'අය' තැබීම පියල් සතු කාරියක් වී ය. පංචි පෙනෙහි අය තැබීමට දුර දක්නා නුවණ ද ඇතැම් විට කූට බුද්ධිය හා පුරුද්ද ද වුවමනා ය. අනුලා මේ කිසිවකින් ඌන නොවූ දූරියකි. පියල්, උගත්කමින් ලත් නුවණත් පංචි කෙළියෙන් ලත් අත්දැකීමත් ඇත්තෙකි. දෙපිළෙහි අය තබන්නන්ට ඒ ඒ පිළෙහි අනික් දැනුමුත්තෝ, සිතාමතා කරන අනුශාසනයෙන් ද ගුණ දෙස් කීමෙන් ද උදව් කළහ.

ඔප-මට්ටම් ඇති කුඩා පොල්-කටුව තුළ දමන ලද කවඩි සෙලවෙන විට ද කවඩි, ඔප-මට්ටම් ඇති තවත් ලොකු පොල් කටුවක් මුදුනෙහි වැටී වැගිරෙන විට ද නැඟෙන හඬ, ගෙයින් පිට සිටින්නන්ට ද ඇසෙයි. දෙපිළෙහි සෙල්ලමට වැඩි වූවන් ඇතැම් විට තර්ක කරන හඬ, පිටත සිටියවුන්ට ඇසෙන්නේ කලහ හඬක් ලෙසිනි.

අඳුර පැතිරෙත්ම, පංචි කෙළිය නවත්වන ලදින්, මුහන්දිරම්ගේ සහෝදරයාගේ පවුලේ අවිවාහකයන් හැර, අන්‍යයෝ පෙරළා, ඔවුනොවුන්ගේ ගෙවල් බලා ගියෝ ය. ඉතිරිව එහි රැඳුණු දරුවෝ ද දූරියෝ ද කෙළි කවට කතාවෙන් හා ඕපාදූප දෙඩුමෙන් ද සන්තෝෂ වූහ.

''අවුරුද්ද ගිහිල්ලා තුන් මාසයක් යන කලුත් කත්තිරිනා පංචි දැමීම නවත්වන්නේ නැහැ''යි අනුලා කීවා ය.

''ඒ ගැනි පංචි කෙළියට පටන්ගන්නේත් අවුරුද්ද ලබන්න මාසෙකට විතර කලින්''යි කියමින් සෝමදාස සිනාසුණේ ය.

''කත්තිරිනා පංචි දැමීම ඉවර කරන්නේ තුරු කරාබු උකස් කොට ගන්නා සල්ලිත් පැරදුණාම.''

''ගිය අවුරුද්දේ ඒ ගැනි ගෙදර වත්තේ පොල් ගසුත් උකස් තියා සල්ලි අරගෙන පැරද්දුවා''යි පියල් කී ය.

''සමහර අවුරුදුවල ඒ ගැනි රුපියල් පනහ හැටත් දිනනවා''යි අනුලා කීවා ය.

Scanned by CamScanner

''පංචි කෙළිය කත්තිරිනාට සෙල්ලමක් නෙවී, සූදුවක්''යි පියල් කී ය.

''අම්මලා තාත්තලා ඉඩ දෙනවා නම් මේ ගොල්ලත් අනිත් අවුරුද්ද එන කල්ම පංචි දවී''යි කියූ තිස්ස තම සහෝදරියන් දෙස බැලුවේ ය.

''කත්තිරිනාට වාගෙ සූදු මතයක් අපට නෑ''යි අනුලා කීවා ය.

''අවුරුදු දවස්වල අපි පංචි දන්නේ සෙල්ලමට''යි සෝමා කීවා ය.

''කත්තිරිනා පංචි දන්නේත් සෙල්ලමට''යි තිස්ස කීයේ ඇනුම් පදයක් වශයෙනි.

''සෙල්ලමට නෙවි සූදුවට''

''එහෙනම් අක්කලා දිනුවම සල්ලි ගන්නෙ නැද්ද?''

''ඇයි නැත්තේ? අපි සල්ලි දිනන්නම ආසාවෙන් නෙවි නෙව පංචි දන්නෙ.''

''ඒ බොරු'' යි පියල් කී ය.

''දිනන්න ආසා නැති හින්ද තමයි සංඩු වෙච්ච පංචි දන්නේ ''යි තිස්ස කී ය.

''අපට කත්තිරිනාගේ විත්තියක් ඕනෑ නෑ. ඒ ගෑනි වගේ බඩු උකස් තිය තියා පංචි දන්න අපි ගොඩේ ඇවිදින්නේ නෑ''යි සෝමා කීයේ තිස්සට සැර කරන්නාක් මෙනි.

පියල් නැගී සෙමින් ආලින්දය දෙසට ගියේ ය. සාලය එළිය කරමින් දැල්වුණේ වැටි සතරක් ඇති පොල්තෙල් පහනක් වුව ද ආලින්දය එළිය කෙළේ බිත්තියෙහි සවි කරන ලද රට ලාම්පුවකි. බූමි තෙල් භාවිතයට පුරුදු වුණු වත්-පොහොසත්කම් ඇති ගැමියන් මුලදී ආලින්දය එළිය කිරීමට පමණක් බූමි තෙල් පහන් ගත්තේ සුළඟ නිසා පොල් තෙල් පහන් ආලින්දයෙහි තබා දැල්විය නොහැකි බැවිනි. බිත්ති ලාම්පුවෙන් එළිය වුණු ආලින්දයට නන්ද ගියේ සිහිල් සුළං ටිකක් ලබන පිණිස ය. මව විසින් මිදුලෙහි වවන ලද හෙන්දිරික්කා මලින් ද සමන් මලින් ද නැගින සුවඳ මුසු මද-සුළඟ නිසා ආලින්දයට පැමිණි නන්ද, සුවඳ විතක් යටට පැමිණියක ලෙස ආස්වාදයක් ලැබුවා ය. ඈත, ගල්-වැට දෙරටුව අසල සඳ පහනින් බැබලෙන කොළ සහිත මුදුන ඇති දෙල් ගස යට වාඩි වී කතා-බහ කරන මෙහෙකාරයන් දෙදෙනෙකුගෙන් එකකු කියන දේ පමණක් නන්දට ඇසෙයි. හයියෙන් කතා කළ ඒ මෙහෙකාරයා ඉතා කුඩා කාලයෙහි පටන් වැඩුණේ මහ ගෙදරම ය. හතළිත් පස් හැවිරිදි වියෙහි වූ ඔහු මුහන්දිරම්ගේ දරුවන් විසින් සලකන ලද්දේ තමන්ගේම පවුලේ එකකු ලෙසිනි.

Scanned by CamScanner

එහෙයින් සාද, මුහන්දිරම්ගේ දූන් දෙදෙනාට හා ඇතැම් විට කුඩා පුතාට ද සැරවැර කරයි. හතළිස් පස් ඇවිරිදි වියෙහි වුව ද සාද, අවුරුදු දිනයෙහි අලුත් සරමකුත් බැනියමකුත් හැඳ, ඉණ වටා බඳින ලද හම් පටියක් ද කරෙහි දමාගත් පට ලේන්සුවක් ද ඇතිව කුඩා දරුවකු මෙන්, මිදුලෙහි තබන ලද රතිඤ්ඤා පෙට්ටියක සේව නූලට ගිනිතබා එය හඬ නඟා පුපුරනු බලා සන්තෝෂ වෙයි.

දෙල් ගස යට වාඩි ගත් සාද කතා කෙළේ මුහන්දිරම් මහත්මයාගෙන් මේ වර අවුරුදු තෑගි වශයෙන් ලැබුණු පට සරමත් මේස් බැනියමත් පට ලේන්සුවත් ගැන බව, ආලින්දයෙහි සිටි නන්දට ඇසිනි. අලුත් මෙහෙකාර කොලුවකු වන අනිකා එතරම් හයියෙන් කතා නොකෙළේ, ඔහු ලැබූ සරමත් බැනියමත්, සාද ලැබූ දේ තරම් නොවටනා බැවින් විය යුතු යයි නන්ද සිතුවා ය. එසේ සිතූ ඈ රතිඤ්ඤා පෙට්ටියක් තෑගි කිරීමෙන් උගේ මන වඩන්ට ඉටා ගත්තා ය. සිංහල අවුරුදු දවසෙහි කුඩා දරුවන් හා නෑ මිතුරන් ද පමණක් නොව, මෙහෙකාරයන් ද සන්තෝෂයෙන් සිටිනු දැකීමට ගෘහණියෝත් ඔවුන්ගේ වැඩිවිය පත් දරියෝත් ඉතා ආශා ඇත්තෝ ය.

''මෙන්න නන්ද, පැරදුණ සල්ලි''යි කියමින් පියල් රුපියලේ කාසියක් නන්ද දෙසට දික් කෙළේ ය.

''මට එපා''යි කියමින් නන්ද, පියල්ගේ අතට ගැසුවා ය. රුපියල පිළෙහි වැටුණේ ගීත නාදයක් වැනි හඬක් නඟමිනි. පියල් පාත් වී රුපියල ගෙන මිට මොලවා ගත්තේ ය.

''නන්ද පරාද නෙවද?''

''සෙල්ලම් කරන්නේ දිනන්නමය?''

''නැතුව? අපේ පිළට ආවා නම් නන්ද රුපියලක් දිනනවා''

''මම ගියේ මට ඕනැ පිළට; මම ඇයි කාට වත් ඕනැ පිළට යන්නේ?''

නන්දගේ කට කොනට සිනාවක ලකුණකුදු තවම නොනැඟුණු බව පියල් දිටී ය. එහෙයින් යළිත් රුපියල ඈට දීමට සිතූ සිතුම ඔහු මැඩගත්තේ ය.

''අක්කත් නංගිත් දෙපිළට ගියා නම් දෙන්නාම පරදින්නේ නැහැ.''

''අද පැරදුණ රුපියල ආයිත් අවසක දිනාගන්නවා.''

''එදත් පැරදුණොත්?.''

''තවත් සෙල්ලම් නොකර නිකම ඉන්නවා''

''මේක, නන්දගේ රුපියල; ගන්න''යි කියමින්, පියල් යළිත් නන්ද දෙසට රුපියල දික් කෙළේ ය.

Scanned by CamScanner

"මට එපා" යි කියමින් මේ වර ඇ පියල්ගේ අතට ගැසුවේ කෝපයෙනි, ඔහු රුපියල සාක්කුවේ දමා ගත්තේ ය.

"තාත්තා තව ම ගෙදර නාවේ මන්ද?"යි ඇසීමෙන් පියල් කතාව අන් අතකට හැරවීමට සිතුවේ ය.

"තාත්තා අවුරුදු තෑගි අරගෙන මාතර ආච්චිලාගෙ ගෙදර ගියා?"

"මෙතෙක් රෑ වන තෙක් ගෙදර නාවෙ?"

"සමහර විට තාත්තා රෑ බත ආච්චිලාගෙ ගෙදරින් කාලා එන්න නවතින්න ඇති."

"නන්දට තාත්තාගෙන් ලැබුණු අවුරුදු තෑගි මොනවාද?"

"චීත්ත රෙදි දෙකකුයි හැට්ට දෙකක රෙදියි ලැබුණා"

"මම අවුරුදු තෑග්ගක් දුන්නාම නන්ද නොගන්නේ ඇයි?"

"මම මොකට ද පියල්ගෙන් තෑගි ගන්නේ?"යි කියමින් ඇ පියල් දෙස බැලුවේ, නාඳුනන අමුත්තකු දෙස බලන කුල මාන-යෙන් දැපුණු ස්ත්‍රියක ලෙසිනි.

"එහෙනම් මා ගෙනැත් දෙන පොත් ගන්නේ?"

"කියවා ආපහු දෙන්න"

"මා දුන් පොත කියෙව්වා ද?"

"මොන පොත ද?"

"රොබින්සන් ක්රූසෝ"

"ඒ පොත කියවන්න මගේ ඉංගිරිසි දැනුම තාම මදි: ඒක තේරුම් ගන්න ටිකක් අමාරුයි."

"අනික් පොත "ග්‍රිම්ස් ෆේයරි ටේල්ස්"

"ඒක කියෙව්වා"යි පිළිතුරු දෙමින් නන්ද ගල් වැට දෙරටුව දෙස බැලුවා ය.

"පොත කියවන්න මහන්සි වෙනවා නම් ඉංග්‍රිසි ඉගෙනීම හුඟක් පහසු ය"යි නන්දගේ උදාසීනත්වය නැති කරන අදහසින් පියල් කී ය.

"අම්මා කියන්නෙ අත්යන් කරන්නත් ටැලිගරාම් එකක් බලන්නත් ඉංග්‍රිසි ඉගෙන ගත්තාම ඇත කියා"

පියල් සිනාසුණේ ය.

"ටැලිග්රෑම් එකක් බලන්න නම් ඉංග්‍රිසි තරමක් දුර දැනගන්න ඕනෑ. ඉංග්‍රිසි ඉගෙනගන්න ඕනෑ ටැලිග්රෑම් බලන්න නොව පොත් කියවන්නයි."

"පොත් කියවන්න අපට තිවාඩු නැහැ."

Scanned by CamScanner

නන්ද ද සිනාසුණා ය.

''එහෙනම් අම්මාගේ කීම හරි?''

''ඔව්'' යි නන්ද වහා උත්තර දුන්නේ ඇනුම් පදයකට ඇනුම් පදයක් කියන්නාක් මෙනි.

''ඉංගිරිසි ඉගෙනගන්න පටන්ගැනීමට පෙර නන්දත් ඉංගිරිසියෙන් අත්සන් කරන්න ඉගෙනගත්තා නෙවද?''

පියල් මෙසේ කියේ ඇනුම් පදයක් වශයෙන් බව නන්දට වහා වැටහිණ.

''ඔව් – ගමේ තරුණ කවුරුත් ඉංගිරිසියෙන් අත්සන් කරන්න ඉගෙනගත්ත''යි නන්ද ඔහුට ඍජුව ම පිළිතුරු දුන්නා ය.

''සිංහලෙන් අත්සන් කිරීම මදිකමක් ද?''

''එහෙනම් පියල් ඉංගිරිසියෙන් අත්සන් කරන්නේ මදිකමක් නිසා ද?''

නන්ද සමඟ එකටෙක කීමෙන් ඒ කථාව දික්කිරීමට පියල් වෑයම් නොකෙළේ ය. ඔහු මෙතෙක් කතා කෙළේ නන්දගෙන් යම් කිසි පැනයක් ඇසීමට මඟ පාදගනු පිණිස ය. ඔහු ඒ පැනය ඇසීමට මඟ පාද ගැනීමට තැත් කළ හැම විට ම නන්ද කතා කෙළේ වාද කරන අටියෙනි. පියල් සහ නන්ද, ගමේ එකම කුලයක උපන් දෙදෙනෙකු වුව ද, පියල් පෙළපතින් හීනයෙකැයි නන්දගේ මවුපියෝ සලකති. පියල්ගේ පියාගේ පියා, ගමේ එළවළු කත්කාරයකු මෙන් ජීවත් වූවකු බව නන්ද දත්තේ අන්‍යයන් කියනු ඇසීමෙනි. මුහන්දිරම් සහ ඔහුගේ භාර්‍යාව ද පියල්ගේ මුත්තා එළවළු කද කරින් ගෙන යනු ඇසින් දුටුවෝ ය. නන්ද තමා සමඟ හැම විටම තර්ක කරන්නේ ඇගේ කුල ගර්වය නිසා ය යි පියල් කිසි විටක නොසිතුවේ ය. එහෙත් නන්ද නම් ඔහු සමඟ හුදෙකලාව කතා බහ කළ හැම විට ම කුල ගර්වය හිසට නඟාගත්තා ය. කිහිප දෙනකු ඉදිරියෙහි නම් ඇ, හැම විට කතා කෙළේ පියල්ගේ පැත්ත ගෙන ය. නන්ද තමාට මෙසේ දෙවිදියකින් සලකන බව පියල් අනියි. එහෙත් ඇ එසේ කෙළේ කුල ගර්වයෙන් ය යන හැඟීමක් පියල්ගේ සිතට කිසි විටෙක නොනැංගේ ය. කිහිප දෙනෙකු ඉදිරියෙහි කතාබහ කරන විට නන්ද තමාගේ පැත්ත ගන්නේ, ඇගේ සිතෙහි තමා පිළිබඳ හැඟීමක් ඇති නිසා ය යනු පියල්ගේ වැටහීම වී ය. එහෙත් ඇගේ සිත තුළ තමා පිළිබඳ හැඟීමක් ඇද්දැයි සෙවීමට වෑයම් කළ හැම විට, අන්තරායක් දුටුණු වහාම ඉදිබුවකු හිස ඇතුළට ඇදගන්නාක් මෙන්, ඇ ඇගේ නිසග ගති ගුණත් ඇදගෙන කුල ගර්වය නමැති කබොල්ල තුළට වැදුණා ය.

"හොඳ පොත් කියවන්න තරම් ඉංග්‍රීසි ඉගෙනීමට නන්දට ආසා නැද්ද?"

"නැහැ" යි ඈ සැර කළා ය. "ටිකක් ඉංග්‍රීසි ඉගෙන ගත්තාම අපට හොඳටම ඇති."

"නන්ද, ඇයි මගේ අන්තිම ලියුමට වත් උත්තරයක් නොවුණේ?"

පියල් මෙතෙක් වෑයම් කෙළේ මේ පැනය අසනු සඳහා, වඩා හොඳ අවස්ථාවක් ලබා ගැනීමට ය. එවැනි අවස්ථාවක් නොලැබිය හැකි බව දුටු නිසා ය හදිසියෙන්ම ඔහු යථෝක්ත ප්‍රශ්නය ඇසුවේ.

ඔහුගේ ප්‍රශ්නය ඇසුණු විගස නන්දගේ මුහුණ මඳක් වෙනස් වී ය. මෙතෙක් වේලා පියල් හා මුහුණට මුහුණ දී කතා කළ ඈ මුහුණ ඉවතට හරවා ගත් සැටි බිත්ති ලාම්පුවෙහි එළියෙන් පියල් දිටී ය.

"අන්තිම ලියුම? පොත අස්සේ තිබුණු ලියුම ද?" යි නන්ද සෘජුවම ඇසුවා ය.

"ඔව්"

"ලියුම්වලට උත්තර ලියන්නේ නෑ"යි මම කිව්වා මතක නැද්ද?"

"මම අහන ප්‍රස්නෙට උත්තරයක් දුන්නාම මම තවත් ලියුම් ලියන්නේ නැහැයි මම කිව්වා. මගේ ඒ ලියුම කියෙව්වා ද?"

"ඔව්" යි නන්ද පිළිතුරු දුන්නේ කිසිම හැඟීමකින් තොරව ය.

"උත්තරයක් කටින් කියන්න බැරි නම් ලියා එවනවා ද?"

"නැහැ"

මේ වචනය ඇගේ කටින් පිට වුණේ, කුඩා දරුවකුගේ බට තුවක්කුවෙන් විදෙන ඇපල ගෙඩියක් සේ ය. එහෙත් ඈ යළිත් සෙමින් මෙසේ කීවා ය.

"අම්මාගෙන් අහන්න."

"හොඳයි මම අම්මාගෙන් අහන්නම්. ඉස්සෙල්ලා නන්දගේ කැමැත්ත අකැමැත්ත දැනගන්න ඕනෑ."

"අම්මා කැමති නම් මම කැමැතියි."

පියල්ගේ මුහුණට පණ ආවේ මේ වචන ඇසීමෙනි.

"අම්මා කැමැති නුණොත්? සමහර විට අම්මා කැමති වෙන එකක් නැහැ."

"අම්මා අකැමැති නම් මම කැමැති වෙන්නේ මොකට ද?"යි ඈ ඉවත බලාගෙන කෙඳිරි ගෑවා ය.

"මට ආදරේ නම් ඇයි බැරි?"

Scanned by CamScanner

පියල්ගේ මේ වදන් ඇසූ නන්දගේ සිතට නැංගේ කෝපයකි. ඈ ඒ කෝපය යට කරගැනීමට ද වෑයම් නොකළා ය.

"මම ආදරේ අම්මාට"

පියල් යළිත් අන්දමන්ද වී ය. නන්ද තවත් වරක් කෝප කිරීමට බිය ගත් ඔහු කුමක් කිව යුතු දැයි තීරණය කිරීමට පමා වී ය.

"හොඳයි අම්මා කැමති නම් මම ලියුමෙන් කළ යෝජනාවට නන්ද කැමැති නොවැ?"

"කැමැති යයි සැරයක් කිව්වා ?"

"අම්මා කැමැති නම් නන්ද මම එක්ක කසාද බඳින්න කැමති වෙන්නේ ආදරය නිසා නොවේ ද?"

"මම දන්නේ නැහැ"යි ඈ යළිත් තරහයෙන් පිළිතුරු දුන්නා ය.

"යන්න—යන්න——පුංචි නෝනා; රෑ වෙලා; ගෙට යන්න."

මේ බස් තෙපලේ ගල් වැට දෙරටුව අසලින් නැඟී කුස්සිය දෙසට ගමන් කළ සාද ය. සාද තමන්ට නුදුරින් ගමන් කළ බව නන්ද ද පියල් ද දැනගත්තේ යට කියන ලද බස් ඇසූ පසු ය.

"සාද අක්කාටත් මටත් හොඳටම ආදරෙයි. පෙරෙයිද සවස රා බී ගත් මිනිහෙක් ගම්සබා පාරේ ගියා. සාද ඇත සිට දුවගෙන ඇවිත් 'යන්න, යන්න, ගෙට යන්න'යි අපට සැර කරා. අක්කා සාදට කවටකම් කරා මිසක් ගෙට ගියේ නැහැ"යි නන්ද සිනාසෙමින් කිවා ය.

"සාද එහෙනම් මාත් වෙරිකාරයෙක්ය කියා හිතා ගෙන වෙන්න ඇති එහෙම කිව්වේ."

"නැහැ, ඉලන්දාරියෙක් නිසා වෙන්න ඇති!"යි කියමින් නන්ද සිනාසෙමින් සාලය තුළට දිවුවා ය.

නන්දට අනතුරුව සාලයට පිවිසි පියල්, තවමත් කතාබහ කරමින් එහි සිටියවුන් හා එක්වීමට අදහස් නොකෙළේ ය.

"දැන් රෑ වෙලා! අපි යනවා"යි කියමින් පියල් යන්නට හැරුණේය.

"අවුරුද්ද ළඟ නොවැ; පියල් අවුරුද්දට මොනවද කරන්න ඉන්නේ?"යි අනුලා ඇසුවා ය.

"හිතුණු දෙයක් කරනවා."

"අවුරුද්දට කාඩ් ගහමු"යි තිස්ස යෝජනා කළේ ය.

තිස්සගේ යෝජනාව ඇසූ කවුරුත් සිනාසුණහ. ඔවුන් සිනාසුණේ දස හැවිරිදි වියෙහි වූ ඔහු, ලොකු මිනිහෙකු මෙන් කාඩ් ගැසීමට යොජනා කළ බැවිනි.

Scanned by CamScanner

"තිසා කාඩ් ගහන්න ඉගෙන ගත්තේ කොහොම ද?" යි අනුලා ප්‍රශ්න කළා ය.

"ගාල්ලේ බෝඩිමේ දී."

"අහා! එහෙනම් තිසා ඉගෙනගෙන තියෙන්නේ සූදුවයි. බෝඩිමේදී කාඩ් ගහන බවක් අම්මා ඉන්දෙද්දී කියන්න එපා."

"මම කාඩ් ගැහුවේ නැහැ. අනිත් ඇයන් කාඩ් ගහනවා බලා ගෙන උන්නා."

"බලාගෙන ඉඳලා උණත් ඉගෙනගන්නා නෙවැ සූදුවක්?" යි මේ වර කීයේ සෝමා ය.

"පංචි කෙළිය සූදුවක් නෙවි ද?" යි තම සහෝදරියන් සිනාස්සමින් තිස්ස ප්‍රශ්න කෙළේ ය.

"බොහොම හරි!" යි කියමින් පියල් නික්ම ගියේ ය.

"හරි වෙන්නේ කොහොම ද? පංචි කෙළිය සූදුවක් නෙවි; සෙල්ලමක්".

"එහෙනම් කාඩ්ස් ගැහිල්ලත් සෙල්ලමක්"

"පොඩි ළමයින්ට හොඳ සෙල්ලමක් නෙවි"

"ලොකු උණාම කරන්න උණත් පොඩි කාලේ ඉගෙනගන්න ඕනෑ."

"පැහිච්ච කම් දෙඩන්න එපා" යි අනුලා සැර කළා ය.

Scanned by CamScanner

# 2 වන පරිච්ඡේදය

මුහන්දිරම් කයිසාරුවත්තේ එදින රෑ දහයට පමණ ගෙදරට ළඟා වූයේ ය. ඔහු පැමිණෙන විට, අවදියෙන් සිටියේ බිරිඳ ද සාද ද මැද වියෙහි වූ තවත් පිරිමියකු ද පමණි. අවුරුදු තෑගි ගෙන නැන්දම්මාගේ ගෙදරට ගිය මුහන්දිරම්, තම ගෙදර බලා පිටත් වුණේ රෑ කෑමෙන් පසු ය. එහෙයින් ඔහු තම නිවසට පැමිණි විගස, ගෙයි පිටි පස බිත්තියට අල්ලා තනන ලද අඩි දෙකක් පමණ උස් වූ කයිරුව උඩ තබන ලද කොරහයෙහි උණු දියෙන් මුහුණ සෝදගෙන, තමාගේ ලියන මේසය ඉදිරියෙහි වූ පුටුවෙහි වාඩි ගත්තේ ය.

පරෙවි කූඩුවක් වැනි ඉහළ තට්ටුවකින් ද ගණන් පොත් හා රූල ද පෑන් පැන්සල් ද තැබීම පිණිස තුනට බෙදන ලද කාමර තුනක් ඇති තට්ටුවකින් ද යුතු පෙට්ටියක් ඒ මේසය උඩ වී ය. මුහන්දිරම්, පෙට්ටිය ඇර, පියන උස්සා, එහි මුදුනෙහි හෙවූ විගස, දල්වන ලද වැටි දෙකක් සහිත 'හිටවන' පහනක් සාදගේ ඇතින් මේසය උඩට පැමිණියේ ය. පහන මේසය උඩ තැබූ සාද මඳක් ඈතින් එල්ලෙමින් දූල්වෙන අනිත් පිත්තල පහන කටින් පිඹ නිවුවේ ය.

''කටින් පිඹලා පාන නිවන්න එපායයි හැම දම කියන නමුත් උඹ කරන්නේ එපාය කියන වැඩේමයි'' කියමින් මූහන්දිරම් හාමිනේ සාදට තරවටු කළා ය.

''තවත් කටින් පිඹලා පාන නිවන්න එපා.''

මුහන්දිරම් කෝපි කෝප්පයක් බී කරෝලිස් විසින් මේසය උඩ තබන ලද ගණන් පොත් දෙකින් එකක් පෙරළ පෙරළා බලන්ට වී ය. මේසය උඩ වූ පොල් තෙල් පහනින් නිකුත් එළි-යෙන් එළිය වූයේ සාලයෙහි ලියන මේසය පිහිටි මුල්ල පමණි. ඔහුගේ දෙකම්මුල වසා හෙවුණු සුදු රැවුළ, එහි පළින් පළ වූ කළු කෙස් නිසා, කැඩුණු කුරක්කන් ගොඩක් සේ පෙනිණ. කුඩා දරුවන්ට වඳුරකුගේ මුහුණ සිහි කරවන මේ රැවුළ, මුහන්දිරම්ගේ තලතුනා පෙනුමට වඩාත් තුඩු දෙන්නකි. බුද්ධිය හඟවන ඔහුගේ නළල් තලයෙහි හැඩහුරුකම තියුණු කරන්නෙකි; තරයේ පියවෙන හෙප්පුවක දෙපියන මෙන් දත් වසා පියවෙන සින් තොල් සහල වඩාත් හොබවන්නකි.

ගණන් පොත් පෙරළා බැලූ ඔහුගේ දෙතොල වඩාත් තද වත්ම ඔහු කන්නාඩිය ඉවතට ගෙන රෙදි කඩකින් එහි වීරුදු දෙක පිස දැමී ය. ඔහුට නුදුරින් පාත් පුටුවක හිඳගෙන උන් බිරිඳ නැගී ඇතුළු කාමරයක් දෙසට ගමන් කළා ය. තම සැමියා



Scanned by CamScanner

කන්නාඩිය ගෙන පිස දමන්නේ හිතට අසන්තෝෂයක් හෝ කෝපයක් හෝ නැඟුණු විට බව මාතර හාමිනේ දනියි.

''කරෝලිස්''යි සැර කරමින් මුහන්දිරම් යළිත් කන්නාඩිය නැහැය මතුයෙහි රඳවාගෙන ආලින්දය දෙස බැලී ය.

''උඹ කියන එක නෙවි කරන්නේ''යි සැරකරමින් ඔහු, තමා වෙතට ළඟා වූ කරෝලිස් දෙස බැලී ය; ''ගමේ ගැනුන්ට ණය දෙන්නට එපායයි උඹට කිව්වා නෙවද? මේ පාර බඩු ගෙනැත් දුන්නේ ණය නොදී වෙළඳාම් කරනවා යයි පොරොන්දු උණු නිසා. නමුත් මේ පාරත් රු. 750 ක ණය දීලා තියෙනවා.''

කරෝලිස් සාලයට ඇතුළු වන දොරටුවෙහි උළුවස්සට හාන්සි වී කරබා ගත්තේ ය.

''උඹට කෙළින් ඉන්නත් බැහැ නොවැ''යි කියමින් මුහන්දිරම් යළිත් පොත පෙරළී ය. කරෝලිස් උළුවස්සෙන් මඳක් ඈත්ව බිත්තියට ළං වූයේ බියෙන් ගැහෙමිනි.

''කඩේ තව බඩු කොපමණ තියෙනවාද?''යි යළිත් කරෝලිස් දෙසට හිස හැරවූ මුහන්දිරම් විචාළේ ය.

''හාල් ගෝනියකුයි සිල්ලර ටිකකුයි තියෙනවා.''

''මදැ මේ තරම් වෙළඳාම කරා! පළමු අවුරුද්දේ උඹට කඩේ දමා දුන්නේ රුපියල් දහක බඩු ගෙනවිල්ලා; අවුරුද්ද අවසාන වෙන කොට උඹ රුපියල් දහක ණය දුන්නා. කඩේ බඩුත් නැහැ. දෙවෙනි පාර රුපියල් හත්සිය පනහක බඩු ගෙනැත් දුන්නෙ තවත් ණය නොදෙන පොරොන්දුව පිට.''

''මේ පාර නම්, ණය දුන්නේ මම නෙවි.''

''උඹ නෙවි? එහෙනම් කවුද?'' යි අසමින් මුහන්දිරම්, ගණන් පොත වසා ඉවත දමා යළිත් කන්නාඩිය ගලවා ඉවත තැබුවේ ය. මුහන්දිරම මෙසේ කෙළේ තමාට ගැසීමට නොවන බව කරෝලිස් නිසැකව දනියි. එහෙත් ඔහු ආරුඪ කරගත් බැගෑ බව ඇතිව මෙසේ පිළිතුරු දුන්නේ ය.

''මම රුපියල් සීයකට වැඩිය ණය දුන්නේ නැහැ. ඒකත් දුන්නේ ණය ටිකක් නොදී වෙළඳම් කරන්නට බැරි හින්ද. අනිත් ඔක්කොම ණය දුන්නේ හාමිනේගේ ඕනෑ කමට''.

අදිරියන් කයිසාරුවත්තේ මුහන්දිරම් පදවිය ලැබීමට පෙර ගෙදර මෙහෙකරුවෝ, ඔහුගේ බිරිඳ 'හාමිනේ' යන නමින් ද ගැමියෝ 'මාතර හාමිනේ' යන නමින් ද හැඳින්වීමට පුරුදු වූවෝ ය. කයිසාරුවත්තේ මුහන්දිරම් පදවිය ලැබූ පසු ද ඔවුහු තමන්ට සුපුරුදු ඒ නමින්ම ඈ හැඳින්වූහ. ඔවුන් එසේ කෙළේ ඈට ඔවුන්

තුළ වූ සැලකිල්ල හා ආදරය ද නිසා ය. මහ ගෙදර කිසිවකු වැඩ කාරයන් ලවා වත් 'වලව්වේ මහත්තයා'යි කියවීමට වෑයම් නොකළ නමුත් ගැමියෝ ඇතැම් විට මුහන්දිරම්ගේ බිරිඳ තියටි වූ කල 'වලව්වේ මහත්තයා' යි කීහ. ඔවුහු මුහන්දිරම්ගේ නිවස 'මහ ගෙදර වලව්ව' නමින් හැඳින්වූහ. එහෙත් ඔවුන් ළං ව ආශ්‍රය කළ, ඔවුන්ට අවංකව ඇලුම් කළ, ඇතැම් ගැමියෝ, පරණ පුරුද්ද නොහැර මුහන්දිරම්ගේ බිරිඳ 'මාතර හාමිනේ' නමින් ද, නිවස 'මහ ගෙදර' නමින් ද හැඳින්වූහ. කරෝලිස් ද කුඩා කාලයෙහි පටන් මෙහෙකාරයකු මෙන් මහ ගෙදරම වැඩුණෙකි. මුහන්දිරම් ඔහුට සිල්ලර කඩයක් දමා දුන්නේ ඔහුගේ දියුණුවත් තමාගේ ලාභයත් සලකා ය. වෙළඳාමෙන් ලැබෙන ලාභයෙන් කොටසක් කරෝලිස්ට දුන් පසු ඉතිරි වන මුදල තම පවුලට මාස් පතා වුවමනා සහල් මිරිස්, ලුනු ආදිය සැපයීමට තරම් වෙතියි කඩය පටන්ගත් අවස්ථාවෙහි මුහන්දිරම් කල්පනා කෙළේ ය. එහෙත් ඔහු ගේ ඒ සිතුම් පැතුම්, ගලක හැපුණු විදුරු පාත්තරයක් මෙන් සුන්බුන් වී ය.

''කාගේ ඕනෑකමට ණය දුන්නත්, අවුරුද්දට වෙළඳාමෙන් රුපියල් දෙදහක් පමණ නැති උණා!''

''මේ පාර ගෙදරට කෑමට ගත් බඩුවලට අඩු කරන කොට අලා-බයක් හිටින එකක් නැහැ''යි කරොලිස් මතක් කෙළේ ය.

''යෝදයෝ! ගෙදරට කෑමට දීපු බඩුවලට අඩු කරලා තමයි ඔය අලාබය''යි කියමින් මුහන්දිරම් යළිත් ගණන් පොතක් පෙරළා බැලුවේ ය.

''හාමිනේ කිව්වාට ඇයි උඹ ගමේ ගෑනුන්ට ණය දුන්නේ; උඹ නෙව වෙළඳාම කෙළේ?''

''මම ණය දෙන්න බැරිය කිව්වාම ඒ ගෑනු එනවා හාමිනේ හම්බ වෙන්න; අඬා දෙඩා කනිපින්දම් කියා හාමිනේගෙන් තුංඩු කෑල්ලත් අරගෙන ඒ ගෑනු එනවා ආයිත් ණයට බඩු ගන්න.''

මෙසේ පිළිතුරු දුන් කරෝලිස්, මාතර හාමිනේ පිට වරද පැටවීමට ද කැමැති නොවූයෙන් වහාම මේ වදන් ද ඒ පිළිතුරට එක් කෙළේ ය.

''ඒ ගෑනු අඬන දෙඩන කොට හාමිනේගේ තියා මගේ උණත් හිත උණු වෙනවා.''

''කදිම වෙළෙන්දෙක් තමයි අපට අහු උණේ!''යි තෙපලමින් මුහන්දිරම් යළිත් ගණන් පොත ඉවතට දැමුවේ ය. ''ඉතුරු හාල් ගෝනියත් සිල්ලර ටිකත් මෙන්න මෙහේ ගෙදරට එවලා කඩේ වහලා දමාපන්. උඹලට වෙළඳාම කරන්න බැහැ.''

Scanned by CamScanner

කරෝලිස් ගියේ ගෙයි අනික් පැත්තේ මිදුල දෙසට ය. ඒ පැත්තේ දොරටුවක් ළඟ සිටි මාතර හාමිනේ, අඳුර අතරින් එන කරෝලිස් යන්තම් දුටු වහාම මෙසේ කීවා ය.

''මහත්තයාට තරහ ගොහිල්ල වගෙයි.''

''ඔව්''

''මොකද කිව්වේ''?

''කඩේ වහළ දමන්න කිව්වා, මහත්තයා කියන එකත් ඇත්ත. අපට මේ ගමේ ගෑනු එක්ක වෙළඳාම් කරන්න බැහැ.''

''හාමිනේ'' යන හඬ ඇසූ විගස මුහන්දිරම්ගේ බිරිඳ වහාම තම සැමියා වාඩි වී උන් මේසය අසලට ගියා ය.

''ගොඩේ ගෑනුන්ට ණයට බඩු දෙන්න හාමිනේ තුංඩු දෙනවාය කියා කරෝලිස් කියන්නේ හැබෑ ද''යි මුහන්දිරම්, තම භාර්යාව ගෙන් විචාළේ කෝපය මැඩ ගෙන ය.

''ඔව්–උන්ගෙන් බේරෙන්න බැහැ–දුප්පත් ඇයෝ.''

''මෙ පාරත් රුපියල් හත්සිය පනහක පිතර ණය දීලා තියෙනවා.''

''රුපියල් හත්සිය පනහක?''

''ඔව්; රුපියල් හත්සිය පනහකටත් ටිකක් වැඩිය දීලා තියෙනවා; කත්තිරිනාට රුපියල් දෙසීයකම ණය දීලා තියෙනවා.''

''කත්තිරිනාගෙන් රුපියල් දෙසීයක් එන්න තියෙනවා!''යි ඇ නෙපලේ පෙරටත් වැඩි විස්මයකිනි.

''ඔව්; ඒ ගැනිගෙන් රුපියල් දෙසිය විස්සක් එන්න තියෙනවා.''

''මම එච්චර ණය දෙන්න කිව්වේ නැහැ. මම දන්නේ නැහැ ඒ ගැනිට එච්චර ණය දීපු බවක්, සැරේකට රුපියල් දෙක තුනක ණය දෙන්නය කියා මම තුංඩු දීලා ඇති.''

''ඒ ඔක්කොම එකතුවෙලා තමයි. මෙ ගණන හැදී තියෙන්නේ.''

''එක්කහු වෙන්න මම එච්චර තුංඩු දුන්නේ නැහැ.''

තමා විසින් කරන ලද වරද මාතර හාමිනේට වැටහෙන්නේ දුන් ය. තම සැමියා කොතෙක් කෝප වුණත් තමාට කිසි විටක නොබණින බව දන්නා ඈ වඩාත් ශෝක වූවා ය. විවාහ වී අවුරුදු විස්සක් වන නමුත් එද මෙද තුර කයිසාරුවත්තේ කිසි විටක තමාට බැණ නොවැදුණ බවත් කෝපෙන් පවා තමා දෙස රවා නොබැලූ බවත් ඈ දනියි. ඇතැම් විටක ඔහු ඈ සමඟ කෝප වූ විට කෙළේ යතුරු කැරැල්ල දමා ගසා, පුටුවෙන් නැඟී යාම පමණි. දෙතුන් දවසකින් අවුරුද්ද ලබන බැවින් මෙදින එලෙස වත් මුහන්දිරම්, තම කෝපය හෙළි නොකරන බව බිරිඳ දනියි. ඇගේ ශෝකයත් පසුතැවිල්ලත් වැඩිවූයේ මේ සිතිවිලි පහළ වූ නිසා ය.

"මම කරෝලිස්ට එච්චර ණය දෙන්න යයි කිව්වේ නැහැ"යි මාතර හාමිනේ යළිත් කීවා ය. "දුප්පත් ගැනුන් අඬනවා දොඩනවා ඇහුණාම කාගේ උණත් හිත උණු වෙනවා."

තම බිරිඳ කෙරෙහි ඇතියි මුහන්දිරම් කයිසාරුවත්තේ දුටුවේ එකම එක දෙෂයකි. එනම්: දයා--කරුණාවෙන් පිරුණු හදවතක් ඇති වීමයි. එහෙත් එය ද දෝෂයක්, මෝඩකමක්, සේ සැලකීමට තරම් ඔහු ධර්මය නො අදහන්නෙක් නොවී ය. මුහන්දිරම්ගේ බිරිඳ තම කනෙහි කරෙහි පළඳින අබරණ වුව ද, නිරාහාරව දුක් විඳින රෝගාතුර ගැමි දරුවකුගේ තොරතුරු කියන ගැමි ගැහැනියකට දී ඈ සැනසීමට තරම් නිර්ලොභී වූයේ දෙව් ලොව සැපතට ආශාවෙන් නොවන බව මුහන්දිරම් දැනියි. ඈ අනාථයන්ට සංග්‍රහ කෙළේ හංසයකු දියට බසින්නාක් මෙනි. ගැනීම මෙන්ම දීම ද ඈට එක සේ සන්තෝෂයක් වී ය. වේදනාවෙන් මිරිකෙන දරුවකුගේ මුහුණ පමණක් නොව, ආරූඪ කරගත් වේදනාව ඇති තක්කඩි හිඟන්නෙකුගේ මුහුණ ද ඇගේ හද උණු කෙළේ ය. එසේ තම හද උණු කළ කවරකු වුව ද සැනසීම ඈට ප්‍රීතියකි. එසේ නොකළ හැකි වීම ඈට දුකකි.

ගෙයි පැළදෙර පැත්තේ මිදුලේ රිටක අවුනන ලද කාකු පොල් කටුවෙහි බත් මිටක් නොදමා ඈ කිසි දවසක දවල් බත් කා අත නො සේදුවා ය. ඈ බත් කන විටක පැමිණි හිඟන්නකු කුසගිනි නිවා නොගෙන ගියේ ඉතාම කලාතුරකිනි. ව්‍යඤ්ජන පිඟානක් පිරිවර කොට ඇති බත් පිඟානක් පන්සලට නොයවන ලද පසළොස්වක පොහොයක් ඈ ජීවත්ව සිටියදී ඉකුත් නොවී ය. එහෙත් ඈ භික්ෂූන් කෙරෙහි හෝ බණ දහම් කෙරෙහි හෝ පමණ ඉක්මවූ අන්ධ භක්තිය ඇති උවැසියක් නොවූවා ය. ඈ භික්ෂූන්ට පසළොස්වක පොහොය නොවරදවා දන් දුන්නේ කුල සිරිතක් වශයෙනි. අසරණයන්ගේ දුක් ගිනි නිවීමෙන් ලත් සැනසුම එයින් ද ලත් බැවිනි. ඈ බණ ඇසීමට විහාරස්ථානයට ගියේ පසළොස්වක පොහොය දවසෙහි පමණි. මාතර හාමිනේගේත් ගමේ ගතානුගතික උවැසියකගේත් වෙනස නූගත් ගැමියෝ ද දුටහ. ඔවුන් 'උපාසකම්මා' 'උපාසක හාමිනේ' යන ගරු නම් මාතර හාමිනේට ආරූඪ නොකෙළේ එහෙයිනි.

කොතෙක් උඩුකුරු කරන ලද නමුදු යටිකුරුව පොළොවටම ඇදෙන මුලක් සේ හැම විට ඇතුළට නොහොත් තමා තුළටම හැරෙන සිතක් ඇත්තියකි මාතර හාමිනේ. ඈ නිතර අවුස්සන්නේ ලෝකයේ නොව ඇගේම හදවත ය. ඇගේ මනස නිතැතින් ලෝකය දෙසට හැරෙතත් මනැස යොමු වන්නේ ඇගේ හදවත තුළ වූ ඇතුළු ලොව දෙසටම ය. එහෙයින් අනුන් කළ වරද ද ඈ දකින්නේ තමාගේ වරදක් ලෙස ය; අනුන්ගේ දුක් ගින්න

නිවන්නට වෑයම් කරන්නේ එය තමාගේ දුක් ගින්න නිවීමක් වන බැවිනි. කොතෙක් කෑවත් නොනිවෙන කුස ගින්නක් කපුටුවාට ඇතියි ගැමියෝ අදහති. මාතර හාමිනේ ද සොම්නසින් හා සැපතින් ද නොනිවෙන දුක් ගින්නක් ඇත්තියක වැන්න. එය ඇතුළු හදට යොමු වුණු සිතක් ලැබීමේ ප්‍රතිඵලයකි.

තම බිරිඳගේ සිත මෙවැනි විභාගයකට භාජන කිරීමට තරම් නිශ්චල උගැන්මෙන් පිරුණු හිසක් මුහන්දිරමට නොවී ය. එහෙත් ඔහු ඇගේ ගති ගුණ ඇති හැටියෙන් දුටුවෙකි. ගැනීමට නොව දීමටම හුරු වුණු අත් දෙකක් තම බිරිඳ ලැබීම, ඇතැම් විට කයිසාරුවත්තේ සැලකුවේ ව්‍යසනයක් ලෙස ය.

"හාමිනේ"යි කයිසාරුවත්තේ ශොකාකුල ස්වරයෙන් කීවේ ය. "ගමේ ගෑනුන් දුප්පත්කම නිසා දුක් විඳින බව ඇත්තයි. හාමිනේ මේ විදියට වැඩ කරන්න ගියොත් අපටත් දරුවන්ටත් වෙන්නේ අන්තරාවයි. ඒක හිතේ තියාගෙන වැඩ කරන්න."

කර බාගෙන උන් මාතර හාමිනේ මෙතැන් සිට සිත දැඩි කර ගැනීමට ඉටාගත්තා ය.

"කන්තිරිනාට එච්චර ණය දෙන්නයයි කිව්වේ නැහැයි හාමිනේ කිව්වා නෙව ද?"යි කයිසාරුවත්තේ මුහන්දිරම් යළිත් ඇසී ය.

"ඔව්, මට මතක නෑ ඒ ගෑනිට එච්චර ණය දෙන්න කිව් වගක්."

තමාගේ වරදම සැලකීමට ද අනුන් ගැන කුකුස් නො ඉපදීමට ද පුරුදු උණු මාතර හාමිනේ හැර අනික් ස්ත්‍රියක තුළ නම් මේ අවස්ථාවෙහි කරෝලිස් ගැන උපදින්නේ මහත් සැකයකි.. කයිසාරුවත්තේ තම බිරිඳගේ ගති ගුණවලට බෙහෙවින් වෙනස් ගති ගුණ ඇත්තෙකි. බිරිඳ නිතරම ඇතුළු හදට හැරුණු මනැස් ඇත්තියක වුව ද කයිසාරුවත්තේ වූ කලී හිරු දෙසටම හැරෙමින් පිපෙන සූරියකාන්ත මලක් මෙන් බාහිර ලෝකය දෙසටම යොමු වූ මනස ඇත්තෙකි. එහෙයින් ඔහුගේ මනසට හසුවන අනුන් පිළිබඳ තොරතුරු, සැතින් වෙදකම් කිරීමෙහි ගුරයකුගේ සැතට හසු වන පිළිකාවක් ලබන සංග්‍රහ ලබයි.

"කන්තිරිනාට හැම විටම තුංඩු දුන්නා ද?"යි මුහන්දිරම් ඇසී ය.

"නැහැ; සමහර විට මම රුපියල් දෙක තුනක ණය දෙන්න කටිනුත් කියා ඇති."

"එක වර රුපියල් දහයේ දෙළහේ ණය දෙන්න කිව් බවක් මතක ද?"

"නැහැ; කවදාවත් එච්චර ගණනක ණය එක පාරකට දෙන්න කිව් වගක් මට මතක නැහැ."

Scanned by CamScanner

"හොඳට කල්පනා කරන්න."

"මට හොඳට මතකයි. රුපියල් දහයක දෙළහක එකවර ණය දෙන්න යයි මම කවදාවත් කිව්වේ නැහැ."

මුහන්දිරම් වමතින් නළල අත ගා ලියන පෙට්ටියේ දොර වසා අගුළු ලා පුටුවෙන් නැඟී නිදන කාමරය දෙසට ගියේ ය.

තුන් දවසකට පසු ද උදය වරුවේ සාද කා බී අලුත් පට සරමත් බැනියමත් හැඳ, හම් පටිය ඉන වටා බැඳ ගෙන, මිදුලට බැස රතිඤ්ඤ මිටියක් ගිනි තබා පිපිර වීමෙන් මහ ගෙදරට පමණක් නොව ගමට ද අවුරුද්ද ළඟා වූ බව සැල කෙළේ ය. රතිඤ්ඤ පිපිරෙන හඬින් අවදි වුණු තිස්ස ඇඳෙන් පැන දිව, තමාගේ රතිඤ්ඤ මිටි දෙක අතට ගත්තේ ය. සාද රතිඤ්ඤා පුපුරවා ඉවත් වූ විගස නන්ද රතිඤ්ඤා මිටි දෙකක් එක විට මිදුලේ තබා ගිනි තැබුවා ය.

"මේ දරිවිත් පුංචි එකියෙක් වෙන්න හදනවා!" යි අනුලා කීවා ය.

අනුන් රතිඤ්ඤා පුපුරවනු අසා බලා සන්තෝෂ වූ තිස්ස තම රතිඤ්ඤා මිටි දෙක අතින් ඉවත්ව මිදුලට ගොස් පිපිරෙතියි සැක කළ බැවින්දෝ වඩාත් තදින් අල්ලා ගත්තේ ය.

අලුත් අවුරුදු බත කන මොහොත පැමිණියේ දවල් දෙක පසු වූ විට ය. සුබ මොහොත ළං වත්ම සාලයෙහි එළන ලද පැදුරුවල හිඳගත් මුහන්දිරම් ද බිරිඳ ද දරුවෝ ද ඔවුන් අසල දණ ගසාගත් ගෙදර වැඩකාරයෝ ද වැඩකාරියෝ ද සුදු ඇතිරිල්ලෙහි වූ කෙසෙල් කොළවලට බෙදගත් කිරි බත් සුබ මොහොතින් අනුභව කළහ. සුබ මොහොතින් කිරි බත් කෑ පසු වැඩකාරයෝත් වැඩකාරියෝත් නැඟී කුස්සියට ගියහ. මුහන්දිරම් ද බිරිඳ ද හැර මහ ගෙදර අතික් සියල්ලන්ම අවුරුදු බත කෑවේ තාන් රෙදි පිළි හැඳ ගෙනය. අවුරුදු බත කෑමෙන් පසු ඔවුන් එදින ගතකෙළේ සෙල්ලමිනි.

මාතර හාමිනේගේ අතින් පළමුව 'සතයක්' ලබා ගැනීමට පැමිණි ගෑනු රාශියකි. මෙසේ පැමිණි ගැහැනුන් අතර ඇත්ත වශයෙන් අලුත් අවුරුද්දෙහි මාතර හාමිනේගේ අතින් කාසියක් ලබා ගැනීම සුබ ලකුණක් ලෙස සලකන ගැහැනු බොහෝ වූහ. මුදල් එකතු කර ගැනීමේ ආශාවෙන් පැමිණි ගැහැනු ද හිඟ නොවූහ. කවුරුනුත් පැමිණියේ 'සතයක්' ලබාගැනීමට වුව ද මාතර හාමිනේගෙන් රිදී කාසියක් නොලැබුයේ කුඩා දැරියක පමණි.

"මම උඹ හම්බවෙන කල් තමයි හිටියේ" යි කියමින් මාතර හාමිනේ, බුලත් කොළ කැල්ලක දවටන ලද ශත විසිපහේ කාසියක් කත්තිරිනාට දුන්නා ය.

Scanned by CamScanner

කත්තිරිනා මාතර හාමිනේට හත් අවුරුද්දකින් පමණ බාල වියෙහි වූ දිළිඳු ගැහැනියකි. දිළිඳු වුව ද ඈ පිරිසිදුව අඳින අවංක සෘජු ස්ත්‍රියකි. ඇගේ සැමියා මත්පැන් බොන්නකු වුව ද හොඳ ගැමියෙකි. කත්තිරිනා දුක් විඳින්නේ ඇගේ සැමියා නිසා බව මාතර හාමිනේ දනියි. කොතෙක් දිළිඳු වුව ද, දුක් පීඩා විඳින නමුදු, කත්තිරිනා කිලිටි රෙදි හැඳගෙන ගෙයින් පිට යනු නොදක්නා ලදී. කත්තිරිනා, ස්වාමිදූවකට මෙන් ද, මවකට මෙන් ද, ඇතැම් විට මිතුරියකට මෙන් ද මාතර හාමිනේට සලකයි. හතළිස් ඇවිරිදි ගැමි ගැහැනියක වුවද තරුණ විය ද තරුණ වියෙහි වූ කඳිම රූ සපුව ද කියනා සලකුණු කත්තිරිනා කෙරෙන් තවම සම්පූර්ණයෙන් ඉවත් නොවී ය.

''අනේ හාමිනේ මම මේ පැත්තේ ටික දවසකින් නාවේ මගේ දූගේ ලෙඩේ හොඳටම සනීප නූණ නිසා.''

''දූන් සනීප ද?''

''ඔව්, හාමිනේට පින් අයිතිවෙන්න මගේ දූ මේ පාර ජීවත් කරගත්තා. හාමිනේ කරන උපකාර උප උපන් ජාතියේ මම සිහි කරනවා.''

කත්තිරිනා මෙසේ කීවේ වාටු අදහසින්ම නොවේ. මෙවැනි බසින් පෝෂණය ලබා වැඩෙන අහංකාර සිතක් මාතර හාමිනේට නැති බව කත්තිරිනා දනියි. එහෙත් එසේ වාටු බස් දෙඩීම, තමාගේ සිත සැහැල්ලු කරගැනීමට මෙන් මාතර හාමිනේගේ සිත ඇදගැනීමට ද වහල් වන බව කත්තිරිනා නොදනිති යි ද කිව හැකි නොවේ.

''ඇයි දූ එක්ක නාවේ අවුරුද්දට?''

''අනේ හාමිනේ තාම ලැයිසාට හොඳටම සනීප නැහැ. වෙද මහත්තයා කිව්වා බොහෝම පරෙස්සම් වෙන්නය කියා; ආපත්තියක් උණොත් බොහොම නරකය කියා. ලැයිසා නම් හාමිනේත් නෝනලාත් දකින්න ආශාවෙන් ඉන්නවා.''

''ආ කත්තිරිනා මම නුඹට රුපියල් දෙසීයක බධු ණයට ගන්න කිව්වා ද?''

''රුපියල් දෙසීයක!'' යි කත්තිරිනාට කියැවුණේ, ඈ විස්මයෙන් ගොළු වීමට පෙර ය.

''ඔව්''කරෝලිස් කියන්නේ උඹට රුපියල් දෙසීයක ණය දුන්නාය කියා.''

කත්තිරිනා පිළිතුරු දුන්නේ පෙට්ටියක් තුළින් අමාරුවෙන් එළියට ආ ගැහැනියක මෙනි.

Scanned by CamScanner

"නැ හාමිනේ; මම හාමිනේ කිව්වාට වඩා සත දහයක බඩු ගත්තේ නැහැ. මට මතක තියෙන හැටියට මම ඔක්කොම රුපියල් පනහක හැටක විතර බඩු ගන්න ඇති."

"කඩේට ඉස්සර කොච්චර ණය තිළණා ද?"

"මේ ගිය අවුරුද්දේ මුල් හරියේ ගත්තු ණය ද?"

"ඔව් ඊට ඉස්සර අවුරුද්දේ ණය අත්හැර දැම්මායයි කරෝලිස් කිව්වා."

"මට හරියට කියන්න බැහැ. සැරින් සැරේ ගෙව් මුදල් යන්න රුපියල් දහයකට පහළොවකට වැඩි වෙන්න බැහැ."

"මොනවා? උඹට හරියට මතක ද?" යි මාතර හාමිනේ විචාළේ තමා තුළ සැකයක් හටගත් නිසා නොවේ; කත්රිනාට අමතක වීමෙන් ඒ ගණන් අඩු විය හැකියයි සිතූ බැවිනි.

"ඔව් හාමිනේ, මට හොඳට මතකයි. සමහර විට කරෝලිස්ට වැරදිලා වෙන්න ඇති. වෙන කාගේ දේ ණයක් මගේ ගණනට දලා වෙන්න ඇති."

කත්රිනාගේ මේ පිළිතුරෙන් පසු මාතර හාමිනේ ණය කතාබහ නැවැත්වූයේ යම් කිසි විනිශ්චයකට බැසීමෙන් නොවේ. යළිත් කරෝලිස්ගෙන් ප්‍රශ්න නොකොට කත්රිනා සමඟ තර්ක කිරීම නිෂ්ඵල බැවිනි.

සිංහල අවුරුදු දිනයෙහි මාතර හාමිනේගේ අතින් රිදී කාසියක් ලබා ගැනීමට කත්රිනා එන්නේ අවුරුදු පසළොසකටත් වැඩි කාලයක සිට ය. එහෙත් මේ වර පැමිණියේ කාසියක් ලබන අදහසින් පමණක් නොව තවත් අදහසකුත් ඇතිව ය. ණය පිළි-බඳව පිළිබඳ කථාව නැවැත්වූ විගස කත්රිනා මෙසේ කීවා ය.

"හාමිනේට වැදගත් කාරණාවක් ගැන කියන්නත් එක්කයි මම අද ආවේ."

"වැදගත් කාරණාවක්?" යන වචනම තෙපලා මාතර හාමිනේ නන්දට හඬ ගෑවා ය.

"ඉඳා මෙන්න මේ ඉතුරු සිල්ලර කාසි ටික අල්මාරියේ තියාපන්."

නන්ද, තම මව දුන් කාසි ටික ද යතුරු කැරැල්ල ද ගෙන කාමරය දෙසට ගියේ මෙසේ කියමිනි.

"සල්ලි බෙදලා ඉවරවා වගෙයි!"

මාතර හාමිනේ සිනාසී කත්රිනාට මෙසේ කීවා ය.

"පුංචි නෝනා තරහයි; එන එන ගැනුන්ට සල්ලි දෙනවාය කියා."

Scanned by CamScanner

''ගමේ කවුරුත් හාමිනේට පින් දෙනවා; හාමිනේ අතින් අවුරුද්දට සතයක් ගත්තොත් හරි යනවාය කියා''යි තෙපලීමෙන් කත්තිරිනා මාතර හාමිනේට අනුබල දුන්නා ය.

''ඒ බොරු!''

''බොරුවට එහෙම කියන උදවියත් ඇති; ඇත්තට එහෙම කියන ගෑනු වැඩි''යි කී කත්තිරිනා, මාතර හාමිනේට යළිත් කතා කරන්ට ඉඩ නොතබා මෙසේ කීවා ය.

''වැදගත් කාරණාවක්ය කිව්වේ ඉස්කෝලේ මහත්තයා කිව්ව කාරණාවක් ගැනයි.''

''ඉස්කෝලේ මහත්තයා, මොන?''

''පියල් ඉස්කෝලේ මහත්තයා''

''මොකක්ද කාරණේ?'' යි මාතර හාමිනේ මේ වර ඇසුවේ මඳ කුහුලක් ඇතිව ය.

''පුංචි නෝනා ගැන''

''මොන පුංචි නෝනා ගැන ද?''

''හාමිනේලයි පුංචි නෝනා ගැන''

''නන්දවති නෝනා ගැන?''

''ඔව්''

කත්තිරිනා වටින් පිටින් කතා කරගෙන එන්නේ කුමන අදහසක් ඇතිවදැයි මාතර හාමිනේට වැටහුණේ දැන් ය. ඒ වැටහීම ඇගේ හිසට නැඟීමට ප්‍රමාද වූයේ ඇ එවැනි යෝජනාවක් ගැන සිහිනෙනුදු නොසිතූ බැවිනි.

''උංට කවුද හිර දෙන්නේ?'' යන වචනය මාතර හාමිනේට කියවුණේ ඒ වේලාවෙහි ඇගේ හිසට නැඟුණු ගර්වය නිසා ය. කුල ගර්වයට වහල් වූව ද මාතර හාමිනේ, කිසි විටක ඊට මුවහ වී අනුන්ට නින්ද නොකළා ය. පියල් විසින් හෝ ඔහුගේ මව විසින් හෝ මේ යෝජනාව කරන ලද නම්, මාතර හාමිනේ, ඔවුන්ගේ සිත් නොරිදෙන ලෙස බොරුවක් කියා එය බැහැර කරනු නිසැක ය. ඇ කිසිවකුගේ සිත රිදවූයේ ඉතාම කලාතුරකිනි. මහගෙදර වැඩි හිටියන් නම් කුල ගර්වය වහල් කොට ගත්තේ අනුන්ට ලොකු කම් පානු සඳහා නොව, තමන්ගේ ආරක්ෂාව සඳහා ය. කුල ගර්වය නිසා ඔවුන් ලත් ඒ ආරක්ෂාව, ඔවුන්ගේ පිරිහීමට හේතු වී ය. කෙමෙන් වෙනස් වන පරිසරය නොතකා ඇතැම් පැරණි අවයව, පැරණි ස්වරූපයෙන් රැකගැනීමට තැත් කළ සත්තු වඳ වී ගියෝ ය.

Scanned by CamScanner

මාතර හාමිනේගේ පිළිතුර කත්තිරිනා නොසිතුවක්ම නොවේ. මහ ගෙදර පවුලෙහි කුල ගර්වය දන්නා ඈ පියල් පිළිබඳ යෝජනාව අසා ඇතැම් විට මාතර හාමිනේ කිපෙතියි කලින්ම සිතුවා ය. තැනට උචිත පරිදි කථා කිරීම ඇට අමාරු කාරියක් නොවූයේ එහෙයිනි.

"ඔව්—ඒ අතින් නම් ඒ ගොල්ල මොන මිනිස්සුද? හාමිනේලාගේ පවුලට බැඳෙන්න යෝජනා කරන්න තියා හිතෙන් හිතන්නවත් ඒ ගොල්ලන්ට පුළුවන් කමක් නැහැ. ඉස්කෝලේ මහත්තයාගේ හොඳකම නිසාත් උගත්කම නිසාත් මම නිකං හිතුවා හාමිනේට කියලා බලන්න. එයා නොකිව්වා නම් මම එහෙම එකක් මගේ ඕනෑ කමින් මතක් කරනවාද? එහෙම එකක් මගේ ඕනෑ කමින් කතා කරන්න ඒ ගොල්ල මොන මිනිස්සුද?"

"එහෙනම් පියල් පුංචි නෝනා ගැන කතා කරන්න උඹට කිව්වා?"

"ඔව් හාමිනේ, මම බැරිය කිව්වා; ඒත් මට වද කරන නිසාත්–" යි කී කත්තිරිනා කටට ආ අනික් වචන යළිත් ගිලගත්තා ය.

තමාගේ ඇතුළු හදටම සිත හරවන්නට පුරුදුවුණු මාතර හාමිනේ සියුම් බුද්ධියෙන් දක්ක යුතු ඇතැම් කරුණක් ඉව ඇල්ලීමෙන් මෙන් දැනගැනීමට පුරුදු වුණු ස්ත්‍රියකි. එහෙයින් කත්තිරිනා ගිලගත් වචන ඇසීමට ඈ නොඉවසුම් වූවා ය.

" 'ඉස්කෝලේ මහත්තයා කිව් නිසාත්—' යයි කතාව නැවත්තුවේ ඇයි කත්තිරිනා?"

බිම බලාගත් කත්තිරිනා ටිකක් ඇඹරුණා ය. ගිල ගත් වචන යළිත් කටට නහා පිට කිරීමට ඈ ඇලි මැලිකම් කළා ය.

"කියාපන් කත්තිරිනා, දැන් ඉතින් උඹ කියන්න හිතාගෙන ආ ඔක්කොම කියාපන්."

"පුංචි නෝනාත් කැමතිය කිව් නිසාත්—"යි කත්තිරිනා බිම බලාගත් වනම, කලින් වරක් ගිලගත් වචන කටින් පිට කළා ය.

"පුංචි නෝනාත් කැමතිය කිව්වා!"යි මාතර හාමිනේ ඇසුවේ කත්තිරිනාට සැරකරන්නාක් මෙනි. තම සිතට නැඟුණු කෝපය ද විස්මය ද මැඩගැනීමට මාතර හාමිනේ වෑයම් නොකළා ය.

"හාමිනේ තරහ වෙන්න එපා. මම නිකම් කිව්වේ ඉස්කෝලේ මහත්තයා කිව් එකයි; හාමිනේටත් දැන ගන්න. කොහොම උණත් එහෙම එකක් දැනගත්තාම හාමිනේට දන්නීම අපේ යුතුකමක්."

මාතර හාමිනේගේ හිසට නැඟුණු කෝපය හා කුහුල ද වැඩි වුණා මිස අඩු නොවී ය. එවේලේම නැගිට ගොස් නන්දගෙන් අසා

Scanned by CamScanner

දනාගෙන ඇට තරවටු කිරීමට සිතුණු නමුදු ඒ සිතිවිල්ල මාතර හාමිනේ මැඩගත්තා ය.

" 'උංට හිර දෙන්නේ කාරිදැයි'යි මම කිව වචන පියල්ට කියන්න ඕනෑ නෑ. එයාගෙන් ළමයි දෙන්නාම ඉංගිරිසි ඉගෙන ගත්තා."

මාතර හාමිනේ මෙසේ කීවේ නියරුණේ පියල්ගේ සිත රිදවීම නොමනායයි හැඟුණු බැවිනි. පියල් තම දූන් දෙදෙනාට ඉංගිරිසි ඉගැන්නුවේ ය. මාතර හාමිනේ පියල් ලවා ඔවුන් දෙදෙනාට මෙහෙ-
ඉංගිරිසි ඉගැන්නුවේ යම් කිසි කාරියක් සඳහා වැටුප් පිට නොවේ.
කාරයකු යොදනා හැඟීම ඇතිව මිස අන්කිසි හැඟීමකින් පිණිස
එහෙත් පියල් පලි ගන්නා සිතින් නන්දට නින්ද කරනු ඉංගිරිසි
බොරු ගොතා කීවත් ඒ බොරු මිනිස්සු අදහති. ඔහු ඇට ඉගැන්වූ බැවිනි.

"හාමිනේ කියන එකක් මම එහෙමත් අනුන්ට කියනවාද? ඉස්කෝලේ මහත්තයාටත් වැරදි ගන්න බැරි විදියට හාමිනේ ඉස්-
අකැමැති වග කියන හැටි මම දන්නවා. ඒ උණත් හාමිනේ,
කෝලේ මහත්තයා නම් හොඳ හැදිච්ච ළමයෙක්"

මාතර හාමිනේගෙන් අනුබල නොලැබුණු නමුත්, කත්තිරිනා නම් දෙඩුවම නොනැවැත්තුවා ය.

"තාත්තාගේ කල්පනාව තිඋණේ ඉස්කොලේ මහත්තයා පෙරකදෝරු මහත්තයෙක් කරන්න."

"උඹ කොහොමද දන්නේ?"

"එයාලයි තාත්තා ඉන්දෙද්දි එහෙම කිව්වා."

"උඹ එක්ක ද?"

"මම එක්ක නෙවි. තාත්තා මැරුණේ නැති නම් පෙරකදෝරු වෙක් වෙන්න ඉගෙනගන්න තිඋණායයි ඉස්කෝලේ මහත්තයා දවසක් කිව්වා. තාත්තා පුතාට හුඟක් හම්බකරලා තියලයි මැරුණේ. නන්දියස් ඔපිසර මහත්තයාගේ ගේත් ඉඩමත් බැඳගෙන රුපියල් තුන් දහක් තාත්තා ඉන්දෙද්දී පොළියට දීලා තිඋණා. දැන් පොළිත් එක්ක ඌය රුපියල් දහ දහකට ළං වෙලා".

"උඹේ කට රිදෙන්නේ නැද්ද කත්තිරිනා"යි මාතර හාමිනේ ඇසුවේ ඇනුම් පද සිනාවකින් කටකොනා සරයා ගෙන ය.

"ඕවා මම නිකං කිව්වා. ඉස්කෝලේ මහත්තයා හාමිනේලයි පවුලට ගැළපෙන මිනිහෙක්ය කියා හිතා ගෙන නෙවි"යි කියමින් කත්තිරිනා තමා හිඳගෙන උන් බංකුවෙන් නැංගා ය.

"හාමිනේ එක්ක මේ කතාව කරන්න වෙන කෙනෙක් ආවා නම් බැණලා එලවන වග මම නොදන්නවා නොවෙයි. ඉස්කෝලේ

Scanned by CamScanner

මහත්තයාත් මටම කිව්වෙ ඒක දන්න නිසා තමයි'' කියමින් කත්තිරිනා යන්ට හැරුණා ය.

'' 'උඹට කවුද හිර දෙන්නේ'යි කිව් එක පියල්ට කියන්න එපා. අපි මොකටද කවුරුවත් තරහ කර ගන්නේ?''

''ඔව් හාමිනේ; මම එයාට කියන්න ඕනෑ විදියට කියන්නම්: හාමිනේලාගේ අගේ වැඩි වෙන විදියට.''

''හොඳයි ගිහින් වරෙන්''යි කියමින් මාතර හාමිනේ ද තමා හිඳගෙන උන් පාත් පුටුවෙන් නැංගා ය.

Scanned by CamScanner

# 3 වන පරිච්ඡේදය

මාතර හාමිනේ පියල් පිළිබඳ පුවත ගැන තම දුවගෙන් විපරම් කෙළේ අවුරුදු උළෙල ඉකුත් වී තුන් දවසකිනි. කත්තිරිනා ගිය වහාම ඒ ගැන නන්දගෙන් විපරම් කිරීමට සිතූ සිතුම මාතර හාමිනේ මැඩගත්තේ අවුරුද්ද නිමිත්තෙන් සන්තෝෂ වන තම දුවගේ ඒ සන්තෝෂයට බාධා නොකරන පිණිස ය.

''පියල් උඹෙන් මොකුත් ඇහුවා ද? ''යි මාතර හාමිනේ නන්දගෙන් විචාලා ය. ඈ මෙසේ විචාළේ අනුලා ද නන්ද ද නිදන කාමරය තුළදී ය. කළුවර ලීයෙන් හා ඇත් දලින් කැටයම් කරන ලද බුරුත ලී බීරෝ අල්මාරියක් බිත්තියක් අද්දර වී ය. අල්මාරි දොර දෙකෙහි හතරැස් කොටු හතර මැද, ඇත් දත් ඇනයෙන් කැටයම් කරන ලද කළුවර ලී මල් හතරක් වෙයි. බුරුත දොර සාරා කවා සවිකරන ලද ඒ මල් සතර, බුරුත ලීයෙහි නිතැතින්ම හටගැනෙන සලකුණු වැන්න. කුඩා පිත්තල කළවල හැඩහුරු කම් ඇති කළුවර ලී කකුල් හතරින් උසුලා ගත් අල්මාරියෙහි පහළ තට්ටුවෙහි රාමුව ද කළුවර ලීයෙන් කරන ලද්දකි. එහි කළුවර ලී මුදුන ද පහළ තට්ටුවේ රාමුවට කැපෙන්නකි. කළුවර කැටයම් පටියෙන් වැසුණු පිරිද්දුම් ඇති ඒ අල්මාරිය, විශාල බුරුත ගසක් කපා හාරා ඔප–මට්ටම් කොට කැටයමින් අලංකාර කිරීමෙන් තනන ලද්දක් සේ පෙනිණ. ඉතා ළංව අතපත ගා බලන්නෙක් වුව ද, ඇතුළු පැත්තෙන් දොර දෙක අල්ලා ගත් පිත්තල අසව් තුඩු හැර අනික් කිසි පිරිද්දුමක්, විවරයක් ඒ අල්මාරියෙහි ඇතැයි නොසිතයි.

නන්ද මේ අල්මාරියට හාන්සි වී සිටියා ය. මාතර හාමිනේ වාඩි වී උන්නේ අල්මාරියට මඳක් ඈතින් බිත්තිය අසල වූ ඇඳක ය. ඇඳෙහි එළන ලද තුන්හිරි පන් පැදුර පරණ එකක් වුව ද කොට්ටය නොකිලිටි සුදු උරයක් ඇත්තකි. 'මෙය පිරිසිදු ව ඉන්ට පුරුදු වුණු නොකම්මැලි දූරියන් දෙදෙනකු නිදන කාමරය ය' යන හැඟීම එහි ඇතුළු වන අමුත්තකුගේ සිතට නඟිනු නිසැක ය.

මව, යට කියන ලද ප්‍රශ්නය නැඟුවේ කුමක් නිසාදැ යි නන්ද වහාම තේරුම් ගත්තා ය. 'අම්මා කැමැති නම් මම කැමැතියි'යි ඈ පියල්ට කීවේ ඔහු, මව සමඟ ඒ ගැන කතා කරතියි යන හැඟීමක් ඇතිව නොවේ. මව සමඟ කතාවට පියල්, කත්තිරිනා යවතියි නන්ද සිතෙනුදු නොසිතුවා ය. ඈ ඒ වේලේ පියල්ගේ ප්‍රශ්නය සැලකුවේ කවටකමක් ලෙසිනි.



Scanned by CamScanner

"ඔව් අම්මා"යි නන්ද මව විචාළ ප්‍රශ්නයට ඍජුවම පිළිතුරු දුන්නා ය.

"මම කැමැති නම් උඹත් කැමතිය කිව්වා ද?"

"ඔව්"

"මොකටද පියල් එක්ක ඔහොම කතාවට ගියේ. උංට කවුද හිර දෙන්නේ?"

"මම එච්චර දුරට කල්පනා කෙරේ නෑ අම්මා. ඒ වෙලාවේ කටට ආ නිසා මම එහෙම කිව්වා. අම්මා කියන කෙනෙකුට මිසක් වෙන කෙනෙකුට කැමැති වෙන්නේ නැති නිසා මට එහෙම කියවුණා."

"එහෙනම් පියල් ඊට කලිනුත් ඔය ගැන කතා කරන්න ඇති."

"පියල් ලියුම් වගයක් දුන්නා."

සෙන පුපුරණ හඬින් බිරාන්ත වූ එකියක සේ මාතර හාමිනේ දෙනෙත් විදහාගෙන නළල රැලිගැන්නුවා ය.

"අපේ වරිගෙ කවුරුත් නොකරපු වැඩක් නෙව උඹ කරලා තියෙන්නෙ! පියල් එක්ක තියා අපේ පෙලන්තියේ අපේම පවුලක උණත් ඉලන්දරියෙක් එක්ක ලියුම් ගණුදෙනු කරනවා ද හැදෙන ගැනු ළමයෙක්?" යි මාතර හාමිනේ කීවේ බලවත් කෝපයෙනි; ශෝකයෙනි.

"මම ලියුම් යැව්වේ නැහැ අම්මා. මම ගැන ඇයි ඔහොම හිතන්නේ?"යි නන්ද බිය රැඳි දෙනෙතින් යුතුව විචාළා ය.

"එහෙනම් පියල් ලියුම් දුන්නායයි උඹ දැන් කිව්වේ?"

"එයා ලියුම් දුන්නාට මම ලියුම් යැව්වාය? පියල් ලියුම් දෙකක් දෝ කොහෙදෝ මට දුන්නා. මම ඒවා ඉරා — අල්මාරිය අස්සට — මම පියල්ට කවදාවත් ලියුම් යැව්වේ නෑ."

පියල්ගේ ලියුම් 'ඉරා'යි නන්ද කීවේ මව සනසන අටියෙනි. 'අල්මාරිය අස්සට ——'යි අනතුරුව කීවේ පළමු කියුම බොරු-වක් විය හැකි බැවිනි. නන්ද පියල්ට ආලය නොබැඳගත් බව ඇත්තකි. එහෙත් තමාගේ රූපය ද ගතිගුණ ද වර්ණනා කෙරෙන කියුම් සහිත ලියුම් කියවූ ඇගේ හද තුළ ගුප්ත සන්තෝෂයක් හට ගත්තේ ය. ඒ ලියුම් ඉරා නොකොට අල්මාරියේ මුල්ලක සඟවා තබන්නට ඇට සිතුණේ ද එහෙයිනි.

පියල්, දූලි නූලක් සේ යම්තම් මතු වුණ රැවුළකින් යෙවුණ වූ සිත් උඩු තොල ද ඊටම යරිලන යටි තොල ද එයින් වැසුණු කුඩා කටක් ද කජු පුහුලමක් වැනි නැහැයක් ද ඇති තරුණයෙකි. පියල්ගේ මුහුණ එතරම් සුන්දර නො විය. එහෙත් සිනාව නිසා,

Scanned by CamScanner

ඔහුගේ ඒ මුහුණ ප්‍රියංකරත්වයක් ලැබී ය. කොණ්ඩ කාරයන් බහුල ගමෙහි තරුණයන් අතර කොට කර කපන ලද කොණ්ඩය ඇත්තෝ හත් අට දෙනකුට වැඩි නොවූහ. පියල් ඔවුන් ගෙන් එකෙකි.

ගාල්ලේ ඉංගිරිසි පාසැලකින් ඉගෙනීම ලැබූ පියල් කලිසන් හඳින්නට වූයේ එහිදී මිස ගමෙහි දී නොවේ. ගමදී ඔහු දනුදු හඳින්නේ සරමත් බැනියමත් පමණි; පිට ගමකට යන විට සරම හා කෝට් එකක් ද ගාල්ලට හෝ පිට පළාතක මඟුලකට තුලාවකට හෝ යන විට කලිසන් කෝට් ද හඳියි. සමහර ගැමි ගැහැනුන් අතර ඔහු 'කපාලා අඳින මහත්තයකු, ලෙස ප්‍රකට වූයේ මේ නිසා ය.

තරුණයකුට ආලය කරනු කැමැති කවර තරුණියක වුව ද වරක් දුටු පියල් දෙස තවත් වරක් බලනු නිසැක ය. පියල් පිළිබඳ මේ කරුණු සිහි කළ මාතර හාමිනේ, නන්ද වඩාත් සැක කළා ය. පියල්ට ලියුම් නොයවන ලදැයි යන දූවගේ කියුම ඇදහීමට ඈ මඳක් ප්‍රමාද වූයේ එහෙයිනි. තරුණියන්ගේ පොදු ගති ගුණ දන්නා මාතර හාමිනේ ඔවුන්ගෙන් ඇතැමුන්ගේ විශේෂ ගති ගුණ දැකීමට තරම් විචාර බුද්ධිය ඇති ස්ත්‍රියක් නොවූවා ය. තමා තරුණියකව සිටියදී සිතූ සැටි ද කළ සැටි ද සිහි කිරීම, නිතර තමාගේ හදවත තුළට යොමු වුණු සිත ඇති ඇගේ සිරිත වී ය. ඈ තමා දූරියක ලෙස සිතූ පැතූ කළ කී දේ අනුව තම දූන් ද විනිශ්චය කරයි. කුඩා කල තමාට තරුණයකුගේ ලියුමක් ලැබුණි නම්, මාතර හාමිනේ කලබල වනු නිසැක ය. එහෙයින් පියල්ගෙන් ලියුම ලැබුණු විට නන්ද ද කලබලවන්ට ඇතියි මාතර හාමිනේ සිතුවා ය. තරුණයකුගේ ලියුමක් නිසා එසේ කලබල වූ තරුණියක තුළ ඇති විය හැක්කේ සිත්විලි දෙකකි. තරුණයාට රහසින් ආලය කිරීම එකකි; ලියුම ඉරා වීසි කොට ඔහුගෙන් ඈත් වීමට සිතීම අනික ය. තමාට ආලය බැඳගත් තරුණයකු සම්බන්ධයෙන් තරුණියකට ගත හැකි අනික් මඟක් නැතැයි යනු හාමිනේගේ විනිශ්චය වෙයි.

තමාගේ බාල වියෙහි දී නොවූ විරූ පරිදි රට ද ගම ද දැන් වෙනස් වී ඇති බව මාතර හාමිනේ සිහි නොකරයි. රට ගම වෙනස් වන විට එහි වෙසෙන්නන් ද ඊට අනුරූපව වෙනස් වන සැටි සිතා ගැනීමට අනුබල දෙන මතයක් ඇගේ උගැත්මෙහි ද ප්‍රත්‍යක්ෂයක් ඇගේ අත්දැකීමෙහි ද ඇතුළු නොවී ය.

සුන්දර තරුණයෙකැයි කිව යුතු පියල් නිසා නන්ද තුළ නම් අමුතු හැඟීමක් පහළ නොවී ය. ඇතැම් විට ඇගේ කුල ගර්වයත්, පියල්ගේ මුත්තා පිළිබඳ පුවතත්, පියල් නිතර දකින්ට ලැබීමත්, යන කරුණු අමුතු හැඟීමකට ඉඩ නොදෙන ලදැයි හැඟේ.

Scanned by CamScanner

"උඹ පියල්ට ලියුම් යැව්වේ නැහැයි කිව්වේ ඇත්තක් ද?"යි මව යළිත් ඇසුවා ය.

"නෑ අම්මා"යි නන්දා පිළිතුරු දුන්නේ මඳක් තරහයෙනි.

"පියල් දුන් ලියුම් ගත්තේ මොකටද?"

"මම අම්මා හිතන තරම් දුර කල්පනා කෙරේ නැහැ. ලියුම් අරගෙන කියවා මම වීසි කරා—"

"වීසිකරා?"

"ඔව්, අල්මාරියට — මම කියන්න හැදූ එක කියා ඉවර කරන කල් ඉවසන්නෙත් නැතුව අම්මා ප්‍රශ්න අහනවා"යි කියමින් නන්දා බුම්මාගත්තා ය.

"උඹට ලියුම් දුන් වග පියල් සමහර විට කත්තිරිනාටත් කියන්න ඇති."

මවගේ මේ වදන් ඇසූ නන්දාගේ මුහුණ අඳුරු වී ය. ඇගේ හිසට නැඟුණු කෝපය හා ගර්වය ද දෙනෙත් කවුළුවෙන් පිට නොවී නම් ඇගේ මුහුණ වඩාත් අඳුරු වෙයි.

"මම පියල්ගෙන් අහන්නම්"යි නන්දා කීවේ, එහි නොසිටි ඔහුට කරන තර්ජනයක් ලෙසිනි.

පියල් පිළිබඳ පුවත මී කුණක් ලෙස වළ ලනු දැකීමට ආශාවෙන් උන් මාතර හාමිනේ, නන්දාගේ වචන සැලකුවේ සංවේගයෙනි. එහෙයින් ඈ දූවගේ කෝපය සංසිඳවන අටියෙන් මෙසේ කීවා ය.

"කත්තිරිනා දන්නවාදැයි මට හරියට කියන්න බැහැ. මම කැමැති නම් උඹත් කැමතියි කත්තිරිනාට කියා තියෙන්නේ පියල්. ඒක කිව් හන්දා ලියුම්වල වගත් කියන්න ඇතැයි මම අනුමාන කරා. කොහොම උණත් දැන් පියල්ට බණින්න යන්න එපා. ඒ මිනිහා තරහ උණොත් නැති පදෑ හදා රටේ පතළ කරාවි."

නන්දාගේ කෝපය අඩු වී ය.

"මම හිතන්නේ නැහැ අම්මා ලියුම්වල වගක් එයා කත්තිරිනාට කියන්න ඇත කියා. එයාගෙන් අහන හැටි මම දන්නවා. එයාගෙන් ලියුම් තුනක් ලැබුණා; ඒ ලියුම් දැන් මම පුළුස්සාදමනවා."

නන්දා කළුවර කැටයමින් අලංකාර වුණු බුරුත අල්මාරිය ඇර එහි මැද තට්ටුවෙහි එක් මුල්ලකට අත යවා එහි වූ රෙදි අත පත ගෑවා ය. අල්මාරිය ඇරිය විගස නිකුත් වුණු සුවඳින් කාමරය සුවඳ වී ය. ඒ සුවඳ නිකුත් වූයේ පියල්, තම ආදර හසුන් ලියනු පිණිස ගත් සුවඳ කවන ලද පතකින් නොවේ. සුවඳ කැවුණු පත් ආදර හසුන් ගෙනයාමට උචිත දූතයන් ලෙස සිතන අවස්ථාව තෙක් ගැමි තරුණයෝ තවම දූෂණය නොවූහ. අල්මාරිය තුළින්

Scanned by CamScanner

නිකුත් වූයේ සැවැන්න මුල්වල සුවඳ ය. ගැමියන් සැවැන්න මුල් අල්මාරිය තුළ දමන්නේ රෙදි-පිළි සුවඳ කරණ පිණිස ම නොව පරෙස්සම් කරනු ද පිණිස ය.

නන්ද අල්මාරිය තුළින් ගත් ලියුම් පත් තුනක්, මව ද බලා සිටිය දී පිළිස්සුවා ය.

මේ වර සිංහල අවුරුද්ද ගෙවී දෙසතියකින් පමණ පාසැල්වල පාස්කු නිවාඩුව කෙළවර වන බැවින් තිස්ස ගාල්ලේ පාසැලට යා යුතු දවස් ද ළඟා වෙයි. පාසැල පටන් ගැනීමට දෙදවසකට කලින් තිස්ස ගාල්ලේ බෝඩිමට යැවීමට මාතර හාමිනේ වැයම් කළා ය. එහෙත් ගමෙහි කොලුවන් සමඟ කෙළි-සෙල්ලමින් කාලය ගත කරන තිස්ස පාසැල පටන්ගන්නා දවසට පෙර දින මිස ඊට කලින් බෝඩිමට නොයන බව කී ය.

තිස්ස පාසැල් නිවාඩුව හෝ මසකට වරක් සතියේ නිවාඩු දෙදවස හෝ සඳහා ගමට පැමිණි හැම විටම ආපසු බෝඩිමට ගියේ කැමැත්තෙන් නොවේ. කෙළි-සෙල්ලම ද ගෙදර ද අමතක කොට උගැන්ම සඳහා බෝඩිමට ආපසු යෑම ඔහු සැලැකුවේ තමා ලබන දඬුවමක් ලෙසිනි. ගාල්ලේ බෝඩිමක නැවතී ඉංගිරිසි උගැන්මට පටන් ගෙන තුන් අවුරුද්දක් පමණ ගත වූ නමුදු තිස්සට බෝඩිමේ වාසය ප්‍රිය නොවී ය. පාසැලෙහි නොව, පාසැල අසල ගෙදරක වූ ඒ බෝඩිම වූ කලී කච්චේරියේ ලියන්නකුගේ නිවෙස ය. ලියන්නා ද ඔහුගේ බිරිඳ ද ඔවුන්ගේ තරුණ දුව ද මෙහෙකාරයෙක් ද මෙහෙකාරියක් ද එහි වෙසෙති. ගෙහිමියා තමා හොඳින් දන්නා හඳුනන කයිසාරුවත්තේ මුහන්දිරම්ගේ පුතා ද තමා ගේ දුර නෑයකුගේ පුතකු ද එහි නවත්වා ගැනීමට කැමැති වූයේ, ඔවුන්ගෙන් වැඩි මුදලක් ලැබුණු නිසා නොව තමාගේ මිතුරකුට හා නෑයකුට ද කරන උදව්වක් වශයෙනි. පාසැල් බෝඩිමෙහි නවත් වනු ලබන ළමයකු උදෙසා වැඩි මුදලක් ගෙවිය යුතු ය. ඒ මුදලෙන් තුනෙන් දෙකකි ඉහත කියන ලද නිවසෙහි නවාතැන් ගත් ළමයින් දෙදෙනාගෙන් අය කරන ලද්දේ.

බෝඩිමේ ජීවිතය තිස්සට ප්‍රිය නොවූ නමුත් පාසැල් ජීවිතය අප්‍රිය නොවී ය. පාසැල පටන්ගැනීමට පැ බාගයකට පමණ කලින් ගොස් තමාගේ වියෙහි වූ අනික් ළමයින් සමඟ කෙළි-සෙල්ලම් කිරීම නිසාය ඔහුට පාසැල් ජීවිතය අප්‍රිය නොවූයේ. පාසැලෙහි උගැන්ම අවසාන කළ පසු ද පැ බාගයක් පමණ කෙළි-සෙල්ලම් නොකොට තිස්ස ආ පසු බෝඩිමට නොයයි. නිවාඩුවට ගමට පැමිණි විට, මවගේත් සහෝදරියන්ගේත් ආදර සැලකිලි ද ගමේ ළමයින් හා කරන කෙළිය ද නිසා තමාට ප්‍රිය වුණු පාසැල් ජීවිතයත් තිස්සට එපා වෙයි. ඔහු ආපසු බෝඩිමට යැවීම දුෂ්කර වනුයේ මේ හෙයිනි.

Scanned by CamScanner

තිස්ස ඉරිදා රෑ නින්දට ගියේ සඳුදා උදය වරුවේ මහ වැස්සක් වැස්සොත් මැනවයි සිතමිනි. මහ වැස්සක් වැස්සොත් ඔහුට එදින ද ගෙදර නැවතිය හැකි බැවිනි. සඳුදා උදයෙන් ම අවදි වුණු තිස්ස හිස උස්සා බලා යළිත් නින්දට වැයම් කරනු පිණිස දෙඇස තද කරගත්තේ ය. ඔහු එසේ කෙළේ අහස වැස්සක් නැඟීමට තතනන බව හැඟුණු හෙයිනි.

''තිස්ස නැගිටපන්, අද නෙව බෝඩිමට යන දවස''යි කියමින් අනුලා තම මලුගේ ඇඟට අත ගසා සෙලෙවුවා ය. තිස්ස දෙනෙත් වඩාත් තද කරගත්තේ ය.

''හොරා! විගහට නැඟිටපන්''යි කියමින් යළිත් ඈ තිස්ස අවදි කළා ය.

''වහිද්දි යන්නේ කොහොම ද?''

''යන්නම් පොද වැස්සක්; ඒක තිළනට යන්න ඇහැකි. අන්න උඹට ඉස්ටේසමට යන්න අම්මා අස්ව කරත්තෙ බඳින්න කිව්වා''යි කියමින් අනුලා තිස්ස කෙළින් කොට අනතුරුව උස්සා දෙපය බිම ගැස්සෙවුවා ය. තිස්ස තම සහෝදරියට සිතින් බණිමින් ගොස් අඟුරු විකා දත් මැද, මුහුණ සෝදගත්තේ ය.

තිස්ස දුම්රිය පළට ඇර-ලනු පිණිස ඔහුගේ මව ද අශ්ව රථයෙන් ගියා ය. ඈ සමඟ තිස්සගේ ඥාති සහෝදරයා වන සෝමදස ද ගියේ ය. ඔහු ගියේ, තිස්ස දුම්රියෙහි නංවා මාතර හාමිනේ තනියම අශ්ව රථයෙන් ආ පසු ගමන් කිරීම නොමනා බැවිනි. ගමෙහි කුල ගෙයක මැද විය ඉක්මවූ ගෘහිණියක වුව ද එකල ගෙයින් පිටව මයිල කාලක් පවා දුර ගියේ ගැහැනියක හෝ ළමයකු හෝ වැඩකාරයකු හෝ ඇතිව ය.

තිස්ස දුම්රිය පළට ගෙන ගිය අශ්ව රථය මුහන්දිරම් ඉඳහිට ගමනක් යනු පිණිස භාවිත කරන්නකි. ඔහු මීට පෙර ඒ රථයෙන් නිතර ගමන්-බිමන් ගිය නමුත් දැන්නම් යන්නේ කලාතුරකිනි. රථය කබල් වීමත්, අශ්වයා අකාලයේ මහලු වීමත් නිසා, මුහන්දිරම් ඒ අශ්ව රථය නිතර භාවිත නොකෙළේ ය. තුනටියේ ඇට මතු වුණු ඒ අශ්වයා විකිණිය හැක්කකු නොවූයෙන් ඌට කෑම සැපයීමත් අස්ගොව්වාට වැටුප් ගෙවීමත් නිෂ්ඵල වියදම් වී ය.

බෝඹු ලී දෙක මුලින් නැඟුණු අයුතක ගිඳගත්තකු විසින් එළවනු ලබන ඒ කරත්ත ගැමියන් හැඳින්වූයේ 'ඩික්කි කරත්තය' යන නමිනි. රිය පදවන්නාගේ ආසනය ප්‍රකට වූයේ 'ඩික්කිය' යන නමිනි. රථයෙහි වූ ආසන දෙක මැදින් නැඟුණු යකඩ කූරු දෙකක ස්වි කරන ලද, මිට නැති හබලක් වැනි, ලෑලි පටියක් වෙයි. රථයෙහි නැඟුණු තිදෙනා, ඉටි රෙදි කඩින් වසන ලද මේ ලෑලි

පටියට පිටු දී දෙපැත්තට මුහුණ ලා වාඩි ගත්හ. තිස්සත් මවත් වාඩිගත්තේ ඉස්සරහ පැත්තේ අසුනෙහි ය.

පරණ යකඩ ගොඩක් ගල් ගොඩක් උඩින් ඇදෙන විට නඟන හඬ වැනි හඬක් නඟමින් කරත්තය මහපාරෙහි ගමන්ගත්තේ ය.

යකඩ පට්ටම සහිත රෝද හතර කැරකුණේ 'කර කර' යන හඬ නඟමිනි. ලණු කෑලිවලින් පුරුද්දන ලද හම් පටි සෑදලය අශ්වයාගේ කොන්ද උඩ තරයේ නොපිහිටයි. කැඩුණු හම් පටි සහිත කොල්ලරයේ මුදුන් කොන් දෙක එක් කොට බඳින ලද්දේ කොහු ලණු හතර පටකිනි. ලණු කෑලිවලින් පුරුද්දන ලද මේ ඇඳුම් හැඳ ගත් අශ්වයා මයිල තුන හතරක් වුව ද ගමන් කොට ගෙදරට පැමිණෙන්නේ තුවාල කිහිපයක් ඇතිව ය. ඒ තුවාල සුව වන තෙක් අශ්වයා යළිත් රියෙහි බඳිනු නොලැබේ. දෑවැන්ත අශ්වයෙක් වුව ද පරණ යකඩ ගොඩක් වැනි මේ රිය හමසක් ඇද්දෙත් වෑරෙයි. අශ්වයා ලවා මේ යකඩ ගොඩ ඇද්දීම උගට කරන හිංසාවක් ය යන හැඟීම කරුණාවෙන් පිරුණු හද ඇති මාතර හාමිනේ තුළ පවා පහළ නොවී ය.

ගමේ කොලුවන් හා කළ කෙළි-සෙල්ලම් සිහි කරමින් රියෙහි වාඩි වී උන් තිස්සට මහ පාර දෙපැත්තෙහි වූ පොල් ගස් ද පළින් පළ පිහිටි ගෙවල් ද සහිත බිම්-තීරු කැරකෙමින් තමා පසු කොට යන්නාක් සේ පෙනිණි. තමා ද අනිත් කොලුවන් ද පන්දු ගසන පිටිය දෙස තිස්ස දෙතුන් වරක් බැලීය. කෙළියට තවම කොලු-වන් රැස් නොවූයෙන් එය පාළු පිටියකි. පිටිසර නිපදවන අල බතල, පල-වැල යන ආදී ද්‍රව්‍ය පළින් පළ තබාගෙන විකුණන ගැමි ගැහැනුන්ගෙන් ද ගැමියන්ගෙන් ද දරුවන්ගෙන් ද හවස් වරුවේ පිරෙන කටුකුරුන්දේ කඩ පළත්, ඔහු දුන් පසු කළ පිටිය මෙන්ම පාළු වූවකි. හවස් වරුවේ නම් ඇවිදින හිස් ගොඩක් නිසා අතුරු සිදුරු නැති වන ඒ කඩ පළින් නික්මෙන්නේ බඩු මිල කියන, හෙට්ටු කරන, කතාබහ කරන, ගෑනුන් හා පිරිමින් ද නඟන හඬයි. එහෙත් දුම්රිය පළ බලා යන තිස්සට මේ වේලාවේ ඇසෙන්නේ, පෙර දින මාලුකාරයන් විසින් කපා ඉවත දමන ලද මාලු වරල් හා කන්තොලු ද ගිලීමට පොරකන කපුටුවන්ගේ කොර-සැඩි නාදය ය.

කඩපළ පසු කොට මදක් දුර යත්ම, ඉදිරියෙහි ගමන් කළ ගොන් කරත්තයකට ඉස්සර කරනු පිණිස රිය කරුවා කසයෙන් දෙවරක් අශ්වයාට තැළී ය. වේදනාවෙන් මිරිකුණු අශ්වයා යකඩ ගොඩක් වැනි කරත්තය කන් හිරි වටවන හඬින් හඬවමින් ඇදගෙන වේගයෙන් දුවන්නට වි ය.

''ඔය සතාට ගහන්න එපා'' යි මාතර හාමිනේ රියදුරාට කීවා ය. ''රේල්ලට තව හුඟක් වේලා ඇති. අර ගොන් කරත්තෙන් එන සෙදියස් මුදලාලි යන්නේත් සිංහලේ යන පිඟිස රේල්ලට, හිමින් දක්කාපන්''

දුම්රිය පළට ළඟා වූ වහාම තිස්ස, මව බසින්ට පෙර බිමට පැන්නේ ය. ඔවුන් දුම්රිය පළට ඇතුළු වූ විගස එහි මිදුලේ ඇත කෙළවරෙහි සිට දිව ආ කරෝලිස්, මාතර හාමිනේට ළං වූ වහාම කඳුළු උතුරුවමින් හඬන්ට වී ය.

''ඇයි කරෝලිස් අඬන්නේ?''යි මාතර හාමිනේ විචාළා ය.

''මම සිංහලේ යනවා; හාමිනේට කියන්න එන්න බැරි උණා''යි පිළිතුරු දුන් කරෝලිස් හැඬීම නොනැවත් වූයේ ය.

''සිංහලේ යන්න!''යි මාතර හාමිනේ විස්මයෙන් ඇසුවා ය.

''ඔව්——මහත්තයා යන්න කිව්වා; ගමේ හිටියොත් මට වගා වක් වෙන්නේ නැත කියා''

''මුහන්දිරම් මහත්තයා කිව්වා?''

''ඔව්; මට සමාවන්න''යි කියමින් කරෝලිස් කඳුළු සලන්ට වී ය.

කුඩා කල පටන් තමාගේ ගෙදර ආශ්‍රය කරමින් හැදුණු කරෝලිස් හිටි හැටියේ වෙන්ව යන බව ඇසූ මාතර හාමිනේගේ දෙනෙතට ද කඳුළු ඉනිණි.

''ඇයි කරෝලිස් හිටි හැටියේ යන්න හිතුවේ?''

''මහත්තයා හිටි හැටියේ ම මට යන්න කිව්වා. මට සමා වෙන්න; මගෙන් වරදක් උණා නම් සමා වෙන්න.''

කරෝලිස් තමාගෙන් සමාව ඉල්ලන්නේ කුමක් නිසාදැයි මාතර හාමිනේට නොවැටහෙයි. වෙන්ව යන නිසාම ඔහු එසේ කියන ලදැයි මාතර හාමිනේ නොසිතූ බැවිනි.

''උඹෙන් වරදක් උණේ නැහැ කරෝලිස්.''

''හාමිනේ දන්නේ නැහැ—එහෙනම්; මහත්තයා කියලා නැහැ. මම ගිහිල්ලා ලියා එවන්නම් ——ඔන්න කෝච්චිය එනවා''යි කියමින් කරෝලිස් දුම්රියට නැඟීමට සූදනම් වී ය.

ගාල්ලට දිවෙන දුම්රිය ළඟා වූයෙන් තිස්ස, කරෝලිස් නැඟුණු රිය මැදිරියට මඳක් ඈතින් වූ රිය මැදිරියකට නැංගේ ය; මව තිස්සගේ හිස අල්ලා ළං කරගෙන දෙවරක් දෙකම්මුල් සිම්බා ය.

''පුතා බලාගෙනයි; රේල්ල පිටත් උණාම දොරට හාංසි වෙන්න එපා''යි කියමින් මාතර හාමිනේ තම පුතාට සත පනහේ කාසියක් දුන්නා ය. ගාඩ් නළාව පිම්බෙන් දුම්රිය ඇන්ජිමට ද සැර නැංගේ ය.

"තිස්ස ආයිත් ගමට එන්නේ කවද ද?"යි සෝමදස ඇසුවේ ශොකාකූල ස්වරයෙනි.

"ලබන සෙනසුරාද එන්නයි හිතාගෙන උන්නේ; අම්මා කියනවා හතරවන සුමානේ සෙනසුරාදට ඉස්සෙල්ලා එන්න එපයි කියා."

"ඔව් — ඔව් — එදට ආවාම ඇති"යි සෝමදස කීවේ මාතර හාමිනේ දුම්රිය පිටත්වන තෙක් එහිම සිටි බැවිනි.

දුම්රිය පිටත් වූයෙන් තිස්ස කවුළුවෙන් හිස එළියට දමා මවට ද සෝමදසට ද අත වැනී ය. සෝමදස ද අත වැනීමෙන් පිළිතුරු දුන්නේ ය. මාතර හාමිනේ තම සුරතල් දරුවාගෙන් වෙන් වන ශෝකයෙන් නෙත් වුණු දෙනෙත් ඇතිව, ඔහුගේ මුහුණ නොපෙනෙන මානය තෙක් දුම්රිය ගමන්කරනු බලා සිටි බැවින්, අනික් රිය මැදිරියකින් එබිගෙන සිටි කරෝලිස්ගේ ශෝකාතුර මුහුණ නුදුටුවා ය.

මව ද සෝමදස ද නොපෙනෙන මානය තෙක් දුම්රිය ගමන් කළ පසු තම අසුනෙහි වාඩි වුණු තිස්සට, පොල්ගස් අතරින් පෙනුණේ නිසංසල මහ මුහුද ය. වට රවුමක කැරකෙන ගල් කනු රාශියක් සේ කැරකෙමින් පසු වන පොල් ගස්වල කඳන් නිසා වෙහෙසුණු ඇසත් හිසත් ඇති තිස්ස, අනික් පැත්ත බැලීය. ඔහුගේ රිය මැදිරියේ අනිත් කෙළවර අසුනෙහි, සිංහලේ යන ගැමියෙක් ද නඩුවක් උදෙසා ගාල්ලට යන ගමේ ගොඩ පෙරකදෝරුවෙක් ද ඔහුට හසු වුණු ගැමි ගැහැනියක් ද වූහ. තමා ගමදී දක පුරුදු ගැමි ගැහැනියත් ගොඩ පෙරකදෝරුවාත් දුටු තිස්සට යළිත් මතක් වූයේ තමාගේ ගෙදර ය.

අවුරුදු කිහිපයක සිට ගාල්ලේ බෝඩිමෙහි නැවති උගන්නා තිස්සට තමාගේ ගමත් ගෙදරත් තවම සිතින් ඉවත් කළ හැකි නොවී ය. මවගේ තන පුඩුව බදගන්නා බිළිඳකු මෙන් තිස්ස තම ගමටත් ගෙදරටත් තවම ඇලුම් කරයි. ගමටත් ගෙදරටත් ඔහු තුළ වූ ඇල්ම තුනී නො වූයේ හිතවත් මිතුරන් බෝඩිමේ හෝ පාසැලේ හෝ ඔහුට නොවූ බැවිනි. ගාල්ලේ පාසැලට ඇතුළුවී ඉගෙනීමට පටන්ගෙන අවුරුදු හතරක් පමණ ගත වුණු නමුදු තිස්ස තවම හිත මිතුරන්ගේ ආශ්‍රයෙන් තොර වූවෙකි.

පාසැලෙහි කවුරුත් තිස්සට කැමැත්තෝ ය; පන්තියේ ළමයින් ගෙන් එකකු හැර අනික් කවුරුත් තිස්සට කැමැත්තෝ ය. එහෙත් තිස්ස තම මිතුරකු ලෙස සැලකුවෙක් ඔවුන් අතර නොවී ය. තිස්ස හිත මිතුරකු ලෙස සැලකීමට ආශා ඇති ළමයි කිහිප දෙනෙක් ඔහුගේ පන්තියෙහිම වෙති. වැඩි ලජ්ජාවකිනුත් බයකිනුත් පෙළෙන තිස්සගෙන් අනුබලයක් නොලත් නියා ඔවුහු ඒ ආශාව මැඩගනිති. තම පන්තියේ ළමයින්ගෙන් එකකුට තිස්සගේ

Scanned by CamScanner

සිතෙහි දැඩි විශේෂ ඇල්මක් හටගත් නමුත් ඔහු කිසිවිටක ඒ වග අනිකකුට තබා තමාගේ සිත ගත් ඒ ළමයාට පවා දැන ගැනීමට හැකි වන කිසිවක් නොකී ය; නොකෙළේ ය. තිස්ස එසේ ක්‍රියා කෙළේ ඒ ළමයා. තමා හිත මිතුරකු ලෙස සැලකීමට අකමැති වෙතියි යන හැඟීමෙනි. ඒ හැඟීමට හේතුව තිස්සගේ වැඩි ලජ්ජාවයි; ඒ ලජ්ජාව නිසා හටගන්නා හැඟීමයි.

තිස්ස, ඔහුගේ මව මෙන්, හදවත තුළට හැරුණු මනැස ඇත්තෙකි. කවර කාරියක වුවද ශූරයා, හැම විට තිස්සගේ සිත්ගත්තේ ය. තිස්ස ඉගෙනීමෙහි මෙන් සෙල්ලමෙහිද ශූරයෙකි. තමාමෙන් ඉගෙනීමෙහි හා සෙල්ලමෙහි ද ශූරයන් වන තම පන්තියේ අනික් ළමයි දෙතුන් දෙනා ද තිස්සගේ සිත් ගත්තෝ ය. එහෙත් තිස්ස තම හිත මිතුරකු ලෙස සලකා ළං ව ඔවුන්ගෙන් එකකුදු ආශ්‍රය නොකෙළේ ය. ඔහු පාසැලෙහි දී ඔවුන් මිතුරන් ලෙස සැළකුවේ ය; ගෙදර ගිය පසු අමතක කෙළේ ය. ළංව ඇසුරු කරන හිත මිතුරකු නැති තිස්ස සතියේ නිවාඩු දෙදවස ළං වන විට මතක් කරන්නේ ගම ය; ගෙදර ය; ගැමි දරුවන් ය. තිස්ස තුළ ගමට ද ගෙදරට ද මවට ද සහෝදරියන්ට ද හටගත් ඇල්ම ක්‍රමයෙන් දැඩි වූයේ යට කියන ලද කරුණු නිසා ය.

ගාල්ලේ දුම්රිය පළ ළඟා වන තෙක් ම තිස්ස සිතුවේ ගම ගැන ය; ගෙදර ගැන ය; මව හා සහෝදරියන් ද ගැන ය; යළිත් ගමට යන දවස ගැන ය.

සිංහල අවුරුදු කාලය ළං වන විට සතියකට වරක් බැගින් ගමට යාමට තිස්ස කැමැති ය. පිට පිට දෙසතියක් ගමට පැමිණි නිසා ඊ ළඟ සතියේ සෙනසුරාද ගමට එන්ට එපායයි අනුලා වරක් තිස්සට ලිවා ය. එහෙයින් ගමට යෑමට දුම්රිය ගාස්තු ද ඔහුට නොලැබිණ. තිස්ස ඒ සතියේ සෙනසුරාද උදයේ පිටත්ව පයින්ම ගමට ගියේ ය. මයිල දහයක් පයින් ගමන් කොට වෙහෙසීමෙන් විඩාවට පත් වූණු තිස්ස දුටු මවගේ දෙඇසට කඳුළු නැංගේ ය. මුදල් නොයැවීම ගැන ඈ අනුලාට තරවටු කළා ය.

තිස්ස උදය වරුවේ ඇදෙහි ගුළිවී උන්නේ 'දෙයියනෝ වැහැපන්' යි සිතින් කියමිනි. එහෙත් ගාල්ලේ දුම්රිය පළට දුම්රිය ළඟා වත් ම වැහි වලාවෙන් තොර වූ හිරු රැසින් බැබළෙන අහස දෙස බැලූ තිස්ස සන්තෝෂ වී ය. පාසැලේ යහළුවන් සමඟ සෙල්ලම් කිරීමට ආශා කළ තිස්ස, ගමත් ගෙදරත් මතක් වීමෙන් හටගත් ශෝකාකුල සිතිවිලි සිතින් ඉවත් කොට දමා දුම්රියෙන් බැස්සේ ය.

Scanned by CamScanner

# 4 වන පරිච්ඡේදය

මාතර හාමිනේ දුම්රිය පළෙන් පිටත්ව, පෙරළා ගෙදර පැමිණෙන විට මුහන්දිරම්, ලියන මේසය ළඟ පුටුවෙහි වාඩිගෙන නැහැය උඩ රැඳුණු කන්නාඩිය ඇතිව ගණන් පොතක් බලමින් උන්නේ ය.

"තිස්ස මේ පාර බෝඩිමට යන්න හුඟක් කම්මැලි කරා නෙවද?" යි කයිසාරුවත්තේ, සාලයට ඇතුළු වුණු තම බිරිඳගෙන් අසමින් කන්නාඩිය ඉවතට ගෙන මේසය උඩ තැබී ය.

"ඔව් ටිකක් කම්මැලි කරා"

"මිනිහට වැඩිපුර ගමට එන්න ඉඩ දෙන්න එපයි කියා මම ලියන මහත්තයාට ලියා අරිනවා"

"එහෙම ලියන්න එපා. තිස්ස ගමට එන්න ආසයි. සෙල්ලමටත් වැඩිය උඹ ආසා ගෙදරටයි."

"හාමිනේත් අක්කලාත් සුරතල් කරන නිසා."

"මේ පාර මාසයක් ගෙවෙන්න ඉස්සර ගමට එන්න එපයි මම තිස්සට කිව්වා. ඉරිදා සෙනසුරාදා දවස්වල ගමට එන එක, එක පාරටම නවත්වන්න හොඳ නෑ."

"මම කිව්වේ සම්පූර්ණයෙන් නවත්වන්න නෙවි. මාසෙකින් දෙකකින් සැරයක් ඉරිදා සෙනසුරාදා දවස්වලත් ඉස්කෝලේ වහන කාලෙත් ගමට ආවාම ඇත කියා."

"කරෝලිසුත් සිංහලේ යන්නය කියා තිස්ස ගිය කෝච්චියෙන්ම ගියා" යි මාතර හාමිනේ කීයේ විස්මය නඟාගත් දෙනෙත ඇතිව ය. එහෙත් එම පුවත ඇසූ මුහන්දිරම් පුදුම නොවී ය. කරෝලිස් පිළිබඳ පුවත ඇසූ විගස මුහන්දිරම් යළිත් ගණන් පොත අතට ගත්තේ ය; අතට ගෙන පෙරළා බැලී ය.

"කරෝලිස් ගියේ බොහොම කණගාටුවෙන්; මම දැක්ක හැටියේ මිනිහට ඇඬුණා".

බිරිඳගේ මේ වචන ඇසූ පසු ද මුහන්දිරම්, තම ගොළුවත නොහැරියේ ය. එහෙයින් බිරිඳ මෙසේ විචාලේ ඔහු දෙඩවනු රිසියෙනි.

"කරෝලිස්ට ගිවිහැටියේ සිංහලේ යන්න කිව්වාද?"

"ඔව්"යි පිළිතුරු දුන් මුහන්දිරම් පුටුවක් පෙන්නුවේ ය.

"හාමිනේ වාඩි වෙන්න."

මුහන්දිරම් මෙසේ කියන්නේ වැදගත් කරුණක් ගැන කතා බහ කරනු රිසි වූ විටයයි දන්නා මාතර හාමිනේ පාත් පුටුවක් ගෙනැ-



Scanned by CamScanner

විත් තබා එහි හිඳගත්තා ය. පිටත දී මිස ගෙදරදී තම සැමියා හා සම අසුනක හිඳ නොගැනීම ඇගේ සිරිත ය.

"කරෝලිස් රුපියල් හාරපන්සීයකට වැඩේ කරලා තියෙනවා"යි මුහන්දිරම් කී ය.

"කඩෙන් හොරකම් කරලා ද?"යි මාතර හාමිනේ ඇසුවේ බලවත් විස්මයකිනි. අවුරුදු දවසේ කත්තිරිනා කී බස් ඇගේ සිතට සැණකින් නැංගේ ය.

"ඌ හොරකම් කරගත්තායයි මම කියන්නේ නැහැ. ණය දුන්නායයි ලියාපු ගණන් හුඟක් බොරු."

"ඇත්තද? මම කවදවත් කරෝලිස් සැක කෙරේ නැහැ. අවුරුද්ද දවසේ කත්තිරිනාගෙන් ඇහුවාම රුපියල් දෙසීයක ණය ගත්තේ මොකටද කියා ඒ ගැනි පුදුම උණා! ඒ ගැනි දිවුරුවා රුපියල් පනහකට හැටකට වැඩිය ණය ගත්තේ නැත කියා. ඒත් මම කරෝලිස් ගැන සැක කෙරේ නැහැ."

කරෝලිස් ගැන සැක උපදන තොරතුරු දැනගෙනත් ඔහුගේ සොරකම ගැන කුකුසකුදු ඉපිදවිය නොහැකි වූ මාතර හාමිනේ, තම සැමියාගේ බුද්ධිය විස්මයෙන් සැලකුවා ය.

"අවුරුද්ද ලබන්ට දෙතුන් දවසකට ඉස්සර මම කරෝලිස්ගේ පොත් බලා හාමිනේගෙන් ඇහුවාම කිව්වා නෙවද කවදවත් කත්තිරිනාට සැරේකට රුපියල් දෙක තුනකට වඩා ණය දෙන්න යයි තුංඩු නුදුන් බව."

"ඔව්"

"මට සැක උපන්නේ ඊට පස්සේ, සැරේකට රුපියල් හතර පහෙත් දෙතුන් වරක් රුපියල් දෙළහේ පහළොවේත් කත්තිරිනාට ණය දුන්නායයි කරෝලිස් පොතේ ලියා තිව්වා. මේ සැකය නිසා මට කරෝලිස් ගැන සොයන්න හිතුණා. සොයන කොට මට දැනගන්න ලැබුණා කත්තිරිනාගේ මිනිහා, පුංචි අප්පු, රෑට කවුරුවත් නොයන වෙලාවල් බලාගෙන කඩේට යන එනබව. තවත් සොයන කොට දැනගන්න ලැබුණා කරෝලිස් කත්තිරිනාලාගේ ගෙදරට අවේලාවේ යන එන බවත්, ලැයිසා එක්ක ටිකක් යාළු බවත්."

"ලැයිසා එක්ක!"

"ඔව්, ඈ නරක ගෑනියෙක් ද?"

"ලැයිසා හොඳ එකියෙක් නෙවි. ඇගේ අම්මා වගේ නෙවි; හිනාවෙලා ඇහැ කරකවා බලා මිනිසුන් රවටා ගන්න ඈ දන්නවා."

"මම උපායක් සිතාගෙන දවසක් පුංචි අප්පු මගදී හම්බඋණාම ඇහුවා——'ඒ බාන් පුංචි අප්පු උඹට රුපියල් විසිපහක බඩු

දුන්නායයි කරෝලිස් පොතේ ලියා තිඋණා—ඒක නොගෙව්වේ ඇයි?' කියා. 'අනේ රාළහාමි බැරිකම නිසා ඒක ගෙවන්න බැරි උණා; මම ඒක ගෙවා දුන්නම්'යි ඒ මිනිහා උත්තර දුන්නා! මගේ සැකය හරි බව මම දැන ගත්තා. මම නන්දියස් ඔපිසරට පණිවිඩයක් යවා ගෙන්වා තොරතුරු දන්වා කරෝලිස් අල්ලාගෙන ගොහින් බය කරලා ඇත්ත දැනගන්නයි කිව්වා. ඔපිසර කරෝලිස් අල්ලාගෙන ගොහින් ඇහුවාම නැහැයි ඌ කියා තියෙනවා. ඔපිසර කරෝලිස් පොලීසියට ගෙනියන්න සූදානම් කරලා හොඳටම බය කරාම ඇත්ත ටිකක් එළි කරලා තියෙනවා. ඊට පස්සේ ඔපිසර මට පණිවිඩයක් එව්වා. මම ගොහින් හිරගෙයි දනවා යයි බය කරාම ඌ ඔක්කොම කිව්වා. ලැයිසාට හිත ගිහිල්ලා ඌ ඔක්කොම කරලා තියෙන්නේ; පුංචි අප්පු කරෝලිස් රවටාගෙන බොන්න සල්ලිත් ඉල්ලා ගෙන තියෙනවා.''

''කත්තිරිනාත් එහෙනම් මහ අමාරුකාර ගැනියෙක්, මගෙනුත් උපකාර අරගෙන දූ පෙන්නලා කරෝලිස් රවටා කඩේ හිස් කරලා තියෙනවා.''

''ඒකට කත්තිරිනා සම්බන්ධ උණායයි මම හිතන්නේ නැහැ''යි කයිසාරුවත්තේ කී ය.

''කරෝලිස් පළමුව කත්තිරිනාලාගේ ගෙදරට ගොහින් ලැයිසා එක්ක කතාවට වැටිලා තියෙනවා. කත්තිරිනා ඒකට කැමැති වෙලා නැතිව කරෝලිස්ට බැණලා තියෙනවා. ඊට පස්සේ කරෝලිස් පුංචි අප්පු යාළු කරගෙන ලැයිසා බලන්න යන්න උණා. පුංචි අප්පු කරෝලිස්ගෙන් සල්ලිත් බඩුත් ගන්න උණා. කරෝලිස් පුංචි අප්පුට සල්ලි සහ බඩු දීලා සමහර විට ලියන්නේ නැහැ. සමහර විට කත්තිරිනාගේ ගණනට ලියනවා. කත්තිරිනා මුලදී විරුද්ධ වෙලා පුංචි අප්පු එක්කත් සංඩු වෙලා තියෙනවා. මිනිහා ගහන්න බණින්න උණාම ඒ ගැනිත් කර බාගෙන නිකම් හිටියා. දූ ලෙඩ උණාට පස්සේ ඒ ගැනි කතාවක් බහක් නැතිව හිටියා. දූගේ ලෙඩේ හොඳ කරන්න පුළුවන් උණෙත් කරෝලිස් ගෙන් ලැබුණු උපකාර නිසා.''

''ඒ උණත් ඒ ගැනි මට යන්තමවත් ඇගෙව්වේ නැහැ නෙව ඔය වගක්''යි මාතර හාමිනේ කත්තිරිනාට දොස් නැඟුවා ය.

''එහෙම තමයි—කොපමණ හොඳ ගැනියෙක් උණත් බලන්නේ තමන්ගේ ලාබය. කරෝලිස් ගැනුන්ට රැවටෙන මිනිහා. මේ ගමේ හිටියොත් ඌට වගාවක් වෙන්නේ නැති නිසා මම මිනිහා-ගෙන් ඇහුවා. 'නඩු දමා සිරගෙට යනවාට කැමති ද නැති නම් ගමින් පිටවෙලා සිංහලේ ගොස් වෙළඳාම ඉගෙනගන්න කැමතිද?' කියා. කරෝලිස් සිංහලේ යන්න කැමති උණා. මම තේදියස් මුදලාලි එක්ක කතා කරලා කරෝලිස් ඒ මිනිහාගේ කඩේට යවන්න

Scanned by CamScanner

සැලැස්සුවා. කරෝලිස් හොරෙක් නොවන බවත් අපට කර අලා-බය ගැනුන්ට රවටී කරපු එකක් මිස උගේ ප්‍රයෝජනයට කර හොරකමක් නොවන බවත් මම තේදියස් මුදලාලිට විස්තර කරාම ඒ මිනිහා කැමැති උණා. කරෝලිස් අවුරුදු හත අටක් සිංහලේ හිටියාම හරි යාවි.''

''කරෝලිස් ගැන මේ මොකුත් මට නොකිව්වේ මන්ද?''යි මාතර හාමිනේ ඇසුවේ මඳ අසන්තෝෂයකිනි.

''හාමිනේට කිව්ව නම් හොරකම අල්ලාගන්න බැරිවෙනවා. කරෝලිස් සිංහලේ පිටත් කරන්න ලැබෙන්නේත් නැහැ. ඒක නිසා තමයි මම ඒ ගැන කිසිවක් හාමිනේට කලින් නොකිව්වේ.''

''මටත් කියන්න මතක නැති උණා. රාළහාමිට කාරණයක්; පියල්, කත්තිරිනා අත යෝජනාවක් කරලා එවා තිඋණා.''

''යෝජනාවක්?''

''ඔව්—නන්ද ගැන.''

''නන්ද ගැන පියල් යෝජනාවක් කරලා එවා තිඋණා?''

''ඔව්''

''උන්ට කවුද හිර දෙන්නේ?''

''මමත් එහෙම තමයි කිව්වේ''යි මාතර හාමිනේ කීවේ සන්-තෝෂයෙනි.

මුහන්දිරම් එපමණින් පියල් පිළිබඳ කතාව නැවැත්තුවෙන් මාතර හාමිනේ ද කර බාගත්තා ය.

අවුරුද්ද ගෙවී දෙමසකින් පමණ පියල් ගමින් පිට වී ගියේ ය. ඒ දෙමස තුළ පියල් මහ ගෙදරට ගියේ දෙතුන් වරකි. මුහන්දිරම්-ගේ දූන්ට ඉංගිරිසි ඉගැන්වීම ඉබේම නැවතිණ. මාතර හාමිනේ යෝජනාවට අකැමැති බව කත්තිරිනා පියල්ට කීවේ ඔහුගේ සිත නොරිදෙන පරිදි ය. ඔහුගේ ප්‍රාර්ථනය සම්පූර්ණයෙන් සුන් කරගැනීමට අනුබල නොදෙන අදහස ද ඇති වය, කත්තිරිනා, මාතර හාමිනේ කී කරුණු සකස් කොට පියල්ට කීවේ. ඈ එසේ කීවේ පියල්ගේ සිත නොරිදවීමටත් මාතර හාමිනේ කෙරෙහි පියල් තුළ අමනාපයක් ඇති නොකිරීමටත් සිතාගත් බැවිනි. නන්ද පිළිබඳ පැතුම පියල්ගේ සිතින් ඉවත් නොවී ම, තමාගේ ලාබයට හේතු වෙතියි යන හැඟීම ද කත්තිරිනා ගේ සිතෙහි නොවීයයි කිව හැකි නොවේ.

පියල් හිටි හැටියේ ගමින් පිටව ගියේ කුමක් නිසාදැයි නිසැකව ඔහුගේ මව ද නොදත්තා ය. ඔහු ගෙයින් පිට වූයේ 'කොළඹ ගොහින් එන්න යනවා'යයි කියමිනි. 'රස්සාවක් ලැබුණු බැවින් කොළඹ නවතින්නට සිදු උණා. තුන්හාර මසකින් ගමට ඇවිත්

යන්න එනවා'යි ගමින් පිටව ගොස් දෙසතියකට පසු පියල් තම මවට ලිවේ ය. එහෙයින් මව, තම පුතා කොළඹ රක්ෂාවකට ගියේයයි පියල් ගැන විචාළ කා හටත් පිළිතුරු දුන්නා ය.

පියල් ගමින් පිටව ගොස් දෙසතියකට පසු නන්දට අපූරු ලෙඩක් වැළඳිණ. ඇගේ රෝගය පටන් ගත්තේ බඩ රිදුමකිනි. බඩ රිදුම නැවතුණ පසු ඇගේ කටට සෙම උනන්ට විය. සෙම නැගෙන සමහර විට ඇ හුස්ම ගන්නේ අමාරුවෙනි. සෙම නැගීම අඩු වී ආශ්වාසය හා ප්‍රශ්වාසය ද පහසු වන ඇතැම් විටක ඇ ඇනුම් හරියි.

වෙදකු ලවා ලෙඩාට වෙදකම් කරවන විට යකැදුරකු ලවා යකැදුරුකම් කරවීම ද ගැමියන්ගේ සිරිත ය. ඒ සිරිත් මහ ගෙදරිනුදු කරවන අතර යකැදුරන් ලවා යකැදුරුකම් ද කරවන ලදි.

අසනීප වූ දවසෙහි නන්ද දුටු හැටියේ, එය 'සාංකාවෙන් හැදුණු ලෙඩක්ය'යි කත්තිරිනා සිතුවා ය. දවසක් මාතර හාමිනේ සමඟ කතාබහ කරමින් සිටියදී නොදැනම කත්තිරිනාගේ කටින් ඒ සිතුම පිට වී ය. මාතර හාමිනේ උදහස්ව කත්තිරිනාට තර්ජන කළා ය.

''උඹ තවත් ඔය වල්බූත කතාකරන්න එපා. මම ඉදිරියේ දී කිව්වාට කවුරුවත් එක්ක ඔය උඹේ විලම්බිත අදහස් කියන්න එපා 'ඇහුණ ද කත්තිරිනා? දැනගත්තොත් රාළහාමිට හොඳට ම තරහ යාවි. උඹ ගමෙ ඉන්දන එකක් නැහැ. රාළහාමිගෙ විදිය උඹ දන්නවා නෙව ?''

''අනේ හාමිනේ මම වෙන කවුරුවත් එක්ක ඕක කිව්වෙ නැහැ. හාමිනේ ඉදිරියේදි මට නිකම් කිය උණා. මම තවත් හීනෙන්වත් ඕක ගැන හිතන්නේ නැහැ.''යි කත්තිරිනා පොරොන්දු වූවා ය.

තුන් මසක් පමණ වෙදකම් කරවන ලද නමුත් නන්දගේ රෝගය සම්පූර්ණයෙන් සුව නොවී ය. මාතර හාමිනේගෙන් මග වියදම් ද 'සාස්තර' කාරයාගේ ගාස්තුව ද ඉල්ලා ගත් කත්තිරිනා හීනටිගල ගොස් නන්දගේ රෝගය ගැන 'සාස්තරයක්' ඇසුවා ය. මාතර හාමිනේගෙන් අණ ලත් තවත් ගැහැනියක් අංජනම් එළිකාරයකු සොයා ගියා ය. මහ ගෙදර මිනිසුන් තමන් උදෙසා සාස්තර ඇසීම, අංජනම් එළි බැලීම, යන ආදිය කරවූයේ කත්තිරිනා වැනි කුළුපග ස්ත්‍රීන් ලවා ය.

'නන්දට වැළඳුණේ යක් ලෙඩක් ය' යන මතය ගැමියන් අතර පැතිරෙන්නට වූයේ කත්තිරිනාගේ සාස්තරයෙන් ද අනික් ගැහැනිය බැලූ අංජනමෙන් ද පසු නොවේ. ඒ මතය පැතිරෙන්නට පටන් ගත්තේ නන්ද රෝගාතුර වූ තැන් සිට ය. සාස්තර ඇසීමෙන් හා අංජනම් එළි බැලීමෙන් ද පසු ඒ මතය වඩාත් ගැමියන් අතර පැතිරිණ. ඔවුන්ගෙන් සියේට අනූ දෙනෙකුන් පමණ එය නිසැක-

Scanned by CamScanner

එම යක් ලෙඩක්යයි විනිශ්චය කළහ. රෝගයට හේතුව 'පුංචි නෝනාගේ සිත ගැනීමට ඉස්කෝලේ මහත්තයා අඳුනක් කැවීමය' යන කතාව ගැමි ගැහැනුන් පළමුව කටින් පිට කෙළේ රහසේ ඔවුනොවුන් ටික දෙනකු අතර ය. එහෙත් දැන් නම් ඒ මතය ගමෙහි ප්‍රකට රහසකි. මුලදී ඒ මතය පහළ කළ ගැහැනුන්ට බැණ වැදුණු මාතර හාමිනේ, දැන් ඔවුන් හා තර්කයට නොයයි. එහෙත් ඈ එවැනි කරුණක් අදහන්නේ තම සැමියා ද අදහතොත් පමණි.

කයිසාරුවත්තේ මුහන්දිරම් යන්තර-මන්තර ගුරුකම් ආදිය නොඅදහන්නෙක් නොවී ය. ඒ කිසිවක් අරබයා ඇත්තද නැත්තද? යන ප්‍රශ්නය ඔහු විසින් කිසි කලක නඟන ලදැයි කිව හැකි නොවේ.

ඉතා අඩු කතා ඇත්තකු මෙන් ප්‍රකට ඔහු හඬ නඟා සිනාසෙනු නොදක්නා ලදැයි ගැමියන් කියනු අසන්නට ලැබුණේ කලාතුරකින් නොවේ. හඬ නොනඟතත් ඔහු නඟන සිනාව ඔහුගේ මුහුණෙහි විශේෂ සුන්දර ලකුණක් ලෙස මාතර හාමිනේ පමණක් නොව ගැමියෝ ද සලකති. ඇතැම් විට මුහන්දිරම්ගේ ඒ සිනාව කත්-තිරිනා විසින් පෙර බෙහෙවින් වර්ණනා කරන ලදැයි ඇතැම් ගැමියකු සරදම් ඉඟියකින් සැරසූ ඇසක් නටවමින් කීයේ කුමක් නිසාදැයි කිසිවෙක් නොදනියි.

තම දරුවකු රෝගාතුර වූ විට මුහන්දිරම්, වෙදකු කැඳවන්නේ ඔහු වෙදකම පමණක් අදහන්නකු නිසා නොව, පුරුද්ද නිසා ය. අනායයන් ලෙඩාට යකැදුරුකම් ද කරවිය යුතුයයි යෝජනා කළ විට ඔහු යකැදුරන්ද කැඳවයි. විහාරස්ථානයට ඉතා කලාතුරකින් යන ඔහු ආගමත් වෙදකමත් යකැදුරුකමත් සැලකුවේ උදාසීනත්ව යකිනි; ඒ උදාසීනත්වයට හේතුව ඒ කිසිවක් උදෙසා ඔහු තුළ පහළ වුණු කුකුසක් නම් නොවේ. ඔහු සිතුවේ තම දරුවන් ගැන ය; බිරිඳ ගැන ය, දරුවනට ඉගැන්වීමත්, කන්ට අඳින්ට සපයාදීමත්, ඔවුන්ගේ අනාගතයත් සඳහා ය, ඔහුගේ සිත යොමු වුණේ. එසේ වුව ද ඔහු ආත්මාර්ථ කාමියෙක් නොවී ය.

මාතර හාමිනේ වඩා ආදරය කෙළේ තිස්සට ය. දරුවන් සියලු දෙනාටම එක සේ ආදරය කළ මුහන්දිරම් ගේ සිත වඩාත් ඇදගත්තී නන්දා ය.

අංජනම් එළි බැලවීමෙන් පසු 'පියල් නන්දාට අඳුනක් කවන ලදැයි' යන මතය මුහන්දිරම්ගේ සිතට ද වැදුණේ ය. එයින් පසු මාතර හාමිනේ ද සැලකුවේ එය ප්‍රත්‍යක්ෂ සත්‍යයක් ලෙසිනි. එහෙත් ඔවුහු කිසි විටක නන්දාගේ බාප්පාගේ පවුලෙහි වැඩි හිටි-යන් සමඟ හැර අනික් කිසිවකු සමඟ ඒ ගැන කතාබහ නොකළහ.

Scanned by CamScanner

මේ මතය තමාගේ සිතට නැඟුණු තැන් පටන් මුහන්දිරම් වඩ වඩාත් යකැදුරන්ගේ උදව් සෙව් ය. එහෙත් ඔහු ගාල්ලෙන් දෙස්තරකු ගෙන්වා, ඔහු ලවා නන්දට වෙදකම් ද කෙරෙව්වේ ය. ගාල්ලෙන් දෙස්තර ගෙන්වනු පිණිස වරකට රුපියල් විසිපහක් තිහක් වියදම් කළ යුතු ය. මුහන්දිරම්, වියදම් නොසලකා සතියකට වරක් හෝ දෙවරක් හෝ බැගින් මසක් ගෙවන තුරුම දෙස්තර ගෙන්වූයේ ය. දෙස්තර, නන්දගේ අසනීපය ගැනුන්ටම 'හැදෙන මූර්ච්ඡා රෝග විශේෂයෙක් ලෙස හැඳිනගෙන, වෙද-කමක් නැතත් කල් යන කොට ඉබේම ලෙඩේ හොඳ වේය'යි කියමින් වෙදකම් කෙළේ ය. යකැදුරුකම් කරවන අතර කරවූ දෙස්තර වෙදකමින් නන්ද බෙහෙවින් සුව ලැබුවා ය.

"දැන් ඉතින් වෙදකමක් උවමනා නැහැ; කල් යන කොට හොඳටම සුව ලැබේවි"යි කියූ දෙස්තර තමාගේ අවසාන ගමන උදෙසා ගෙවන රුපියල් පහළොව සාක්කුවේ දමාගත්තේ ය.

නන්දගේ රෝගය සම්පූර්ණයෙන්ම සුව කරනු පිණිස මුහන්දිරම්, යකැදුරන්ගේ අවවාදය අනුව තොවිල් කර වූයේ ය. මෙතැන් පටන් හාර මසක් යනතුරු මහ ගෙදර විශාල තොවිලයක් නොක-රන ලද සතියක් ඉකුත් නොවී ය. ගමේ පෙර කිසිවකු නොඇසූ විරූ නම් ආරූඪ කරන ලද අලුත් තොවිල් ද යකැදුරන් විසින් කරන ලදි. තොවිලයක් කෙළවර වන තෙක් සුදු පිරුවට හැඳගෙන යකැදුරාට පෙනි පෙනී පිදේනි ඉදිරියෙහි හිඳීම නන්දට ප්‍රිය නොවී ය. මුලදී අමාරුවෙන් යට කරගත් ඒ පිළිකුල ඈ ටිකින් ටික ප්‍රකට වන්නට හැරියා ය.

ගැමියන් තුළ මහ ගෙදරට පැවැති ගෞරවාදරය වඩාත් ප්‍රකට වූයේ මේ තොවිල් කරවන ලද හාර මාසය තුළ ය. තොවිලයකට වුවමනා දේ සැපයීම සඳහා පැමිණෙන ගැමියන්ගෙන් ද ගැහැනුන් ගෙන් ද මහ ගෙදර පිරෙයි. එකකුට වුවද කළ හැකි විලක්කු පන්දම් එතීමට හත්අට දෙනෙක් වෙහෙසෙති. කෙසෙල් ගස් ගොප් අතු ආදිය සැපයීමට හතර පස් දෙනෙක් යති. ගොඩ දිය මස් හා මල් ද සැපයීමට වෙහෙසෙන්නෝ ද හත්අට දෙනෙකි. යකැදුරන් ඇතැම් තොවිලයකට ගන්නේ සුදු මල් පමණි. තවත් තොවිලයකට ගන්නේ පාට පසක, වන–මල් පමණි. එහෙයින් මේ මල් වර්ග සැපයීම පිණිස ගැමියෝ අසල ගම්වල කැලෑ බිඳිමින් ඇවිද්දෝ ය.

තොවිලයට වුවමනා දේ සැපයීමට වෙහෙසෙන මේ ගැමියෝ, කුලී වශයෙන් සතයකුදු නොගනිති. එහෙයින් ඔවුන්ට ආහාර-යෙන් සංග්‍රහ කිරීම ගැමියන් අතර වූ සිරිත ය. සමහර ගැමියන් ආහාර අනුභවය සඳහා තමන්ගේ ගෙදරවලට යන්නේ මහ ගෙදර මිනිසුන්ට නොදන්වා රහසිනි. එහෙත් තොවිල් කරවන දවසෙහි

Scanned by CamScanner

මහ ගෙදර, සහල් ගෝනි බාගයක පමණ බතක් ද ඒ බතට වුවමනා ව්‍යඤ්ජන, මාළු කරවල, ආදිය ද ඉවිය යුතු ය. තොවිල් කරවූ භාර මස තුළ මුහන්දිරම් කළ වියදම දෙස්තර ලවා වෙදකම් කරවීමට කළ වියදමට කිහිප ගුණයකින් වැඩිවී ය. ඒ භාර මස අවසානයෙහි නන්ද සම්පූර්ණයෙන් සුව ලැබුවා ය. එයින් පසු ඈ සුවසේ පෙර මෙන් විසූ නමුත්, ඇතැම් දවසක රැයෙහි අමුතු පැවතුම් ඇත්තියක් වූවා ය. අසල ගෙදරක රැ තොවිලයක් හෝ යකැදුරුකමක් හෝ කරනු දැනගත්විට ඈ ශයනයට වී ඇනවිලි හරින්ට පටන් ගනියි. නින්ද යන තෙක් ඇනවිලි හරින ඈ පසු ද උදේ වෙනද මෙන් නැඟී කටයුතු කරයි. භාර මසක් තොවිල් කරවීම නිසා ඇගේ යටි සිතට වැදුණු යම් කිසි හැඟීමක් මේ ඇබ්බැහිකමට හේතු විදැයි සෙවීමට කිසිවෙක් නොවෙහෙසුණේ ය. ඇගේ ඒ ඇබ්බැහිකම යකැදුරන් ද ගැමියන් ද සැලකුවේ, ඇට වැළඳුණේ යක් ලෙඩක් ම යන මතය තහවුරු කෙරෙන ප්‍රත්‍යක්ෂ සාක්ෂ්‍යයක් වශයෙනි. සිත ගැනීමේ අදහසින් පියල් විසින් නන්දට අඳුනක් කවන ලදැයි යන මතය ද දැන් ඔවුන්ට ප්‍රත්‍යක්ෂ සත්‍යයකි.

නන්ද සුව ලබන විට කයිසාරුවත්තේ මුහන්දිරම් අගහිඟවලින් මිරිකෙන්නෙකි.

"කොපමණ වියදම් උණත් නන්දට සනීප උණ එක අපට සැනසිල්ලක්"යි මුහන්දිරම්, දවසක හවස් වරුවේ තම බිරිඳ අමතා කී ය.

"අනේ ඔව් — මම පසු ගිය හත් මාසේ ගත කෙරේ පපුවේ පත්තු උණු ගින්දරෙන්."

"දරුවෙකුට ලෙඩක් හැදුණාම ඕනෑවට වඩා හිතට ගන්න එපායයි මම හාමිනේට ඉස්සර හිටන් කියන නමුත් අහන්නේ නැහැ. දැන් හාමිනේ නෙව මේ හත් අට මාසෙට කෙට්ටු වෙලා ඉන්නේ."

"මම ටිකක් කෙට්ටු උණාට මොකද? නන්ද බේරා ගත්තා මට ඇති. දෙවියන්ගේ බැල්ම තියෙන නිසා දෝ කොහෙ දෝ නන්දගේ ඇඟ වැටුණේ නැහැ"යි මාතර හාමිනේ කීවේ දෙවියන්ට පින් දෙන්නාක් මෙනි.

"හාමිනේට කියන්න බැරි උණා; ඉඹුල් ගහ වත්තත් විකුණා සල්ලි ගන්න සිද්ද උණා—"

මාතර හාමිනේ සුසුම් ලෑවා මිස කිසිවක් නොකීවා ය. ඉඹුල් ගහ වත්ත විකුණන්ට පෙර තමා සතු කුඩා ඉඩම් කිහිපයක් උකස් කොට තම සැමියා මුදල් ලබාගෙන නන්දගේ ලෙඩට වියදම් කළ බව මාතර හාමිනේ දනියි. දැන් ඔවුන් සතු වස්තුව ඔවුන් ඉන්නා ගෙටත් වත්තටත් සීමා වෙයි.

Scanned by CamScanner

"කල් නැර නන්දගෙන් නිදහස් වෙන්න ඕනෑ" යි මාතර හාමිනේ යෝජනා කෙළේ, නන්දගේ අසනීපයට, ආදරය නිසා හටගත් සංකාවක් හේතුවන්ට ඇතැයි යන හැඟීම ද නැතිව නොවේ.

"මාතර කච්චේරියේ ලියන මහත්තයෙකුට කතා කරන්නදැයි ජේමිස් ඇහුවා. මම බලන්න කතා කරන්න කිව්වා."

"අපට කැපෙන වැදගත් පවුලක ඉලන්දාරියෙක් කවුරු උණත් කමක් නැහැ" මාතර හාමිනේ කීවා ය.

මාතර කච්චේරියෙහි ලියන්නාගේ කේන්දරය ගෙන්වා නන්දගේ කේන්දරයට ගැළපෙද්දැයි දෛවඥයන් දෙදෙනකු ලවා බලවන ලදී. දෙදෙනාම කේන්දර දෙක නොගැලපෙන බව කීහ.

"රාළහාමි, මේ කාරණය නම් කරන්න එපා" යි වේදේහ රජුට අනුශාසනා කළ සේනකයා මෙන්, එක් දෛවඥයෙක් කයිසාරු වත්තේට අනුශාසනා කෙළේ ය.

අනතුරුව නන්දගේ කේන්දරය ගාල්ලේ විවාහ ලේකම් කෙනෙකුගේ පුතෙකුගේ ද පැරණි උසස් පවුලකින් පැවත එන නිකමෙකුගේද ඉඩම් හිමි ශූර තරුණයකුගේ ද කේන්දර වලට ගැළපෙද්දැයි දෛවඥයන් ලවා පරීක්ෂා කරවන ලදී. ඒ කේන්දර තුනෙන් එකක් හැර අනික් දෙකටම නන්දගේ කේන්දරය නොගැලපෙතියි දෛවඥයෝ තීරණය කළහ. මුහන්දිරම්ට රුචි වුණු විවාහ ලේකම්ගේ පුතාට ආවාහ කර දුන්නොත් නන්ද විධවාවක වෙතියි එක් දෛවඥයෙක් දිවුරා කී ය. නන්දගේ කේන්දරයට ගැළපුණේ ඉඩම් හිමි ශූර තරුණයාගේ කේන්දරය පමණි. එහෙත් ඔහුගේ පියා පාන් පෝරණුවක් තබාගෙන වතු කාරයන්ට පාන් මස් මාළු විකිණීමෙන් මුදල් සැපයූ හීන පෙළපත ඇත්තෙකි. ඔහුගේ පියාගේ පියා බුලත් වෙළඳාමෙන් ජීවත් වූවෙකි. එහෙයින් මුහන්දිරම් ඒ තරුණයාට තම දුව දීමට කැමැති නොවී ය.

නන්ද ආවාහ කර දිය නොහැකි වීම ගැන මාතර හාමිනේටත් වඩා ශෝක වූයේ මුහන්දිරම් ය. තමා ක්‍රමයෙන් දිළිඳු විගෙන යන බව දන්නා මුහන්දිරම් අනාගතය ගැන සිතුවේ බියෙනි; ශෝකයෙනි. එහෙයින් කෙසේ හරි නන්දගෙන් නිදහස් විය යුතු ය. කල් යාමෙන් ඔවුන්ගේ දිළිඳු බව ප්‍රකට වන විට නන්දට කැපෙන තරුණයකු සොයා ගැනීම වඩාත් දුෂ්කර වන බැවිනි.

"තිස්සගේ බෝඩින් ගාස්තු හය මාසෙකින් යවන්න බැරි උණා" යි අඟහිඟ මතක් වුණු බැවින් මුහන්දිරම් කී ය. "ඉස්කෝලේ කාසි විතරක් යන්තම් යැව්වා. ලියන මහත්තයා බෝඩින් ගාස්තු මතක් කරලා ලියුමක් එවා තියෙනවා. අද හෙට කොහොම හරි රුපියල් අනූවක් සොයා යවන්න ඕනෑ."

"අපොයි ඌට බෝඩිමෙන් එන්ට වෙයි ද?''යි මාතර හාමිනේ ශෝකයෙන් ඇසුවා ය.

"නැහැ, ලියන මහත්තයා මට එහෙම කරන එකක් නැහැ. ඒත් කොහොම හරි අද හෙට සල්ලි යවන්න ඕනෑ. නන්දගේ ලෙඩේට හුඟක් වියදම් උණ බව ලියන මහත්තයා දන්නවා. ඒ උණත් සල්ලි යවන්න බැරි උණ එක අපට මහ ලජ්ජාවක්. සමහර විට සල්ලි නොයැවුවොත් ලියන මහත්තයා නිවාඩුවෙන් පසු තිස්ස නවත්වාගන්න අකමැති වෙන්නත් පුළුවනි.''

"ඔව්, පිට මිනිස්සු නෙව. සල්ලි කොහොම හරි යවන්න ඕනෑ.''

"ළඟදි එච්චර මුදලක් ලැබෙයයි හිතන්න බැහැ''යි මුහන්දිරම් කියේ බිරිඳ කරන යෝජනාවක් අසනු රිසියෙනි.

"අනුලාගේ රත්රන් බඩුවත් උකස් තියා සල්ලි ටිකක් ගන්නවා මිසක් වෙන මොනවා කරන්නද?''

"අනුලා තරහ වෙයි නෙව?''

"නෑ: ඈ තරහ වෙන්නේ නැහැ. තිසාට උගන්වන්න අපි ඔක්කොටම වඩා ආසා ඈ තමා.''

අහස සුළඟක් සහිත වැස්සක් නැඟුයෙන් ආලින්දයෙහි කුඩා අසුනක වාඩිගෙන උන් මාතර හාමිනේ නැඟිගියේ ගේ තුළට ය. ඈ ගේ තුළට පැමිණ මඳ වේලාවකින් සාලයේ එක් කොනක් වැහි බින්දු වැටීමෙන් තෙමෙනු දැක උඩ බලා, පිපිරුණු උළු කැටයකින් වැස්සෙන දියෙන් ගෙපිළ තෙමෙනු වළක්වනු පිණිස හිස් පිත්තල පඩික්කමක් ගෙනැවිත් ඒ වැහි බින්දුවලට එල්ල කොට තැබුවා ය.

බිඳුණු උළුකැට අතරින් කාන්දු වන දියෙන් තෙමෙන්නේ ගෙයි මෙතැන පමණක් නොවේ. පස් අවුරුද්දකින් පමණ උළු මාරු නොකරන ලද මහ ගෙය මෙසේ තෙමෙන්නේ, පරණකම නිසා එය ටිකින් ටික දිරාපත් වන බැවිනි. වඩා පරණ නොවන ගෙයක් නම්, පස් අවුරුද්දක් පිළියම් නොලැබුවත් මෙවැනි දිරුම කට හසු නොවේ. ඕලන්දක්කාරයන්ගේ කාලයෙහි තනවන ලද්දකැයි ගැමියන් සලකන මේ ගෙයි බිත්ති, අවුරුදු දෙකක් පිළියම් නොලැබුවොත් ක්‍රමයෙන් ගරා වැටුණු වේෂයක් ගනියි. ගෙයි විශාලත්වයටත්, දැඩි බවටත්, ගැළපෙන විශාල පිළියමක් කළ හැක්කේ, රුපියල් දෙතුන් දහසක වියදමිනි. මීට අවුරුදු පසළොසකට පමණ පෙර නම් එතරම් වියදමකින් මහ ගෙය පිළියම් කරනු ලැබී ය. ඊට පසු එවැනි පිළියමක් සඳහා කළ යුතු වියදම මහ ගෙදර පවුලට ඔරොත්තු නොදෙන්නක් වී ය. එහෙයින් බදම ගැලවුණු තැන්වලට පිළියම් කරවා බිත්තිවල හුනු ගෑවීමෙන් මහ ගෙදර මිනිස්සු තමන්ගේ නිවස ගරා වැටෙණු වැළැක්වූහ.

Scanned by CamScanner

# 5 වන පරිච්ඡේදය

නන්දගේ රෝගය සුව වී අවුරුදු දෙකක් පමණ ගත වූ නමුත් ඇ විවාහ කරදීමට මුහන්දිරම් කළ උත්සාහය සාර්ථක නො වී ය. ජේම්ස් ගාල්ලෙහි ද මාතර ද වැලිගම ද තරුණයන් හත් අට දෙනෙකුගේම කේන්දර සොයාගෙන ආ නමුත් නන්ද තවමත් අවිවාහක තරුණියකි. නන්දගේ කේන්දරයට නොගැළපෙතියි දෛවඥයන් කී නිසා ජේම්ස් ගෙනා කේන්දර කීපයක් ඉවත දමන ලදී. ඇගේ කේන්දරයට ගැලපෙන කේන්දරය හිමි එක් තරුණයකු දැවැද්ද වශයෙන් රුපියල් තුන් දහසක් ඉල්ලූ නිසා ඒ කේන්දරය ද ඉවත දමන ලදී. තමන්ගේ පවුලට නොකැපෙන, පෙළපතින් පහත් තරුණයකුට නන්ද විවාහ කරදීමට මුහන්දිරම් ද මාතර හාමිනේ ද කැමති නොවෙති.

''මම නම් දූන් ඉතින් සොයන්න පුළුවන් හැම තැනම සෙව්වා''යි ජේම්ස් කී ය. දූන් තීන්දු කරගන්න ඉතුරු වෙලා තියෙන්නේ කාරණා දෙකයි. ඒ දෙකෙන් එකකට මුහන්දිරම් රාළහාමි කැමැති නොවෙනවා නම් මම මීට පස්සේ පුංචි නෝනා ගැන මහන්සි වෙන්නේ නැහැ.''

මඟුල් කපුකම තම රස්සාව කොටගත් ජේම්ස්, හැම දෙනාටම කපුකම් කරන්නෙක් නොවේ. හොඳ කුල පරම්පරාවක් ඇති ඔහුගේ සීයා නොතාරිස්කම කළ තරමක ධනවතෙකි. ජේම්ස්ගේ පියා ද විවාහ ජීවිතයට ඇතුළු වූයේ පිය උරුමයෙන් ලත් හවුල් ඉඩම්වලින් මසකට රුපියල් තිහක හතළිහක පමණ ආදායම ලබන්නකු ලෙස ය. අනික් රස්සාවක් නොකොට ඒ ආදායමින් යැපුණු දරුමල්ලන් ඇති ඔහු ක්‍රමයෙන් දිළින්දෙක් වී ය. මෙසේ ක්‍රමයෙන් පිරිහුණු කුල ගෙයක උපන් ජේම්ස් ද වැඩිවිය පැමිණි පසු අගහිඟ නිසා ජීවත් වූයේ දුකසේ ය.

ඔහු මඟුල් කපුකමට බැස්සේ විවාහයෙන් පසු දරු දෙනෙදකුද ලත් විට ය. ජේම්ස් තරුණ වියෙහි පටන් ඇබ්බැහි වූයේ නෑ මිතුරන් සොයා ගොස් ඔවුන් සමග ද ගමෙහි කුල ගෙවලට ගොස් ඒ ගෙවල වැඩි හිටියන් සමඟ ද කතා-බහින් කාලය ගෙවීමට මිස නියම රස්සාවක් කිරීමට නොවේ. ඕපාදූප දෙඩීමට පුරුදු වුණු ජේම්ස්, තමාගේ අගහිඟ වැඩි වන විට මඟුල් කපුකමට බැස්සේ එහෙයිනි.

හිස පිටිපස උකුණු වළට ළං කොට බඳින ලද කුඩා කැවුමක් තරම් කොණ්ඩ ගැටයක් ද හිස මුදුනෙන් ගත් ඉතාම හීන් කබල් නැමි පනාවක් ද ඇති ජේම්ස් පනස් විය නොඉක්ම වූවෙකි. බුලත්



Scanned by CamScanner

සැපීමෙන් කළු වුණු ඔහුගේ දත් දැන්දෙහි හැම දත්වල මැද කිරි පාටින් බැබළෙන සුදු පැල්ලම් ඔහු සිනාසෙන විට, දක්ක හැකිය. මාපටැඟිල්ලෙන් හා දබරඟිල්ලෙන් ද පිරිමැදීමෙන් උඩුකුරු වුණු දෙකොන් ඇති රැවුල නිසා ඔහුගේ දෙඇස ද මුහුණ ද අමුතු සාහසික විලාසයක් ගතිතත් ඔහු සාහසිකයකු නො වන බව මුහන්දිරම් දනියි.

ජේම්ස් හත් අට මසක් තිස්සේ ගාල්ලත් මාතරත් අතර ඇවිද්දේ ඔහුගේම වියදමින් නොවේ. මුහන්දිරම්ගෙන් ගමන් ගාස්තු වශයෙන් ලත් මුදල් වියදම් කිරීමෙනි. ගමන් ගාස්තුව හැර වැඩි පුර මුදලක් ඔහු මුහන්දිරම්ගෙන් ද නොලැබී ය. මනමාලයන් වනු කැමති තරුණයන්ගෙන් ද සමහර විට ඔවුන්ගේ මවුපියන්ගෙන් ද ජේම්ස්ට ලැබුණේ ගමන් බිමන්වලට සෑහෙන තරම් වූ මුදලකි. තමා වෙහෙස ගැනීමෙහි අවසාන ඵලය නෙළාගත හැක්කේ, කවදවත් නුදුටු විරූ තරුණයකු ද තරුණියක ද ඔවුනොවුන් හැඳින ගෙන පෝරුවට නැඟ අත් ගැනීමෙන් පසුව ය.

"මොකක් ද ජේම්ස් උඹ කියන කාරණා දෙක?"යි මුහන්දිරම් විචාළේ ය.

"ගාල්ලේ හැංඩි මහානාම-එයා කදිම හැදෙන ඉලන්දාරියා; ඉඩම් කඩම් තියෙනවා. ළඟදීම ලොකු වෙළෙඳාමකුත් පටන් ගන්න යනවා. සල්ලි හම්බ කරන්න නම් හැබෑම සූරයා—"

"ජේම්ස් අපි එයාට කැමති වෙන්නේ කොහොම ද? එයාලයි මුත්තා මාර්කට් එකේ එලවළු බක්කියක් තියාගෙන ජීවත් උණ මිනිහෙක්. තාමත් සමහර මිනිස්සු හැංඩි අඳුන්වන්නේ 'බුලත් කත්කාරයාගේ මුණුපුරා' කියා. එයාගේ තාත්තා පාන් පෝරණුවක් තියාගෙන වතුකාරයන්ට පාන් මස් මාළු සැපයීමෙන් සල්ලි හම්බ කරගත්තු මිනිහෙක්. එයාලයි පෙළපතේ මිනිසුන්ගෙන් ඉස්සර වතුරවත් බොන්නේ නැහැයි මේ අපේ හාමිනේගේ අම්මා කියනවා."

"ඔව්"යි කියමින් මාතර හාමිනේ තම සැමියාට රුකුල් දුන්නාය. "හැංඩිලයි මුත්තාගේ මුල් ගම අපේ ගම මයි. මිනිහාට එහිදී ජීවිකාව කරගන්න බැරුව ගමින් පිට වෙලා ගාල්ලට ගොහින් එහි පදිංචි උණායයි අපේ අම්මා මීට ඉස්සර කියනවා මම අහලා තියෙනවා."

"අනේ හාමිනේ දැන් ඕවා සොය සොයා ඉන්න කාලයක් නෙවි. දැන් සල්ලි හම්බ කරගෙන පොහොසත් වන පවුල්වල කාගෙත් සුලමුල ඔහොම තමයි. ඉස්සර හොඳින් හිටි පවුල්වල කාටත් වාගේ දැන් මුදල් නැතිවෙගන යනවා. ඒ කාටත් දැන් බහින කලාව්. ඕව සොයන්නේ නැතුව මෙන්න මේ කාරණේ කරන්න කැමති

වෙන්න. මුහන්දිරම් රාළහාමිගෙන් කටයුත්තක් කරගන්න එයා නම් හොඳට කැමතියි. රාළහාමි කැමති වෙනව නම් ඒ මිනිහ මංගල්ලෙට ඕනැ වියදමටත් සල්ලි ගෙනැත් දීලා පුංචි නෝනා කසාද බැඳගනීවි. රත්රන් බඩුත් ඕනැ නැහැයි කියනවා.''

ජේම්ස් මෙසේ කීවේ අගහිඟවලින් මිරිකෙන මුහන්දිරම්ට කුල මානය අමතක කරවන අදහසිනි. එහෙත් ජේම්ස්ගේ කියුමක් තරුණයාගේ ආසාවත් තම පවුලට නිතැතින්ම ලැබුණු උපහාරයක් ලෙස මුහන්දිරම් සැලකුවේ ය. එහෙයින් වැඩිහිටියන්ගේ සුරතල් බසින් අනුබල ලැබූ කුඩා දරුවකු දඟයකු වන්නා සේ මුහන්දිරම් කුල මානය වඩාත් හිසට නගාගත්තෙක් වී ය.

''ජේම්ස්, ඒක ගැන නම් කතා කරන්න එපා. ඒක අපි හිතින් අහක් කර දමමු.''

''එහෙනම් අනිත් කාරණේවත් කරමු''යි කියමින් ජේම්ස් සාලය දෙසට එබී බැලී ය. ''අන්න හොඳයි! පුංචි නෝනාත් අහගෙන ඉන්නවා.''

''ජේම්ස් කියන්නේ බොරු''යි නන්ද සිනාසෙමින් කීවා ය. ''මම දැන් සාලෙට ආවා විතරයි අම්මා ජේම්ස්ට දෙන්න කෝපි කෝප්පයක් වත්කරන්නයයි කියනවා මට ඇහුණා. බොරු කිව් නිසා මම කියනවා කෝපි වත්කරන්න එපයි කියා.''

මෙසේ කිවූ නන්ද සිනාසෙමින් සාලයෙන් ඉවත්ව ගියා ය.

''මම කිව්වේ කවටකමට''යි ඉක්මනින් කෝපි බොනු රිසි වූ ජේම්ස් කී ය.

පනස් ඇවිරිදි වියෙහි වූ ජේම්ස් කෝපි බොන්නේ ඇනැමුන් අබින් කන්නාක් මෙනි. කෝපි වතුරෙන් දිව නොපොහොවා පැයක් පවා කතා-බහ කිරීම ජේම්ස්ට නම් අමාරු කාරියකි. වරුවක් කතා-බහ කිරීමට නම් ඔහුට අඩු ගණනේ කෝපි කෝප්ප හතරක් වත් වුවමනා ය.

''මොකක්ද ජේම්ස් අනිත් කාරණේ''යි මුහන්දිරම් ඇසී ය.

''පියදිගම ලොකුඅප්පු ආරච්චි මහත්තයාගේ පුතා – ජිනදාස ළමාහේවා මහත්තයා—''

''මමත් ඔය කාරණේ ගැන හුඟක් කල්පනා කරා. මිනිස්සු නම් හොඳයි. නෑදෑයොත් හොඳයි. ඒකට මොකද තාත්තා මැරුණාට පස්සේ ඒ ගොල්ලන්නේ තිළුණු දේ නැති උණා නෙව. දැන් බොහොම අමාරුවෙන් නෙවද ඒ ගොල්ලො වැඩ කරගෙන ඉන්නේ? දීපු දූත් ගෙදර ඇවිත් ඉන්නවා.''

''ටිකක් නැති උණාට තව කොච්චර දේ තියෙනවා ද ඒ මිනිසුන්ට? තවමත් කන්නේ කුඹුරුවලින් ලැබෙන වීමයි. රට හාල් ඇටයක් ගෙදරට ගන්නේ නැහැ.''

Scanned by CamScanner

''වී ටිකක් ලැබුණාම ඔය හැටි කාරියක්ය ජේම්ස්? හාල් දිය කරන්න තවත් හුඟක් දේ ඕනෑ. ඒවාට නෙව වියදම් යන්නේ.''

''ඇයි රාළහාමි, ඉඩම්වලින් ලැබෙන ආදායම?''

''මොන ඉඩම් ද ජේම්ස්? මම දන්නවා එයාලයි ඉඩම් වලින් ලැබෙන ආදායම. ඔහෙ යන්තම් පිරිමහගෙන කන්න පමණක් ඇති ඒ ගොල්ලන්ගේ දූන් ආදායම. කසාද බැන්දම මිනිහෙකුට තවත් හුඟක් වියදම් කරන්න වෙනවා.''

''ජිනදස මහත්තයා රස්සාවක් කරන්නයි ඉන්නේ. ඒක පටන් නොගෙන ඉන්නේ කසාද බඳින කල්.''

ජේම්ස් කෝප්පයෙහි ඉතිරි වුණු කෝපි මංඩි ටික බී කෝප්පය ඉවත තබා දෑතට විදහන ලද ඇඟිලි තුඩුවලින් රැවුල් කොන් අවුස්සමින් උඩුකුරු කෙළේ ය.

''රස්සාවක් කරන්න යනවා?'' යන වචන මුහන්දිරම් කීවේ පෙරට වැඩි සැලකිල්ලකිනි. ජිනදසට විරුද්ධව චෝදනාවක් නැඟිය හැක්කේ රක්සාවක් නැතිව මවුපියන්ගෙන් ලත් දෙයින් යන්තම් පිරිමසාගෙන ජීවත්වීම ගැන ය. රක්සාවක් කරතොත් උසස් පෙළපතකින් පැවත එන ජිනදසට නන්ද විවාහ කරදීමට මුහන්දිරම් ද හාමිනේ ද කැමති වන බව ජේම්ස් දනියි. ජිනදස බැන්ද වහාම රස්සාවක් කිරීමට පුල පුලා සිටින බව ජේම්ස් කීවේ එහෙයිනි; රස්සාවක වගකුදු ජිනදස තමාට කී නිසා නොවේ.

''රස්සාවක් කරනවා නම් ජිනදසට කැමති නො වෙන්න කාරණයක් නැහැ. වැරැද්ද රස්සාවක් නොකරන එකයි. තවත් වැරැද්දකට තියෙන්නේ එයාගේ කසාද බැඳපු අක්කාත් ගෙදර ඇවිත් ඉන්න එකයි. මහත්තයා මැරුණාට පස්සේ එයා ගෙදර නැවතීමට ඇවිල්ල දූන් අවුරුදු හතරකට වැඩියි'' මාතර හාමිනේ කීවා ය.

''ජිනදස මහත්තයා කසාද බැන්ද වහාම ඒ නෝනා, මහත්තයා-ලයි ගමට පදිංචියට යාවි.''

''යනවයි කිව්වාද?''

''මම ඒක කරවන්නම් හාමිනේ''

ජේම්ස් කෝපි කෝප්ප දෙකක් හිස් කිරීමෙන් පසුය මහ ගෙදරින් එළිමහ-එළියට බැස්සේ. දෙතුන් මසකට පෙර නොදක්නා ලද එළිමහ- ... නක් මහ ගෙදර මිදුලෙහි ද වත්තෙහි ද ඇතැයි හැඟුණු ජේම්ස් වට පිට බැලී ය. මහ ගෙදර වත්තට වමෙහි ද මහ ගෙදරට පිවිසෙන මහ දෙපැත්තෙහි ද මීට පෙර වූ කැලෑ රොදවල් අද ඔහු නුදුටුවේ ය. ගඳපාන පඳුරුවල ද කුරුඳු, බලුදත් මාදන්, ගස්වල ද හිඳ ගෙන වෙනද හඬ නඟන කුරුල්ලන්ගේ නාදය නොඇසිණ. කපා ගිනි

තැබිමෙන් විනාශ කරන ලද ගස් වැල්වල මුල්, අහුරු ගොඩවල් සේ ජේමිස්ට පෙනිණ. පළින් පළ හාරන ලද වළවලින් උඩට ඇදුණු ගොබ සහිත පොල් පැළ දුටු ඔහු, මහ ගෙදර වම් පැත්තෙහි වූ ඒ බිම් තීරුව අලුත් හිමියකුගෙන් ළඟදී සංග්‍රහ ලබන ලදැයි සිතුවේ ය. ඉවත් කරන ලද වියලි කොළ සහ කුණු ද ඇති මහ ගෙයි වත්ත වසා ගත් තණ බිස්ස හිරු රැස් වැටීමෙන් බැබළෙන හතරැස් ලනු පැදුරක් ලෙසිනි, කුතුහලව අවට බැලූ ජේමිස්ට පෙනුණේ. පොල් ගස් සෙවණේ සරුව වැවුණු තණ කොළින් වැසුණු, මේ වත්තෙහි ගවයකු නොදක්නා ලැබෙන්නේ, හතර පැත්තෙහි වූ විශාල ගල් වැට නිසා ය. වත්තෙහි පොල් ගසින් සෙවන නොවූ එක් කොණක, ගල් වැට අසල වූ දැවැන්ත අඹ ගස, එහි යට සිටින්නකු මහ වැස්සකදී වුව ද නොතෙමා සෙවන කළ හැකි තරම් කොළ ඇත්තකි. පෙර කොළවලට වඩා ගෙඩි හට ගත් මේ අඹ ගසෙහි දැන් අඹ හට නොගැනීම, මහ ගෙදරට බහින කලාව ලැබිමේ ලකුණක් ලෙස ය ජේමිස් සලකන්නේ. දකුණු පැත්තේ ගල් වැට අද්දර වූ කෙට්ට ගස් දෙක, කොළ නැති ගස් වෙසෙසක් ලෙස පෙනෙන්නේ ගැමි ගැහැනුන් මලවාගෙන කෑමට එහි අතු ඉති බිඳගෙන යාම නිසා බව ජේමිස් දනියි. ගල් වැටටත් ගෙයටත් මැද වැවුණු ලොවි ගස නම්, රතු විදුරු බෝල රාශියක් සේ හිරු රැසින් බැබළෙන ඉඳුණු ගෙඩියෙන් බර වූවකි.

“සාදගෙ වැඩේ නිදන් රකින නයෙක් වගේ ගල් වැට දෙරටුව ළඟට වෙලා මහ ගෙදර වලව්ව රැකීම ය”යි, ගල්වැට දෙරටුව අසල දෙල් ගස යට තණ බිස්සෙහි වාඩි වී, මිදුලෙහි වූ ජම්බු ගසෙහි ගෙඩි කෑමට එන පණු ගිරවුන් එළවන සාදට ජේමිස් කී ය. කිසි විටෙක බුලත් නොසපන සාද පොල් ඉරි දෙකක් සේ සුදු දත් දෙපෙළ පෙන්නා සිනාසුනා මිස කිසිවක් නොකීවේ ය. වයසින් අවුරුදු හතළිස් අට ඉක්මවූවකු වුව ද කිතුල්කෙඳි සේ දළ කළු කෙස් වැටියක් ද රැවුල නැතත් කෙස් ගස් දෙකක් සහිත ඉන්නකු ගෙන් යුතු ගැනු මුහුණක් ද ඇති සාද, පෙනීමෙන් නම් තිස්පස් වන අවුරුද්ද නොඉක්මවූවෙකි.

“මේ වලව්වේ වත්තට අල්ලපු වත්තට එළිය වැටුණේ කොහොම ද සාද?”යි අනතුරුව ජේමිස් ඇසී ය.

“ඉස්කෝලේ මත්තයලයි අම්මා කැලේ එළිකරවා පොල් ඉන්දෙව්වා නෙව.”

“හෝ!—එහෙනම් ඉස්කෝලේ මහත්තයලයි අම්මයි මේ ඉඩම අරන් තියෙන්නේ. මේ ඉඩමෙන් කොටසක් මුහන්දිරම් රාළහාමිටත් තිඋණා නෙවද?”

“ඒ කොටසත් වික්කා; අනික් මිනිසුන්ගේ කොටස් වික්ක නිසා”

“ළඟදී ද?”

Scanned by CamScanner

"ඔව්"

"ඉස්කෝලේ මහත්තයලයි අම්මට ඔය තරමට සල්ලි කොයින්ද බන්."

"ඉස්කෝලේ මහත්තය එව්වයි කියන්නේ."

"කොළඹට යන්නත් ඉස්සර ඉස්කෝලේ මහත්තයා කොහොම ද සල්ලි හම්බ කරන්නේ?"

"ඉස්කෝලේ මහත්තයා ගමින් ගොහින් දැන් අවුරුද්දක් විතර වෙනවා."

"මිනිහත් එහෙනම් එයාගෙ තාත්තා වගේ සල්ලි හම්බකරන්න හපනෙක්"යි කියමින් ජේමිස් නික්ම ගියේ 'ණය කාරයා'යි සිතින් කියමිනි. ඔහු 'ණය කාරයා' යි කීවේ සාදුට ය. අවුරුදු තිහකට වැඩි කාලයක සිට බල්ලකු සේ ළැදිව මහ ගෙදර මිනිසුන්ට සේවය කරන සාදු පෙර ජාතියෙහි මුහන්දිරම්ගෙන් හෝ ඔහුගේ බිරිඳගෙන් හෝ ණය ගෙන නොගෙවන ලද්දකු සේ ය ජේමිස් සැලකුවේ. පියල් මුදල් සැපයීමේ ගුරයෙකියි ජේමිස් සිතුවේ ඔහුට ද විවාහ යෝජනාවක් කිරීමට අදහසක් ඒ වේලාවෙහි තමාගේ සිතට නැඟුණු බැවිනි.

දෙමසකට පමණ පසු ජේමිස් යළිත් මහ ගෙදරට පැමිණියේ වැඩි හිටියන් දෙදෙනකු පිරිවර කොටගත් තරුණයකු සමඟ ය. ඒ තරුණයා අනිකකු නොව ජිනදාස ලමාහේවා ය. ඔහු පැමිණියේ මනමාලිය නොහොත් නන්දා බලනු පිණිස ය. අමුත්තන් මුහන්දිරම්ගෙන් ද බිරිඳ ගෙන් ද බුලතින් හා සුරුට්ටුවලින් හා තේ පැනින් ද සංග්‍රහ ලැබූ පසු, මාතර හාමිනේ, හොඳින් ඇඳ පැළඳගෙන සැරසුණු නන්දා සමඟ ගොස් සාලයේ ඇතින් වූ අසුනක වාඩි ගත්තා ය.

කුඩා මල් සහිත කදිම පට රෙද්දකින් වැසුණු යටි කය ද රැලි නැඟුණු සුදු හැට්ටයකින් වැසුණු උඩු කය ද ඇති නන්දා මව ළඟම වූ පුටුවෙහි වාඩි වූවා ය. ඇගේ බෙල්ල සරසන ලද්දේ රත්රන් ඇට දෙපටකිනි. දෙඅත් ගොබ, රත්රන් කම්බි තුන් පට ඇඹරවූ මෙන් තනන ලද වළලු දෙකකිනි; දෙකණ මුතු කරාබු දෙකකිනි. තරු දෙකක් සේ දිලිසෙන මුතු කරාබු දෙක නිසා ඇගේ දෙඇස අමුතු දීප්තියකින් බැබළිණ; සිත් තොල් සහලින් වැසුණු කුඩා කට, පෙනුමෙන් තියුණු වී ය.

මීට අවුරුදු හත අටකට පෙර නම් ගැමියන් මනමාලිය පෙන්නුවේ මීට මදක් වෙනස් විදියකිනි. අමුත්තන් සමඟ පැමිණි මනමාලයා ඉදිරියෙහි තබන ලද කනප්පයක් උඩ, මනමාලිය බුලත් ඉලත්තට්ටුවක් තබා අනිත් අතට හැරී යාම පරණ සිරිත විය.

Scanned by CamScanner

අලුත් පන්නයට ඉඩ හැර එය ගැමියන් අතරින් අතුරුදහන් වූයේ මීට අවුරුදු හතකට අටකට පමණ පෙර ය.

ඉඳහිට ජිනදාස දෙස බැලූ නන්ද වඩාත් හොඳින් දුටුවේ ඔහුගේ ඇඳුම් ය. වඩාත් ඇට බලන්ට හිතුණේ ඔහුගේ ඇඳුම් ද මුහුණ ද යනු නිශ්චය කිරීම අමාරු කාරියක් වනුයේ ඇ මිනිසුන්ගේ, විශේෂයෙන් තරුණයන්ගේත් තරුණියන්ගේත්, ඇඳුම් පැළඳුම් වල ඇද පලුදු සෙවීමට පුරුදු වුණු සියුම් නෙත් ඇත්තියක සේ පවුලේ අනික් නෑයන් අතර ප්‍රකට වූ බැවිනි. ටුවිඩ් රෙද්දකින් වැසුණු යට කය ද කමිසයකින් හා ටුවිඩ් කෝට් එකකින් වැසුණු උඩු කය ද ඇති ජිනදාස පන්තිස් ඇවිරිදි වයස් ඇත්තෙකි.

අමුත්තන් නික්ම ගිය වහාම නන්ද අනුලා සමඟ කීවේ ජිනදාසගේ ඇඳුම්වල ඇද පලුදු ය.

"කමිස කොලර් එකේ කොනක් උඩට ඉස්සිලා තිඋණා!"යි කියමින් නන්ද සිනාසුණා ය.

"අම්මේ, නන්දට පෙනිලා තියෙන්නේ මනමාලයා ගේ ඇඳුම්-වල ඇද-කුද"යයි අනුලා එහි පැමිණී මවට කීවාය.

"හැම දම එයාට පේන්නේ මිනිසුන්ගේ ඇඳුම්වල ඇද පලුදු නොවෙන්නම්"යි කියමින් මව සිනාසුණා ය.

"කෝට් එකේ පස්ස පැත්ත ඔක්කොම පොඩි වෙලා"යි නන්ද මවට ද ඇසෙන සේ කීවා ය.

"වෙන?"

"සපත්තු දෙක කකුල් දෙකට ලොකු!"යි නන්ද කීවේ සිනාව මැඩගෙන ය.

"ඇති බලාපු තරම!"

"මුහුණේ ඇද කුද නොකියන්නේ මනමාලයාගේ මුහුණ හොඳ නිසා වෙන්න ඇති"යි කියමින් අනුලා තම නහාට සරදම් කළා ය.

"එහෙනම් අනු මුහුණ බලන්න ඇති."

අනුලා කීවේ ඇත්ත බව නන්ද දනියි. ජිනදාස කඳිම නැහැය කින් ද නොමහත් තොල් සඟලකින් ද නිල් පැහැති ඇස් දෙකකින් ද හෙබුණු මුහුණක් ඇත්තකු බව ඔහු දෙස බැලූ පමණින් නන්දට ද වැටහිණ.

"මම බලන්න ආවා නම් බලනවා තමා"යි අනුලා කට කාරියක ලෙස පිළිතුරු දුන්නා ය.

"අනු, මට අන්දවද්දී මනමාලයාගේ මුහුණ හොඳයි කිව්වෙ නැද්ද?"යි අසමින් නන්ද, තමාගේ බෙල්ල වටා සිටි ඇට පට ගලවා මවට දුන්නා ය.

Scanned by CamScanner

"මට මුහුණ පෙනුණු නිසා එහෙම කිව්වා."

"පෙනුණේ නොබලාද?"

"අපි ඕනෑ කරලා බැලුවේ නැහැ."

"හ්ම්—ඔය ඇති; අක්කයි නඟයි වාද කරා"යි කියමින් මාතර හාමිනේ, නන්ද උනා දුන් රන් අබරණ අල්මාරියෙහි තබනු පිණිස අනුලාට දුන්නා ය.

Scanned by CamScanner

## 6 වන පරිච්ඡේදය

ගමින් පිටව ගිය පියල් මුල් හමස තුළ දී ගමට ආවේ එක් වරකි. නන්දට තමා විසින් අඳුනක් කවන ලදැයි යන චෝදනාව ඇසූ පියල් සිනාසුණේ කෝපයෙනි. ලජ්ජාවෙනි. ඒ චෝදනාව මහ බොරුවකැයි පියල් කීවේ ඇතැම් ගැමියකුට බැණ වදිමිනි. දුර දක්නා නුවණැති ඔහුගේ මව ඒ චෝදනාවෙහි ඇත්ත නැත්ත ගැන කිසිවකු සමඟ කතාවට නොයන ලෙස පියල්ට අණ කළා ය. අවුරුද්දක් දෙකක් යන තුරු පියල් ගමට එනු වැළැක්වීම ඇගේ අදහස වී ය. ඈ එසේ අදහස් කෙළේ පියල් ගමට නිතර පැමිණ මුහන්දිරම් තවත් කෝප කිරීමෙන් විය හැකි අන්තරාය දන්නා බැවිනි.

මුහන්දිරම කයිසාරුවත්තේ, තමාට වරදක් කළ එකකුගෙන් කෙසේ හරි පළිගන්නා දැඩි සිත් ඇත්තකු බව පියල්ගේ මව දනියි. මුහන්දිරම්ගේ චරිතයෙහි දෝෂයක් සේ ගැමියන් දුටුවේ ද එය ය. මාතර හාමිනේට බෙහෙවින් ආදරය කළ ගැමියන් මුහන්දිරමට බිය වූයේ ද ඔහුගේ චරිතයෙහි මේ නපුරු අංගය නිසා ය.

මුහන්දිරම් තමාට හතුරුකම් කළ එකකුගෙන් පළි ගන්නේ සිතා-මතා උගුල් ඇටවීමෙනි. අවුරුදු හතක් අටක් යට කරගෙන උන්න පළි ගැනීමේ චේතනාව ඔහුගේ සිතින් අතුරුදහන් නොවෙයි. තමාට වරදක් කළ එකකුගෙන් පළි ගැනීමට අවුරුදු හත අටකට පසුව වුව ද අවස්ථාවක් ලැබුණොත් මුහන්දිරම් එයින් ප්‍රයෝජන ගන්නේ ය. උගුලක් අටවා එහි හසු වුණු සතා බලා සන්තෝෂ වන වැද්දකු සේ මුහන්දිරම් ද තමාට හතුරුකම් කළ එකකු උගුලට හසුකොට සන්තෝෂ වන්නෙකි. ඔහුගේ උගුල බොහෝ විට තම සතුරා බොරු නඩුවකට හසු කිරීම සඳහා ඇටවෙන්නකි. එවැනි කාරියක් ඔහු සාර්ථක කරගන්නේ පොලිස් මුලාදැනියා ඔහුගේ කියුමක් නොඉක්මවන්නකු වන බැවිනි. මුහන්දිරම් තමාට බර වරදක් කළ එකකුගෙන් හැර අනිකකුගෙන් කිසි විටක පළි නොගනියි.

මීට අවුරුදු දහයකට පමණ පෙර දවසක හවස් වරුවේ ගෙයින් පිට ගොස් ආපසු ගමන්ගත් මාතර හාමිනේට ද දුවට ද වෛරිමත්ව ගමන් කළ නෝනිස් හමු වී ය. ඔහු නන්දගේ ඇඟේ හැපෙන තරම් ළං ව ඇට සරදමක් ද කෙළේ ය. මාතර හාමිනේ ඔහුට තර්ජන කළ විට ඔහු ඇට ද බැණ වැදුණේ ය. තම බිරිඳට ද දුවටද නෝනිස් කළ නින්දාව මාතර ගිය මුහන්දිරම් ඇසූයේ පසු ද හවස් වරුවේ මහ ගෙදරට පැමිණි විට ය. වෛරි හිඳුණු නෝනිස්

කමාව අයදින පිණිස මහ ගෙදරට පැමිණි නමුදු මුහන්දිරම් ඔහු එළවා දැම්මේ ය. අවුරුද්දකට පසු නෝනිස් තමා වෛරී මතින් කළ පෙරළියට වන්දි ගෙවීමක් වශයෙන් අවුරුද්දකට හිරගෙට ගියේ ය. එය මුහන්දිරම් විසින් අටවන ලද උගුලෙහි හසුවීමෙහි ප්‍රතිඵලයක් බව ගැමියෝ දනිති.

, මුහන්දිරම්ගේ චරිතයෙහි මේ නපුරු අංගය ගැන සිතූ පියල්ගේ මව, පියල් ගමට නොපැමිණෙනු දැකීමට ආශා කළා ය. ඔහු ගමට පැමිණිය ද දවසකට වඩා එහි නොනැවතුණේ ය. මව කෙසේ හරි ඔහු ගමින් පිටත් කළ බැවිනි.

''පියල් නන්දට අඳුනක් කැවී ය'' යන චෝදනාව මුහන්දිරම් කිසි විටෙක තම කටින් පිට නො කෙළේ ය. මෙය පියල්ගේ මවගේ බිය සැක අඩු වීමට නොව වැඩි වීමට හේතු වී ය. නෝනිස් තම බිරිඳට ද දුවට ද කළ නින්දාව මුහන්දිරම් අමතක කෙළේ ය යි ගැමියෝ සිතූහ. එහෙත් හුඹසට වැදුණු නයකු සේ, පළි ගැනීමේ චේතනාව ඔහුගේ හද තුළ සැඟවී තිබුණු බව ගැමියන් දැනගත්තේ නෝනිස් බොරු නඩුවකට හසු වී හිර ගෙට ගිය පසු ය.

ගමින් පිටව ගොස් අවුරුද්දකුත් මාස පහක් පමණ ගෙවුණු නමුදු පියල් ගමට පැමිණියේ තුන් වරකි. පළමු වර පැමිණි පියල් ගම රැඳුණේ දවසකි. තුන් වන වාරයෙහි ඔහු තුන් දවසක් ගම රැඳුණේ ය. නන්දට හොඳටම සුවය ලැබුණු පසු අඳුන කැවීම පිළිබඳ කතාව ද ගැමියන් අතරින් අභාවයට ගිය බැවිනි මව, පියල්ට ඒ තුන් වන වාරයෙහි දෙතුන් දවසක් ගම රැදීමට ඉඩ දුන්නේ.

අඳුන පිළිබඳ කථාව ඇසූ හැම විටම, පියල් කීවේ 'ඒක මහ ගොන් කතාවක් ය' යන්නයි. 'මන්තර ගුරුකම් මෝඩයන්ගේ ඇදහිමක්'ය කියමින් ඔහු ගැමියන් හා තර්ක කෙළේ ය. ඇතැම් විට ඔහු 'සිංහලවත් හොඳින් නොදන්නා මෝඩ රැළ'යයි යකැදු-රන්ට බැණවැදුණේ ය. ඔහුගේ මේ තර්ක හා බැණුම් ද ඇසූ සමහර ගැමියෝ 'ඉස්කෝලේ මහත්තයා අඳුන කවාලාම තියෙන වාය!' යන මතයෙහි වඩාත් තදින් එල්බගත්හ. ඔහු මන්තර ගුරුකම්වලට විරුද්ධව තර්ක කරත්ම ගැමියන්ගේ මතය වඩාත් දැඩි වී ය.

කොළඹ ගිය පියල්ට එහි මහ හෝටලයෙහි මත් පැන් සැලෙහි ලිපිකාර කමක් ලැබිණ. ඔහු ඒ රැකියාව ලබා ගත්තේ ඔහු උගත් පාසැල් ගුරුවරයෙකුගේ ද උපකාරයෙනි. ලිපිකාරයකුව සිටිය-දීම පියල්ට, හෝටලයට බිත්තර පලවැල යනා ආදිය සැපයීම පිණිස අවසරයක් ලැබිණ. ඒ ද්‍රව්‍ය සැපයීමෙන් පසු තම පඩිය මෙන් තුන් හතර ගුණයක ආදායමක් ලැබී ය. එලවළු, පලවැල

බෙලිඅත්ත, තිහව යන පෙදෙස්වලින් ද බිත්තර, මීගමුව, ලුනාව යන ආදී පෙදෙස්වලින් ද කෙළින් ම ගෙන්වාගෙන සපයන්නට වූ තැන් සිට ඔහුගේ ලාබ වැඩි වූයේ තවත් කිහිප ගුණයකිනි.

හෝටලයේ මත් පැන් සැලෙහි ලිපිකාරයකු වූ පියල් සුද්දන් හත් අට දෙනෙකුන් හඳුනා ගත්තේය. ඉංගිරිසි කතාවෙහි හුරු බුහුටි ඔහු, විනීතාචාර ඇත්තෙකි. එහෙයින් ඔහු ඒ සුද්දන් හත් අට දෙනාට ඉතා ප්‍රිය වී ය. පියල්, සුද්දන් දෙදෙනකු සමඟ වැලිගමට ගොස් එහි මස් මරන්නන් දෙතුන් දෙනකුන් ද හාද කරගෙන මුහුදෙහි මසුන් ඇල්ලීම සඳහා යාත්‍රා කෙළේ ය. එතැන් සිට සුද්දන් දෙදෙන සැලකුවේ, පියල් තමන්ගේ හිත මිතුරකු ලෙසිනි. ඔවුන් දෙදෙනාගේ උදව්වෙන් පියල් බැරැක්කවලට ද තවත් ලොකු හෝටලයකට ද ඇතැම් ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා අලුත් කොන්තරාත්තු දෙකක් ලබා ගත්තේය. ඒ කොන්තරාත්තු ලැබුණු පසු පියල් ලිපිකාරකමින් අස් වූයේ ය.

ඇවුරුද්දක් ගත වන්නට පෙර පියල්, රුපියල් පන් දහසක් පමණ අරමුදලක් ඇති කොන්තරාත්කාරයෙක් වී ය. පිටකොටුවේ විශාල ගෙයක පිහිටි ඔහුගේ කන්තෝරුවෙහි එක කොටසක් පිරුණේ ආහාර ද්‍රව්‍යයන්ගෙනි. ලිපිකරුවකුව සිටි ඔහු දැන් ලිපිකරුවන් දෙතුන් දෙනෙකුගේ ද කුලිකාරයන් කිහිප දෙනකුගේ ද ස්වාමියෙකි. මුදල් සැපයීමෙහි ශූරයකු වූ පියල් ලාබෙට ගත හැකි විට එක වර රුපියල් තුන්හාර දහසක සහල් ද පිටි ද ගෙන තබා ගනියි. එසේ තබා ගන්නා සහල් සහ පිටි නිසා ඇතැම් විට ඔහුට විශාල ලාබයක් ලැබෙයි.

මෑතක සිට ක්‍රමයෙන් අලංකාරයෙන් දියුණු වන පියල්ගේ නිවසෙහි, මහ ගෙදර පවා නොදක්නා ලැබෙන විසිතුරු ඇඳ, පුටු, මේස, දැන් දක්ක හැකි ය. අලුත් පිඟන්-කෝප්ප, මල් පෝච්චි, ආදිය පියල්ගේ මව මහ පෙට්ටියක් තුළ දමා තබන නමුත් අමුත්තකු එහි යන දවසක එයින් සමහරක් එළියට එයි. සායම් ද හුනු ද ගෑමෙන් නිතර අලුත් වැඩියා කරනු ලබන ඒ ගෙය කුඩා වුව ද දැන් ගමෙහි අලුත් වෙමින් බැබළෙන ගෙවල් දෙක තුනෙන් ඉතාම හොඳ එක වෙයි. ඔහුගේ ගෙය වට කොටගෙන සුදු තාප්පයක් නැඟුණේ මීට මාස හතරකට පමණ උඩ දී ය. තාප්පය දොරටුවෙහි කණු දෙකෙහි යකඩ අසව්වලින් සවි කරන ලද ගරාදි දොර දෙකින් එකක වූ 'සිරි නිවස' යන අකුරු සහිත පිත්තල පත, උදය වරුවේ හිරු රැසින් බැබළෙන්නේ රන් පතක් ලෙසිනි.

පියල් ගමට පැමිණෙන හැම වාරයෙහි ම දිළිඳු ගැමියෝ ද ගැමි ගැහැනු ද ඔහුගේ ගෙදරට යති. ඔහුගෙන් සත පනහක් හෝ විසි පහක් හෝ නොලබා ආ පසු යන්නේ දිළිඳු නොවන ගැමියකු හෝ ගැහැනියක හෝ පමණි. එහි පැමිණෙන ඇතැම් ගැමියෝ,

Scanned by CamScanner

පියල් ගෙනෙන රට කැවිලිවලින් ටික ටික ද ලබති. පියල්ගේ මව, පියල් ගමට පැමිණෙන හැම වාරයෙහි ම රට කැවිලි බන්දේසියක් හා වුවිධ රෙද්ද ද ඔපිසරට යවයි. ඈ මේ සංග්‍රහය කරන්නේ ඇගේ පුතා මුහන්දිරම් අටවන උගුලක හසු වෙතියි යන බියෙන් බව ඔපිසර නොදන්නේ නොවේ. මුහන්දිරම් උගුලක් ඇටවූවත්, එයින් බේරීමට ඉහළ නිලධාරීන්ගේ උදව් ලැබිය හැකි තරම් තැනකට නැංගෙකි පියල්. ඒ වගක් නොදන්නා පියල්ගේ මව ඔපිසරට සංග්‍රහ කරන අතර මාතර හාමිනේට ද වෙනදටත් වඩා ගෞරව දක්වයි.

හතර වන වරට පියල් ගමට පැමිණියේ ජිනදාස ළමා හේවානන්ද බැලීමට ගොස් තුන් මසකට පමණ පසු ය. පියල් පැමිණි බව ඉව ඇල්ලීමෙන් දැනගත්තකු සේ ජේමිස් සඳුදා එළිය වැටෙත්ම 'සිරි නිවසට' පැමිණියේ ය.

''ඉස්කෝලේ මහත්තයා දකින්නත් ආසයි''යි කියමින් ජේමිස් ආලින්දයෙහි වූ හාන්සිපුටුවෙහිම වාඩි වී දිග ඇදුණේ ය. මහ ගෙදරදී හාන්සි පුටුවක වාඩි නොවන ජේමිස්, පියල්ගේ ගෙදරට පැමිණි විට නම් වාඩි ගන්නේ හොඳම හාන්සි පුටුවෙහි ය. වත් පොහොසත්කමින් හැර පෙළපතින් හා අනිත් කරුණුවලින් පියල් ද ඔහුගේ මව ද තමාට පහළයන් ලෙස ය ජේමිස් සලකන්නේ. පියල්ගේ මුත්තා එලවළු කද කරින් ගෙන යනු ජේමිස් සියැසින් දුටුවෙකි. පියල්ගේ මුත්තා තමාට වඩා පහළ පන්තියේ මිනිහකු ලෙස ජේමිස් සැලකුවේ එහෙයිනි.

පියල් සුරුට්ටු මිටියක් සහිත කුඩා වීදුරු තසිමක් ගෙනැවිත් ජේමිස් හාන්සි වුණු පුටුව ළඟ වූ කනප්පය උඩ තැබී ය. ඔහු ඒ මිටිය උනා ගත් සුරුට්ටුව කරකවා බැලී ය.

''කොළඹ සුරුට්ටුවක් බිව් කාලයක් මතක නැහැ''යි කියමින් ජේමිස් සුරුට්ටුව පත්තු කරන්නට වෑයම් කෙළේ ය. ගිනිකූරු හතරකිනුදු සුරුට්ටුව පත්තු කරගත නොහැකිවූයෙන් ඔහු මෙසේ කීය.

''ටිකක් තෙතයි''

පියල් තමා අතෙහි තිබුණු ගිනිපෙට්ටියෙන් කූරක් ගෙන ගසා ජේමිස්ගේ සුරුට්ටුව පත්තු කෙළේ ය.

''ඉස්කෝලේ මහත්තයා මේ පාර ගමට ආවේ අවුරුද්දකට පස්සේ''යි ඔහු කීවේ, කට්ට ගත් දුම පිට කිරීමෙන් පසු ය.

''නැහැ අට මාසෙකට ඉස්සර සැරයක් ආවා''

''අපට දැනගන්නට ලැබුණේ නැහැ''

''ආ දුට පස්සෙන්ද කොළඹ ගියා''

එහෙනම් ඒකයි අපට ආරංචි නුණේ. දැන් ඉතින් ගමත් ටිකක් දවස් නවතින්න ඕනැ කාලේ නෙවද?

''දැන් නම් ගම දවස් තුන හතරක්වත් නවතින්න පුළුවන් කාලයක් නෙවි.''

''ඇයි?''

''වැඩ''

''වැඩ! වෙන කාටවත් බලාගන්න කියනවා නොවැ''

''තවම ඒකට සෑහෙන කෙනෙක් නැහැ.''

''ඉස්කෝලේ මහත්තයා දැන් කරන්නේ කොන්තරාත් වැඩය කියන්නේ හැබෑ ද?''

''ඔව්''

''බොහොම වාසිය කියා අපට ආරංචියි''

''අවාසියක් නැහැ''යි කියමින් මෙතෙක් සිටගෙන කතා කළ පියල් පුටුවක වාඩි වී ය.'

''දැන් තමයි ඉස්කෝලේ මහත්තයා ගම ඉන්න ඕනැ කාලේ.''

''ඇයි?''

''ඇයි ද අහනවා. කටයුත්තක් කරගන්න හොඳ කාලේ දැන් නොවැ; කියද වයස?''

'විසි අටයි' යි කියමින් පියල් සිනාසුණේ ය. ජේමිස් පැමිණියේත් කතාව ඇරඹුවේත් මේ සන්ධියට බැසීමට බව පියල්ට නොවැටහුණු නමුදු සාලයෙහි උන් ඔහුගේ මවට වැටහිණ. සිනාවෙන් අමුතු සුන්දරත්වයක් ලැබූ පියල්ගේ මුහුණ බැලූ ජේමිස්, නුංචි නෝනා හැර වෙන කිසිම තරුණියක පියල්ට අකැමැති වෙතියි නොසිතුවේ ය.

''ඉස්කෝලේ මහත්තයාට මම පළමු වෙනි තරම් කාරණාවක් කතා කරන්න හිතාගෙන ඉන්නවා''යි ජේමිස් කීවේ, පිට කළ දුම් කට, වළාකුළු මෙන් නඟිනු බලමිනි.

''කසාද බඳින්න අදහසක් නැහැ''යි පියල් සිනා සෙමින් පිළිතුරු දුන්නේ ය.

''එහෙනම් මහණ වෙන්න ද?''

නන්ද නොලැබිය හැකි වූ නිසා පියල් අවිවාහකව ඉන්ට අදහස් කරන ලදැයි ජේමිස් සිතුවේ ය.

''නුංචි නෝනාගේ කාරණේ හරි නොගිය හින්ද ද එහෙම හිතන්නේ''යි පියල්ගෙන් පිළිතුරක් ලැබෙන්නට පෙර ජේමිස් යළිත් ඇසී ය.

"නැහැ, නැහැ, ඒක නිසා නොවෙි."

"ඉස්කෝලේ මහත්තයාට මම එයිට වැඩිය හොඳ කාරණාවක් කතා කරන්නම්. පුංචි නෝනාගේ කාරණේ උණත් මට කිව්වා නම් කොහොම හරි වැඩේ කරන්න මහන්සි ගන්න තිඋණා. ඇයි මට නොකිව්වේ?"

පියල් පිළිතුරු නුදුන්නේ ය. ජේමිස් ලවා නන්ද පිළිබඳ යෝජනාව යළිත් කරවිය හැකි ද?' යි පියල් තමා ගෙන් ම ප්‍රශ්න කෙළේ ය. ජේමිස්ගේ බස ඇසුණු විගස පියල්ගේ මව ආලින්දයට පැමිණියා ය.

"ජේමිස් අයියේ, පියල් ඔය යෝජනාව කෙරේ මගෙන් වත් අහලා නෙවි. එයාගේම ඕනෑකමට කත්තිරිනාට කියා තියෙනවා. එහෙම යෝජනාවක් සැහෙන කෙනෙකු ලවා එපාය කරවන්න."

"නැති නම" යි ජේමිස් කීවේ හිසට නඟාගත් ගර්වයෙන් වැසුණු දෙනෙත් ඇතිව ය.

කර බාගත් පියල් තමා තුළින් නැඟ එන නන්ද පිළිබඳ ආලය මැඩගැනීමට වෑයම් කළ නිසාදෝ කථා නොකෙළේ ය.

"පුංචි නෝනා පියදිගම ලොකු අප්පු ආරච්චි මහත්තයාගේ පුතාට තීන්දු වෙලා ය කියන්නේ ඇත්තද?"යි පියල්ගේ මව ජේමිස්ගෙන් විචාළා ය.

"ඔව්: ලබන මාසයේ දහ වෙනි දට මංගල්ලේ කරන්න තීන්දු කරගත්තා."

තමාගේ බස, පියල්ගේ හද දැවුරු කරන පිහියා පහරක් වෙතියි ජේමිස් සිහිනෙනුදු නොසිතුවේ ය. මීට අවුරුදු දෙකහමාරකට පමණ පෙර, කත්තිරිනාගේ බස ඇසීමෙන් පියල්ගේ හද තුළ හටගත් වේදනාව නැති වූණේ කාලය නමැති බෙහෙත නිසා ය. තරුණ වියෙහි වූ ඔහු නන්ද නිසා තමා තුළ හටගත් දැඩි ආලය මැඩ ගැනීමට තරම් අත්දැකීම ඇත්තෙක් නොවී ය. ඔහු දෙතුන් දවසක් යන තුරු ආහාර වශයෙන් ගත්තේ කිරි හෝ කිරි තේ හෝ පමණි. හද තුළින් නැඟෙන ගින්නෙන් වියලෙන හිස් මොළය ඇතිව උන් ඔහු පුරුදු ආහාර ගත්තේ ඒ ගින්න ක්‍රමයෙන් අඩු වීමෙන් හිස් මොළය යළිත් සිහිල් වුණු පසු ය. පුරුදු සත්සුන් බව ඔහු ලැබුවේ කොළඹට ගොස් තුන් හාර මසක් ගෙවුණු පසු ය. එතැන් සිට අද වන තුරු නන්ද නිසා ඔහුගේ සිත චංචල නොවී ය. නන්ද සිහි වුණු ඇතැම් විටක ඔහුගේ හද තුළ හටගත් මඳ වේදනාව සැණකින් තුනී වී ය.

නන්ද අනිකකුට විවාහ කරදෙන්නට යන බව ඇසූ විගස කාලය නැමැති සිහිල් දියෙන් තෙමීමෙන් නිවුණු ආලය නමැති ගින්න

Scanned by CamScanner

ඔහුගේ හද මැඳුරෙහි යළිත් මෙළවිණ. මේ වර ඔහුගේ හද තුළ මතු වුණු ඒ ගින්න ඊෂ්‍යාව ද සංකාව ද නගන පිඹුමෙන් හා සුසු-මෙන් ද තියුණු කෙරෙන්නකි.

"ජිනදාස මට වඩා සුදුස්සෙකු වූයේ කෙසේ ද?" යන පැනය පියල්ගේ සිතට නැඟුණේ ඔහු තුළ හටගත් ඊෂ්‍යාව නිසා ය. ජිනදාස උගත්කමින් පියල්ට ළං නොකළ හැක්කෙකි; ඇඳුමෙන් පැළඳුමෙන් තවමත් ජිනදාස ගැමියෙකි. ඉඩම්වලින් ලැබෙන මඳ ආදායමින් ඔහු අරපිරිමසාගෙන අමාරුවෙන් ජීවත් වන්නෙකි. පෙළපත වූ කලි සැලකිය යුත්තෙකැයි පියල් නොසිතයි. 'ජිනදාස පෙළපතින් තමාට වඩා ඉහළය'යන හැඟීමක් පියල් තුළ පහළ නොවූයේද එහෙයිනි.

ජිනදාසගේ පියා විදාන ආරච්චි ය; විදාන ආරච්චිගේ පියා විවාහ ලේකම් ය; විවාහ ලේකම්ගේ පියා නොතාරිස්ය. ජිනදාස ගේ පරපුර සොයමින් මෙසේ අවුරුදු සීයක් පමණ අතීතයට යන්නකුට වුව ද පහත්යයි සැලකෙන රක්ෂාවක් කළ එකකු නොලැබිය හැකිය. එහෙත් මාතර හාමිනේ අනිත් හැම කරුණුවලට වඩා මෙවැනි කරුණු සලකන්නේ කුමක් නිසාදැයි පියල්ට නොවැටහේ. මාතර හාමිනේ තමාට අකැමැති වූයේ අනිකක් නිසා නොව, මඳ කලකට පෙර තමාගේ සීයා එළවළු කද කරින් ගෙන ගොස් එළවළු විකුණා ජීවත් වූවකු නිසා ය යන හැඟීම පියල්ගේ හිසට නම් නොනැංගේ ය. තම සීයා පිළිබඳ ඒ පුවත ඔහු කුඩා කල වරකට දෙවරකට වඩා අසන ලදැයි කිව හැකි නොවේ. ඔහු උපන්නේ ද සීයා මිය ගොස් කලකට පසු ය. එහෙයින් පියල් දන්නේ තම පියා මිස සීයා නොවේ; ඔහු සිතුවේ තම පියා ගැන මිස සීයා ගැන නොවේ; මාතර හාමිනේ තම සීයාගේ වගතුග මතක් කළ බවක් පියල් නොදනියි. ඔහුගේ යෝජනාව ඉවත දැමීමට මාතර හාමිනේට තුඩු දුන් කරුණු කත්තිරිනා ඔහුට නොකී බැවිනි.

නන්ද පිළිබඳ පුවත පියල්ගේ සන්තෝෂයට හේතු විය නොහැකි බව, තලතුනා පිරිමියකු වන ජේම්ස්ට නොහැඟුණු නමුදු පියල්ගේ මවට හැඟිණ. ඈ මෙසේ කීවේ තම පුතාගේ සිත සනසන අටියෙනි.

"ජිනදාස උන්නැහේ පුංචි නෝනාට කැපෙන මිනිහෙක් නෙවි. වයසත් හුඟක් වැඩියි. අවුරුදු තිස් හය පැනලා ය කියන්නේ?"

"අවුරුදු තිස් පහයි. කේන්දර ගණනාවක් බැලුවා; හරිගියේ නැහැ. ඉස්ටැයිල් එකෙන් අඩු උණාට ජිනදාස මහත්තයා නොකැ-පෙන්න වැරැද්දක් නැහැ. පුංචි නෝනල නම් ඉස්ටැයිල් එකෙන් ටිකක් වැඩී"යි ජේම්ස් තර්ක කෙළේ ය.

Scanned by CamScanner

''ඒ මිනිසුන්ට ඉස්ටැයිල් පුරුදු උණේ අද ඊයේ ය? පරම්පරා ගණනක සිට ඒ මිනිස්සු හොඳට අඳිනව, පලඳිනව. ඒ ඇරෙන්න පුංචි නෝනලාගේ වෙන ආඩම්බරයක් නෑ නෙවද?''

ඈ මෙසේ තර්ක කෙළේ තම පුතාගේ සිත සනසන අටියෙනි. තමාගේ ඒ වචන පියල්ගේ ශෝකය දියුණු තියුණු කරන බව ඈට නොවැටහෙයි.

''අග හිඟ ඇති වෙන කොටත් ඒවා අත අරින්න බැරි එකයි ඒ ගොල්ලන්ගේ වැරැද්ද?''

පියල් නැඟිට තම කාමරයට ගොස් සයනයෙහි හාන්සි වි ය. ජේම්ස් එවි බලා, පියල් පෙනෙන තැනක නොසිටියෙන් යළිත් මෙසේ කී ය.

''මම පුංචි නෝනලයි වැරදි ටිකක් කිව්වෙ ඉස්කෝලේ මහත්තයයි හිත සනසන්න හිතාගෙන. ඒකට මොකද තාම ඉස්කෝලේ මහත්තයා පුංචි නෝනා හිතින් අහක් කරගෙන නැති හැඩයි.''

''නෑ. දූන් එයාගේ හිතේ එහෙම එකක් නැහැ''යි පියල්ගේ මව කීවේ බොරුවක් බව දැනගෙන ය. ''එයැයි ගෙට ගියේ දූන් පසුගිය ඒවා මතක් කරනවාට සතුටු නැති නිසා.''

''එයිට වැඩිය හොඳ කාරණාවක් මම ඉස්කෝලේ මහත්තයාට කතා කරන්නන්කො. ඒ ගැනු ළමයා ඉස්කෝලේ මහත්තයාට පෙන්නන්නයි මට ඕනෑ. ඒ ගැනු ළමයා දැක්කාම ඉස්කෝලෙ මහත්තයාගේ හිත ආයිත් වෙන ගැනියෙකුට යන්නේ නෑ. සල්ලි තියෙනව; ගැනු ළමයා ඉගෙනගෙනත් තියෙනව; ඉංගිරිසිත් හොඳට දන්නවා; වතුර බොන්න වගේ ඉංගිරිසි කතා කරන්න පුළුවනි ඒ ළමයාට.''

ජේම්ස්, තරුණියකට ආලය බැඳගත් දැඩි සිත් ඇති තරුණයකුගේ සිතෙහි තතු ගැන සිතීමට තරම් පොත පතින් ලත් උගැන්ම ඇත්තෙක් නොව, අත්දැකීමෙන් ලත් උගැන්ම ඇත්තෙකි. තමා ද ඉලන්දාරි කාලයෙහි එක ගැමි තරුණියකට පමණක් නොව දෙතුන් දෙනෙකුටම වරින් වර ආලය කෙළේ ය; එහෙත් අවසානයෙහි ආවාහ කරගත්තේ ඒ එකම එකියකුදු නොවේ. තමා ආලය කළ තරුණියක නිසා සමහර විටක ඔහුගේ සිතෙහි මඳ වේදනාවක් හටගත් නමුත් එය කඩියකු කෑ විට හටගත් කායික වේදනාවට වැඩි තරම් එකක් නොවී ය. ඔහු තරුණයන් හා තරුණියන් ද රාශියක් ඔවුනොවුන් හඳුන්වා දී අනතුරුව ඔවුන් අඹු සැමියන් කිරීමෙන් ලත් අත්දැකීම ද ඇත්තෙකි. ඔහු නරුමයකු වූයේ ඒ අත්දැකීම නිසා ය.

'තරුණයන්ගෙන් සියේට හැත්තෑ පස් දෙනෙක් කවර තරුණියකට වුව ද කැමැති වෙති; තරුණියන්ගෙන් සියේට අනූනව

Scanned by CamScanner

දෙනෙක් ම හිසකුත් කකුල් දෙකකුත් දෑතකුත් ඇති කවර තරුණියකුට වුව ද කැමැති වෙති'යි යනු හැඩි දැඩි තරුණයකු වූ ජේම්ස්ගේ වැටහීම ය. මවුපියන් නිසා නොවේ නම් ඕනෑම තරුණයකු ද තරුණියක ද අඹු සැමියන් සේ එක් කළ හැකි ය යනු ඔහු තරයේ එල්බ ගත් මතයන්ගෙන් එකකි. ''මම පතන තරුණිය හැර අන් කිසි තරුණියක හා විවාහ නොවෙමි''යි කලහ කළ තරුණයන් කිහිප දෙනෙක් ද ජේම්ස් නිසා අනින් තරුණියන්ගේ අත් ගත්හ. ජේම්ස් අඹු සැමියන් කළ ඔවුන්; ඔවුනොවුන් ගෙන් වෙන්ව දික්කසාද නොවූයේ ඇල්මෙන් බැඳී ජීවත් වූ නිසා ම නොව ගැමි ගැහැනුන්ගේ ඇතැම් හොඳ ගති ගුණ ද ඇබ්බැහිකම් ද නිසා ය.

ජේම්ස් නිසා විවාහ ජීවිතයට ඇතුළත් වූ ඇතැමෙක් හොර ගැහැනුන් දෙතුන් දෙන ඇත්තෙකි. එහෙත් එවැන්නකුගේ නියම බිරිඳ පවා කල් යත් ම තම සැමියාගේ බර වරද, දුසිරිත, ඉවසන්නට පුරුදු වෙයි. ඈ එසේ ඉවසන්ට පුරුදු වන්නේ දුසිරිත පිළිබඳ තියුණු හැඟීමෙන් තොර එකියක නිසා නොව ධනය හා දේපල ද පිළිබඳ නීති හා සිරිත් ද නමැති යදම්වලින් බඳිනු ලැබූවක නිසා ය. විවාහක ගමබද ස්ත්‍රිය, කෑම ඇඳීම ලබන්නේ තම සැමියා ගෙනි. කෑමටත් ඇඳීමටත් වුවමනා දේ ගැනීමටත් අනික් ආදායමක් ඈ නොලබන බැවිනි. සැමියා හැර ආපසු මවුපියන් වෙත ගිය ද ඈ ඇතැම් විට සංග්‍රහ ලබන්නේ ඇනුම්පදයෙනි.

නන්ද නොලත් පියල් අවිවාහකයකුව සිටිතියි ජේම්ස් විශ්වාස නොකෙළේ ය. කඩවුණු ආලය නිසා අනික් තරුණියක නොපතන බව කී නමුදු තුන් හාර මසක් ගෙවෙන්ට පෙර, ජේම්ස් සොයා දුන් තරුණියන් සමඟ විවාහ වුණු තරුණයෝ හත් අට දෙනෙකි.

''ඉස්කෝලේ මහත්තයාගේ කේන්දරේ මට දෙන්න. මම වැඩේ කරන්නම්''යි හාන්සි පුටුවෙන් නැඟුණු ජේම්ස් කී ය.

''හොඳයි, හොඳයි, ආයිත් ආ දවසක ගෙනියන්න මම කේන්-දරේ බලා තියන්නම්.''

''කේන්දරේ බලා තියන්න. නව සුමාන දෙහෙකින් මම ආයින් එනවා මේ පැත්තේ''යි කියමින් ජේම්ස් නික්ම ගියේ ය.

පියල් පසු ද උදේම නැඟිට කොළඹ යනු සඳහා ඇඳ පැළඳ ගත්තේ ය.

''අද යන්නද? හෙට නෙවද යන්න හිටියේ? හෙට යන්න බැරිය, නැවතියන්''යි මව පියල්ට කීවා ය.

''බෑ අම්මා, වැඩකුත් නෑ, ඉන්නත් කම්මැලියි. කොළඹ කවද ගියත් වැඩ තියෙනවා කරන්න. අද ගියා ම ඒ වැඩ පහසු වෙනවා''යි

Scanned by CamScanner

කියමින් පියල් මේසය ළඟට ගොස් පුටුවෙහි වාඩිගෙන හකුරු කැබැල්ලකුත් සමඟ ආප්ප දෙකක් ද කෙසෙල් ගෙඩියක් ද කා තේ කෝප්පයක් බීවේ ය.

"මම යනවා අම්මා; අද ගියාම මට මගේ වැඩ කර ගන්න පහසු යි."

"දැන් ඉතින් ඉස්සර අදහස් මතක නැතිකරන්න බලාපන්."

"නෑ අම්මා, මගේ හිතේ දැන් මොකුත් නෑ. මට හිර කතා කරන්න ජේම්ස්ට කියන්න එපා. ඒ මිනිසා හිතාගෙන ඉන්නේ ඉක්මනින් කසාදයක් නොබැන්දොත් මට පිස්සු හැදේවි කියා!" යි පැවසූ පියල් සිනාසුණේ ය.

"උඹෙන් නාහා මම හිර කතා කරන්න කියනවා ද? කොයි හැටි උණත් ආයිත් ඉක්මනට ගමට ඇවිත් යන්න බලාපන්."

"හොඳයි එන්න බැරිය" යි කියමින් ගෙයින් මිදුලට බැස්ස පියල්, එහි තිබුණු කුලී කරත්තයෙහි නැංගේ ය. එකෙනෙහි ම ගොනාගේ කරෙහි බඳින ලද ගිගිරි හඬ ද ගලක් උඩින් ගිය කරත්ත රෝදයක් නැඟූ හඬ ද පියල්ගේ මවට ඇසිණි. කරත්ත රෝදය ගලක් උඩින් යාමත් එයින් නැඟුණු හඬත් පියල්ගේ මව සැලකුවේ අසුබ ලකුණු ලෙසිනි. ඈත ගසක සිටි කැරලකු නැඟූ හඬ නිසා ඇගේ බිය වැඩි වී ය.

Scanned by CamScanner

# 7 වන පරිච්ඡේදය

නන්ද ජිනදසට විවාහ කරදී ගමසකට පසු කයිසාරු වත්තේ මුහන්දිරම් මළේ ය. ගැමියන් හා වෙදුන් ද ඇවිලිල්ල යන නමින් හඳුන්වන ලෙඩින් ඔහු මළේ හිටි හැටියේ ය. මෑතදී මුහන්දිරම්ට හාර මසක් ඇතුළත තුන් වරක් මේ ඇවිලිල්ල වැළඳිණ. ඒ හැම වාරයෙහිම මාතර හාමිනේ හා දුව ද සිද්ධාර්ත තෛලය ඔහුගේ පපුවේ ගා අත ගා පපුව තැවූහ. ඔහු සුව ලැබුවේ ය. කසායක් නියම කළ වෙද ද මුහන්දිරම්ගේ ඇවිලිල්ල 'ආම වාතයක් වෙන්න ඇති; ඒක නිකම් ඇරිලා යාවි' යි කී ය. හතර වන වර ඇවිලිල්ල නැඟුණ විට මාතර හාමිනේ හා අනුලා ද සිරිත් පරිදි තෙල් ගා මුහන්දිරම්ගේ පපුව අත ගෑහ. බුලත් කොළය රත් කොට තැවී-මෙන් ද ඇවිලිල්ල අඩු නොවූයෙන් ඔවුහු රත් කරන ලද වැලි පොට්ටනියෙන් තැවූවෝ ය. හිටි හැටියේ මුහන්දිරම්ට හුස්ම ගැනීම අමාරු වූයෙන් මාතර හාමිනේ ද අනුලා ද බියපත් වූහ. වෙදකු කැඳවාගෙන ඒමට දුවන සාද දුටු ගැමියෝ වැල නොකඩා දිවැවිත් මහ ගෙදර රැස් වූහ. ගැමියන් දෙතුන් දෙනෙක් යකැදුරන් ද තවත් දෙතුන් දෙනෙක් වෙදුන් ද සොයා දුවන්නට වූහ. එහෙත් වෙදකු හෝ යකැදුරකු හෝ මහ ගෙදරට ළඟා වීමට පෙර මුහන්-දිරම් මළේ ය.

ශෝකයෙන් පහරන ලද මාතර හාමිනේ ද දුව ද හඬත්ම එහි රැස්ව උන් ගැමි ගැහැණු ද එක විට විලාප නඟන්නට වූහ. ඔවුන්-ගේ හැඬිම මැඩගෙන නැඟුණේ කත්තිරිනා හැඬූ හඬ ය. මරණයක් නිසා එක තැන රැස්වූ ගැමියන්, මෙතරම් ශෝකජනක හඬක් මීට පෙර නොනඟන ලදැයි මුහන්දිරම්ගේ මළකඳ පිළිබඳ අවමංගල-යෙන් පසු ඇතැම් ගැමියෙක් කී ය.

තිස්ස, මහ ගෙදරට පැමිණියේ පියා මැරී වරුවක් ගත වූ පසු ය. පියාගේ මළ කඳ දැකීමෙන් හටගත් ශෝකයටත් බියටත් පාළුව පිළිබඳ හැඟීමටත් වැඩි ශෝකයක්, බියක් හා පාළුව පිළිබඳ හැඟීමක්, තම මව ද සහෝදරියන් දෙදෙනා ද නෑයන් ද නඟන විලාපය ඇසූ, ශෝකයෙන් පරිපීඩිත ඔවුන්ගේ මුහුණ දුටු, තිස්ස තුළ හටගත්තේ ය. ඔහු ද තම සහෝදරියන් සමඟ එක් ව විලාප නඟමින් හැඬී ය. ඔහුගේ හැඬීම නැවතුණේ පියාගේ මළ කඳ වැළලීමෙන් පසු ය.

මුහන්දිරම්ට වැලඳුණු රෝගය මෙකල නම් හැඳින්වෙන්නේ හෘදයාබාධය නොහොත් හෘදය ඇණහිටීම යන නමිනි.



Scanned by CamScanner

තිස්ස දැන් දහඅට ඇවිරිදි තරුණයෙකි. ඉංගිරිසි අට වන පන්තියෙන් මෙ වර සමර්ථවූ ඔහු ඉගෙනීමෙහි ශූරයකු වූ නමුදු වැඩි මහන්සියෙන් උගන්නෙක් නොවී ය. මෑතක සිට ඔහුගේ උගැන්ම සඳහා පියා වියදම් කෙළේ ඉතා දුක සේ ය. ඇතැම් විට ඔහුගේ ඉස්කෝල කාසි ගෙවන ලද්දේ සහෝදරියකගේ රන් අබරණ උකස් කොට මුදල් ගැනීමෙනි. උකස් කරන ලද බඩු බේරාගෙන ඊළඟ වාරයෙහි ඉස්කෝලෙ කාසි හා බෝඩින් ගාස්තු ද ගෙවන ලද්දේ සුළු ඉඩම් කොටසක් අවුරුදු පහකට බදු දී මුදල් ගැනීමෙනි.

වැඩි මහන්සියකින් පොතපත පාඩම් නොකළ නමුදු තිස්ස හැම වාරයෙහි ම තම පන්තියේ පළමුවැන්නා හෝ දෙවැන්නා හෝ වී ය; කුඩා කලම කෙළිසෙල්ලමට හිත ගිය ඔහුගේ ඒ ආශාව ද අඩු නොවී ය. ඔහු උගැන්ම සඳහා වඩා වෙහෙස නොගත්තේ කෙළි සෙල්ලමින් වෙහෙසුණු බැවිනි. පන්තියෙහි දෙවැනි තැනට වඩා පහළ තැනක් නොලැබූ ඔහු වැරවැයමෙන් උගැන්මට නොසිතුවේ ය. අනික් ළමයින් පහසුවෙන් පරාජය කළ හැකි විට වැරවැයම් කරන්නේ කුමකට ද? එහෙයින් කෙළිසෙල්ලමට පමණක් නොව, ඇතැම් කලාවකට ද ඇදුණු සිත ඇති ඔහු පොත පත පාඩම් කිරීමට ආයාසයක් නොකෙළේ ය.

ඔහු නැවති උන් බෝඩිම අසල ගෙදරක චිත්‍රකාරයෙක් වෙසෙයි. සිය වැයමින් ඒ චිත්‍රකාරයා සිත්තම් අඳිනු බලා සිටීමෙන් තිස්ස කෙළි සෙල්ලමින් පවා නොලත් ප්‍රීතියක් ලැබී ය. පාසැලින් ආ පසු ගොස් පොත් පාඩම් කිරීම වෙනුවට ඇතැම් විට සිත්තම් ඇඳීමට පටන් ගත් ඔහු ටික කලකින් අසල ගෙදර උන් චිත්‍රකාරයාගේ සිත්තම් අනුකරණයට උගත්තේ ය. පොත් පාඩම් කිරීමට වුව ද අන් කිසි කලාවක් උගැන්මට වුවද හුරු-බුහුටි කම ඇති තිස්සට මඟ පෙන්වීමට කිසිවෙක් නොවී ය.

පියා මැරී හමසක් පමණ ගෙවුණු නමුදු තිස්ස පාසැලට යළිත් උගැන්ම සඳහා නොගියේ ය. ගමෙහි තරුණයන් සමඟ කෙළි සෙල්ලමට වැටුණු ඔහු, යළිත් බෝඩිමට යාමට නොසිතුවේ ය. මාතර හාමිනේ ඔහු බෝඩිමට යැවීමට වැරවැයම නොකෙළේ අගහිඟ මඟ හැරුණු වහාම යළිත් යවන අදහසිනි.

ගමෙහි තරුණයන් සමඟ කෙළි-සෙල්ලමට පුරුදු වුණු තිස්සගේ චරිතය ද ක්‍රමයෙන් වෙනස් වෙයි. ඔහු යහළුවන් සමඟ ඇවිදීමට ගොස් ගෙදර එන්නේ හවස් වරුවේය; ඇතැම් විට එන්නේ රෑ අටට හෝ නවයට හෝ පමණ ය. මව ද සහෝදරිය ද ප්‍රශ්න කරන බැවින්, ඔහු කෙසේ හරි රෑ අටට පෙර ගෙදර ඒමට වැයම් කරයි.

කිසි විටක මත් පැන් නොබිවූ ඔහු වරක් යහළුවන්ගේ වධය ද පොරය ද නිසා අරක්කු ටිකක් බීවේ ය. මෙතෙක් මත්පැන් කටට

Scanned by CamScanner

නොගත් ඔහු, මෙතැන් සිට ඇතැම් යහළුවන්ගේ සරදමට ඉලක්කයක් වී ය.

"තිස්ස අද අරක්කු බිව් වග ගෙදර ගියාම අම්මාත් අක්කාත් දැනගනී"යි බලදූස කී ය.

"ඒ කොහොම ද? මම වෙරි වෙන්න බිවයැ?"යි තිස්ස ඇසීය.

"ගඳ ගහනව! කන්න කොත්තමල්ලි ටිකක්; නැත්නම් සත්තකයි අම්මත් අක්කත් දැනගන්නවාට".

තවත් යාළුවෙක් කොත්තමල්ලි මිටක් ගෙනැවිත් තිස්සට දුන්නේ ය. තිස්ස කොත්තමල්ලි ටිකක් ගෙන ටිකා ඉස්ම ගිල හපය ඉවත දැම්මේ ය.

"දැනුත් ගඳද?" යි අසා, අනතුරුව තිස්ස කටින් හුස්ම පිට කෙළේ ය.

"දැන් බොහොම පංකාදුයි; කොත්තමල්ලි පුස්ඹ හැර මොකුත් දැනගන්න බැහැ"යි බලදූස කීය.

"බලදූසත් අද ටිකක් බොන්න ඕනෑ"යි තිස්ස යෝජනා කෙළේ ය. "බීලා කොත්තමල්ලි ටිකක් කන්න."

"ඔහෝ! තිස්ස අර නරියා කළ වැඩේ නෙව කරන්න හදන්නෙ! අපට බැහැ; මම කවදාවත් බොන්නේ නැහැයි දිව්රා තියෙනවා."

"ඔව් අන්න හරි! අද බලදූසත් ටිකක් බොන්න ඕනෑ"යි විජය, තිස්සගේ යෝජනාව ස්ථිර කෙළේ ය.

"කාට ද දිවුරුම් දුන්නේ?"යි තිස්ස ප්‍රශ්න කෙළේ ය.

"කාටවත් නෙවි මට"

"ඒ බොරු"

"බොරු නෙවි. තිස්ස මෙන්න මේ කොත්තමල්ලි ටිකත් කන්න. අම්මත් අක්කවත් දැන ගත්තොත් මටත් විසුමක් වෙන්නේ නැහැ. මම හින්දයි තිස්සට මේ මෙරෙන්ද කන්න එන්න ඉඩ දෙන්නේ."

තිස්ස ද යාළුවෝ ද එදින දැල්කාරයකු ලවා නදියෙන් අල්ලාගත් වෙක්කුන් උයවා මයියොක්කා ද සමග කෑහ. තිස්ස එදින ගෙදර ගියේ රෑ දහයට ය.

පසු ද හවස තිස්ස හමු වීමට මහ ගෙදරට ගිය බලදූස මාතර හාමිනේ ද අනුලා ද ඉදිරියෙහිදීම තිස්සට සරදම් කෙළේ ය.

"මාතර හාමිනේ, ඊයේ තිස්ස කීයට ද ගෙදර ආවේ"යි බලදූස ඇසී ය.

Scanned by CamScanner

''ඊ දහයට විතර. බලදාසත් එක්ක මෙරෙන්දයක් කැවයි කිව් නිසා මම එයාට මොකුත් කීවේ නැහැ. මීට පස්සේ ඔහොම ඒවාට යන්න එපයි මම එයාට තරවටු කරා''.

''මෙරෙන්ද කෑවා විතරක් නොවි!'' යි කියමින් බලදාස තිස්ස දෙස බැලී ය.

බියෙන් ද ලජ්ජාවෙන් ද මිරිකෙන තිස්ස තරහයෙන් මෙසේ කීය.

''බලදාස ඔනෑ නැති බොරු කියන්න එපා. අම්මා විශ්වාස කරාවි''

''මොනවද වෙන කෑවේ?'' යි කුතුහල වූ හාමිනේ ඇසුවා ය.

''කොත්තමල්ලි!''

''කොත්තමල්ලි කෑවා! ඇයි ඒ බඩේ ගායක් හැදිල ද?''

''ඔව්'' යි පිළිතුරු දුන් බලදාස තිස්ස දෙස බලා ඉහි මැරුවේ ය.

''මම දන්නවා, තිස්ස මේ පාර නැති අසනීප හද ගන්නවා, ඔය පුරුදු නැති කෑම කාලා; තවත් යන්නට එපා ඕවාට.''

මාතර හාමිනේ අනතුරුව බලදාස දෙස බලා මෙසේ කීවේ මදක් තරහයෙනි.

''බලදාස, තිස්ස තවත් ඔය වගේ කාංඩවලට එක්ක යන්න එපා. එහෙම එක්ක යනවා නම් මම එයාට බලදාස එක්ක උණත් ඇවිදින්න යන්න දෙන්නේ නැහැ.''

''නැහැ; අපි තවත් ඊ මෙරෙන්ද කන්න යන්නේ නැහැ''යි කියමින් බලදාස තිස්ස සමඟ මහ ගෙදරින් පිටත්ව ගොස් ගම් සබා පාරට බැස්සේ ය.

''බලදාස හැබෑ මිනිහෙක් නෙවැ!''

''ඇයි?''

''මම අරක්කු බිව් එක අම්මාට කියන්න නෙව ද හැදුවේ? කිව්ව නම් සෙල්ලමක් නෙවි.''

''මම එහෙමත් කියනවාද? මම මුලදීම හිතුවේ කොලොප්පමක් කරලා තිස්ස ටිකක් බය කරන්න.''

''මම හිතුවේ අරක්කු බිව් එක කියන්න යනවා ය කියා.''

''කිව්ව නම් තිස්සට වඩා බැණුම් අහන්න වෙන්නේ –මට''

බලදාසත් තිස්සත් එදින සවස ගියේ කත්තිරිනාගේ ගෙදරට ය. ලස්සණ ලමිස්සියක මෙන්, අහර-දහර කාරියක ද වන ලයිසා දැකීමට පමණක් නොව, ඇ සමඟ කතා බහ කිරීමට ද බලදාස කත්තිරිනාගේ ගෙදරට යන්නට පටන් ගත්තේ, ලයිසාගේ අසනීප යෙන් පසු ය. විවාහ ලේකම්ගේ පුතා වන බලදාස, එහි එන්නේ

Scanned by CamScanner

තමා හා කතා බහ කිරීමට නොව ලයිසා දැකීමට හා ඇ
හා කතාබහ කිරීමට ද බව කත්තිරිනා දනියි. එහෙයින් ඔහුගේ
පැමිණීම ඇ ඉවසුවේ කැමැත්තෙන්ම නොවේ. ගමේ ඉහළ
පවුලක තරුණයකුගේ සිත රිදවීමෙන් ඔහු කෝප කිරීමට ද ඇ
කැමැති නොවූවා ය. කත්තිරිනාගේ නිවෙසට ගිය විට ලයිසා හා
කතාබහ කිරීමට බලදසට අවස්ථාවක් නොලැබෙන්නේ පුංචප්පු
ගෙදර සිටින වේලාවක පමණි. පියා ගෙදර සිටින විට ලයිසා
ඔහු හා කතාබහ කිරීමට නොඑළඹෙතත් කත්තිරිනා සිටිය දී නම්
එළඹෙයි. ඇතැම් විට කත්තිරිනා යම් කිසි කාරියක් සඳහා මඳ
වේලාවකට ඉවතට ගිය විට ලයිසාට විහිළු–තහළු කිරීමට ද අවස්-
ථාවක් බලදස ලබයි. බලදස කත්තිරිනාගේ ගෙදරට යන්නේ
මේ නිසාම නොවේ. කථාවෙහි හුරු බුහුටි කත්තිරිනා සමග
ගමේ ඕපාදූප දෙඩීමට ද ඔහු ඉතා කැමැත්තේ ය.

තිස්ස බලදස සමග කත්තිරිනාගේ ගෙදරට ගිය තුන් වන වතාව
මේ ය. කත්තිරිනා නම් තිසස්ට සැලකුවේ තම දරුවකුට මෙන්
ආදරයෙන් ද මාතර හාමිනේගේ දරුවකුට මෙන් ගෞරවයෙන් ද
වේ. බලදස සමග ඇවිදීමෙන් තිස්ස ද චරිතයෙන් පිරිහෙතියි ඇ
ඇතැම් විට සිතුවා ය.

තිස්ස තවම තරුණියන් ගැන සිතන්නේ, පාසැල් දරුවකු ලෙසිනි.
තිස්ස තවම තරුණියන් ගැන සිතන්නේ, පාසැල් දරුවකු ලෙසිනි.
තරුණියන් හා හුදෙකලාව කතාබහ කිරීමට ඔහු විළිබිය ඇත්තෙකි.
තරුණියක නිසා ඔහු තුළ මේ තාක් ආලයට සමකළ හැකි හැඟීමක්
හට නොගත්තේ ය. පාසැලට යන වියෙහි වූ ගෑනු ළමයකු ගැන
සිතන්නාක් මෙනි ඔහු තවමත් තරුණියන් ගැන සිතන්නේ.
ආලය බැඳ ගන්නා අදහසින් තරුණියක ගැන සිතීම නම් තවමත්
ඔහුට ලජ්ජාවට කරුණකි. තරුණියක කිසි විටක තමාට ආලය
කරතියි තිස්ස නොසිතුවේය. ගැහැනියක ආලය කරන්නේ තමාට
වඩා ලොකු බලදසගේ වයසෙහි වූ හෝ ඔහුගේ වයස ඉක්මවූ
හෝ, උඩු තොලෙහි රැවුල ද ඇති මිනිසුන්ට ය යන හැඟීමක් ඔහු
තුළ වූ බැවිනි. එහෙයින් ගැහැනුන් අරබයා ඔහු තුළ පැවැත්තේ,
උන් තමාගේ වියෙහි වූවන් නොසලකන, එකම මිනිහකුට හැර
අනික් කිසිවකුට ආලය නොකරන, සීතාවන් ලෙසිනි. ගිහන
තරුණයකුට පෙම් බැඳගත් තරුණියක, අනතුරුව රාජ කුමාරයකුට
වුව ද කැමති නොවෙතියි දැක්වෙන බොළඳ කථා වස්තුව ඔහුට
ප්‍රත්‍යක්ෂ සත්‍යයකි.

බලදස කත්තිරිනාගේ ගෙදරට යන්නේ ඔහු ලයිසාට තම පණ-
ටත් වඩා ආලය කරන බැවිනියි තිස්ස සිතුවේ ය. ලයිසා බලදස
හැර අනිකකු දෙස බැලීමට පවා කැමැති වෙතියි තිස්ස සිහිනෙනුදු
නොසිතුවේ ය. ඔහු පළමු වතාවේ කත්තිරිනාගේ ගෙදරට ගොස්

Scanned by CamScanner

බලදූස හා ලයිසා හා සෙළි කවට බස් ද ඇතැම් විට තමාට නොතේරෙන තේරවිලි වැනි කියුම් ද කියනු, ගොළුවකු සේ අසා ගෙන උන්නේ ය. ලයිසාගේ මුහුණ බැලීම පවා නොමනාය යනු තිස්සගේ හැඟීම වී ය. බලදූසට හැර අනිකකුට ආලය නොකරන ලයිසා, තමා ආසාවෙන් ඇගේ මුහුණ බැලුවොත් තරහ වෙතියි ඔහු සිතුවේ ය. උඩු තොලෙහි රැවුල හෙවන වියට පැමිණිය ද තමාට තරුණියක ආලය කරතියි තිස්ස නොසිතුවේ, තරුණියක කැමැති වන රූ සපුවක් තමාට නැතැයි යන හැඟීමක් ඇති බැවිනි. බලදූසටත් වඩා කදිම මුහුණක් ඇති තිස්ස එසේ සිතුවේ, ඔහු ඉතාම සුකුමාර මතික තරුණයකු වූ බැවිනැයි හැඟේ.

අවලස්සණ තරුණයකුට මහත් සේ පෙම් බැඳගත් රුවැති තරුණියක පිළිබඳ කතාවක් ඇසූ විටක තිස්සගේ හද තුළ හටගත්තේ රහස් සන්තෝෂයකි. ගැහැනුන් ගැන සිතන විට ඔහුට මතක් වන්නේ තම මව ය. ඇතැම් විට සහෝදරියකි; එහෙයින් ඔහු තුළ නිතැතින්ම ගැහැනුන් නිසා තවම හටගන්නේ ගෞරවයකි; ඇතැම් විට බියකි; ලජ්ජාවකි.

''අංගොනෝනගෙ දූ කසාද බැඳලා තුන් දවසින් මහත්මයා එක්ක තරහ වෙලා ගෙදර ආවයි කියන්නේ හැබෑ ද?'' යි ගමේ අලුත් ඕපාදූප අසනු රිසි වූ බලදූස ඇසී ය.''

''මහත්තයා මෙතෙනට ආවොත් මම ඔක්කොම සේදි කියන්නම්''යි ආලින්දයේ බංකුවක වාඩි වී බුලත් සපමින් උන් කත්තිරිනා කීවා ය.

සාලයෙහි ඇඳෙක එක් කෙළවරක හාන්සි වී උන් බලදූස නැඟී ආලින්දයට ගොස් පොඩි පුටුවක් ඇදගෙන කත්තිරිනා ළඟින් ම වාඩි වී ය.

''අංගොනෝනගෙ දූ රෑට පුරුෂයා එන කොට හැංගෙනවාය කියනව නොවැ!''යි කත්තිරිනා බලදූසගේ කනට කට ළං කොට කොඳුරත්ම ඉස්තෝප්පුවේ උන් ලයිසා සාලයට ගියා ය. බලදූසත් තමාත් ගමේ ඕපාදූප දොඩන විට ඇසෙන තෙක් මානයක ලයිසා සිටිනු දැකීමට කත්තිරිනා අකැමැති ය.

''මොනවා! ඇත්තද?''

''ඔව්-වදේ!-පුරුෂයා ළඟට එනවාය කියා ඒ දරිච්චි බයේ ගෙදර ඇවිල්ලා තියෙනවා!''

''එහෙනම් පිංගුත්තරයාගෙ කතාවේ අනික් පැත්ත නෙව!''

''ඔව්; ඔව්-අන්න හරි! කුමාරිකාව ළඟට ආ විට පිංගුත්තරයා බැහැලා ඇඳ යටට වෙලා නිදාගත්තා. මේක කුමාරයා යන කොට කුමාරි හැංගෙන එකයි!''

Scanned by CamScanner

''මනමාලි එහෙම හැංගෙන්නේ වෙන කව්දෝ මිනිහෙක් කොඩිවිනයක් කරපු නිසායයි මනමාලියගේ අම්මා කියනවා.''

''තොවිල් කරවා කොඩිවින කප්පවන්න යනවා ගානව. අංගො නෝනලයි ගෙදර ලබන සුමානේ ලොකු තොවිලයක්.''

''එහෙනම් හොඳ නැටුම් ටිකක් බලන්න පුළුවනි. තිස්සලාගේ අක්කාගේ ලෙඩේට කෙරෙවූ තොවිල්වලට පස්සේ හොඳ තොවිල-යක් බලන්න ලැබුණේ නැහැ.''

''ඇයි එහෙම කියන්නේ? රට යකුමක් සන්නි යකුමක් නොනැ-ටන සුමානයක් පහුවන්නේ කලාතුරකින්.''

''රට යකුම් බලා දැන් මට තිත්ත වෙලා''යි කියමින් බලදූස කත්තිරිනා දුන් බුලත්විට ගෙන සපා ලේ පැල්ලමක් වැනි පැල්ල-මක් මිදුලෙහි ඇන්දේ ය.

සාලයට පිවිසි ලයිසා කාමරයට ගියේ ඇදෙහි අනික් කෙළව-රෙහි වාඩි වී උන් තිස්සගේ අත ද මිරිකාගෙන ය. ලයිසා සිතාම තමාගේ අත මිරිකාගෙන ගෙට ගිය බව දනිතත්, ඈ වැනි රුවැති තරුණියක තමාට ආලය කරතියි තිස්ස නොසිතයි. ලයිසාගේ අත වැරදීමකින් තමාගේ අතෙහි හැපෙන්නට ඇතැයි ද තමා තුළ ඇති ආශාව නිසා අත මිරිකුවා සේ හැඟිණැයි ද සිතීමට ඔහු වෑයම් කෙළේ එහෙයිනි. එහෙත් කාමරයට ගිය ලයිසා ඉඳ හිට තමා වෙතට හෙලන බැල්මත්, කට කොනට නඟන සිනාවත් නිසා තිස්ස 'ලයිසා මගේ අත මිරිකුවාම'යි යන තීරණයට බැසගත්තේ ය.

ලයිසාගේ මුදු මොළොක් ඇඟිලිවලට හසුවීමෙන් සිහිල්වුණු තැනින් ඇතුළු වුණාක් මෙන්, අපූරු හැඟීමක් ඔහුගේ සිත කය පුරා පැතිරෙන්ට වී ය. ලයිසාගේ අත ඇල්ලීමටත් ඇගේ මුහුණ බැලීමටත් ඔහු තුළ හටගත්තේ මහත් ආශාවකි. එහෙයින් ඔහුද වරින් වර ලයිසා දෙස බැලී ය. ලයිසා එක වරක් බලා අනික් වර බලන්ට පෙර, තිස්ස දෙතුන් වරක් ඈ දෙස බලයි. තිස්ස එසේ කරන්නේ ආලින්දයෙහි වාඩි වී ඕපාදූප දොඩන දෙදෙනාට තමා නොපෙනෙන බැවිනි.

''තිස්ස මහත්තයා අපේ ගෙදරට තනියම එන්නෙ නැත්තේ මන්ද?''යි කාමරයේ දොරටුව ළඟට පැමිණි ලයිසා විචාළා ය.

''බලදූස මහත්තයා එන හින්ද ද එන්නේ?''යි තිස්ස ගෙන් පිළිතුරක් නොලත් බැවින් ලයිසා යළිත් අසමින් තම දකුණු අත ඇඳේ විට්ටම උඩ තැබුවා ය. තිස්ස තම අත ලයිසාගේ අතේ හැපෙන තරම් ළං කළ නමුත් ඈ අත ඉවතට නොගත්තා ය.

Scanned by CamScanner

''පුරුදු නැති නිසා තනියම එන්නේ නැහැ''යි තිස්ස අමාරුවෙන් කී ය.

''දැන් තුන් ගමනක් ආවා නෙවැ.''

''ඒ බලදසත් එක්ක.''

''එයින් පුරුදුවුණා නෙව මෙහාට එන්න.''

''තව ටිකක් දවස් ගියාම තනියම එනවා. මම විතරක් එනවාට බලදස කැමති වෙන එකක් නැහැ''යි කියමින් තිස්ස ලයිසාගේ මුහුණ බැලුවේ ය.

''අකමැති වෙන්නේ නැහැ.''

''දන්නේ කොහොම ද?''

''කැමැති නූනත් මොක ද?''

''එතකොට එයා තරහ වෙයි.''

''තරහ උනාම මොකද? අපි මහත්තයලා අඳුනන්නේ බලදස මහත්තයලට ඉස්සර නෙව.''

''බලදස මහත්තයාත් තනියම එනවා නම් ලයිසා කැමති ද?''

''නැහැ'' යි කියමින් ලයිසා සිනාසුණා ය.

''එහෙනම් බලදස මහත්තයා එන්නේ මොකට ද?''

''අම්මා එක්ක කතා කර කර ඉන්න වෙන්න ඇති.''

''නැහැ, ලයිසා එක්ක කතා කරන්න''යි තිස්ස කීවේ ය.

''බලදස මහත්තයා කතා කරන නිසා මමත් කතා කරනවා''

''හවස් උණා තිස්ස, ඉතින් යමු''යි ඔපා දූප කතාව කෙළවර කොට සාලයට පිවිසි බලදස යෝජනා කළේය. හුදෙකලාව ලයිසා සමග කළ කතාබහ නවතන්නට වීම තිස්සට සන්තෝෂයක් නොවී ය.

''මොනවද ලයිසා කියන්නේ?''යි බලදස තිස්ස ගෙන් ඇසුවේ ලයිසා දෙස බලමිනි. ලයිසා බලදස දෙස ඇස් කොනින් බලා, හැට්ට කර හරිගැස්සුවා ය.

''තිස්ස මහත්තයා උපාසකයෙක්''යි කියමින් ලයිසා සිනා-සුණා ය.

''උපාසක බලල්ලු තමයි මීයා අල්ලන්නේ! ඉතින් යං තිස්ස''යි කියමින් බලදස තිස්සගේ උරහිසෙහි අත තැබී ය.

''අනේ නැහැ, තිස්ස මහත්තයා එහෙම කෙනෙක් නෙවි.''

ලයිසා මෙවැනි කියුම් කියතියි තිස්ස නොසිතුවේ ය. තිස්ස සිතන්නේ එක් තරුණියකු හැර අන් තරුණියන් දෙස බැලීමට

Scanned by CamScanner

පවා අකැමැති තරුණියන් ගැන ය. තරුණියක හා තරුණයකු ද කතාබහ කළ යුත්තේ හුදකලාව ය. ඔවුන් කරන කතාබහ පිළිබඳ කිසිවක් අනිකෙකු ඉදිරියෙහි නොකිව යුතු ය. එහෙයිනි, ලයිසා බලදසට කී බස් නිසා තිස්සගේ සිතෙහි අසන්තෝෂයක් හටගත්තේ.

වෙනද මෙන් නොව, ලයිසා තමාගේ අත මිරිකීමත් වරින් වර තමා දෙස බැලීමත් නිසා තිස්සගේ සිතෙහි පිබිදුණේ අසංකීර්ණ රාග චේතනාවක් නොව, රුවැති ස්ත්‍රීන් නිසා දිවි පුදන්නට වුව ද සිතවන, කවියට නැඟිය යුතු, සංකීර්ණ හැඟීමකි. තමා තුළ පිබිදුණු ඒ නිර්මල ආලයට ලයිසා සුදුසු තරුණියක් ය යි ඔහු නොසිතුවේ ය. ඔහු තුළ හටගත්තේ ලයිසා එකම තරුණයකුට ආලය කරන සුවිනීත කුමරියක වනු දැකීමේ ආශාවකි. තරුණයන් දෙතුන් දෙනෙකුන් සමඟ කෙළි කවට බස් තෙපලමින් ඔවුන් කාටත් ආලය කිරීමෙහි වරද ලයිසාට අවබෝධ කළ හැකි නම් කොතරම් මැනැවි ද?

තිස්ස එදින රෑ නින්දට ගොස් ද සිතුවේ ලයිසා ගැන ය; රුවැති තරුණියක විපතින් බේරාගැනීමට ශක්තිය ඇති නිර්භය වීරයකු විය හැකි නම් කොතරම් අගනේ ද? තරුණියන්ගේ සිත් ඇදෙන සේ ගමන් කළ යුතු ය; කතාබහ කළ යුතු ය; හැඳ පැළඳ ගත යුතු ය. තරුණියකගේ සිත ඇදෙන තරම් සුන්දර මුහුණක් තමාට ඇත්තේ ද? රැය නොවී නම් තිස්ස ඇදෙන් නැඟී යන්නේ කැඩපත ළඟට ය. තිස්ස නිදන්ට වැයම් කෙළේ තමා නිදන සැටි දුටු තරුණියක ලවා තමා වීරයෙකැයි සිතවන සේ කකුල් ද අත් ද හිස ද ඒ මේ අතට හරවමිනි.

ලයිසා නිසා තිස්ස තුළ හටගත්තේ සීතාව වැනි නිර්මල රුවැති තරුණියකට පෙම් බැඳගැනීමේ ආශාවක් පමණි. ඒ හැඟීම ඔහුගේ සිත තවන්නක් නොව සනසන්නක් වී ය. දවස් හතක් අටක් පමණ ඉකුත් වූ විට ඔහුට ලයිසා අමතක වී ය. ලයිසා තමා සමඟ මෙන් බලදස සමඟ ද වෙනද මෙන්ම කෙළිකවට තෙපුල් තෙපලමින් අහරදහර පාන බැවිනි. ලයිසා පිළිබඳ හැඟීම ඔහුගේ සිතින් අතුරුදහන් වූයේ දවසක බලදස කියූ පුවතක් ඇසීමෙනි. රැයෙහි කත්තිරිනා නිදගත් පසු, බලදස ගොස් ගෙයි කවුළුව ළඟට වී ලයිසා සමඟ පැයක් දෙකක් පමණ කතාබහ කෙළේ ය.

''එද පුංචි අප්පු ගෙදර උන්නේ නැහැ''යි යටොක්ත පුවක කී බලදස පැවැසී ය. බලදස කියූ පුවත ඇසූ තිස්ස කලකිරිණි.

''ලයිසාගේ මූනත් ඉම්බාද?''යි තිස්ස විචාළේ මැඩගත් කෝපය ද ඊර්ෂ්‍යාව ද ඇතිව ය.

''මුණ ඉඹින්න කොහේද ඉඩ තියෙන්නේ. ජනේලේ කිතුල් ලි අතරින්. මගේ අතේ ඇඟිලි හතරක තුඩු පමණක් යන්නම් ඇතුල් කරන්න පුළුවනි. මම බිත්තියට පොල්පිති ඔලුවක් ගහලා ඒකට නැගිලා ලයිසා එක්ක නිකම් කතා කර කර ඉඳලා ආවා.''

මේ පුවත් ඇසූ තැන් සිට තිස්ස ලයිසා බැලීමට යන්නේ කලාතුරකිනි. බලදසගේ කරදරය නිසා ගියත්, ඔහු වෙනද තරම් ආශාවෙන් ලයිසා සමඟ කතාබහ නො කෙළේ ය.

තිස්ස බලදස සමඟ කත්තිරිනාගේ ගෙදරට යන වග දැනගත් මාතර හාමිනේ, තව ටික කලක් ගමේ සිටියොත් ඔහු තරක චරිත ඇත්තකු වෙතියි බිය ගත්තා ය. උගැන්ම සඳහා තිස්ස ගාල්ලේ බෝඩිමට යැවිය නොහැකි වුවහොත් රක්සාවක් කරනු පිණිස කොළඹට යැවීමට මාතර හාමිනේ සිතා ගත්තා ය.

''තිස්ස උඹ දුන් ඇවිදින්න යනවා වැඩිය''යි මාතර හාමිනේ තිස්සට තරවටු කළා ය. ''උඹ දවල් බත් කාලා පැයක් දෙකක් යන්න ඉස්සර ගෙයින් පිට උණාම ගෙදර එන්නේ රෑ බත් කන වේලාව ළං වන කොට, බලදස එක්ක ඔය තරමට ඇවිදින්න යන්න එපා.''

''වැඩක් නැති නිසා ගෙදර ඉන්න කම්මැලියි අම්මා''

''කම්මැලි නම් පොතක් කියවාපන්?''

''හැම තිස්සෙම පුළුවන පොත් කියවන්න?''

''උඹ කත්තිරිනලයි ගෙදරට යන්නේ මොකට ද?''

''බලදස අඬගැහු නිසා.''

''යන්න එපා. බලදස අඬගැහුවාම බැරිය කියාපන්. යන්න එපායයි මම කිව් බව කියාපන්. ඇහුණ ද?''

''ඔව් අම්මා.''

Scanned by CamScanner

# 8 වන පරිච්ඡේදය

**විවාහ** වී අවුරුදු එකහමාරකට පසු නන්ද තම සැමියාත් සමඟ මහ ගෙදර ටික කලක් නැවතීමට පැමිණියා ය. නන්ද මවගේ ගෙදරට පැමිණියේ දරු ගැබක් ඇති හෙයිනි. විවාහයෙන් පසු ජිනදාස වඩාත් හොඳ මිනිසකු වුණාක් මෙන් දිළින්දෙක් ද වී ය. මඟුල සඳහා ඔහු වියදම් කෙළේ, ණයට ගත් මුදලකි. දෑවැද්ද වශයෙන් මුදලක් නොලැබුණු නිසා ඔහු, ඒ ණය ගෙව්වේ ඉඩම් කැබලි දෙකක් උකස් කොට මුදල් ගැනීමෙනි. ඉතිරි වූ ඉඩම් කැබලි වලින් ලැබුණු ආදායම, ඔවුන් දෙදෙනාට අමාරුවෙන් දවස් පතා කෑම සපයා ගැනීමට තරම් වී ය. ඔවුන් ඇඳුම් පැළඳුම් සඳහා වියදම් කෙළේ ණය වෙමිනි. මවු–පියන් ගේ ඉඩම් කොටස් වලින් ලත් ආදායමින් තනිකඩයකු සේ ජීවත් වුණු කාලයෙහි ජිනදාසට අග හිඟ නොදැනිණ.

පෙර සිට ම මහ ගෙදර ගෑනු හොඳින් අඳිති; පළඳිති; ඇඳුම් පැළඳුම් සඳහා නොමසුරුව වියදම් කරති. නන්දට ඇඳුම් පැළඳුම් සැපයීම මදක් වියදම් යන කාරියක් වුව ද ජිනදාස කිසි විටෙක නොකෙඳුරුවේ ය. නන්ද ඇඳුම් පැළඳුම් සඳහා නිකරුණේ සතයකුදු වියදම් නොකළ නමුදු කුළ සිරිතක් වශයෙන් හැම විටම පිරිසුදුව ඇන්ද ය. ගමනක්–බිමනක් යන්නේ නොඅඩුව ඇඳුම් ද පැළඳුම් ද ලත් විට පමණි. අඩු මිළට විකුණන කවර රෙද්දක් වුව ද ඈ ගෙදරට අඳින නමුත් ගෙයින් පිටව යන විට නම් ඇට විකක් වටිනා රෙදිපිළි වුව මනා ය. තම සැමියා ණය වෙමින් රෙදිපිළි සපයන බව දැනගත් පසු ඇඳුම් පැළඳුම් වලට වියදම් නොකිරීමට සිතාගත් නන්ද ගෙයින් පිටව නෑ ගමනක් ගියේ ද කලාතුරකිනි.

ජිනදාස විවාහ වූ පසු ඔහුගේ සහෝදරිය ගෙයින් පිට ව තම සැමියාගේ ගමට යතියි ජේම්ස් කී නමුත් ඈ නොගියා ය. ඈ සහ දරුවන් දෙදෙනකු ද එහි නැවතී සිටීම නිසා, වත්තෙහි පොල් කැඩූ විට ඈට ද කොටසක් දිය යුතු ය. දෙල්, කොස්, පුවක් යනාදියෙන් ද කොටසක් ඈ ගනියි. ඈ ගෙදර නැවතී සිටීම නිසා ජිනදාසට ද නන්දට ද උසුලන්නට වූයේ මෙවැනි සුළු අලාබයක් පමණි. නන්ද තම නෑනා සමඟ කිසි විටක කලහ නොකළ නිසා ජිනදාසට ද සහෝදරිය සමඟ කෝප වීමට අවස්ථාවක් නොලැබිණ.

නන්ද මහ ගෙදරට ඇවිත් දෙමසක් ගෙවුණු තැන ඈ උදෙසා පිරිතක් කියවනු පිණිස, මාතර හාමිනේ ගෙය සුද්ධ පවිත්‍ර කළා ය. ගැමි ගැහැනුන් කිහිප දෙනකු ද මෙහෙකාරිය ද ලවා ඇඳ පුටු මේස එළියෙ තිබ්බවා ගෙපිළ සේදෙවුවා ය. තම සැමියා ජීවත්ව සිටියදී



Scanned by CamScanner

භාවිතා කළ ලියන පෙට්ටිය සහිත මේසය තවමත් ගෙයි පෙර තිබුණ තැනම වෙයි. රුපියල් හැට හැත්තෑවක් වුව ද ගෙවා ඒ ලියන පෙට්ටියත් මේසයත් මිලට ගැනීමට ගම් මුලාදෑනියා කැමැති ය. අගහිඟ ඇතත් මාතර හාමිනේ ඒ මේසය විකිණීමට කැමති නොවූවා ය. ලියන පෙට්ටිය සහිත මේසය මාතර හාමිනේ සැලකුවේ තම සැමියා සිහි කරවන අගනා වස්තුවක් ලෙසිනි. වරක් නන්දියස් ඔපිසර, ඒ ලියන පෙට්ටිය සහිත මේසය ගන්නා අදහසින් රුපියල් පනහක් මාතර හාමිනේගේ අතෙහි තැබූ නමුත් ඇ මුදල් ඔහුට ආපසු දී,

"මහත්මයා සිහි වෙන්න තියෙන්නේ මෙච්චරය"යි කීවා ය.

ගෙබිම සෝදන ලද දවසෙහි මාතර හාමිනේ තම සැමියාගේ ලියන පෙට්ටියත් මේසයත් පිසදමා ලියන පෙට්ටිය තුළ වූ කඩදසි ද පරණ ඔප්පු ද ගසා–බසා දමා වියලා යළිත් පෙරසේම තැබුවා ය. ඇ ලියන පෙට්ටියෙහි ඇතුළු ලාච්චුවක් හැර එහි වූ ලියුම් එකිනෙක ගෙන ගසාදමා යළිත් පෙර සේම තැබුවා ය. ඒ ලියුම් අතර ගැහැනියකගේ අතින් ලියවුනක් සේ සැලකිය යුතු ලියුමක් ඇට දකින්ට ලැබිණ. කුතුහල වූ මාතර හාමිනේ, ලියුම අතට ගත් කෙණෙහිම ඒ අත් අකුරු කවරෙකුගේදැයි හැඳින ගත්තා ය. අත් අකුරු හැඳින ගත් නිසා, ඇ ඒ ලියුම කියෙව්වේ බලවත් කුහුලකිනි. ලියුම කියවූ ඇගේ හිසට පළමුව නැඟුණේ දැඩි කෝපයකි. අනතුරුව හදට නැඟුණේ ශෝකයකි. තියුණු වේදනාවකි. ඒ ලියුම ඉගෙන් තබා ගෙන තවත් එවැනි ලියුම් ඇද්දැයි බැලූ ඇට තවත් ලියුම් දෙකක් ලැබිණ. ඇ ලියුම් තුනම කුස්සියට ගෙන ගොස් වට පිට බලා ලිපෙහි දමා, ඒ ලියුම් පිළිස්සී අළු වන තුරු ලිප ළඟින් නොගියා ය.

මාතර හාමිනේ පිළිස්සුවේ කත්තිරිනා විසින් කයිසාරුවත්තේ මුහන්දිරමට එවන ලද ලියුම් තුනකි. එයින් එක ලියුමක් අවසාන වූයේ 'පුංචිඅප්පු දෙවුන්දර ගියා; එන්නේ අනිද්දටයි' යන වාසගමිනි. කත්තිරිනා මේ ලියුම් තුනම ලියා තිබෙන්නේ මුහන්දිරම් කයිසාරුවත්තේ, මාතර හාමිනේ සමඟ විවාහ වන්ට හත් අට මසකට පමණ පෙර බව ලියුම් පටන් ගැන්මෙහිදී ලියන ලද සටහන්වලින් හෙළි වී ය. ලියුම් තුන පිළිස්සූ මාතර හාමිනේ, කත්තිරිනා මීට පසු තම සැමියාට ලියන ලද ලියුම් ඇද්දැයි සෙවීමට සිතුවා ය. ඇ සියලුම ලාච්චු හිස් කොට කඩදසි කැබලි එකිනෙක ගෙන පරීක්ෂා කළ නමුදු කත්තිරිනාගේ අතින් ලියුමක් ඇට හසු නොවී ය.

කයිසාරුවත්තේ, තමා විවාහ කර ගැනීමට පෙර කත්තිරිනා හා හාදව සිටි බව දුන් මාතර හාමිනේට නිසැක ය. කත්තිරිනා

Scanned by CamScanner

මුහන්දිරම් සමඟ හාද වී තිබෙන්නේ ඈ පුංචි අප්පු හා විවාහ වූ පසු ය. 'පුංචි අප්පු දෙවුන්දර ගියා එන්නේ අනිද්දට'යි යන වාසගමින් ඈ ලියුම කෙළවර කරන ලද්දේ මුහන්දිරම් ගෙන්වා-ගන්නා අදහසිනි. තමා හා 'විවාහ වූ පසුත් මුහන්දිරම්, කත්තිරිනා වෙත ගියා ද?' යන ප්‍රශ්නය නිතැතින්ම මාතර හාමිනෝගේ හිසට නැඟිණ. තමා හා විවාහ වූ තැන් සිට මුහන්දිරම් ආ ගිය තැන් ද කළ කී දේ ද මාතර හාමිනෝ සිතින් විවේචනය කළා ය. මැණික් ගරන්නා සේ, ඈ තම සිතින් අතීතය ගරන්ට වූ නමුත් තමා හා විවාහවූ පසු මුහන්දිරම, කත්තිරිනා වෙතට ගියේයයි යැක කිරීමට අනුබලදෙන කිසිම කරුණක් ඈට සොයා ගත නොහැකි වී ය.

මාතර හාමිනෝ හා විවාහ වූ පසු මුහන්දිරම් අවේලාවෙහි තම ගෙදරින් පිට වී නොගියේ ය. ඔහු මාතර ගොස් දවසක් දෙකක් එහි නැවතී කෙළින් ම ආවේ ගෙදරට ය. කත්තිරිනාගේත් මුහන්දිරම්ගේත් හාදකම තමා හා විවාහ වීමට පෙර වූවක් බව මාතර හාමිනෝ දනියි. එහෙත් තම සැමියාගේ චරිතයෙහි මේ කිලිටි අංශය නිසා ඇගේ සිතට තවමත් නඟින්නේ කෝපයකි; බලවත් ශෝකයකි; තියුණු වේදනාවකි.

කත්තිරිනාගේ දුව මතක් වන විට මාතර හාමිනෝගේ කෝපය වැඩි වෙයි. ලයිසා සිනාසෙන විට නිකට කොන වළ ගැසෙයි. ලයිසාගේ දෙතොල කත්තිරිනාගේ දෙතොලට නොව, මුහන්දි-රම්ගේ දෙතොලට සමාන ය. සිනාසෙන විට වළ ගැසෙන සින් නිකටක් ඇත්තේ මුහන්දිරම්ට ය. ලයිසාගේ නැහැය මුහන්-දිරම්ගේ නැහැයට මිස කත්තිරිනාගේ වත් පුංචි අප්පුගේ වත් නැහැ-යට හුරු නොවේ. ලයිසා, කත්තිරිනාට වඩාත් හුරු වන්නේ අහර-දහර වලිනි; ඇස් දෙකිනි. වළ ගැසෙන ඇගේ නිකට දික් වූ උස් වූ නැහැයත් සින් දෙතොළත් සිහි වන විට මාතර හාමිනෝගේ සිතට නැඟෙන්නේ බලවත් කෝපයකි; ශෝකයකි.

විසිතුරු ලෙස හැඳ පැළඳගත් ලයිසා සමඟ ඇතැම් විට කත්තිරිනා මහ ගෙදරට පැමිණියේ මුහන්දිරම් හා ඈ හා අතර ඇති හාදකම ගර්වයෙන් සිහි කළ නිසා ද? කත්තිරිනාත් ලයිසාත් අනුලාට සහ නන්දට ද මහත් ලැදි කමක්, සැලකිල්ලක්, දැක්වූයේ ඒ නිසාම නොවිය හැකි ද? කත්තිරිනා ඇතැම් විටක ලයිසාට අඳිනු පිණිස නන්ද ලවා අලුත් පන්නයට හැට්ට කප්පවා ගැනීමට පැමිණියේ, ලයිසා ද කයිසාරුවත්තේ පවුල හා නෑ සබඳකම් ඇත්තියක් ය යන හැඟීම ඇතිව ද?

වයස් ගත වීමත් ආහාර හිඟ වීමත් නිසා කත්තිරිනා දැන් නම් රූ සපුවෙන් පිරිහුණු ස්ත්‍රියකි. එහෙත් ඇගේ පිරිහුණු රූ සපුවෙහි නටබුන් සලකුණු ඇගේ දෙනෙතෙහි ද උස් වූ ළයෙහි ද අ..ර-..හරවල ද තවම දක්ක හැකි ය. තමා මුහන්දිරම්ගේ බිරිඳව

Scanned by CamScanner

කොග්ගල වාසයට පැමිණි අවස්ථාවෙහි දක්නා ලද කත්තිරිනාගේ සුන්දර රූ සපුව මාතර හාමිනේ සිහි කළේ ඊර්ෂ්‍යාවෙනි. කත්තිරිනා එකල නිතර මහ ගෙදරට ආවේ තමා දක්නා පිණිස නොව නිසැකවම මුහන්දිරම් ද දකිනු පිණිසය යි මාතර හාමිනෝ අනුමාන කළා ය. එහෙත් තමා හා විවාහ වුණු පසු මුහන්දිරම් විසින් කත්තිරිනා සිහිකරන ලදැයි ඈ නොසිතුවා ය.

තිස්ස බලදස සමඟ ලයිසා බැලීමට ගිය වග ඇසූ පළමු අවස්ථාවෙහි මාතර හාමිනෝගේ සිතට නැඟුණේ තිස්ස චරිතයෙන් පිරිහෙතිය යන හැඟීම පමණි. දැන් ඇගේ සිතට නඟින්නේ බලවත් උදහසකි; පිළිකුලකි. පිළිකුලට එක්වුණු බියකි.

මේ සිතිවිලි නිසා වඩාත් කිපුණු මාතර හාමිනෝ ආලින්දයෙහි උන් තිස්සට හඬ ගෑවා ය. මව වෙතට ගිය තිස්සගේ සිතට මහත් බියක් නැඟුණේ මීට පෙර කිසි විටක තම මවගේ මුහුණෙහි මෙවැනි බියකරු ලකුණක්, ශෝකාකුල ලකුණක්, නොදුටු බැවිනි. තම මව මෙතරම් කිපෙතියි තිස්ස මීට පෙර නම් සිනෙනුදු නොසිතුවේ ය.

"තිස්ස" යි ඈ තම පුතාට තර්ජන කළා ය. "මීට පස්සේ උඹ එහෙම කත්තිරිනාලාගේ ගෙදරට ගියොත් බලා ගනින්. තවත් යන්න එපා! උන්නේ ගෙදර මිදුලේ පස් පාගන්න එපා! ඇහුන ද?"

"එද එපයි කිව්වට පස්සේ මම එහේ ගියේ නැහැ අම්මා"යි මවගේ විලාසයෙන් වඩාත් බිය ගත් තිස්ස කීවේ ය.

"උන්ගේ ගෙදර පැත්තට වත් යන්න එපා. උඹ ආයිත් ඉගෙන ගන්න යන්න ඕනෑ. බැරි උණොත් රස්සාවක් කරන්න කොළඹ යන්න ඕනෑ; ඇහුන ද?"

තිස්ස ඉගෙනීම සඳහා පාසැලට යාමට නොව රස්සාවක් සඳහා කොළඹ යෑමට කැමති ය. රක්සාවක් කිරීමට ඔහු ආශා කෙළේ මවද අනුලා ද අඟහිඟවලින් මිරිකෙන සැටි දන්නා බැවිනි.

"රස්සාවකට යන්න නම් මම වඩා කැමතියි අම්මා"යි තිස්ස පිළිතුරු දුන්නේ ය.

මාතර හාමිනේ යළිත් සාලයට ගොස් මුහන්දිරම්ගේ ලියන පෙට්ටිය වසා යතුර දමා කුස්සිය දෙසට ගියා ය. තම මව කෝපයෙන් කතා කරනු අසා පැමිණි අනුලා ආලින්දයට ගියා ය.

"අනු අම්මට අද හොඳට ම තරහ ගිහිල්ලා කවදාවත් අම්මට අද විතර තරහ ගියේ නැහැ"යි තිස්ස කී ය.

"තිස්ස ඇවිදින්න යන නිසා වෙන්න ඇති. කත්තිරිනලයි ගෙදරට යනවයි කියා දවස් හත අටකට උඩදී අහන්න ලැබිලා ටිකක් තරහයෙන් තමයි අම්මා උන්නේ."

Scanned by CamScanner

"අම්ම එපයි කිව්වට පස්සේ මම කත්තිරිනලයි ගෙදරට ගියේ නැහැ. අම්මට තරහ යන්න ඇත්තේ වෙන මොනවාදෝ නිසා වෙන්න ඇති."

"අම්මා ලයිසා රුස්සන්නේ නැහැ. ඒ දවස්වල ලයිසා ඉඳ හිටලා මෙහාට ආවත් අම්ම තරහයි. අපි නිකම් ලයිසා එක්ක කතා කළත් අම්ම තරහයි. ඈ එක්ක කතාවට යන්න එපයි ඒ දවස්වල අම්ම කියනවා."

"මම ලයිසා බලන්න නෙවි අනු ගියේ; බලදූස අඬ ගැහු නිසා."

"තිස්ස ඇවිදින්න යනවා වැඩියි. කාංඩවලට වැටිලා නරක් වෙනවා; අම්මා නිතරම බයෙන් ඉන්නවා. අම්මා දැන් හුඟක් කෙට්ටුයි, හිතට කරදර නිසා. තිස්ස අම්මට වැඩිය කරදර කරන්න එපා"යි අනුලා කීවේ තම මව නිසා උපන් දයාව ඇතිව ය.

"මම අම්මට කරදරයක් කරාය අනූ?"

"මම කිව්වේ එහෙම කරදරයක් ගැන නෙවි; උඹ ඇවිදින්න යන එක අම්මාගේ හිතට කරදරයක්."

"ඇයි අනූ, මට උදේ හිටන් හැන්දෑ වෙන කල් ගෙදර නිකම් වාඩි වෙලා ඉන්න පුළුවන?"

"ගෙදර ඉන්න කම්මැලි නම් ටිකක් ඇවිදින්න ගියාට ඇති වරදක් නැහැ. ගොඩේ ගෑනුන්ගේ ගෙදරවලට යන්නේ මොකට ද? කාංඩවලට වැටිලා රෑ වෙන තුරු ගෙදර නේන්නේ ඇයි?"

"මම ගියේ කත්තිරිනලයි ගෙදරට විතරයි."

"උඹ රේන්ද ගෙදරට ගියේ නැද්ද?"

"අනූ කොහොම ද දන්නේ!"යි අසමින් තිස්ස සිනාසුණේ ය.

"තිසා හිතාගෙන ඉන්නේ අපට ආරංචි වෙන එකක් නැත කියා; නොවෙද?"

"අනූ මහ අමාරු කාරියෙක්!"

"ඉලන්දාරින්ට යන්න හොඳ තැනක් නෙවි රේන්ද ගෙදර."

"ඇයි"?

"රේන්ද මහගෙ බලාගෙන ඉන්නේ වැදගත් පවුලක තරුණයෙක් රවටාගන්න. දූ නම් වරදක් නැහැ ඒකට මොකොද රේන්ද මහගෙ මහ අමාරුකාරි."

"මම යන්නේ හිර ගන්නය මම හීනෙන්වත් නොසිතූ ඒවා අනූ හිතනවා."

"දැන් නොහිතෙන ඒවා පස්සේ හිතෙන්න පුළුවනි. යන්න එපා රේන්ද ගෙදරට."

Scanned by CamScanner

''මම එක දවසයි ගියේ. රේන්ද, මහගෙ පාරෙදි හම්බවෙලා අඬගැහුවා ගෙදරට යන්න.''

''අහා! මම කිව්වේ නැද්ද; රේන්ද මහගෙ මහ අමාරු කාරියෙක් කියා? මම අම්මට කිව්වේ නැහැ; තිස්ස රේන්ද ගෙදරට යන වගක්.''

''අනු හැබෑ අමාරු කාරියක් වගෙයි. එහෙනම් මම යන එන තැන් ඔක්කොම සොයාගෙන තියෙන්නේ අම්මා නෙවි; අනු!''

''කව්රු සොයා ගත්තාම මොකොද? යන්න එපා රේන්ද ගෙදරට''යි අනුලා කීවේ තර්ජන කරන්නාක් මෙනි.

''මම හිතුවේ අනු කසාද බඳින්නේ නැත කියමින් පිරිමින්ගේ ඇද කුද සොයනවා විතරක් ය කියා!''

''මම පිරිමින්ගේ විතරක් නෙවි ගෑනුන්ගෙ ඇද කුදත් සොයනවා!''

''ඒක නොවෙන්නම් අනු ඉක්මනට නාකි වෙලා ඉන්නේ!''යි කියූ තිස්ස අනුලාගෙන් ටිකක් ඈත් වූයේ ය.

''පැහිච්චකම් දෙඩන්න එන්න එපා මම එක්ක''යි අනුලා කෝපයෙන් සැර කෙළේ ය.

ආලින්දය දෙසට ඉක්මනින් එන මාතර හාමිනේ දුටු අනුලා ද තිස්ස ද බිය ගත්හ.

''තිස්ස ඉක්මනට ගොහින් වීරසිරි වෙද මහත්තයා එක්ක වරෙන් නන්දට ටිකක් සනීප නැහැ''යි ආලින්දයට පිවිසෙන්නට පෙර මාතර හාමිනේ අණ කළා ය.

තිස්ස ගිය පසු මාතර හාමිනේත් අනුලාත් ආ පසු නන්දගේ කාමරය දෙසට ගියහ. වෙද පැමිණීමට පෙර නුදුරින් වෙසෙන වින්නඹුව කැඳවනු ලැබුවා ය. අනතුරු ව පැමිණි වීරසිරි වෙද මහත්මයා නන්දගේ අත අල්ලා බලා 'දැන්ම කලබල වෙන්න එපා'යි මාතර හාමිනේට කී ය.

''මම හිතන්නේ නැහැ රෑ හතට ඉස්සර වෙලා පුංචි නෝනාට අමාරුවක් වේය කියා''

වෙද මහ ගෙදර ආලින්දයෙහි වූ හාන්සි පුටුවෙහි දිගා වී ය. අනුලා, නන්ද කලින් සූදනම් කරන ලද කුඩා කොට්ටය ද බෝල කොට්ට දෙක ද ගෙන, අලුත් උර දමා අතින් තට්ටු කොට, තිබුණු තැනම තැබුවා ය. ජිනදාස ආලින්දයෙහි වූ පුටුවක වාඩි වී වෙද සමඟ කතාබහ කෙළේ ය. වෙද සංස්කෘත ශ්ලෝක ඇද බාමින් කරන කතාවට කන් දීමත් ඉඳහිට අඟල්පත් තැබීමත් හැර ආයුර්වේදය ගැන තර්ක කිරීමට තරම් දැනුම ඇත්තෙක් නොවී ය ජිනදාස. තිස්ස ඇතැම් විට වෙද මහත්මයාගෙන් ප්‍රශ්න අසමින් වාද කෙළේ ය.

Scanned by CamScanner

"නාඩි ඇල්ලීමෙන් හෘදය වස්තුවේ ගැහීම් මිසක් වෙන මොනවාද දැනගත හැක්කේ"යි නාඩි විද්‍යාව ගැන වෙද කී තොරතුරු අසා ගෙන උන් තිස්ස ඇසී ය.

"නාඩි ශාස්ත්‍රය බොහොම ගැඹුරු එකක්."

"නාඩි බලා ලෙඩා කාපු කෑමත් කියනව නෙවද සමහර වෙද්දු."

"ලෙඩා කාපු කෑම නාඩියෙන් දැනගත හැකියයි මම කියන්නේ නැහැ. ඒ උණත් නාඩියෙන් හුඟක් දේ දැනගත හැකි"යි කියමින් වෙද සුරුට්ටු කොටය මිදුලට වීසි කෙළේ ය.

"සිංහල වෙද මහත්තැන් ලෙඩඩුන්ට විතරක් නෙවි, සනීපෙන් ඉන්න මිනිසුන්ටත් හරක් මස් කන්න එපයි කියන්නේ ඇයි? කනවා නම් කන්න ඕනෑ හරක් මස්; හැබැයි දිරවන්න පුළුවන් මිනිස්සු විතරක්."

"හරක් මස් උෂ්ණයි; අගුණයි."

සිංහල වෙද මහත්තැන් හරක් මස් කන්න එපයි කියන්නේ ඒ නිසා නෙවි. සංස්කෘත වෙද පොත් ලියා තියෙන්නේ හින්දුකාරයෝ; උන් හින්දුකාරයෝ හරකට දෙවියකුට වගේ ගෞරව කරනව; උන් හරක් මස් කන්නේ නැහැ. සංස්කෘත වෙද පොත් මරක්කල ආගම ඇදහූ ඉර්සින් වහන්සේලා ලිව්වා නම් ඌරු මාළු ඉතාම අගුණ යයි කියන්නේ නැද්ද?"

"මරක්කල ආගම අදහන මිනිසුන්ට කවදාවත් ඍෂින් වහන්සේලා වෙන්ට බැහැ."

"මරක්කල වෙද්දුන් කියාවි හින්දු ආගම අදහන්නන්ට කවදාවත් නබිලා වෙන්ට බැරිය කියා."

"නබිලා"?

"ඔව්—නබිලාය කියන්නේ මරක්කල ආගම්කාරයන්ගේ ඉර්සින් වහන්සේලාට නමා."

තිස්සගේ තර්කයෙන් වීරසිරි වෙදමහත්තයා නරහ වෙතියි සිතූ නිසා දෙන් ජිනදාස මෙසේ කීවේ ය.

"මම කවදාවත් හරක් මස් කන්නේ නැහැ; මට අගුණයි; කෑවොත් මොකක් හරි අසනීපයක් හැදෙනවා."

"ඒ අයියට. තව කී දෙනෙකුට හරක් මස් හරි යනව ද? මනිමෙල් සුමානෙකට තුන් හතර දවසක් හරක් මස් කනවා. පෙරේද රෑ රේල්ලට වැස්සියෙක් අහු උණා. මනිමෙලුයි තවත් දෙන්නෙකුයි එළදෙන මැරෙන්නත් ඉස්සර කකුල් කපාගෙන දිව්වා! ඔපිසර මහත්තයා මිනිස්සු අල්ලන්න සොයන කොට උන් මස් උයාගෙන කාලත් ඉවරයි! මනිමෙල්ට කිසි අසනීපයක් නැහැ. ඒ මිනිහාට පස් දෙනෙක් එක්ක උණත් ගහගන්න පුළුවනි."

''උන් බොන කන වල් මිනිස්සු''යි ජිනදාස තර්ක කෙළේ ය.

''එහෙනම් හරක් මස් අගුණ හොඳ මිනිස්සුන්ට විතරක් ද?''

''හොඳ මිනිස්සු හරක් මස් කන්නේ නැහැ.''

''අපේ කතාව හොඳ මිනිස්සු හරක් මස් කනවා ද නැද්ද කියා නෙවි. හරක් මස් කන එක අගුණ ද කියා යි.''

''අලුත හිට ඉංගිරිසි ඉස්කෝලවලට යන ළමයින්ගේ අදහස් මෙහෙම තමා!''යි ජිනදාස කීවේ වෙදමහත්තයා දෙස බලාගෙනය.

අනතුරුව ඔවුන් කථා කෙළේ යකුන් ගැන ය; යකැදුරන් ගැන ය. වෙද ද තිස්ස මෙන් යකැදුරන්ට නින්ද කෙළේ ය. එහෙත් තිස්ස 'මන්ත්‍ර ශාස්ත්‍රය' බොරුවකැයි කී විට වෙද එය ගැඹුරු ශාස්ත්‍රයකැයි කියමින් තර්ක කෙළේ ය. මන්ත්‍ර ශාස්ත්‍රයෙන් ඔවුහු මුහුදෙහි මසුන් ගැන කතාවට බැස්සෝ ය.

''මුහුදු මත්ස්‍යයෙක් ගොඩ ගත් විට උඹ මැරෙන්නේ ජලසන්නියෙන්''යි වීරසිරි කී ය.

''ජල සන්නිය?''යි තිස්ස පුදුමයෙන් ඇසී ය. ''දියෙන් ගොඩ ගත්තාම මාළුවා මැරෙන්නේ හුස්ම ගන්න බැරිව.''

''හුස්ම ගන්න බැරිව!'' යයි ජිනදාස තෙපලේ විස්මයෙනි. ''හුස්ම ගන්න මාළුන්ට නාස් පුඩු තියෙනවා ය?''

''මාළු හුස්ම ගන්නේ කටින්. කටින් ගන්නා වතුරේ ඇති අම්ලකර වාතෙ කරමලෙන් වෙන් කර ගන්නවා; හුස්ම ගන්නවාය කිව්වේ ඒකටයි. මාළුවාට වතුරෙන් පමණයි අම්ලකර ගන්නට පුළුවන්. ගොඩ දැම්මාම උඹට හුස්ම ගන්න බැරිවෙනවා; නාස් පුඩු නැති නිසා.

වීරසිරි වෙදමහත්තයා පැරණි මතවල එල්බගත්තකු වුවද බුද්ධිමතෙකි. ඔහු තිස්සගේ තර්කවලට කන් දුන්නේ එහෙයිනි. සෘෂීන් හරක් මස් නියම නොකරණ ලද්දේ ඔවුන් හින්දුකාරයන් වූ නිසා විය යුතුයයි වීරසිරි ද සිතුවේ ය. එහෙත් මාළුවා පිළිබඳ තම මතය, තිස්සගේ තර්කය ඇසූ පමණින් ඔහු නොහළේ ය.

''දැන් ඉගෙන ගන්න ළමයි පරණ හැමදේම බොරු කියනවා. ඒකට මොකො ද තිස්සත් ලෙඩ උණාම වෙදකම් ගන්නේ වෙද මහත්තැන්ගෙන්!''යි ජිනදාස කී ය.

''ක්‍රිස්තියානි ඉස්කෝලවලට යන එකේ වැරැද්ද''යි වෙද කී ය.

''ක්‍රිස්තියානි ඉස්කෝලවලට යන එකේ වැරැද්ද? මම කතා කෙරේ ඇත්ත නැත්ත; ආගමක් නෙවි.''

''ක්‍රිස්තියානි ඉස්කෝලවලට යන ළමයින්ගෙන් වැඩි දෙනා ගන්නේ ක්‍රිස්තියානිකාරයන්ගේ පැත්ත.''

Scanned by CamScanner

‘‘මේ ළමයි නිකම්ම රවටෙනවා, පාදිලි උන්නාන්සේලාට. උන් සීනි බෝල දීලා ළමයි රවටාගන්න දන්නවා’’යි කියමින් ජිනදාස, වෙද මහත්මයාගේ මතය තහවුරු කෙළේ ය.

‘‘මහා පට්ට බොරු කතා පරණ පොත්වල තියෙන ගල් පැළෙන බොරු විශ්වාස නොකරන්නේ ක්‍රිස්තියානි ඉස්කෝලවලට යන නිසා නෙවි; ඇත්ත ඇති හැටි දැන ගන්න ලැබෙන නිසා.’’

රෑ අට වන තුරුත් නන්දගේ කුසෙහි උන් බිළිඳා මෙලොව එළිය නුදුටුවේ ය. පසුද එළිය වැටෙන තුරු තමාට යන්ට නොලැබෙන බව දන්නා වීරසිරි මහගෙදරින් ම රෑ කෑම කා යළිත් ගොස් ආලින්දයෙහි හාන්සි පුටුවෙහි දිගා වී සුරුට්ටුවක් පත්තු කරගත්තේ ය. බලදාස හා විජය ද එදින රැය මහගෙදරම ගත කරන අදහසින් පැමිණියෙන් තිස්ස යළිත් වෙද සමඟ වාදයට නොගියේ ය.

වහින්ට තතනන අහසෙහි වූ තාරකා දුම් පැල්ලම් සහිත නිල් රෙදි පටකින් වැසුණු පහන් සේ බබලයි. මඳ සුළඟකුදු නොහමන නමුදු මිදුලෙහිත් ආලින්දයෙහිත් වාතය තෙතමනයෙන් හා සිහිල් ගුණයෙන් ද යුතු වී ය. මහගෙදර පිළිකන්න අසල වූ ජම්බු ගසක ඉදුණු ගෙඩි කෑමට පැමිණි වවුලකු අත්තටු ගසන හඬ ආලින්දයෙහි හාන්සි පුටුවෙහි දිගා වී උන් වෙදට ඇසෙයි. අහස වහින්ට තතනන නිසා දෝ වත්තෙහි කුරුමිණි සතුන් නගන වීණා-හොරණෑ කයිතාලම් හඬ වෙන ද සේ නො ඇසෙයි. බිත්ති ලාම්පුවෙන් නික්මෙන එළිය නිසා ආලින්දයෙහිත් මිදුලෙහිත් අඳුර මදක් දුරු වූ නමුදු මිදුලෙන් ඔබ්බෙහි දෙල් ගසින් ද පොල් ගසින් ද සෙවණ වුණු පෙදෙසෙහි වූයේ දැඩි අඳුරකි. මහ ගෙදරින් ටිකක් ඈතින් වූ ගම්සබා පාරෙන් ඉහළ නඟිමින් පහළ බසිමින් ගමන් කරන එළියක් අඳුර අතරින් දුටු වෙද පුදුම නොවී ය. එය තම නිවෙස බලා ගමන්ගත් ගැමියකු අතෙහි වූ ගිනි කොළපුවකැයි ඔහු දන්නා හෙයිනි. වැහි අඳුර නිසා වාතය වෙන දා වඩා බරය. රැයෙහි වූ මේ බර නිසල බව සසල වූයේ ගමේ ගෙදරක බල්ලකු ඉඳ-හිට නැඟූ බිරුම් හඬින් ද මඩුවක හිර කරනු ලැබූ වස්සකුගේ උඹෑ හඬින් ද පමණි.

Scanned by CamScanner

## 9 වන පරිච්ඡේදය

රෑ එකට පමණ නන්ද පිරිමි දරුවකු බිහි කළා ය. වීරසිරි වෙදමහත්තයා මහගෙදරින් නික්ම ගියේ උදේ තේ වතුරද බීමෙන් පසු ය. නන්ද සුව සේ උන් නමුත් බිළිඳා යම්කිසි ආබාධයකින් පිඩා විඳියි. තුන් දවසක් ඉකුත් වූ තැන බිළිඳාගේ මුහුණෙහි නරක ලකුණු දක්නා ලදින් ගාල්ලෙන් දොස්තරෙක් කැඳවනු ලැබී ය. ඔහු මහගෙදරට ළඟා වූයේ බිළිඳා මැරී පැයක් පමණ ගෙවුණු පසු ය. හඬා වෙහෙස වීමෙන් මඳක් අසනීපයෙන් උන් නන්දට බෙහෙත් නියම කළ දොස්තර, බිළිඳාගේ මළ කඳ පරීක්ෂා කොට අනතුරුව නන්දගේ කාමරයෙහි කුඩා මේසයක් උඩ තුබුණු කතුරක් අතට ගෙන බැලී ය.

"ළමයාගේ පෙකනිය කපන්න ඇත්තේ මේ කතුරෙන් වෙන්න ඇති"යි දොස්තර ගුණවර්ධන කී ය.

"ඔව්" යි මාතර හාමිනේ පිළිතුරු දුන්නා ය.

කතුර තුබුණු තැන යළිත් තබා සාලයට ගමන් කළ දොස්තර, ජිනදාස දුන් රුපියල් විසි පහ හකුලා කලිසන් සාක්කුවේ දමාගෙන වට පිට බැලී ය. ඒ වේලේම කාමරයෙන් පිට වුණු මාතර හාමිනේ දොස්තර ට ළං වූවා ය.

"ළමයා මැරෙන්න ඇත්තේ වින්නඹුවගේ වැරැද්ද නිසා"යි දොස්තර කී ය. "හං කතුරෙන් පෙකනිය කපන්න වෑයම් කරද්දී පෙකනිය ඇදිලා තියෙනවා; ඒ අමාරුවට උණ අරගෙන ළමයාට වලිප්පුව හැදෙන්න ඇති. ඒ කතුර හොඳටම හංවෙලා--මැරිච්ච මිනිසුන්ගේ නහය කපන්න හොඳ කතුරක්"

දොස්තර ගිය පසු ජිනදාස, වින්නඹුව සමඟ කලහ කරන්ට සූදානම් වූ විට, මාතර හාමිනේ ඔහු සනසනු පිණිස මෙසේ කීවා ය.

"ඒ ගැනි විතරක් නෙවි; අපිත් වැරදිකාරයෝ. හොඳ කතුරක් ඒ මේසේ උඩම තිබුණා. පරණ හං කතුර ඒ මේසේ උඩ කවුරු ගෙනැත් තිවුවාද දන්නේ නැහැ. වින්නඹු ගෑනි අහන්නේත් සොයන්නේත් නැතුව අතට අහු උණු කතුරෙන් පෙකනිය කපලා තියෙනවා."

අසනීපය දියුණු නොවූයෙන් දවස් කිහිපයකින් සුව ලැබූ නන්ද හමසක් පමණ ගෙවුණු පසු, යළිත් ඇගේ රූසපුව ද ගති ගුණ ද ලැබුවා ය. ඇගේ සැමියා නම් පෙරට වඩා කෙට්ටු ය; ඔහුගේ මුහුණෙහි පෙරවූ සන්තෝෂය ද බෙහෙවින් අඩු ය. ඊට හේතුව බිළිඳාගේ මරණයම නොව අගහිඟවලින් මිරිකීම ද බව නන්ද



Scanned by CamScanner

දනියි. නන්ද මහගෙදරට පැමිණි තැන් පටන් කෑම සඳහා වියදම් කෙළේ ජිනදාස ය. නන්දට වෙදකම් කරවනු සඳහා කළ වියදම, විශාල නොවූවත් ඒ අවස්ථාවෙහි ඔහුට ඉසිලිය නොහැකි තරම් බරක් වී ය. ඔහු නන්දගේ රන් අබරණද උකස් කොට මුදල් ගෙන වියදම් කෙළේ එහෙයිනි. තමාගේ ගෙදර වත්තෙන් ලැබුණු සුළු ආදායම ද මහගෙදර නැවතීමට පැමිණි තැන් සිට ඔහුට නොලැබුණේ, ඔහුගේ සහෝදරිය එහි පොල් දෙල් කොස් ආදිය කඩවා විකුණා ගත් හෙයිනි.

වෙන කිසිම ආදායමක් නොලත් ජිනදාස කුඩා ඉඩම් දෙකක් බදු දීමෙන් ගත් මුදල් පළමුව වියදම් කෙළේ ය. අනතුරුව වියදම් කෙළේ ණයට ගත් මුදල් ය. දෙස්තර ගෙන්වනු පිණිස වියදම් කෙළේ නන්දගේ රන් අබරණ උකස්කොට ගත් මුදල් ය. දැන් මහගෙදර නැවතීමට අකැමැති ඔහු, ආපසු නන්ද සමඟ තම නිවෙසට යාමට නොසිතුවේ පෙර තරම්වත් ඉඩම්වලින් ආදායමක් නොලැබිය හැකි බැවිනි.

අතමිට හිඟ වූ නිසා ජිනදාස දෙමසක පමණ සිට කෑම බීම සඳහා වියදම් කරන්නේ කලාතුරකිනි. එහෙයින් ඉතා අමාරුවෙන් අරපිරිමසාගෙන ගෙදර සියලු දෙනාටම කෑම සපයන්නී අනුලා ය. මහ ගෙදර වත්තෙන් ලැබෙන ආදායම කිසිසේත් ඊට ප්‍රමාණ නොවේ. නන්ද ඇතැම් විට මැහුම් ගෙතුම් කොට ඒ මැහුම් ගෙතුම්, සාද අත පිටගමකට හෝ ගාල්ලට හෝ යවා විකුණවා ලබාගන්නා මුදල් ගෙදර වියදම් සඳහා අනුලාට දෙයි. එහෙත් කරදර නිසා කෝප වුණු ඇතැම් විටක අනුලා නන්දට ඇනුම් පද කීවේ ජින-දාසට ඇනුම් පද නොකිය හැකි බැවිනි.

ජිනදාසට ඇනුම් පද නොකිය හැකි නිසා දෝ අනුලා, දවසක, පළා බෙදීම වැනි කාරියක් කළා ය. ඈ දවල් බත උයා උම්බලකඩ නැති පොල් සම්බෝලයකුත් සමඟ සාදගේ අතින් මේසයට යැවුවා ය. නන්ද මේසය දෙස බලා 'කෑම ලැස්තියයි මහත්තයාට දන්ම කියන්න එපා'යි සාදට අණ කොට ගියේ කුස්සිය දෙසට ය. ඈ සාද ලවා ගහල ගස් දෙකක් උගුළුවා ගහල කුරුල්ලන් කපා ගෙනැවිත් සෝද තම්බා අනතුරුව එයින් ව්‍යංජනයක් ඉවුවා ය. රට ලූනු ගෙඩියක් ගෙන පෙති ගසා ගම්මිරිස් කුඩු ඉස එය ද සමඟ ගහල කුරුලු ව්‍යංජනය මේසයට යැවුවා ය.

''ඔක්කොම හරියට රෙකුලාසියට ඕනෑ! ටිකක් එහෙම අඩු වෙන්න හොඳ නැහැ!''යි කුස්සියට පිවිසි අනුලා තම සොහොයුරි යට–ඇනුම් පදයක් කීවා ය.

''ගෙනැත් දෙන කල් හොඳයි; බැරි උණ දුට නැති හිඟපාඩු ඇති වෙනවා.''

Scanned by CamScanner

''ඔව්—මහ ලොකුවට ගෙනැත් දුන්නා! මම ඒවා හංගාගත්තා මගේ ප්‍රයෝජනෙට ගන්න.''

''හංගගත්තයි කිව්වෙ කවුද? අපට තියෙනවයැ ඔය තරම් ගෙනැත් දෙන්න. මහත්තයට ඇහැක් තරම් තමයි ඔය ගෙනැත් දුන්නේ.''

''මහත්තයට අමාරු වෙලා ඉන්නේ එහෙනම් අපට ගෙනැත් දිලා තමයි.!''

''මහත්තයාගේ අමාරුව කාටවත් කියන්න යන්නේ නෑ.''

''අපේ අමාරුවත් අපි කියන්න යන්නේ නැහැ.''

''නැත්තන් දූන් කිව්වෙ?''

''අපි කිව්වේ ටිකක් අඩු පාඩු වෙන්න හොඳ නැති එක!''

''අඩු පාඩුවකට නොවන බව අපට ජේනවා.''

''අපට ඇහැක් තරම තමයි ඔය''යි කියමින් අනුලා ලිපෙහි දැවෙන දර කැලි අළු යට ඔබා නිවා පැත්තක තැබුවා ය.

''මොකක් ද මේ කතාව? අක්කයි නංගියි රංචු වෙන්න හදන වාද?''යි නන්දගේත් අනුලාගේත් කතාබහ අසා කුස්සියට පැමිණි මාතර හාමිනේ විචාළා ය. ''අනූ, පලයන් එළියට.''

මවගේ අණ ඇසූ විගස කාමරයෙන් පිට වුණු අනුලා මිදුලට බැස සිනාසෙමින් ගල් වැට දොරටුව කරා ගමන් කළා ය. ඈ එහි ගියේ සාදු සමඟ කතා බහ කරන අටියෙනි. ගල් වැට දොරටුවට ළඟා වූ අනුලාට හමු වූයේ සාදු නොව ගල් ගොඩ උඩ වාඩි වී උන් තිස්ස ය.

''තිස්ස මොකද තාන්තුවාවෙන් වගේ ඉන්නේ?''

''මම තාන්තුවා උණේ නැහැ අනූ.''

''ලොකු කල්පනාවකින් වගේ උන්නේ?''

''විජය එයාගේ දෙවෙනි මනමාලයාට එන්නයි කිව්වා. මම, බැරිය කියා මග හරින්න මහන්සි ගත්තා. එයා ඉඩ දුන්නේ නැහැ; නොගියොත් තරහ වේවි.''

''විජයගෙ මංගල්ලෙ ළඟ ද?''

''ලබන මාසෙ දහ වෙනි ද.''

''එහෙනම් තව සුමාන තුනයි.''

''මම බැරිය කිව්වේ ඇඳුම් නැති නිසා.''

''තිස්සගෙ හැම එකටම විජය එනව නෙවැ? නොගියොත් එයා තරහ වේවි.''

Scanned by CamScanner

''ඒ උණත් කොහොමද අනු මම යන්නෙ? මට ඇඳුම් තියෙන-වාය යන්න? ඇඳුම් නැතෙයි කිව්වොත් එයා ඇඳුම් මස්සවා දේවි. ඒක එයාට ඇහෙව්වොත් අපට ලැජ්ජයි නෙවැ.''

''එයාට කියන්න එපා ඇඳුම් නැති වගක්; මග අරින්න බලනව මිසක්. අපේ බැරිකම් ඒ ගොල්ලන්න උනත් දැනගන්න අරින්න හොඳ නෑ.''

''මග අරින්න තමයි මම පුළුවන් තරම් මහන්සි ගත්තෙ. විජය-ගෙන් බේරෙන්න බැහැ, යන්නම ඕනෑ ය කියනවා.''

''ඇඳුම්වලට කීයක් යාවි ද?''

''සූට් එකක් මස්සවන්න ඕනෑ; සපත්තු දෙකක් ඕනෑ. මගේ තොප්පිය පරණ උණත් ඒකෙන් පිරිමහන්න පුළුවනි.''

''සූට් එකටත් සපත්තු දෙකටත් කීයක් විතර යාවි ද?''

''රුපියල් තිහකින් විතර පිරිමහගන්න පුළුවන් වේවි.''

''මග අරින්න බැරි නම් මගේ රත්රන් බඩුවත් උගස් තියලා සල්ලි අරන් දෙන්නම්.''

''අලුත් ඇඳුමෙන් සැරසී දෙවන මනමාලයා මෙන් යාමට තිස්ස ද ආශා කෙළේ ය. ඇඳුම් නැති නිසා ඔහු විජය ගේ යෝජනාව බැහැර කරන්ට වෑයම් කෙළේ ඒ ආශාව මැඩ ගැනීමෙනි.

''අනුගේ බඩු උගස් තිබ්බාම මම බේරන්නේ කොහොම ද? මට සල්ලි හම්බවෙන්නේ කොහෙන්ද?''

''ඇහැක් විදියකින් මම බේරා ගන්නවා; බඩු ටික උකස් තිබ්බවන්න තමයි කෙනෙක් නැත්තෙ. අම්ම බැණලා දුන් කත්තිරිනා අපේ ගෙදර අහලකටවත් එන්නේ නැහැ. ඉස්සර අපි ඕනෑ කමක් උණාම බඩු උගස් තිබ්බෙව්වෙ කත්තිරිනාට කියා.''

''පියල්ලයි අම්ම බඩු උගසට ගන්නවා නෙව ද?''

''උන්ට කවුද බඩු උගස්තියන්නෙ අපේ ඔක්කොම බැරිකම් උන් දැනගනියි එතකොට.''

''එහෙනම් කොහොමද වැඩේ කරගන්නේ?''

''මම සාද අත ගාල්ලට යවා හෙට්ටි කඩේට උගස් තිබ්බවන් නම්. තිස්ස සාදත් එක්ක ගාල්ලට ගොහින් උඹ සල්ලි අරන් දුන්නාම ඇඳුම් මස්සවා ගන්න.''

අනුලා පලා බෙදන්නාක් මෙන් බතත් උම්බලකඩ නැති පොල් සම්බෝලයත්, මේසයට එවන ලදැයි ජිනදාස නොදනියි. නන්දා ද ඒ වගක් කිසි විටක ඔහුට නොකීවා ය. එසේ වුව ද අනුලාත් නන්දත් අසන්තෝෂයෙන් ඉන්නා බව ඔහු දනියි. අගහිඟ නිසා

Scanned by CamScanner

රක්සාවක් කරනු පිණිස සිංහලේ යාමට ජිනදස සිතාගත්තේ මීට දෙමසකට පමණ පෙර ය.

''නන්ද, මම මෙහෙම නිකම් ගෙදර හිටියාම කොහොම ද? පොඩි වෙළඳාමක් වත් කරන්න සිංහලේ යන්නයි මම හිතාගෙන ඉන්නේ''යි ජිනදස කී ය.

නන්ද අල්මාරිය යට වූ පොල් තෙල් බෝතලය ගෙන නිවෙන්ට ළං ව තුබුණ පහනට තෙල් ටිකක් වත් කොට ඇඟිලි තුඩින් පහන් වැටිය ටිකක් දික් කළා ය. අලුත් තෙල් උරාගත් වැටියෙන්, කාමරය මඳක් එළිය කරමින් මුදු එළියක් නිකුත් වී ය.

''වෙළඳාමක් කරන්න යන්න සල්ලි එපායැ?''යි නන්ද ඇසුවා ය.

''ගෙදර වත්තේ මගේ කොටස උගස් තියාලා මම රුපියල් හත්සිය පනහක් ගත්තා. එයින් දෙසීයකින් ණය ගෙව්වා. ඉතුරු පන්සිය පනහ තියෙනවා. මම එයින් සතයක් වත් වියදම් කරන්න හිතුවේ නැහැ.''

''වියදම් නොකරන එක හොඳයි. ගම ඉන්න ගියොත් ඒකත් ටික ටික වියදම් වේවි. ඈත පළාතකට යනවාටත් මම කැමැති නැහැ. ඒත් නොගොහින් මොනවා කරන්නද?''

''මම සිංහලේ යන්න දවසකුත් වේලාවකුත් බලවා ගත්තා.''

''කවද ද?''

''අනිද්ද''

''අනිද්ද!''යි තෙපලමින් නන්ද ශොකයෙන් බර වුණු තම හිස පාත් කර ගත්තා ය. ඈ අනතුරු ව හිස ඔසවා බැලුවේ තම සැමියා දෙස ය.

''එහෙනම් යන්න; කල් දමන්නේ මොනවට ද? ගිහිල්ලා ප්‍රවේගමෙන් වැඩ කරන්න. මම ඇහැක් විදියකින් වැඩ කරගෙන ඉන්නම්.''

නන්දගේ දෙනෙතට කඳුළු නගිනු දුටු ජිනදසගේ දෙනෙතට ද කඳුළු නැංගේ ය.

''මම ගිහිල්ලා මාසෙකට සැරයක් සල්ලි ටික ටික එවන්න බලනවා.''

''සල්ලි එවන්න එපා. වෙළඳාම දියුණු කරගත්තාට පස්සෙ එවන්න. එතකල් මම ඇහැක් විදියකින් බලා ගන්නම්. කොහේද වෙළඳාම කරන්න හිතාගෙන ඉන්නේ?''

''බිබිලේ''

''බිබිලේ උණ තියෙන පළාතක් නෙව ද? ඈයි වෙන දිහාවකට යන්න බැරි ද?''

"වෙන දිනෙක වෙළෙඳාමක් කරන්න නම් සල්ලි හුඟක් ඕනෑ. බිබිලේ හොඳයි. අඩු වියදමෙන් ජීවත් වෙන්නත් ඇහැකි. සල්ලි වැඩිපුර නැතත් ඒ පළාතේ වෙළෙඳාමක් පටන්ගන්න ඇහැකි."

"උඹ නැදුණොත් එහෙම?"

"උඹට බය වෙලා බැහැ නන්ද. මම උඹෙන් පරෙස්සම් වෙන්න බලනවා."

"අම්මාටත් කියන්න. අම්මා ඔය පළාත ගැන අහලා ඇති"යි කියමින් නන්ද අසුනෙන් නැගී ගොස් කාමරයෙහි දොර අඩවන් කළා ය. ඔවුන් දෙදෙනා මේ කතා බහ කරන්නේ මහ ගෙදර අනික් සියලු දෙනාම නින්දට ගිය පසු ය.

බිඳුණු උළු කැට අතරින් වැස්සෙන වැහි බිඳු ගෙපිලෙහි ද පෙට්ටියක් උඩ ද පැදුරක ද ඉඳ හිට වැටීමෙන් නගින හඬ රැයෙහි නොනිඳ උන් නන්දට ද ජිනදාසට ද ඇසෙයි. ඔවුන්ගේ කාමරයෙහි වූ අල්මාරිය උඩ ද වැහි බිඳු වැටෙයි. නන්ද පරණ ගෝනියක් ගුලි කොට අල්මාරිය උඩ වැහි බිඳු වැටෙන තැන තැබුවා ය. වැස්සක් නැවතුණු වහා ම මහ ගෙයි වහලින් වැටෙන දිය බිඳු, අවුරුදු කිහිපයකින් අලුත් වැඩියා නොකරන ලද ඒ වහළ ක්‍රමයෙන් දිරා පත්වන බව කියන ලකුණු ය. වහලෙහි උළු යට එක් වුණු කුණු, සුළං හමන කල ගෙය පුරා වැටෙයි. පොල් අතු අග්ගිස්සක් බඳින ලද පිටකින් කිහිප වරක් සාද, මකුළු දැල් කඩා වහල සුද්ධ කළ නමුත් සුළං කාලයෙහි කුණු වැටීම නොනැවතිණ. එය නැවැත්විය හැක්කේ ගෙය ද වහල ද අලුත් වැඩියා කිරීමෙනි.

මෑතකදී සුනු පිරියම් නොකරන ලද මහ ගෙයි, පොළොවට නුදුරින් වූ බිත්තිය, පාළු ගෙයක බිත්තිය සිහිපත් නොකෙළේ, ගෙයි වාසය කරන්නන්ගේ වැර වෑයම නිසා ය. වරින් වර කිහිප වරක් පොල් ලෙල්ලෙන් උලා සේදීමෙන් බිත්තිවල පෙඳ පැල්ලම් මකන ලද බව දහවල් කාලයෙහි මහ ගෙයි බිත්ති දෙස බලන කාහට වුව ද දැනගත හැකි ය. සුනු නොගාන ලද නමුත්, අලුත් බදමෙන් පිළියම් කරන ලද තැන් ඇති පිට බිත්ති, අණ්ඩ ඇල්ලීමෙන් වැසුණු ඉරුණු තැන් ඇති, කිලිටි සුදු ඇතිරිලි වැන්න. මහ ගෙදර වෙසෙන්නන් තමන්ගේ දිළිඳු කම ලෝකයාගෙන් සැඟවීමට කරන වැර වෑයම ගෙයි බිත්ති දෙස බලන්නන් අතුරෙන් කොතෙක් දෙනකුට වැටහෙන්නේ දැයි කීම දුෂ්කර ය.

බිඳුණු උළුකැට අතරින්, ඇඳක පැදුරක 'ටක්—ටක්' යන හඬින් දිය බිඳු වැටෙනු නන්දට ඇසෙයි. ඈ තම කාමරයෙන් නික්ම මඳක් ඈතින් වූ කාමරයට ගියා ය. එහි බිත්තිය අද්දර වූ ඇඳෙහි නිදන තිස්ස, තම කාමරයෙහි වහලටත් බිත්තියටත් අතර විවරයෙන් ඇතුළු වන මඳ එළියෙන් නන්ද දුටුවා ය. 'ටක්—ටක්'

යන හඬ නගමින් වැහි බිඳු වැටෙන්නේ තිස්සගේ ඇඳෙහි වූ පැදුරෙහි ය. හුස්ම ඉහළ පහළ හෙළන හඬින් ම තිස්ස බර නින්දෙන් නිදා බව නන්දා දැන ගත්තා ය. ඔහු අවදි නො කළ යුතුයයි සිතා නන්දා ඇඳෙහි එක් කොනක් මැනට ඇද්දා ය. එවිට වැහි බිඳු වැටුණේ ඇඳෙහි නොව බිම ය.

"තෙමෙන්නේ තිස්සගේ ඇඳ ද?" ජිනදාස කාමරයට ඇතුළු උණු නන්දාගෙන් ඇසුවේ ය.

"ඔව්, තිස්ස හොඳට ම නිදි."

"ගෙයි බිව්විත් තෙමෙනවා ඇති. බිව්වි තෙමෙන්න හොඳ නැහැ."

"බිව්වි තෙමෙන්නේ නැහැ. හුඟක් කාලෙකින් උළු මාරු කරවන්න බැරි උණා"යි කියමින් නන්දා තම සැමියාගේ ඇඳෙහි ම වාඩි වූවා ය.

"උළු මාරු නොකළොත් වහලේ පරාලත් රීප්පත් තෙමිල දිරාවි"

"පරාළ රිප්ප පරණ උණත් හොඳ කොස් ලී. උළු විතරයි මාරු කරන්න තියෙන්නේ; ගේ ලොකු හින්දා උළු මාරු කරන්න හුඟක් වියදම් වෙනවා."

"තිස්සට ගම ඉන්න අරින්න හොඳ නැහැ. කාංඩවලට වැටිලා නරක් වෙනවා."

"අම්මා තිස්ස රස්සාවකට අරින්න හැදුවා; ඉඩ නුදුන්නේ අපි. තව ටිකක් කල් ඉගෙන ගන්න අරින්න යයි අපි කිව්වා. දැන් ඉතින් ආයිත් ඉස්කෝලේ අරින්න බැහැ. තිස්සත් කැමැති රක්සාවක් කරන්න තමා."

"රක්සාවකට යවන එක හොඳයි. බලදාසට සල්ලි තියෙනවා ගම නිකන් උන්නත් එයාට පාඩුවක් නැහැ. තිස්සට එහෙම ඇහැක?"

"විජයගෙ මංගල්ලෙන් පස්සේ තිස්ස රක්සාවකට යන්න තමයි ඉන්නේ; එයාටම දැන් ගම එපා වෙලා."

ඇඳෙහි දිගා වී ටික වේලාවකින් ජිනදාසට නින්ද ගිය නමුත් අනාගතය ගැන සිතන්ට වූ නන්දාට නින්ද ගියේ පැයක් පමණ ගෙවුණු පසු ය.

ජිනදාස සිංහලේ ගොස් සති හතරකට පමණ පසු තිස්ස ද රක්සාව උදෙසා කොළඹ ගියේ ය. සුබ මොහොතින් කොළඹ යාමට පිටත් වන්නට පෙර අනුලා ද නන්දා ද බුලත් කොළවලං දවටන ලද රුපියලේ රිදී කාසි දෙක බැගින් තිස්සගේ අතෙහි තැබූ හ. මව ද රුපියලේ කාසි දෙකක් තිස්සගේ අතෙහි තබා ඔහුගේ මුහුණ සිප කඳුළු රැඳුණු දෙනෙත් ඇති ව මෙසේ කීවා ය.

''අනේ පුතා! උඹ හොඳින් ඉන්න ඕනෑ. ගමදී වගේ රෑ ඇවිදින්න යන්න එපා. නරක මිනිස්සු ආශ්‍රය කරන්න එපා. රක්ෂාව කරන ගමන් ඉගෙනගන්නත් බලාපන්.''

තිස්ස මහ ගෙදරින් පිටත් වුණේ ශෝකයෙන් බර වූ හද ද කඳුළු රැඳි දෙනෙත් ද ඇති ව ය. තිස්ස දුම්රිය පළට ඇරලනු සඳහා බලදාස ද විජය ද ගිය හ. බලදාස, දුම්රිය ළඟා වන තුරු බලා උන් තිස්සගේ අතෙහි රුපියල් පහේ කොළයක් තැබුවේ ය. පොරෙන් ඒ තිස්ස එය ආපසු බලදාසට දුන් නමුත් ඔහු වදෙන්—පොරෙන් ඒ තිස්ස එය ආපසු බලදාසට දුන් නමුත් ඔහු වදෙන් රුපියල් පහ තිස්සගේ සාක්කුවෙහි දැමී ය. විජය, කඩදාසියක දවටන ලද දෙයක්, දුම්රියට නැඟී අසුනෙහි වාඩි වුණු තිස්සගේ උකුළෙහි තබත්ම දුම්රිය ද පිටත් විමට ගෝසාව නැඟී ය.

''මොකට ද විජේ තෑගි?'' යි තිස්ස ශෝකාකුල ස්වරයෙන් ඇසී ය.

දුම්රිය පිටත් වූ වහා ම තිස්ස, දුම්රිය පළේ පිල් කඩ උඩ උන් තම මිතුරන් දෙදෙනාට අත වැනීමෙන් ආයුබෝවන් කී ය.

''ගිය හැටියේ අපට ලියුම් එවන්න'' යි බලදාස කෑගැවේ ය.

''ගිය හැටියේම ලියුම් එවනවා.''

''කොළඹ කෙල්ලන්ට රැවටෙන්ට එපා! උන් මහ අමාරු කාරියෝ!'' යි බලදාස යළිත් කෑගසා සිනාසුණේ ය.

තිස්ස සිනාසුණ නමුත් කිසිවක් නොකීවේ ය. තම හිත මිතුරාගෙන් බලදාස සහ විජය ද ආපසු ගමන් කෙළේ තම හිත මිතුරාගෙන් වෙන් වීම නිසා හටගත් දැඩි ශෝකයෙනි.

''තිස්ස හොඳ එකා'' යි බලදාස කී ය.

''අනේ ඔව් හොඳ හිත ඇති එකා.''

''නොයන ගමනකට උණත් අපි අඬගැහුවොත් තිස්ස එනවා. කිසිම ආඩම්බරයක් නැහැ. අපි යන ඕනෑ එහෙකට එනවා; කරන ඕනෑ වැඩකට හවුල් වෙනවා. අපි යන ගමනකින් අපි වලක්කන්න හදල බැරි උණ විටවත් තිස්ස මහ අරින්නේ නෑ; අපිත් එක්ක එනවා.''

''අක්කල නම් ටිකක් ආඩම්බරයි. තිස්සට නම් ඒක ගෑවිලාවත් නැහැ. තිස්ස දෙවෙනි මනමාලයාට සූට් එක මස්සවා ගෙන තියෙන්නේ සල්ලි ණයට අරගෙන, මිනිහාගේ කටින්ම, මට ඒක අහු උණා.''

''ඇයි සූට් එකක් මස්සවා නුදුන්නේ?''

''මම දන්නේ පස්සෙ. මම කලින් ඇහුවාම එපයි කිව්වා.''

''තිස්ස බොහොම ලැජ්ජාකාරයා. ලැජ්ජා හිතෙන වචනයක් ඇහුවොත් මිනිහගේ හිතට බොහොම අමාරු වෙනවා. මිනිහා

Scanned by CamScanner

ගෙදරින් පිට උණාම කලබල නොකර උපාසකයා වගේ ඉන්නේ ඔය ලජ්ජාවත් බයත් නිසා.''

''අපේ ගෙදරට ආවත් තිස්ස කතා කරන්නේ මම එක්කයි, අම්මා එක්කයි විතරයි. නංගි එක්කවත් වැඩිය කතාකරන්නේ නැහැ. මගේ නෝනා එක්ක කතා කරන්නේ කලාතුරකින්.''

''තිස්ස ලස්සණ ගෑනු එක්ක කතා කරන්න හොඳට ආසායි''යි බලදස කිවේ ය. ''තිස්ස උන්ට ආදරෙයි; නමුත් ලැජ්ජාව නිසා මිනිහා ගෑනුන් අතරට ගියාම ගොළු වෙනවා!''

''තිස්ස ලයිසා එක්කත් කතා කරන්නේ නැද්ද?''

''නැහැ නොවෙන්නම්. ලයිසා එක්ක කතා කළොත් ඉඳහිටලා. තිස්ස වැඩිය කතා නොකරන නිසා ලයිසාත් තිස්ස එක්ක කතා කරන්න බයයි. ලයිසා විතරක් නෙවි ගමේ හැම ලමිස්සියොම තිස්සට බය යි කියා මම හිතනවා.

''බයයි?''

''ඔව්–බය තිස්ස උපාසකයෙක් ය කියා උන් හිතන නිසා. නමුත් තිස්ස උපාසකයෙක් නෙවි.''

''තිස්ස පස්සේ ලයිසාගේ ගෙදරට නොගොහින් ඇරියේ ඇයි?''

''අම්මා එපයි කිව් නිසා. දැන් මාතර හාමිනේ ඉස්සර වගේ කත්තිරිනා එක්ක හොඳ නැහැ. කත්තිරිනා මහ ගෙදර අහල-කටවත් යනවාට මාතර හාමිනේ කැමති නැති බව දවසක ලයිසාගේ කටින්ම එළි උණා.''

''සමහර විට තිස්ස ලයිසා බලන්න යන වග ආරංචි උණාට පස්සේ වෙන්න ඇති''යි විජය කී ය.

''ඒකටම වෙන්න බැහැ; සමහර විට කත්තිරිනා පියල්ලයි ගෙදරට නිතර යන එන නිසා වෙන්න ඇති.''

''ඒකට මාතර හාමිනේ තරහ වෙන්නේ මොකට ද?''

''විජේට මතක නැද්ද? පියල් නන්දට අඳුනක් කැවීමේ කතාව. අඳුන කත්තිරිනා ලවා කවන්න ඇතැයි සැක කරන්න ඇති. දැන් ඒ ගැනි පියල් එක්ක හොඳට යාළු නිසා ආයිත් මොනවා-වත් කවාවිය කියා බය ඇති.''

''හරි! හරි! දැනුයි මට තේරෙන්නේ''යි කියමින් විජය බලදසගේ මතය පිළිගත්තේ ය.

''පියල්ගේ හිතින් නාම පුංචි නෝනා ඉවත් වෙලා නෑ. මුහන්-දිරම් මහත්තයා මැරුණාට පස්සේ පියල් නිතර ගමට එනවා. පුංචි නෝනා මහ ගෙදර නවතින්න ආවාට පස්සේ පියල් සුමානෙකට සැරයක් ගමට එන්න පටන්ගත්තා.''

Scanned by CamScanner

''පියල් දූන් මහ ගෙදරට යනවා නෙවද නිකර?''

''ඔව් මාතර හාමිනේත් අනුලාත් එයා එක්ක කතාවට ගියාට පුංචිනෝනා යන්නේ නැහැ. එයා මහා ආඩම්බරකාරි.''

''පුංචි නෝනා කසාද බැඳලා නෙව? එහෙනම් පියල්ගේ හිතේ ඇති අනුලා කසාද බැඳගන්න.''

''නැහැ''යි බලදස සැණකින් පිළිතුරු දුන්නේ ය. ''අනුලා කසාද බඳින්නේ නැහැ; මීට ඉස්සර යෝජනා කීපයක් කරා; ඒ එකකටවත් කැමති උණේ නැහැ. දූන් අනුලා කසාද බඳින වයසත් පහු වෙන්න ගියා.''

'එහෙනම් පියල් යන්නේ පුංචි නෝනා යාළු කරගන්න හිතාගෙන!''

''ඒක හිතේ තියාගෙන වෙන්න ඇති. පුංචි නෝනා එහෙම රැවටෙන ගැහැනියෙක් නෙවි''.

බලදසත් විජයත් කෙළින්ම ගියේ මහ ගෙදරට ය. ඔවුන් දුටු විගස මාතර හාමිනේ ඇසුවේ තිස්ස ගැන ය.

''තිස්ස හුඟක් කණගාටුවෙන් ගියේ. රේල්ලට නැග්ගට පස්සෙවත් මිනිහා සන්තෝසෙන් උන්නද?''

''මොන සන්තෝසයක් ද? තිස්සගේ ඇස් දෙකේ කඳුළු පිරිලා. මිනිහා අඬන්නේ නැතිව උන්නේ බොහොම අමාරුවෙන්''යි බලදස කීය.

''මම ඉස්ටේසමට ගියා නම් එයාගේ කනගාටුව වැඩි වෙනවා; මම නොගියේ ඒ නිසා.''

''හා පැටියා බලාගන්නයයි තිස්ස දෙසැරයක් ම කිව්වා''යි විජය කී ය.

''එයාට මතක් වෙලා තියෙන්නේ හා පැටියා! අපි නෙවි''යි නන්ද කීවේ සිනාසෙමිනි.

''පුංචි නෝනා මතක් කරන්න මහත්තයා ඉන්නවා නෙව''යි බලදස සරදම් කෙළේ ය.

''මහත්තයා? මොන මහත්තයෙක් ද'' යි නන්ද ඇසුවේ රවා බලමිනි.

''ජිනදස මහත්තයා — පියල්''

''බලදස මම එක්ක ඔය ඕනෑ නැති කවටකම්වලට එන්න එපා''යි නන්ද සැර කළා ය.

''මම කෙරේ කවටකමක් නෙවි. ජිනදස මහත්තයා විතරක් නෙවි; පියලුත් තාම පුංචි නෝනා මතක් කරනවා ඇති.''

Scanned by CamScanner

"පියල් මොනවට ද මම මනක්කරන්නේ? බලදසට මම කිව්ව නෙව ද ඕනෑ නැති කවටකම් කරන්න එන්න එපයි කියා?"

"කවටකමට නෙවි ඇත්තට මම කිව්වේ. පියල්ට කිප තැනකින් කතා කරා ජේමිස්; මිනිහා ඒ එකකට වත් කැමැති නැහැ."

"ඒක පියල්ලයි අම්මටයි කියන්න ඕනෑ; මට නෙවි."

"කොයි හැටි උණත් පුංචි නෝනත් දැනගන්න ඕනෑකාරණයක්."

"මට දැනගන්න ඕනෑ කමක් නැහැ, අනුන්නෝ විත්ති."

"පියල් ලොකු ගේකුත් හදනවා; පුංචි නෝනාට ජේන්න වෙන්න ඇති."

"වාචාල කතා කියන්න එපා බලදස."

"පියල් කොච්චර හොඳ මිනිහෙක් ද? හරියට සල්ලි තියෙනවා. මොටෝකාර් එකකුත් ගේන්න යනවා ළඟදී."

"බලදසගෙ කවුරුත් ඉන්නවා නම් පියල්ට කසාද බැඳලා දෙන්න බැරිය?."

"අපේ කවුරු වත් උන්නත් පියල් කැමැති වෙන්නේ නෑ."

"ඇයි?"

"පුංචි නෝනා නිසා" කියමින් බලදස නන්දගෙන් ඈත් වී ය.

නන්ද හාන්සි පුටුවෙහි තුබුණු කුඩා කොට්ටය ගෙන බලදසගේ මුහුණට දමාගසා ඉවත් ව ගියා ය.

"බලදස ආවොත් නන්දට කවටකම් කරන්න ගොහින් බැනුම් අහලයි යන්නේ"යි අනුලා කීවා ය.

"බලදසට කට තියාගෙන ඉන්න බැහැ; දෙඩවනවා."

"පුංචි නෝනාට අඬගහන්න"යයි විජය යෝජනා කෙළේ ය.

"අනේ මට නම් බැහැ; එයා මම එක්කත් රංඩුවෙන්න පටන්ගනීවි."

"පුංචි නෝනා කැමති නූණ නිසා අනුලා කැමති වෙන්න" බලදස යෝජනා කෙළේ ය.

"බලදස ඒ පාර කවටකමට මම අල්ලාගන්න හදනවා ද?"

"කවට කමට නෙවි; මම කියන්නේ ඇත්තට. පියල්ට හරියට සල්ලි තියෙනවා!"

"මේ පාර බලදසගේ රක්සාව ම ල් කපුකම් කිරීම ද?"

"පුංචි නෝනා මෙන්න අක්කා ටිකකට කතා කරනවා"යි විජය කාමරයෙහි උන් නන්දට ඇසෙන සේ කෑගැසී ය.

Scanned by CamScanner

''බොරු කියන්න එපා විජය; කතා කෙරේ නෑ''යි අනුලා සැර කළා ය.

''පියල්ට කොච්චර සල්ලි ලැබුණත් එයාලයි අම්මයි වැඩේ සල්ලි හම්බ කිරීම ම යි'' බලදස කී ය.

''පියල්ලයි අම්මට සල්ලි හම්බ කරන්න බැරි මොකද? උගස් බඩු ගන්නවා. පොල් ලෙලි දමනවා. ඉඩම් බදු ගන්නවා. දැන් ගැනිටයි. අද ඒ ගැනි පොල් ලෙලි බේරවනවා.''

''ඔහෝ! ඒකයි එහෙනම් පොල් ලෙලි තළන හඬ ඇහෙන්නේ. අද තොටි පළේ ගෑනු පිරිලා ඇති. විජය යං තොටි පළ පැත්තේ-අද මාළු අකුලකුත් වට කරනවා.''

''මාළු අහු උණොත් අපිටත් ටිකක් අරන් එවන්න''යි කියමින් අනුලා සත පනහේ කාසියක් බලදසට දුන්නා ය.

''සල්ලි තියාගන්න; මාළු තිඋණොත් අපි අරන් එන්නම්''යි කියමින් බලදස, විජය ද සමඟ තොටිපළ බලා ගියේ ය.

තොටිපළ මහ ගෙදර ගල් වැටින් මයිල කාලක් පමණ ඇතින් පිහිටි ගං ඉවුරෙහි වූවකි. එහි යාමට මහ ගෙදරට දකුණු පැත්-තෙන් ගම්සභා පාර ඇතත්, බලදසත් විජයත් එහි ගියේ මහ ගෙදර පිටිපස ගල් වැටින් පැන, එතැන් පටන් තොටි පළ තෙක් කැලය මැදින් වැටී ඇති අඩි පාර ඔස්සේය. කිරිතිල්ල, තැල්කොළ, යන ආදි වැළින් හෙවුණු කඳුරු ගසින් හා මිදෙල්ල ගසින් ද හෙවණ වුණ ඒ පාරෙහි නියං කාලයෙහි පවා කූඩැල්ලෝ හිඟ නොවෙත්. තමන්, වියළි කොළ පාගන විට නඟින හඬ අසා කැලයට වදින කොරවකුන් නඟන හඬ, ඔවුන් දෙදෙනාට ඇසෙයි. කිරල ගසින් හා කඩොල් ගසින් ද හෙවණ වූ මඩ සහිත ඉවුරෙහි වදින මාරියාව නිසා අනවරතයෙන් නඟින්නේ බලදසටත් විජයටත් සුපුරුදු හඬකි. කොහු තළන ගැහැනුන් අතින් ගත් කිතුල් පොලු කොහු කඳවල වැදීමෙන් නඟින හඬ දැන් ඔවුන් දෙදෙනාට වඩාත් ළං ව ඇසෙයි. ඔවුන් තොටි පළට පැමිණියේ කුඩා අගළකින් පැන තවත් අගළක් හරහා දමන ලද ඒදංඩකින් එතෙර වීමෙනි.

කුඩයකින් හිස සෙවණ කරගත් පියල්ගේ මව, තෙපානිස් නමැති මෙහෙකාරයා පොල්ලෙලි ගැන ගැහැනුන්ට දී මුදල් ගනු බලා සිටියි. සමහර ගැහැනු කලින් තළා අව්වෙහි දමන ලද කොහු එකතු කොට ලනු අතංගුවල දමා ඔබා හිසින් ගෙන තමන් ගේ නිවෙස් බලා යෙති. අනික් ගැහැනු තන පට බැඳගෙන පොල් ගස් යට වාඩි වී තවමත් පොල්ලෙලි තළති.

''බලදස මහත්තයා මාළු අල්ලනවා බලන්න වත් ද මේ පැත්තේ ආවේ?''යි පියල්ගේ මව විචාළා ය.

Scanned by CamScanner

"ඔව් අපි ආවේ ඒකට තමයි. පොල් ලෙලි බේරවා ඉවර ද?',

"ඉවරයි. තෙපානිස් මේ ඉතුරු පොල්ලෙලි ටික ගැණලා දෙනකල් බලාගෙන ඉන්නවා."

"ඔරුවක් බාගෙන අකුල් වැටිය බලන්න යන්න ඕනෑ"යි කියමින් බලදාස ඔරුවක් සොයා ගියේ ය.

"ඇයි මහත්තයා නිකම් පව් පුරවා ගන්න යන්නේ? මාළු අල්ලනවා බලාගෙන උන්නත් පව් නෙවද?"

"ටිකක් පව් උණත් කමක් නැහැ!"යි කියමින් බලදාස ඔරුව දියත් කොට එහි නැංගේ ය.

"ටිකක් නෙවි හුඟක් පව්. නිකම් පව් සිද්ද කර නොගෙන ගෙදර යන්න. අම්මා දැනගත්තොත් බණීවි"යි පියල්ගේ මව තර්ක කළා ය.

ඇගේ බණට කන් නුදුන් බලදාස, විජය ද නැඟුණු පසු අකුල් වැටිය දෙසට ඔරුව පැදවූයේ ය.

මස්මරන්නෝ, හත් අට මසකට පෙර නදියෙහි කොළ අතු සිටුවන ලද තැන වට කොට රැයෙහි බට පැළලි අදිති. උදය වරුවේ ඒ කොළ අතු නොහොත් ඉදල් උදුරා උදුරා ඉවත දමමින් කොටුව ක්‍රමයෙන් කුඩා කොට අවසානයෙහි එක බට පැලැල්ලකින් නැනුණු හිර කුඩුවක් තුළට මසුන් ගාල් කරති. අතංගුවක් ගෙන මේ කොටුව තුළට බසින මස් මරන්නෙක් එහි හිරවුණු කොරලියන්, කටුමැස්සන්, පැන්නන්, ගොඩයන්, ලිල්ලන් බඩෝරුන්, ආදී මසුන් පෙරා ගෙන ඔරුව තුළ දමීමට දෙයි. බලදාසත් විජයත් පැමිණියේ මේ මසුන් ඇල්ලීම බලනු පිණිස ය. මස් මරන්නන් කොටුව තුළ හිර වුණු මසුන් අල්ලා අවසාන කරන තෙක් බලා උන් බලදාසත් විජයත් රුපියලක මාළු ගෙන ආපසු ඔරුව පැදවූහ.

## 10 වන පරිච්ඡේදය

දවසක උදේ යහළුවන් සමඟ ගඟේ ඔරු පැදීමට ගිය බලදාස තොටිපළට ආපසු පැමිණියේ දහවල් කාලයේ ය. යහළුවන් ඔවුනොවුන්ගේ ගෙවල් බලා ගිය පසු බලදාස ගං ඉවුරින් වැටුණු අඩි පාර ඔස්සේ ගමන් කොට ගල් වැටින් පැන මහ ගෙදර පැළදෙර පැත්තේ මිදුලට පැමිණියේ ය.

''තිසා ගිය ද ඇවිත් ගියාට පස්සේ බලදාස මේ පැත්තේ ආවේ අද තමා''යි දෙරටුවෙහි සිටි අනුලා කීවා ය.

''තිස්සගෙන් මට මාසෙකින් ලියුමක් ලැබුණේ නැහැ. ළඟදී ලියුම් ලැබුණා ද?''

''ඔව්, පෙරෙයිදාත් ලියුමක් ලැබුණා. බලදාස ගැනත් අහළා තිබුණා. එද අරන් එවූ මාළුවලට බොහොම ස්තුතියි. මාළුවලට කීයක් ගියා ද?''

''මොන මාළුවලට ද?''

''එද තිස්ස කොළඹ ගිය දවසේ අරන් එවූ මාළුවලට.''

''ඔහෝ — ඒ මාළුවලට ද? ''

''ඔව්''

''ඒ මාළු පියල්ලයි අම්මා අරන් දුන්නා. පුංචි නෝනාට දෙන්න කියා!''යි බලදාස සරදමක් කරන අටියෙන් නන්දට ද ඇසෙන සේ මහ හඬින් කී ය.

අනුලා ගෙයින් එළියට බැස බලදාසට පමණක් ඇසෙන සේ මෙසේ කෙඳුරුවා ය.

''පියල් අන්න ඉස්සරහ පැත්තේ ඉස්තෝප්පුවේ අම්මා එක්ක කතා කරකර ඉන්නවා! කවට කම් කරන්න එපා. එයාට ඇහේවි.''

''පියල් කවදද ගමට ආවේ!''යි බලදාස විස්මයෙන් ඇසී ය.

''ඊයේ''

''පියල්ලයි අම්මා මට ඊයේ හම්බ උණා. ඒ විත්තියක් වත් මම එක්ක කිව්වේ නැහැ.''

''ඒ අම්මංඩිගේ සිහිය සල්ලි හම්බ කරන්නයි. ඇත්තට ම මාළුවලට කීයක් දුන්නා ද?''

''රුපියලයි. මට සල්ලි ඕනෑ නෑ''යි කියමින් බලදාස පැළ දෙරින් ගෙට ඇතුළු වී ය.



Scanned by CamScanner

"සල්ලි ගන්නේ නැති නම් අපි තවත් මොනවා වත් ගේන්න කියන්නේ නෑ."

"සල්ලි ගන්න බැරිය පස්සෙ"යි කියමින් බලදූස ආලින්දයට පිවිසියේ ය."

"පියල් කවදද ගමට ආවේ.?"

"ඊයේ"

"වතුර නැතිව පියල්ට ගෙයි වැඩ නවත්වන්න උණාය කියන්නේ" මාතර හාමිනේ කීවා ය.

"ලිඳ හිඳිලා ද"යි අසමින් බලදූස පුටුවක වාඩි වූයේ ය.

"ඔව්, පොඩි කළයක් පිරෙන තරම් වත් ලිඳේ වතුර නැහැ. නියං කාලෙ පහු වෙන තුරු ගෙයි වැඩ නවත්තන්න උණා."

"දැන් ලිං ඔක්කොම හිඳිලා. තොටිපළ ලඟ ලිඳ ළඟ උදේ හවස කළගෙඩි ගත් ගැනු පිරිලා."

"මෙහෙම පායන්න ගියොත් ගස්–කොළන් වත් ඉතුරු වෙන එකක් නැහැ. තණකොළ පිළිස්සිලා ගිහිල්ලා. හරකුන්න කන්න දෙයක් නැතුව දැන් දෙල් ගස් මුල ලැටි ගාගෙන කනවා"යි මාතර හාමිනේ කීවා ය.

"අපි හිතුවෙ පියල්ලයි ගෙයි වැඩ ඉවර ය කියා"යි බලදූස කී ය.

"ගෙයි පිළේ සිමෙන්ති දමන්න විතරයි තියෙන්නේ. කුස්සියේ පිට බිත්තිවල සුදු බදාම ගාන්නත් තියෙනවා. තව දවස් දහයක දෙළහක වැඩ තමයි ඉතුරු උණේ."

"කොළඹටත් වතුර හිඟද"යි මාතර හාමිනේ විචාළා ය.

වතුර පයිප්ප තියෙන නිසා කොළඹට අමාරුවක් දැනෙන්නේ නැහැ. ඒකට මොකද මේ කාලේ කොළඹ ඉන්න එක අමාරුයි. රෑට නිදාගන්න එක තමයි ඔක්කොටම වඩා අමාරුව."

"ගෙට හුඟක් වියදම් වෙන්න ඇති"යි බලදූස කී ය.

"ටිකක් වියදම්"

"සොහොමවත් පහළොස් දහකට අඩු වෙන එකක් නැහැ"යි කියමින් බලදූස වට පිට බැලුවේ නන්ද තමා ගේ වදන් ඇසෙන තෙක් මානයක සිටිනවා දැයි දැනගනු පිණිස ය.

"එච්චර නැහැ."

"තනි මිනිහෙකුට ගේ හුඟක් ලොකුයි නොවද?"

"ඇයි අම්මා?"

"මම කිව්වෙ තනිකඩයෙකුට"

"පියල් මහණ වෙන්න ඉන්නව නම් නෙව තනිකඩයා වෙන්නේ" යි මාතර හාමිනේ කීවා ය.

පියල් කිසිවක් නොකියා කර බාගත්තේ ය.

"පියල් ආපසු කොළඹ යන්නේ කවද ද?" යි අසමින් බලදස හුනස්නෙන් නැංගේ ය.

"දෙතුන් දවසකින්"

"දවල් උණා; අපි යනවා" යි කියමින් මිදුලට බැස්ස බලදස තම නිවෙස බලා ගමන් කෙළේ ය.

අනුලා ආලින්දයට ගියේ බලදස ගිය පසු ය.

"මම මේ පැත්තට නාවේ බලදස උන්න නිසා. එයා දෙඩවනවා; කටට කමට පටන්ගත්තාම කටට ආ ආ එක කියනවා" යි කියමින් අනුලා, තම මව අසල පුටුවක වාඩි ගත්තා ය.

"පුරුදු වෙලා ගණනක් නැහැ" පියල් කී ය.

"පියල්ට තිස්ස හම්බ වෙන්නේ නැද්ද?"

"ඉද–හිටලා දවසක හම්බ වෙනවා"

"මිනිහා සන්තෝසෙන් ඉන්නවද?"

"කොළඹට ගියාම සන්තෝසෙන් ඉන්න ඇහැකි. ටික දවසකින් කාට උනත් ගම මතක නැති වෙනවා. තිස්ස ගැන දන් තොරතුරු ටිකක් කිව්වා මාතර හාමිනේට".

"ඔව්, අනූ — තිස්ස හොඳින් ඉන්නවලු, නමුත් සෙල්ලම් බලන්න යනවා ටිකක් වැඩිවා වාගෙයි."

"නැහැ" යි පියල් කීය. "කොළඹට සර්කස් එකක් ආවාම කවුරුත් බලන්න යනවා. එහෙම එකක් බලන්ට ගියාට වරදක් නැහැ. සර්කස් එකක් එන්නේ අවුරුද්දකට සැරයක්."

කට කොනකට තභාගත් සිනාවක් ඇතිව නන්ද ආලින්දයට පැමිණියේ තිස්සගේ තොරතුරු අසනු රිසියෙන්මද නොව තමා කාමරය තුළට ම වී ඉඳීම නොමනායයි වැටහුණු නිසා ද වේ.

පියල් කතා බහ කරමින් මෙතෙක් ප්‍රමාද වූයේ නන්ද දකින ආශාව ද ඇතිව ය. පියල් තමා දෙස බලා සිනා සෙන් ම නන්ද බිම බලාගත්තා ය. තම දෙනෙත් පියල්ගේ බැල්මට හසු වනු වැලැක්වීමට තමා වෑයම් කරන්නේ කුමක් නිසාදැයි නන්ද නොදනියි.

විවාහ වන්නට පෙර නන්ද දුටු විට පියල්ගේ සිතෙහි හටගත්තේ කවිකාර තරුණයකු තුළ හටගන්නා සුරවිර හැඟීමට සම වූ හැඟීමකි. 'නන්ද මට ආදරෙයි' යන හැඟීම අපමණ සන්තෝෂයට කාරණයක් වී ය. සුන්දර වර්ණයෙන් බැබලෙන පියාපත්

ඇති කුරුල්ලකු අතට හසු වුණු දරුවකු තුළ හටගන්නා සන්තෝෂයටත් ආශාවටත් වෙනස් සන්තෝෂයක් හා ආශාවක් ද නොවේ, නන්ද නිසා එකල පියල් තුළ හටගත්තේ. එහෙත් දැන් නම් පියල් තුළ හටගන්නේ ඊට වඩා බෙහෙවින් වෙනස් ප්‍රචණ්ඩ හැඟීමකි; ආශාවකි; එකල නන්ද ඇගේ මව ළඟ වාඩි වී ඉන්න විට ද පියල් ඈ සිහි කොට සන්තෝෂ වී ය. දැන් නම් ඔහු, නන්ද අල්ලා තුරුළු කොට ගැනීමේ ආශාවෙන් මඩනා ලද්දෙකි. 'නන්ද මට ආදරෙයි' යි සිතීමෙන් සන්තෝෂ වුණු ඔහුට දැන් සන්තෝෂය ලැබිය හැක්කේ 'නන්ද මගේ' යයි කිය හැකි වූ විටක ය. පියල් තුළ නන්ද නිසා පළමුව හටගත් බොළඳ ආලය මෙසේ වෙනස් වූයේ, ඔහු ටිකක් වයසින් පැසුණු නිසා නොව ඈ අනිකකු සතු වුණු නිසා ය. රූ සපුව ද කය ද පැසීමෙන් ඈ වෙනස් වූ නිසා ය.

පියල් නන්දගේ රූ සපුවෙහි ද කයෙහි ද මේ පැසීම කියන ලකුණු වහා දිටි ය. ඔහුගේ ඇසටත් සිතටත් වහා ගොදුරු වූයේ නන්දගේ කයෙහි වූ ඒ ලකුණු ය. නන්ද දැන් බොළඳ දැරියක් නොව, පැසුණු ස්ත්‍රියකි. ඇගේ මුහුණ වෙනද ට වඩා මඳක් සිහින් ය; බෙල්ල මඳක් දික් ය; අවිවාහකව සිටිය දී මෙන් නොව දැන් දෙතොල වඩාත් රතු ය. පෙරට වඩා මඳක් ලිහිල් කොට බඳින ලද කොංඩය, ඇගේ මුහුණෙහි පැසුණු සලකුණුවලට තුඩු දෙන්නකි. පෙරට වඩා මහත් වුණු ඇගේ ළය පියල් විසින් වහාම දක්නා ලදී. ළය මහත් වීමත් උකුළ පළල් වීමත් නිසා ඇගේ ඉහටිය දැන් බෙහෙවින් සිහින් ය. ඇගේ උකුළ පළල් වූයේ දරුවකු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙනියි සිතා ගැනීමට තරම් ස්ත්‍රීන්ගේ කායික ලක්ෂණ පිළිබඳ දැනුමක් පියල්ට නොවී ය. 'නන්ද දරුවකු ලත් ස්ත්‍රියක් ය' යනු සිහිවුණු විට පියල්ගේ සිතට නගින්නේ කෝපයකි. දරුවා මිය ගිය එක ඔහුට සන්තෝෂයක් වුව ද ඔහු වැඩි සන්තෝෂය ලැබුවේ ඒ දෙපුවතම සිතින් ඉවත් කිරීමෙනි.

''තිස්ස සර්කස් බලන්න ගිය වගත් සර්කස් එකේ විස්තර මට එවූ ලියුමක ලියා තිඋණා''යි කියමින් නන්ද පුටුවක හිඳගත්තා ය.

''මේ අවුරුද්දේ කොළඹට සර්කස් තුනක් ආවා''යි පියල් කී ය.

''එහෙනම් තිස්ස ඒ සෙල්ලම් තුනම බලන්න යන්න ඇති'' මාතර හාමිනේ කීවේ සංවේගයෙනි.

''තිස්ස විතරක් නෙවි මමත් ගියා. එයින් එක සර්කස් එකක් අවුරුද්දකට සැරයක් කොළඹට එනවා. අනික් දෙක මේ පාර කොළඹට ආවේ අවුරුදු පහළොවකට පස්සේය කියනවා. ඒ දෙකම ලෝක ප්‍රසිද්ධ ඉංග්‍රීසි සර්කස් දෙකක්, ඒ දෙකම කොළඹින් යන තෙක් එක වගේ හැම දම මිනිස්සු බලන්න ගියා. සර්කස්

කාරයන් යන තෙක් ටිකට් දෙන තැනට හැම දම එක වගේ මිනිස්සු පිරුණා. එහෙම සෙල්ලමක් බලන්න නොයන කෙනෙක් නැහැ.'' එවර

''තිස්ස 'හාමස්ටන් සර්කස් එක බලන්න ගියා ය. ගියා ලියා තිබුණා''යි නන්ද පියල්ට පුදුම දේ කවදවත් දැකලා නැහැයි ලියා තිබුණා''යි නන්ද පියල්ට ඇසෙන සේ කීවේ තම මව දෙස බලා ගෙන ය.

''මේ පාර සර්කස් තුනෙන් එකක් වොරන් සර්කස් එක; හොඳම එක තමයි හාමර්ස්ටන් සර්කස් එක. සතුන්ගේ සෙල්ලම් හුඟක් ඒකෙ තිබුණා. සිංහයෝ, කොටි, වලස්සු, ව්‍යාඝ්‍රයෝ, වඳුරෝ හුඟක් හිටියා.''

''තිස්සට තියා, අහන කොට අපට උණත් බලන්න යන්න ආසා හිතෙනවා''යි අනුලා සිනාසෙමින් කීවා ය.

''කොළඹ යනවා නම් දවසක බලන්න පුළුවනි''යි යෝජනා කළ පියල් අනුලා දෙස බලා අනතුරුව බැලුවේ නන්ද දෙස ය.

''අපි කොහේ කොළඹ යන්න ද?''

''ඇයි? එනවා නම් ඔක්කොම වියදම් මගෙන්; තිස්ස බලන්නත් පුළුවනි.

''ඒ ගොල්ල කොහේ කොළඹ යන්න ද?''යි මාතර හාමිනේ කීවා ය. ''ගිහිල්ලා නවතින්නේ කොහේ ද? කොච්චර වියදම් ද? මෙහේ ගෙදර බලාගන්නේ කවිද? කොයිබ කෙරෙන වැඩ ද ඕවා.''

කොළඹ යන ආශාව පසුව අනුලාගේ සිතෙහි දමන්ට සිතාගත් පියල් මාතර හාමිනේ සමඟ තර්ක නොකෙළේ ය.

''තිස්ස සෙල්ලම් බලන්න යන්නේ තනියම ද?''යි අනතුරුව මාතර හාමිනේ ඇසුවා ය.

''සාප්පුවේ ඉන්න යාළුවෙක් එක්ක යනවා ඇති.''

''ගිය අලුත තිස්සට සරම්ප හැදුණේ කොහොම ද?''

''බෝ වෙන්න ඇති.''

''බෝ වෙන්න ඇත්තේ එයා ඇවිදිනවා වැඩි නිසා.''

''නැහැ; මම හිතන්නේ සාප්පුවට ආ ගිය කෙනෙක් ගෙන් බෝ වෙන්න ඇත කියා.''

''තිස්ස ඒ දවස්වල මට එවූ ලියුමක ලියා තිබුණා පුදුම කතාවක්''යි අනුලා කීවා ය.

''අවතාර කතාව ද?''යි අසමින් නන්ද සිනාසුණා ය.

''ඒ මොකක් ද?''යි කුතුහල වූ පියල් ඇසී ය.

''කොම්පඤ්ඤ වීදියට යන්නේ බෝට්ටුවෙන් ද?''

Scanned by CamScanner

''ඔව්; දුම් බෝට්ටුවට සත දහයක් ගෙවා බේරේ වැවෙන් එගොඩ වෙන්න ඕනෑ.''

''ඉරිදා සවසක තිස්ස තනියම බෝට්ටුවෙන් කොම්පඤ්ඤ වීදියට ගිහිල්ලා තියෙනවා. බෝට්ටුවෙන් බැහැලා පාළු වීදියකට ගියාම අහලක වත් මිනිහෙක් නුදුටු නිසා මිනිහට ටිකක් බය හිතිලා තියෙනවා. බයෙන් ගමන් කළ තිස්ස බරව කකුලක් ඇති හිඟන්නෙක් එනවා දැක්කා. හිඟන්නා ළං උණාම තිස්ස ඌව මඟ අරින්න අයින් උණා. තිස්සගේ පිටිපස්සට වී ඌ බරව කකුලෙන් තිස්සගේ කකුල් දෙකට ගහලා තියෙනවා. දණ දෙක නැවුන නමුත් තිස්ස වැටිලා නැහැ. තිස්ස බයේ ටිකක් දුර ගොහින් හැරිලා බැලුවාම කවුරුවත් පේන්න ඉඳලා නැහැ!''යි කියූ අනුලා සිනාසුණා ය.

''තිස්ස ලියා එවාපු එකක් ද ඔය?''

''ඔව්''

''ගමදී තිස්ස යක්කු, අවතාර ගැන විශ්වාස කෙරේ නැහැ.''

''දැනුත් එයා විශ්වාස කරන්නේ නැහැ. එයා ඔය විත්තිය ලියා 'ඒක මගේ බය නිසා උණු එකක් වෙන්න ඇහැකි'යි ලියා තිඋණා''යි නන්ද කීවා ය.

''තිස්සට සරම්ප හැදුණේ ඔයිට පස්සේ නෙව ද? තිස්ස දකින්න ඇත්තේ දිස්ටියක් වෙන්න ඇති''යි මාතර හාමිනේ කීවා ය. ''පොඩි කාලේ තිස්ස රෑට නිතර හීනෙන් බය උණා. යන්තරයක් බන්ද වන්න හැදවාම මිනිහා කැමති උණේ නැහැ. ලොකු වෙන කොට හීනෙන් බයවීම නිකම්ම ඇරුණා.''

තිස්ස අධික ලජ්ජාවෙන් ද ඒ ලජ්ජාව නිසා උපදින භයෙන් හා ශෝකයෙන් ද පීඩා විඳින ගති ගුණ ඇති ළමයෙකු බව පියල් දනියි. තිස්ස භාවමය ඉන්ද්‍රියෙහි තියුණුවෙන් මෙන් බුද්ධින්ද්‍රියෙහි තියුණුවෙන් ද පීඩා විඳින්නෙකි. හැඟීම්වල තියුණුව හු මවගෙන් ලත් දායාදයකි; බුද්ධියෙහි තියුණුව පියාගෙන් ලැබූ හුරුකමකි. ඒ තියුණු හැඟීම් මැඩීමට ඔහුගේ බුද්ධින්ද්‍රිය හුරුනොවී ය. ඒ දෙකම එක සේ තනි තනිව වැඩුණු බැවිනි. තර්ක කරනු කැමැති ඔහු කුඩා කලම ආගම් වාද පොත් කියවූයෙන් ඔහුගේ බුද්ධිය තවත් තියුණු වී ය. එහෙත් හැඟීම්වල තියුණුව නිසා ඔහු බුද්ධියෙන් තම ආශාවන් මැඩගැනීමෙහි හුරු බුහුටියෙක් නො වී ය. ගිනෙල විදගෙන නඟින ඉදිකටු තුඩු මෙන් ඔහුගේ හැඟීම්. බුද්ධිය විදගෙන නඟියි. එහෙත් අධික ලජ්ජාව නිසා, ඔහු තමා තුළ නඟින ඒ හැඟීම් ක්‍රියාවට නඟන්නේ කලාතුරකිනි. එහෙයින් ඔහු තුළ පහළ වන තියුණු හැඟීම්, බොහෝ විට ආත්ම වධයක් වෙයි. පොතක් පතක් බැලීමෙහි ආශාව හෝ සෙල්ලමක් බැලීමෙහි

Scanned by CamScanner

ආශාව හෝ මතුවූ විට, ඔහු ඒ ආශාවන් ප්‍රීතියට හරවාගන්නේ ය. අනික් බොහෝ ආශාවන් ඔහු ක්‍රියාවට නොනඟන්නේ බුද්ධියෙන් මැඩගැනීම නිසා නොව අධික ලජ්ජාව නිසා ය. එය ඇතැම් විට ආත්ම වධයක් වෙයි. තරුණියක හා කතා බහ කිරීමට ඇය හාද කරගැනීමට හටගන්නා ආශාව ඔහු ක්‍රියාවට නොනඟන්නේ, ආත්ම සංයමය නොව අධික ලජ්ජාව නිසා ය. ලජ්ජාව නිසා මුළු ගැනෙන ඔහු, ඒ ආශාවන් සිහි කරමින් ඇතැම් විට ප්‍රීති වෙයි; ඇතැම් විට ශෝක වෙයි. තිස්ස නම් මව සේ තමා තුළටම හැරුණු මනැස ඇත්තෙකි.

''තිස්ස යක්කුන් තියා කේන්දරේවත් විශ්වාස කරන්නේ නැහැ.'' යි පියල් කී ය. ''ගාල්ලේ ඉස්කෝලේ ඉගෙනගන්න කාලේ වෙන්න ඇති තිස්ස හැම දේම අවිස්වාස කරන්න පටන්ගන්න ඇත්තේ.''

''නැහැ'' යි අනුලා පිළිතුරු දුන්නා ය. ''තිස්ස පොඩි කාලේම සමහර දේ අවිශ්වාස කරා. ඉස්කෝලෙන් ඉගෙනගත්තු එකක් නෙවි. සමහරවිට පොත් කියවන්න පටන්ගත්තාට පස්සේ ඒවා ගැන වඩාත් අවිස්වාස හිතෙන්න ඇති.''

''මේ දෙන්නා තමයි තිස්ස නරක් කෙරේ''යි මාතර හාමිනේ කිවා ය. ''තිස්ස කැමති එකක් බොරු ය, කිව්වාම මේ දෙන්නත් එයාගේ පැත්ත ගන්නවා. කේන්දරේ බලවන්න හැදුවාම තිස්ස, 'මගේ කේන්දරේ බලවන්න එපාය' කියනවා. මේ දෙන්නත් ඒකට අනුබල දෙනවා 'කේන්දර කාරයෝ බොරු කාරයෝ 'ය කිව්වාම මේ දෙන්නත් එයාගේ පැත්තට කතා කරා. මම එයාගේ කේන්-දරේ බැලෙව්වේ එයා නැති විටක විතරයි. කොළඹදී වත් තිස්ස පන්සලට යනවාද?''

''පන්සල්වලට නම් යනවා. නමුත් කොළඹ ඉන්න ඉලන්දාරි පන්සල් යන්නේ සෙල්ලමට මිසක් වැඳුම් පිදුම් කරන්න නෙවි. ඔය වයසෙදී කවුරුත් ඔහොම තමා.''

''ගමේදීත් තිස්ස පන්සල් ගියේ පිරිත් පින්කම් තිඋණ දවස්වල විතරයි.''

''පොඩි කාලේ පුරුදු නුණොත් ලොකු වෙන කොට හරි යන්නේ කොහොම ද? ඌ නරක් කෙරේ මේ දෙන්නා තමයි.''

''තිස්ස යක්කුන් විශ්වාස නොකරාට මොකද ඉසේ රුදේ හැදුණාම තෙල් මතුරවාගත්තා!''යි කියමින් නන්ද සිනාසුණා ය.

අනුලාද සිනාසී මෙසේ කීවා ය.

''තිස්ස තෙල් මතුරවාගත්තෙ අර්නෝලිස්, නළලේ තෙල් ගා අත ගගා, පිඹ පිඹ, හූහක් වෙලා මතුරන නිසා. ඒ මිනිහා හින්

Scanned by CamScanner

සැරේ නළල අත ගගා පිඟිනා කොට තිස්සට නින්ද යනවා. තෙල් මතුරවා ගත්තේ ඒක නිසා යයි, අපි කවට කම් කරාම එයා කිව්වා. තිස්ස තෙල් මතුරවාගත්තේ අර්නෝලිස් යකැදුරාට කියා විතරයි. වෙන කවුරුවත් ලවා තෙල් මතුරවා ගන්න කැමති උණේ නැහැ. අනික් කවුරුවත් නළල අත ගාන්න දන්නේ නැහැයි තිස්ස කිව්වා.''

''පියල් නැගිට්ටෙ යන්න ද?''යි මාතර හාමිනේ ඇසුවා ය.

''ඔව් අර එන්නේ අම්මාගේ පණිවිඩකාරයෙක්''යි කියමින් පියල් මහ ගෙදර ගල් වැට දොරටුවෙන් ඇතුළු වුණු කොලුවකු පෙන්නුවේ ය. ''අම්මා මම එන කල් බත් නොකා බලාගෙන ඇති.''

''යන්න ඉස්සර ආයිත් මෙහේ එන්න. තිස්සට බඩුවක් යවන්න තියෙනවා''යි අනුලා, මිදුලට බැස්ස පියල්ට කීවා ය.

''දෙතුන් සැරයක් උණත් එන්න බැරිය''යි කියමින් පියල් බැලුවේ නන්දා දෙස ය.

''තිස්සට දෙදෙල් පට්ටයක් හදලා යවන්න ඕනෑ. තිස්ස දෙදෙල්වලට කැමැතියි''යි, පියල් නික්ම ගිය පසු අනුලා කීවා ය.

Scanned by CamScanner

## 11 වන පරිච්ඡේදය

වෙළඳාම පිණිස බිබිලෙට ගිය ජිනදාසගෙන් මුල තුන් මස තුළ සතියකට ලියුමක් බැගින් නන්දට ලැබිණ; මසකට වරක් බැගින් ලැබුණේ රුපියල් දහයේ මුදල් පතක් සහිත ලියුමකි. තුන් මස ඉකුත් වූ තැන් සිට ජිනදාසගෙන් පෙර සේ පිළිවෙළින් ලියුම් නොලැබිණ. ඇතැම් විට දෙසතියකට වරක් ද තවත් විටක සති තුන හතරකට වරක් ද ඔහුගෙන් ලියුමක් ලැබිණ. හමස ඉකුත් වූ පසු ජිනදාසගෙන් නන්දට ලියුමක් ලැබුණේ දෙමසකට පමණ වරකි. අවුරුද්දක් ගෙවුණු පසු දෙමසකට වරක් ලැබුණ ලියමන ද නැවතිණ. අවුරුදු දෙකකට පසු නන්ද යැවූ එකම ලියුමකටවත් ජිනදාසගෙන් උත්තරයක් නොලැබිණ.

දෙතුන් මසක් ගෙවෙන තෙක් ජිනදාස වෙළඳාම කෙළේ දුක සේ ය. කඩ මැස්සෙහි වාඩි වී බඩු විකුණන ඔහු දවල් දොළහට පමණ කඩයෙහි දොරවල් අඩවන් කොට කුස්සියට ගොස් හාල් ගරා ලිපේ තබා යළිත් කඩමැස්සට එයි; දවල් එකහමාරට පමණ යළිත් ගොස් පොල් සම්බලයක් සාද කරවල කෑල්ලක් ද පුළුස්සාගෙන බත් කා දෙකට පමණ කඩ මැස්සට එයි. මුල තුන් මස තුළ හැම කාරියක් මෙසේ ජිනදාස විසින් ම කරන ලද්දේ කොලුවකු නවත්තා-ගෙන පඩි ගෙවන්ට ගියොත් වෙළඳාමෙන් අලාබ වෙතියි සිතූ බැවිනි. ජිනදාස කොලුවකු නවත්තාගත්තේ තමා උණට ගොදුරු වීමෙන් පසු ය. මේ තොරතුරු නන්ද දැනගත්තේ ජිනදාස ගේ ලියුමකිනි. ජිනදාස සුළු පඩියක් ගෙවනු පිණිස කොලුවකු නවත්තා ගත්තේ නන්ද හැම ලියුමකින් එසේ යෝජනා කළ බැවිනි.

මැලේරියා උණට ගොදුරු වීම නිසා ජිනදාස වෙළඳාම හැර ගොඩේ පළාතකට වී දුකසේ ජීවත් වන බව බිබිලේ සිට ගමට පැමිණියකුගෙන් නන්දට අසන්නට ලැබිණ. 'ජිනදාස ගැන සොයා තොරතුරු ලියා එවන්න'යයි මාතර හාමිනේ කරෝලිස්ට ලියුමක් යැවුවා ය. 'ජිනදාස මහත්තයා ගොඩේ පළාතකට වෙලා සුළු වෙළඳාමක් කරමින් ජීවත් වන' බව දැනගන්ට ලැබුණා'යයි කරෝලිස් විසින් එවන ලද ලියුමක සඳහන් වී ය. 'ඉන්නා පළාතකට ගොහින් කොහොම හරි ජිනදාස මහත්තයා ගමට පිටත් කර එවන්න'යයි නන්ද කරෝලිස්ට ලිවා ය.

කරෝලිස්ට ජිනදාස සොයාගත හැකි නොවී ය. ජිනදාස අරබයා ඔහුට අසන්ට ලැබුණේ එකිනෙකට නොගැළපෙන තොරතුරු ය. වෙළඳාමෙන් අලාබ වීමත් මැලේරියාවට ගොදුරු වීමත් නිසා, ජිනදාස හිඟමනට බසින තරම් දිළින්දෙක් වී ය. එහෙයින් 'ගමට



Scanned by CamScanner

යන අදහස හැරදමා ගොඩේ පළාතකට ගිය ඔහුට කුමක් වීද’යි නොදන්නා බව ඇතැමකු කියනු කරෝලිස්ට අසන්ට ලැබිණ. ‘ජිනදාස මීගහකිවුලට වෙලා හේන් ගොවිතැන් කිරීමෙන් යම්තම් පණ–නල රැකගෙන සිට අනතුරුව ගැමි තරුණියක බිරිඳ කොට ගෙන ඇගේ මවගේ ගෙයි වාසය කරන්නේ ය’ යනු තවත් එකකු ගෙන් කරෝලිස්ට දැනගන්නට ලැබුණු පුවතකි.

කරෝලිස්, තම ස්වාමියාගෙන් හතර දවසක නිවාඩු ලබාගෙන එක් ඉරිදවක මීගහකිවුලට ගියේ ය. ‘ජිනදාස නමැත්තෙක් මාස හතරක් පමණ හේන් ගොවිතැන් කරමින් සිට ඇකිරියන් කුඹුරට ගොස් එහි ගැමි ගැහැනියක බිරිඳ කොටගෙන වාසය කරන්නේ ය’ යන පුවත මීගහකිවුලට ගිය කරෝලිස්ට අසන්ට ලැබිණ. ජිනදාස අල්ලනු සඳහා ඇකිරියන් කුඹුරෙහි කරක් ගැහීමට නොසිතූ කරෝලිස් එපමණින් ජිනදාස සෙවීම නවතා ආපසු බිබිලෙට ගොස් නන්දටත් මාතර හාමිනේටත් ලියුම් දෙකක් ලීවේ ය.

“ජිනදාස මහත්තයා බිම්තැන්නට වෙලා හේන් ගොවිතැන් කරනවා”යි කරෝලිස් මාතර හාමිනේට ලීවේ ය. “ගම රට එන අදහසක් කොහෙත් ම නැහැ. උණ හැදෙන නිසා අඳුනාගන්-නත් බැරි තරමට ජිනදාස මහත්තයා වෙනස් වෙලා.”

කරෝලිස්, කල්පනාවෙන් අඩු තැන් පුරවමින් මෙසේ ලීවේ ජිනදාස පිළිබඳ අනිකුත් තොරතුරු දැන්වීමට නොසිතූ හෙයිනි. කරෝලිස්ගේ ලියුම් ලැබුණු පසු නන්දගේ සිත වඩාත් අවුල් වී ය. ශෝකය ද වැඩි වූයෙන් ජිනදාස සොයනු පිණිස බිබිලෙට යාමට ඈ සිතුවා ය. ඇගේ සිතට ඒ සිතිවිල්ල නැංගේ වියෝ දුක මැඩිය නොහැකි තරම් දැඩි වූ නිසා ම නොවේ; සැමියා විසින් තමා හැර දමන ලදැයි ගමේ මිනිසුන් සිතනු ඇත යන හැඟීම සමඟ හටගත් ලජ්ජාව ද නිසා ය.

ජිනදාස නිසා නන්ද තුළ හටගත්තේ කවිකාර බාලයන් වර්ණනය කරන අරුම පුදුම ආලයක් නොවේ. එහෙත් ඈ, තම සැමියා වශයෙන් ජිනදාසට අවංකව ආලය කළා ය. ගම සිටිය දී ජිනදාස දැකීම, ඔහු ළඟින් හිඳගැනීම, ඈට ප්‍රීතියක් වී ය. දුර ගමනක් ගිය විට ඔහු ගෙදර එන තුරු කාලය ගෙවූයේ නොඉවසිල්ලෙනි; ජිනදාස සමඟ නෑ මිතුරන් බලන්ට ගියේ මහත් සන්තෝෂයෙනි; ඔහු හොඳින් අඳිනු පළඳිනු දැකීම ඈට ප්‍රීතියක් වී ය. කිසිවකු ජිනදාසගේ අගුණ කියනු ඇසීමට ඈ කැමැති නොවූවා ය. ජිනදාස නිසා නන්ද තුළ මේ හැඟීම් පහළ වූයේ, අව්‍යක්ත කවිකාරයන් කියන අපූරු ආලයක් ඈ තුළ වූ නිසා නොව පති භක්තිය නිසා ය. ඒ පති භක්තිය ඈ තුළ හටගත්තේ තම සැමියාගේ රූ සපුව, වීර ක්‍රියා උගත්කම ආදිය නිසා ද නොවේ.

Scanned by CamScanner

ගම්බද කුලඟනකගේ පති භක්තිය සංකීර්ණ හැඟීමකි. එය වූ කලි රාගය, දයාව, අනුකම්පාව, මවක වීමේ ආශාව, දරු ස්නේහය, තමාගේ අනාථ භාවය පිළිබඳ හැඟීම, ඇඳුම් පැළඳුම්වලට හා රන් අබරණවලට ද ඇති ආශාව, ලජ්ජාව, බිය යන ආදියෙහි සංකලන-යෙන් පහළ වන්නකි. වියෝ දුක පමණක් නොව තම අනාගතය ගැන සිතීමෙන් හටගත් දුක ද නන්දගේ සිත පෙළී ය.

නන්ද පමණක් නොව අනුලා ද මාතර හාමිනේ ද ජීවත් වන්නේ ඉතා දුකසේ ය. වත්තේ පොල් ගසින් ලැබෙන ආදායම ඔවුන් තිදෙනාගේ යැපීමට පවා ප්‍රමාණ නොවේ. ජිනදාසගෙන් මසකට වරක් ලැබුණු රුපියල් දහය නොලැබීම රුපියල් සියයක ආදායමක් නැවතීම වැන්න. අනුලාත්, නන්දත් ගොතන රේන්ද, සාද අත ගාල්ලට යවා විකිණීමෙන් ලබාගන්නා මුදලින් මහ ගෙදර කවුරුත් ජීවත් වෙති. මහ ගෙදර මිනිසුන්ගේ දිළිඳුකම ගමේ ගැමියන් තබා මහ ගෙදරට නිතර යන පියල් පවා නොදනියි. තම දිළිඳුකම සඟවාගෙන අනිකකුට නොදැනෙන සේ හාමත් වීමට වුව ද ඔවුන්ට පුරුදු වූයේ, ඔවුන් ගේ දැඩි කුල මානය නිසා ය.

මාතර හාමිනේ ක්‍රමයෙන් දුර්වල වූයේ වයස් ගත වීම නිසා නොව, අග-හිඟ වැඩි වීම නිසා ය. දයා කරුණාවෙන් පිරුණු හද ඇති, ඇගේ මුහුණෙහි ශෝකාකුල සලකුණු තියුණු වූයේ ඉතා සෙමිනි; ක්‍රමයෙනි. එ හෙයින් මහ ගෙදරට නිතර යන එන්නෝ ද ඇගේ මුහුණෙහි ක්‍රමයෙන් වූ මේ වෙනස නොදකිති. සිහින් කයක් ඇතිව උන් අනුලා වඩාත් සිහින් වීම ඈ නිතර ඇසුරු කරන්-නන්ට පමණක් නොව, කලාතුරකින් දකින්නන්ට ද දැන ගත හැකි තරම් වෙනසක් නොවී ය. මාතර හාමිනේත් අනුලාත් මදක් වෙනස් වීම අප්‍රකට එකක් වුව ද නන්ද කෙරෙහි වූ මඳ වෙනස නම් ඈ දවසකට වරක් බැගින් දුටුවන්ට ද දැනිණ. පෙර නන්දගේ මුහුණත් කයත් අත් පාත් තල ඇටයෙහි පිරිපුන් බව සිහි කෙළේ ය. දැන් ඒ පිරිපුන් බව සිහි කරන ලකුණු දක්නා ලැබෙන්නේ ඇගේ මුහුණෙහි පමණි. සතියකට වරක් හෝ ඇතැම් විට දෙවරක් හෝ නන්ද දකින පියල් නම් ඇගේ රූ සපුවෙහි මේ මඳ වෙනස කිසි විටක නුදුටුවා ය.

බිබිලෙට ගිය ජිනදාස අතුරුදහන් වීම ගැන පියල් ඇතැම්විට කනගාටු වූයේ තමාගේ යටි සිතෙහි වූ සන්තෝෂය මැඩ ගැනීමෙනි. ජිනදාස පිළිබඳ තොරතුරු දැනගැනීමට නන්දටත් වඩා පියල් වැර-වෑයම් කෙළේය. නන්ද ඔහු සෙවූවේ ගමට ගෙන්වාගනු පිණිසය. පියල් ජිනදාස ගැන සෙවුවේ ඔහුගේ අතුරුදහන් වීම සැක හැර දැනගනු පිණිස ය. ජිනදාස අතුරුදහන් වීම පිළිබඳ තොරතුරු පියල් දැන ගත්තේ මහ ගෙදර කිසිවෙකුගෙන් නොවේ. මහ ගෙදර කිසිවෙක් ඒ තොරතුරු අනිකකුට නොකීවේ ය. ජිනදාස යළිත්

Scanned by CamScanner

ගමට නොපැමිණෙතියි සිතීමට රුකුල් දෙන නිසැක තොරතුරු දැනගත් පියල් තුළ වූ නන්ද පිළිබඳ හැඟීම මැඩිය නොහැකි තරම් වැඩිණි. එහෙයින් ඔහු දැන් නන්ද කෙරෙහි ඇතැයි දකින්නේ, පෙර තමා විසින් නොදක්නා ලද රූ සපුවකි. දැන් ඔහු සුළු වුවමනාවක් වුව ද පෙරටු කොටගෙන සතියකට වරක් හෝ දෙවරක් හෝ ගමට එයි. කත්තිරිනාගේ ලෙඩ බැලීමටයයි ඔහු ගිය සතියෙහි වරක් ගමට පැමිණියේ ය. ඒ සතියෙහි අවසාන දවසෙහි මේ වර ඔහු ගමට පැමිණියේ කත්තිරිනාගේ මරණය උදෙසා ය.

කත්තිරිනාගේ අවමඟුල අවසාන වූ වහාම පියල් ගෙදර ගොස් තමාගේ ඇඳුම් උනා කිලිටි කූඩයෙහි දමා, අලුත් ඇඳුම් ඇඳගෙන ගියේ මහ ගෙදරට ය.

''පියල් පෙරෙයිද නෙවද කොළඹ ගියේ? පියල්ට දැන් කොළඹ හොඳට ම ළංවෙලා''යි අනුලා කීවා ය.

''කත්තිරිනාගේ මරණෙට ආවා. කෝ අම්මා? ඇයි මරණෙට ගියේ නැද්ද?''

''ඇයි නැත්තෙ? අම්මා මරණ ගෙදර ගොහින් ඇවිත් ඇඳුම් ඉවර කරලා ඇඟ හෝදනවා''.

''මම දැක්කෙ නැහැ—මාතර හාමිනේ මරණ ගෙදරදී. මම හිතුවා කත්තිරිනාගේ මරණෙට යන එකක් නැහැයි කියා.''

''ඇයි''

'''කත්තිරිනා එක්ක හුඟක් තරහෙන් ඉන්නවා යයි අනුලා දවසක් මම එක්ක කිවුවා මතක නැද්ද?''

''අම්මා කත්තිරිනා එක්ක තරහෙන් තමයි උන්නේ ලෙඩ බලන්න ගියෙත් නැහැ. මරණෙ ආරංචි උණ හැටියේ අම්මා කනගාටු උණා. ඇස් දෙකේ කඳුළු පිරුණා. කඳුළු පිරුණෙ තාත්තා මතක් උණ නිසා ය.' කිව්වා. අම්මා කවදවත් තරහ හිතේ තියාගෙන ඉන්නේ නැහැ. ඒකට මොකොද කත්තිරිනා එක්ක තිඋණ තරහ ඒ ගැනි මැරෙන කල් හිතින් අහක්කරගත්තේ නැහැ. අම්මා ඊයේත් මරණ ගෙදර ගියා. අද ගියේ කත්තිරිනා ගේ බූමදනෙට.''

''කත්තිරිනාගේ මරණෙ මහ කනගාටු මරණයක්. ඒ ගැනි දුන්ම මැරුණෙ දුප්පත්කම නිසා. කලින් උපකාරයක් කරන්න මට කල්පනා උණේ නැහැ. දෙස්තර ගෙන්නා බෙහෙත් කරවන්නයයි මම පුංචි අප්පුට රුපියල් විසිපහක් දුන්නේ ගිය සඳුද ගමට ආ වේලාවේ; කලින් දුන්නා නම් සමහර විට ලෙඩේ හොඳ කර ගන්න තිබුණා.''

Scanned by CamScanner

''පුංචි අප්පු අතට සල්ලි දුන්නේ ඇයි? ඒ මිනිහා බොන්න වියදම් කරනවා. ඒ මිනිහට නොබී ඉන්න බැහැ.''

''අම්මාත් මට කිව්වා; ගැනිගෙ ලෙඩේට මම දුන්න සල්ලිවලින් රුපියල් පහළොවක් විතර වියදම් කරලා අනිත් සල්ලි බොන්න වියදම් කරාය කියා.''

''පියල් දුන්න සල්ලි පුංචි අප්පු බොන්න වියදම් කර එක පුදුම-යක් ය?'' යි කියමින් අනුලා සිනාසුණා ය. පුංචි අප්පු සුමාන තුනකට ඉස්සර කර වැඩක් පියල් අහලා නැතිවා වගෙයි; අහලා තිළුණා නම් ඒ මිනිහා අතට සල්ලි දෙන්නේ නැහැ.''

''මම අහලා නැහැ. මොකක් ද?''

''කත්තිරිනාගේ බෙහෙත් කසායවලට ගෙවන්න සල්ලි නැතිය කියා පුංචි අප්පු දවසක් ගෙයි ඇතුල් කාමරවල දොරවල් ගලවා විකුණා සල්ලි ගත්තා. කවදාවත් නොවසන දොරවල්වලින් ඇතුල් කාමරවලට වැදගැන්මක් නැතැයි කියමින් ඒ මිනිහා කත්තිරිනා එක්ක වාද කරා. දොරවල් විකුණා ගත්තු සල්ලිවලින් දෙකෙන් පංගුවක් කත්තිරිනාගේ ලෙඩේට වියදම් කරා; අනික් දෙකෙන් පංගුව වියදම් කෙරේ බොන්න.''

''අපූරු මිනිහෙක් තමයි පුංචි අප්පු! මම දන්නවා නම් ඒ මිනිහා අතට සත පහක් දෙන්නේ නැහැ.''

''පුංචි අප්පු දොරවල් විකුණා ඊ ළඟට කර එක දන්නවාද?''

''නැහැ. අම්මා කිසිවක් මට කිව්වේ නැහැ.''

''කිසි ප්‍රයෝජනයක් නොගන්නා සොල්දරේට ලෑලි ඕනෑ නැයි කියා පුංචි අප්පු ඒ සොල්දරේ ලෑලි බාලා මිනීපෙට්ටි හදන වඩු රාළ කෙනෙකුට වික්කා!''

''පුංචි අප්පු හරි මිනිහෙක් තමයි.''

ඇඟ සෝද අලුත් රෙද්දකුත් හැට්ටයකුත් හැඳගත් මාතර හාමිනේ සමග නන්ද ද ආලින්දයට පැමිණියා ය. සන්තෝෂ-යෙන් ගැහෙන හද ඇති පියල්ගේ මුහුණ සඳ රැසින් පිපෙන මලක් සේ පිපිණ.

''පියල් ගමට ආවේ කත්තිරිනාගේ මරණෙට වෙන්න ඇති''යි කියමින් මාතර හාමිනේ හාන්සි පුටුවෙහි වාඩි ගත්තා ය.

''ඔව්; අම්මා මට ටැලිග්‍රෑම් එකක් එවා තිළුණා; නාවාට කමක් නැතෙයි කියා තිළුණ නමුත් මම ආවා.''

''පියල් මරණ ගෙදර ඉන්නවා මම දැක්කා; කතා කරන්න ඉඩක් ලැබුණේ නැහැ.''

''මාතර හාමිනේ ඉන්නවා මම දැක්කේ නැහැ. දැක්කා නම් ඇවිල්ලා මම කතා කරනවා.''

"තිසා ළඟදී හම්බ උණේ එහෙම නැද්ද?"

"පෙරේද මට හම්බ උණා තිස්ස දැන් බොරැල්ලේ පන්සලක හාමුදුරු කෙනෙකුගෙන් සිංහල ඉගෙන ගන්නවා, නොතාරිස් විභාගෙ ගන්න හිතාගෙන."

"සිංහල ඉගෙනගන්නවායයි අපට ලියා එවා තිඋණා. නොතා-රිස් විභාගෙ ගන්න හිතාගෙන ඉන්න වගක් ලියා තිඋණේ නැහැ."

"තිස්ස ඉගෙනගන්න හපනා. දවසක හාමුදුරුවන්ගෙන් මම ඇහුවා. හාමුදුරුවො කිව්වා ඉගෙනගන්න හොඳටම සමර්තයා ය කියා."

"තිසාට ඉක්මනට පාඩම් හිටිනවා. ඕනෑ දෙයක් කිව්වාම තිසා එක පාරට තේරුම් ගන්නවා. වැරැද්ද ගමදී එයා වැඩි ඕනෑ කමකින් ඉගෙන නොගත්තු එකයි"යි අනුලා කීවා ය.

"ගමදී ඉගෙනගන්න ආශාවක් නොතිබුණු නිසා තමයි තිසාට කොළඹ රක්සාවකට යන්ඩ ඉඩ දුන්නේ. නැති නම් අපි තව කලක් තිස්ස ගාල්ලේ ඉස්කෝලේට යවන්න වැයම් කරනවා"යි නන්දා කීවා ය.

"ජිනදාස මහත්තයා ගැන පියල්ට කොළඹදී අහන්න ලැබෙන්නේ නැද්ද? සිංහලේ යන මිනිස්සු කොළඹට නිතර එනවා නෙව ද"යි මාතර හාමිනේ ප්‍රශ්න කළා ය.

නන්දාගේ මුහුණ අඳුරු වී ය. තුනී වැහි වලාකඩකින් වැසුණු සුදු වලාවක් මෙන් අඳුරු වී ය. අඳුරු වූ යේ ශෝකය නමැති වැහි වලාකඩින් නොව කෝපය නමැති දුම් වලා කඩින්.

"පියල්ට දැනගන්න ලැබෙන්නේ කොහොමද මහත්තයා ගැන?"

ජිනදාස ගැන කතා කරනු ඇසීමට නන්දා අකැමැති බව පියල් දනියි. මීට ටික දවසකට පෙර ඔහු ජිනදාස මතක් කළ විට නන්දාගේ සිතට නැංගේ ශෝකය නොව කෝපයකි. ජිනදාස පිළිබඳ තොරතුරු නන්දාටත් වඩා හොඳින් පියල් දනියි; දන්නේ ඔහු නන්දාටත් වැඩි කුහුලකින් ජිනදාස ගැන සොයන බැවිනි. ජිනදාසගේ විත්ති සොයනු පිණිස ඔහු බිබිලෙට දෙවරක් ගිය බව කොළඹ කන්තෝරුවෙහි තම අත වැසියෝ පවා නොදනිති. අවුරුද්දක් ඇතුළත පියල් දෙවරක් බිබිලෙට ආ වග කරෝලිස් පවා නොදනියි. ජිනදාස පිළිබඳ තොරතුරු බිබිලේ වෙසෙන කරෝලිස්ට වඩා හොඳින් තමා දන්නා බව පියල් කිසි විටක හෙළි නොකෙළේ ය. නන්දා පමණක් නොව මාතර හාමිනේ හා අනුලා ද ජිනදාස පිළිබඳ තොරතුරු ගමේ කිසිවකුට නොදත හැකි සේ සඟවා ගැනීමට වැයම් කළහ. ඔවුන් පියල්ට කීවේ 'ජිනදාස මහත්තයා ගෙන් කලකින් ලියුමක් නොලැබුණ' බව පමණි. ගැමියන් මෙන්

Scanned by CamScanner

පියල් ද ජිනදාස සම්බන්ධයෙන් දන්නේ තමන් විසින් කියන ලද ඒ පුවත පමණක් යයි මාතර හාමිනේත් අනුලාත් සිතූ හ. මාතර හාමිනේ යට කියන ලද ප්‍රශ්නය විචාළේ ජිනදාස ගැන තොරතුරු දැන ගැනීමේ ආශාවෙන් පමණක් නොවේ; ඔහු ගැන පියල් වැඩිපුර තොරතුරු දැනගන්නා ලද දැයි හාරාපාරා බලන අටියෙන් ද වේ.

"ජිනදාස මහත්තයාගෙන් තාම ලියුමක් ලැබුණේ නැද්ද?"යි පියල්, පෙරළා මාතර හාමිනේගෙන් ප්‍රශ්න කෙළේ ය.

"තාම නැහැ නොවැ."

"එයාට ඕනෑ දවසක ලියුමක් නේවා ය; අම්මා එයා ගැන සොයන්නේ නැතිව නිකම් ඉන්න"යයි නන්දා මඳක් තරහයෙන් කීවා ය.

"මහත්තයාගෙන් ලියුම් නොලැබුණ නිසා පුංචි නෝනා අපි එක්කත් තරහෙන් ඉන්නා වගෙයි."

"කවුරුවත් එක්ක මම තරහ වෙන්නේ මොකටද?"

"පියල් කිව්වේ බොරු නෙවි. නන්දා දූන් වෙන ද වගේ නෙවි. නිකම්ම තරහ වෙනවා."

"ඒ අනුව හිතෙන හැටි."

"පුංචි නෝනාට තරහ යන නිසා අපි තවත් ජිනදාස මහත්තයා ගැන කතා නොකර වෙන ඒවා ගැන කතා කරමු"යි පියල් යෝජනා කෙළේ ය.

"මමත් ඔය යෝජනාව කරන්නයි හිතා හිටියේ"යි කියමින් අනුලා සිනාසුණා ය.

"ලබන පසළොස්වකට අපි පරගොඩ යන්නයි හිතා ගෙන ඉන්නේ. මාතර හාමිනේලත් යනවද?"

"කවුරු කවුරු ද යන්නේ?"යි අනුලා ප්‍රශ්න කෙළේ මහත් ආශාවෙනි.

"බලදාස මහත්තයාත් නෝනත් යනවා".

"වෙන?"

"මමත් අම්මත් යනවා. බලදාස මහත්තයා පසළොස් දෙනෙකුට උණත් නැගලා යන්න පුළුවන් බරකරත්තයක් සූදානම් කරනවා ය කිව්වා. එදට කෑමට යන වියදම් මගෙන්. බලදාස මහත්තයා හෙට අනිද්දට ඒවි, මෙහේ කාටත් ආරාධනා කරන්න.

"නා මල් පූජා කරන්න යන්න මම නම් කැමැතියි. කැමති නම් ලේස්ති වෙයල්ලා"යි මාතර හාමිනේ කිව්වා ය.

"අපිත් කැමති"යි අනුලා පිළිතුරු දුන්නා ය.

Scanned by CamScanner

''එදට හිතුණොත් යනවා'' යි නන්ද කීවා ය.

''මේ පාර පර ගොඩ ගස් බර ලා නා මල් හැදිලා. වැලිගම සමරතුංග වලව්වේ ඔක්කොම ලබන පෝයට නා මල් පූජා කරන්න පරගොඩ යනවායයි බලදූස මහත්තයා කිව්වා.''

පියල් මෙසේ කීවේ නන්ද පොළඹවන අටියෙනි.

''දවල් කෑමට අපිත් මොකුත් හදන්නම්''යි අනුලා කීවා ය.

''මොකුත් ඕනෑ නැහැ. දවල් කෑමටත් හවස තේ වතුරටත් ඕනෑ දේ මම කොළඹින්ම ගේනවා.''

''හවස තේ වතුර බීලා එන්න හිටියොත් ගෙදර එනකොට රෑවෙච්චි නෙවද?''යි මාතර හාමිනේ විචාළා ය.

''හඳ තියෙන නිසා ටිකක් රෑ උණාට මොකද?''

''විජයගෙ නංගිලා එන්නේ නැද්ද?''යි නන්ද ඇසුවා ය.

''කිව්වොත් ඒවි. බලදූස මහත්තයා කියලා නැහැ.''

''ඒ ගොල්ල එනවට බලදූස අකැමැති ද?''

''නැහැ; කරත්තෙ ඉඩ නැති නිසා තද වෙලා යන්න අමාරු නිසා.''

''පහළොස් දෙනෙකුට යන්න පුළුවන් නම් ඇයි කරත්තෙ ඉඩ නැත්තේ?''

''විජය මහත්තයාගේ නංගිලා හතර දෙනා ම යන්න හදවි. එක්කෙනෙක්වත් ගෙදර නවතින්න කැමති වෙන එකක් නැහැ. බලදූස මහත්තයා නොකිව්වේ ඒ නිසා, පුංචි නෝනත් යනවා නෙව ද?''

''තව කල් තියෙනවා නෙව.''

''දවස් අටයි.''

''එදට හිතුණොත් යනවා.''

''නොහිතුණොත්?''

''ගෙදර නවතිනවා''යි කියමින් නන්ද සිනාසුණා ය.

''මම යනොත් එයා විතරක් ගෙදර නවතින්නේ නැහැ''යි අනුලා කීවා ය.

Scanned by CamScanner

# 12 වන පරිච්ඡේදය

ඇසල පුර පසළොස්වකට පෙර පියල් ගමට පැමිණියේ වෙනද නොගෙනන තරම් රට කැවිලි වර්ග රැගෙන ය. විශාල ගොන් බානක් යොදන ලද ගැලකින් මාතර හාමිනේ ද අනුලා ද නන්ද ද බෙයල්ගේ මව ද තවත් හදෙනකුත් සමඟ පසු ද එළිය වැටෙන්ට පියල්ගේ මව ද තවත් හදෙනකුත් සමඟ පසු ද එළිය වැටෙන්ට පෙර නා මල් පුදනු සඳහා පරගොඩ විහාරය බලා පිටත් වූහ.. සරහන ලද ගැලෙහි දික් බංකු දෙකක් තබා ගැනු එහි නැඟුණහ. පිරිමි ගැල පිටිපසට වී පයින් ගමන් කළහ. ගැල තුළ අඹරාව මුදුනෙහි ද ඒරිය කඳෙහි යටි පැත්තෙහි ද එල්ලී පැද්දෙන ලන්-තැරුම් දෙකින් නිකුත් දුබල එළිය නිසා ගැල තුළ ද යට ද වූ අඳුර මඳක් දුරු වී ය. එළිය වැටෙන යාමය ළං නොවූයෙන් අවට අඳුර තවමත් දැඩි ය.

තමන් ගමන් කරන්නේ දෙපැත්තෙහි ගෙවල් හා කඩපිල් ද සහිත මහමඟ ය යන හැඟීම, අඳුර නිසා, ගැල ඇතුලේ හිඳගත්තවුන් තුළ මෙන් ගැල පස්සේ ගමන් ගත්තවුන් තුළ ද තවම පහළ නොවී ය. රැයෙහි සෙමෙන් ගමන් කරන දුම්රිය නඟන ගෝසාව සේ මුහුද නඟන ගෝසාව ඇසෙයි. ඉඳහිට හමන සුළඟින් සැලෙන පොල් අතු නඟන 'සර සර' යන හඬ නිසා ය ගැල තුළ සිටියවුන්ට මඟ දෙපැත්තෙහි වූ පොල් රුප්පා මතක් වූයේ. රැයෙහි ඇවිද පුරුදු බලදසත් ගැල් කරුත් ඉව ඇල්ලීමෙන් මෙන් තමන් පසු කරන තැන් දැනගනිති.

පැයක් පමණ ඉකුත් වූ පසු යන්තම් වටින් පිටින් එළිය වැටෙන්ට වී ය. කපුටුවන්ගේ හඬ ඇසුණු පසු ය ගැල තුළට වී මෙතෙක් ගොළුවන රකිමින් උන් ගැහැනුන් දෙඩන්ට වූයේ.

''මේ කොහේද?''යි අනුලා ඇසුවා ය.

''කොහේ ය කියලා ද හිතන්නේ?''යි අසමින් බලදස සරදම් කෙළේ ය.

''කොහේ ද දන්නේ නැති නිසා නෙව ඇහුවේ''

''කවු කුරුඳු කඩේ පහු උණාද?'' යි පියල්ගේ මව ඇසුවේ ගැල්කරු සිනස්සමිනි.

තමන් ගමන් කරන්නේ දෙපැත්තෙහි වූ වන රොදින් යුතු පාරක බව ගැල තුළ සිටියවුන්ට දැන් දත හැකි වී ය. පාර අයිනෙහි වූ මැටි ගෙයක් හෝ කඩයක් හෝ ඔවුන්ට දකින්නට ලැබුණේ කලා-තුරකිනි. ගැල්කාරයාත් බලදසත් හැර අනික් කිසිවෙක් තමන් ගමන් කරන්නේ කුමන පෙදෙසක් මැදින්දැ යි නොදනිති.



Scanned by CamScanner

එක බුරුක්කෙහි දෙක තුන බැගින් අතුවලත් කඳ වටාත් එල්ලෙන ගෙඩි සහිත විශාල කොස් ගසින් ද බැදි දෙල් ගසින් ද අඹ ගසින් ද සෙවණ වුණු ඉඩම් මැදින් වැටුණු මහකට ය දූන් ගැල පිවිසියේ. මේ පෙදෙස පල-වැල කා ජීවත් වන වඳුරන්ගේත් ලෙහෙනුන්ගේත් වවුලන්ගේත් කුරුල්ලන්ගේත් විමානයක් වැන්න. ගසින් ගසට පනින වඳුරන්ගේ ගෝසාව නිසා වලග ගසමින් නටන පනින ලෙහෙනුන් නහන 'ටං ටං' හඬ මහ යන්නවුන්ට නොඇසෙයි. ලෙහෙනුන් ද වවුලන් ද විසින් ඉඳුල් කරන ලද වැල-වරකාවලින් නහින සුවඳින් සුවඳ වුණු සිහිල් සුළඟ කය පමණක් නොව නැහැය ද පිනවයි. කොස් ගසින් හා අඹ ගසින් ද සෙවණ වුණු ඇතැම් බිම් කඩක් වසාගත් පරණල ඇතිරිල්ල, ඇස් වටය එරවන තරම් ගන ය. පාර අයිනෙහි විශාල දෙඹ ගසක් යට වවුලන් විසින් රැයෙහි වගුරුවන ලද දෙඹ, බලදස පයින් එක්තැන් කෙළේ ය. දෙඹ ගසට මඳක් ඈතින් පිහිටි කජු ගස් යට වූ වවුල් හප සහිත කජු ඇට අවුලන ගැමි කොලුවන් දෙදෙනෙකුගෙන් බලදස මෙසේ ඇසී ය.

"ඒයි; බොලා මේ දෙඹ අවුලන්නේ නැද්ද?"

"පස්සේ අවුලනවා. දෙඹ රාත්තලක් දූන් විකිණෙන්නේ සතේ බැගින්"යි එක් කොලුවෙක් උත්තර දුන්නේ ය.

ගැල ඉදිරියෙන් පියෑඹූ ඇටිකුකුළෙක් පාරේ අනික් පැත්තටත් වෙලටත් අතර වූ ගල් වැටක් උඩට බැස්සේ ය. වට පිට බලා පාර හරහා දුවන මුගටියකු දුටු බලදස කැටක් අවුලාගෙන ඒ කැටින් ඌට ගැසී ය.

"බලදසට පෝය දවසෙවත් බැහැ නෙව සතුන්ට හිංසා නොකර ඉන්න"යි මාතර හාමිනේ කීවා ය.

"පව් පුරවා නොගෙන ඉන්න බැරි හැටි"යි පියල්ගේ මව කීවා ය.

"බලදස අපි එක්ක ආවේ වන්දනාවට නෙවි, සෙල්ලමට"යයි කියමින් විජයගේ නෝනා සිනාසුණා ය.

"මොකට ද බොරු කියන්නේ; මම නම් ආවේ සෙල්ලමට. පියල් ආවේත් සෙල්ලමට නෙවද?"

"නැතිව?" යි කියමින් පියල් සිනාසුණේ ය.

"නාකි හාමිනේලා දෙන්න නම් එන්න ඇත්තේ නා මල් පූජා කරලා පින් කරගන්න බව ඇත්ත. නමුත් අනිත් නෝනලා-"

"අපි ආවේ නා මල් පූජා කරන්න"යි අනුලා සිනාසෙමින් කීවා ය.

"ඒ බොරු"

Scanned by CamScanner

''බොරු නෙවි ඇත්ත.''

''සෙල්ලමට ඇවිල්ලා තියෙන්නේ පිරිමි කාංඩෙ තමා'' විජයගේ නෝනා කීවා ය,

''ඔව්, අපි ඇත්ත කියනවා. නමුත් ගෑනු බොරු කියා ඇත්ත හංගන්න හදනවා''යි විජය කීවේ ය.

''ඒ මහත්තයා විතරයි, ඇත්ත කිව්වේ''යි කියමින් ගැල්කරු සිනාසුණේ ය.

''තව කවද?''යි අනුලා ඇසුවේ ඇනුම් පදයක් කියන්නාක් මෙනි.

''කවුරු උණාම මොකද ඇත්ත කියන එකට''

''බලදස එහෙනම් මල් පූජා කරන්නේ නැද්ද?''

''උපාසකම්මලා වද කරොත් ඔහෙ පූජා කරනවා නැති නම් නිකං ඉන්නවා.''

''නරකාදි තියෙන්නේ පොල්ලෙලි, පොල් කෝම්බ පුර-වන්න ය?''යි පියල්ගේ මව කීවා ය.

''අපි නරකාදි යන්න බය නැහැ. පිරිමින්ට නරකාදි යන්න ඇරලා ගෑනු දිව්‍යලෝකේ ගියාම දිව්‍යලෝකේ ගෑනු වැඩි වෙනවා!''

''ඒක නොවෙන්නම් සක්කරයාට දහස් ගණන් දිව්‍ය ස්ත්‍රීන් ඉන්නවා ය කියන්නේ!''යි අනික් පිරිමින් සිනස්සමින් විජය කී ය.

''දැන් නරකාදිය ඉස්සර වගේ නෙවි; දැන් ඉන්න යම රජ්ජුරුවෝ අපේ යාළුවෙක්!''

''ඒ කවිද බලදස මහත්තයා?''යි බලදස දෙඩවන අටියෙන් ගැල්කරු ඇසී ය.

''මැරුණ අලි පුංචි රාළ දන්නවා නෙව ද?''

''ඔව්—ඔව්; ගමේම උන් සමර්ත දඩයක්කාරයා.''

''අන්න හරි! ඒ මිනිහා ජීවත්ව ඉන්දෙද්දී එක දවසක් නෑර දඩයංකරා. හාවෙක්, වල් ඌරෙක්, වල් මීයෙක් මරාගන්න බැරි උණ දවසක ඒ මිනිහා තල ගොයෙක් වත් මරාගෙනයි ගෙදර ආවේ.''

''ඉතින්''

''දඩයමට තිළුණ ආසාව නිසා අලි පුංචි රාළ මැරෙද්දී කිව්වා, ඒ මිනිහගෙ තුවක්කුව බෙහෙත් පුරවා මිනී පෙට්ටියේ තියන්න ය කියා. ඒ මිනිහා මැරුණට පස්සේ යම රජ්ජුරුවන් ළඟට ගියේ තුවක්කුවත් අරගෙන.''

Scanned by CamScanner

"කාණු දෙකේ තුවක්කුව වෙන්න ඇති!"යි කියමින් ගැල්කරු අගුල්පත් තැබී ය.

"ඔව්, යම රජ්ජුරුවෝ ඇහුවා 'ඔය මොකක් ද' කියා; අලි–පුංචි රාළ කිව්වා 'මේක මම හීතලට බොන පයිප්පෙය' කියා. 'පයිප්පෙ බීලා බලන්න මමත් ආසා ය'යි යම රජ්ජුරුවෝ කිව්වා. එතකොට අලි–පුංචි රාළ කාණු දෙකේ තුවක්කුවේ කොන දුන්නා යම රජ්ජුරුවන්ගේ කටට; යම රජ්ජුරුවෝ තුවක්කු සෙ ්න උරන්න පටන් ගත්තා; පුංචි රාළ එතකොටම කොකා ගැස්සුවා! යම රජ්ජුරුවො එතනම මැරිලා වැටුණා.

"මාතර හාමිනේත් පියල්ගේ මවත් හැර අනික් සියල්ලෝම සිනාසෙන්නට වූහ."

"එහෙනම් දැන් නරකාදියේ රජකම් කරන්නේ අලි–පුංචි රාළ!"යි අනුලා ඇසුවා ය.

"ලොකු නෝනා බලදස මහත්තයාගේ කට අවුස්සලා නිකම් පවු පුරවාගන්න එපා"යි පියල්ගේ මව අවවාද කළා ය.

"දැන් නරකාදියේ රජකම් කරන්නේ අලි–පුංචි රාළ තමයි. ඒ මිනිහා සත්තු මරන මිනිසුන්ට කිසිම දඬුවමක් කරන්නේ නැහැ. කවු ඉඹුල් ගහත් කප්පවා දරවලට ගත්ත!"

"එහෙනම් මහත්තයෝ දැන් අපට බයක් නැහැ!"යි ගැල්කාරයා කී ය.

"මොන බයද් ද?"

කොස් රුප්පා පසු කළ ගැල අනතුරුව ළඟා වූයේ වෙලින් ගැවසුණු පෙදෙසකට ය. ඈත ගම්වලින් වැටුණු ගම්සබා පාරවල් දෙකක් එක් වන හතර මං හන්දියෙහි කඩ පළක් වෙයි. හාල් සිල්ලර බඩු ද රෙදි–පිළි ද සපයන කඩයකින් හා තේ වතුර කඩයකින් ද යුතු ඒ වෙළඳපළ එහි පිහිටුවන ලද ගැමියන්, වෙළඳාමෙහි ශූරයන් බව, කඩපළ සඳහා ඒ හන්දිය තෝරාගැනීමෙන් ම හෙළි වෙයි. ගම් කිහිපයකින් එන ගැමියන් බසින්නේ ඒ හන්දියට ය. ගැමියන්ට වුවමනා දේ සපයා ඔවුන්ගේ ඉණ–ඉහ අතගා ගනු පිණිස කඩපලක් පිහිටුවීමට සරිලන තිප්පළ මේ හන්දිය ය. කඩපළ සඳහා මේ හන්දිය තෝරාගත් ගැමියෝ, උගැන්මෙන් නොව සහජයෙන් වෙළඳ නුවණ ලැබුවෝ ය. කඩපළ මෙතැන නොවී නම් හැම පැත්තෙන් පැමිණ මහපාරට බසින ගැමියෝ ඔවුනොවුන්ට වුවමනා දේ ගැනීමට යළිත් විසිර ඔවුනොවුන්ට හිතෙන හිතෙන දෙස බලා යති.

"ගොනුන්ට හතියි. පොඩ්ඩක් නැවතිලා හති ඇරලා යං"යි කියමින් ගැල්කාරයා, ගැල නවත්වා ගොනුන් මුද පිදුරු මිටියක්

Scanned by CamScanner

උන් ඉදිරියෙහි දැමී ය. ගැල් කාරයා ද තේ කෝප්පයක් බී විඩා හරිනු පිණිස කෝපි කඩයට ඇතුළු වූයේ ය.

හන්දියෙන් යාර කිහිපයකින් ඔබ්බෙහි පාර දෙපැත්තෙන් ඈතට පැතුරුණු මහ වෙල් දෙකක් වෙයි. වම් පැත්තෙහි වෙල කෙළවර වන තැනින් තැන පැතුරුණු මහ මූකලාන ක්ෂිතිජය තෙක් පැතුරුණු එකක් සේ පෙනෙන්නේ පළින් පළ එළිමහනෙහි පිහිටි ගම්මානයන් ඇසට හමු නොවන බැවිනි. දකුණු පැත්තෙහි, කෙළවර නොදැක්ක හැකි සේ වක්ව පැතුරුණු වෙලකි. ඒ වෙලෙහි එක් පැත්තකින් පටන්ගන්නා මහ මූකලාන, ඇසට පෙනෙන තෙක් මානයෙහි පැතිර දුම් කඳින් වැසුණු මුදුන් ඇතිව, සක්වළ හා එක්ව නිල් වලාකුළුවල ස්වරූප ගනියි. ඒ මූකලාන පටන්ගන්නා තැන වූ බැදි දෙල්, අඹ, හොර, බකිනි, කෝන් යන ආදි ගස්; ගැලෙහි උන් ගැහැනුන් විසින් ද හඳුනාගන්නා ලදී. ගොයම් ගස් අතර බක වත් රකිමින් සිටි කන කොකකු, ගැලෙහි සිටියවුන්ට පෙනුණේ ඉගිලීමෙන් ඌ තම පියාපත්වළ කිරි පාට දැක්වූ පසු ය. කඩපළ පිටි පසින් නැංගා වූ කඳු ගැටය වූ කලි ළඟදි කැලය කොටා ගිනි තබා බිම පෙරළා සකස් කරන ලද හේනකි.

මේ කඩපළත්, ගිනි තබන ලද හේනත්, සක්වළතෙක් පැතුරුණාක් සේ පෙනුණු මහ මූකලානත් දුටු නන්දට සිහිවූයේ සිංහලේ ගිය ජිනදස ය; ඔහු කළ වෙළඳාම ය; ජිනදස ඇකිරියන් කුඹුරෙහි ගොඩේ ගැහැනියකගේ ගෙදරට වී හේන් ගොවිතැනින් ජීවනය සපයාගන්නේ යයි කරෝලිස් විසින් ලියා එවන ලද පුවත ය. නන්ද මාතර හාමිනේ මෙන් ඇතුළු හද දෙසට ම හැරුණු මනැස ඇත්තියක් නොවූවා ය. එහෙත් ඇගේ සිතට හදිසියේ නැඟුණු යට කියන ලද සිතිවිලි නිසා, අතීතය, රූකඩ නැටුමක් සේ ඇගේ මනැසට ගොදුරු වී ය.

තම මව යෝජනා කළ බැවිනි නන්ද, ජිනදස හා විවාහ වූයේ. පියල් ඈ පැතූ නමුත් ඈ පියල් නොපැතුවා ය. එහෙයින් විවාහ වෙද්දී පියල්ගෙනුත් ජිනදසගෙනුත් තමාට වඩාත් ගැළපෙන්නේ කවරෙක්දැයි යන පැනය නන්දගේ හිසට නොනැංගේ ය. ‘ජිනදස නන්දට කැපෙන තරුණයෙක් නොවේ’ය යන හැඟීම ඇතැම් විට ගැමි ගැහැනුන් තුළ වුව ද අළු යට සැඟවුණු ගිනි පුපුරක් සේ පවතින්ට ඇත. එහෙත් නන්ද තුළ නම් එවැනි හැඟීමක් නෙ වී ය. නන්ද ජිනදසට ආලය කරන්ට පටන්ගත්තේ විවාහ වුණු ද රැයෙහි සිට ය. විවාහ වුණු ද රැයෙහි ඔවන් දෙදෙනා කළ කතා-බහ ජිනදස තමාට ද තමා ජිනදසට ද දැක්වූ ආදරය, පෙර ඇසුරු නෙ කළ කතා-බහ නොකළ ජිනදසත් තමාත් අතර එතැන්සිට හටගත්

අපූරු නෑ සබඳකම, යන ආදිය සිහි කළ නන්දගේ සිතට පළමුව නැංගේ සන්තෝෂයකි; දෙවනුව ශෝකයකි; තෙවැනිව තියුණු වේදනාවකි: සිව් වැනිව බියකි.

ජිනදස හා විවාහ වුණු පසු නන්ද පියල් ගැන සිතුවා නම් සිතුවේ තමා කුඩා කල පටන් දන්නා අඳුනන අනික් ගැහැනියක හෝ පිරිමියකු හෝ සිතන්නාක් මෙනි. එහෙත් මෑතක සිට පියල් මතක් වන විට, ඇගේ සිතට නඟින්නේ පෙර ඔහු නිසා නඟින උදුසින සිතිවිලිවලට වෙනස් සිතිවිලි ය. පෙර ජිනදස සිහි කළ කිසි විටක ඇගේ සිතට පියල්ගේ ස්වරූපය නොනැංගේ ය. එහෙත් දැන් ජිනදස මතක් වන විට ඈට පියල් ද මතක් වෙයි. කිසිවකු ජිනදස මතක් කළ විට ඈ කිපෙන්නේ එහෙයිනි.

ස්ත්‍රිය තමාට විය හැකි අනාගත විපත් බොහෝ විට දකින්නේ බුද්ධියෙන් නොව සහජ හැඟීමෙනි. රාගය හා කුසගින්න ද වැනි හැම මැඩීමට හුදු බුද්ධිය, ඇබ්බැහි කමට එක්වුණු බුද්ධිය තරම් ප්‍රබල නොවේ. බොහෝ විට පිරිමිහු ඒ ඇබ්බැහිකමින් තොරයෝ ය. සහජ හැඟීමෙන් අනාගත අන්තරාය දක්නා ස්ත්‍රිය, රාගය, කුසගින්න, යන ආදී මුල් හැඟීම් මැඩගැනීම සඳහා, ඉව නිසා තම දරුවන් රැකගැනීමට වැරවෑයම් කරන දිවි දෙනකගේ ශක්තිය ඇත්තියකි. ස්ත්‍රිය ඒ ශක්තිය ලැබුවේ, කුල සිරිත් නොහොත් සමාජ චාරිත්‍ර නිසා ය.

ජිනදස හා විවාහ වීමට පෙර තමා ගැන පියල් සිතුවේ දැනට වඩා වෙනස් විධියකින් බව නන්ද නිසැකව දනියි. විවාහ වන්ට පෙර ඈ පියල් සමඟ කතා–බහ කෙළේ, ඔහුට සරදම් කෙළේ, ඔහු නිසා හටගන්නා අමුතු සැකයක්, බියක්, පැකිළීමක්, ඇතිව නොවේ. කුඩා කල සිට ඇසුරු කළ එකකු වන පියල් සමඟ ඈ වැඩි වියපත් වීමෙන් පසු ද පෙර සේම–කතාබහකළා ය; ඔහුට සරදම් කළා ය. පියල්ගෙන් ලියුම් ලැබුණු විට පවා නන්දගේ ඒ ගතිය වෙනස් නොවී ය. එහි මඳ වෙනසක් ඇතිවූයේ මව පියල් ගැන නන්දගෙන් ප්‍රශ්න කළ පසු ය; සම්පූර්ණයෙන් වෙනස් වූයේ ජිනදස හා විවාහ වූ පසු ය.

පියල් නිසා තමා තුළ පෙර නොවූ විරූ ලජ්ජාවක්, බියක්, සැකයක් සසල බවක්, දැන් හටගන්නේ කුමක් නිසා ද? යන පැනය නන්ද කිසි විටක නොහැඟුවා ය. දැන් ජිනදස ගැන සිතන හැම විටම පියල්ගේ ස්වරූපය ඇගේ මනැසට නඟින්නේ කුමක් නිසා ද?

නන්ද වූ කලි තමා විසින් තමා ම රවටාගැනීමට හුරු, ආගම භක්තියෙන් මඬනා ලද සිත් ඇති, ගැහැනියක් නොවේ. පියල් ගැන පෙර නොවූ විරූ ලජ්ජාවක්, බියක්, සැකයක්, සසල බවක්, ඇගේ සිතෙහි හටගන්නේ අවලමකු වැනි චපල හැඟීමක් ඇගේ

Scanned by CamScanner

උපවිඥානයට වැදගන්නා ලද හෙයිනි. කුල ගර්වය, සමාජ චාරිත්‍ර, පති භක්තිය, යන ආදිය නමැති මුර කරුවෝ, ඒ අවලම් හැඟීමට ඇගේ ජාගර විඤ්ඤාණය නමැති ශිෂ්ට ලෝකයට පිවිසීමට ඉඩ නොදෙති. එහෙයින් ඇගේ යටි සිතෙහි එවැනි අවලම් හැඟීමක් ඇතැයි නන්ද තවම නිසැකව නොදනියි. කඩපල, ගේන සහ සක්වල නෙක් පැතුරුණු මහ මූකළාන ද නිසා තමාගේ අතීතයත් ජිනදාසත් සිහි කළ නන්දගේ සිතට පියල්ගේ ස්වරූපය නගන ලද්දේ ඇගේ යටි සිතෙහි සැඟවුණු යට කියවුණු අවලම් හැඟීම විසිනි.

''පුංචි නෝනා ලොකු කල්පනාවකට වැටිලා වගෙයි. මෙන්න අඹ''යි කියමින් පියල්, ඉදුණු අඹයක් නන්ද දෙසට දික් කෙළේ ය.

ආරූඪ සිතාවකින් කට පරක්කාගත් නන්ද ඒ අඹය ගෙන කෑවා ය. අනුලා කන්නේ ඇ ලත් අඹයෙහි අවසාන පළුව බව නන්දට වැටහුණේදැන් ය. විජය ගේ නෝනා කන්නේ පියල් කපා දුන් දෙවන අඹය ය.

''පුංචි නෝනා විතරයි වන්දනාවේ යන්න ඕනෑ විදියට යන්නේ'' යි බලදස කිය.

''ඇයි එහෙම කියන්නේ?''

''පුංචි නෝනා වැඩිය කතා නොකර බුම්මාගෙන ඉන්න නිසා. නා මල් පූජා කරලා හොඳටම පින් ලබා ගන්න නම් වන්දනාවෙ යන්න ඕනෑ එහෙම තමා.''

''කතා කරන්න ඕනෑ කමක් උණාම මම කතා කරනවා; බලදස වගේ දෙඩවන්නේ නැහැ''යි නන්ද පිළිතුරු දුන්නා ය.

''පුංචි නෝනාට තව අඹ ඕනෑ ද?'' අසමින් බලදස තවත් අඹයක් දික් කෙළේ ය.

''බලදස මා රවටන්නයි හදන්නේ. ඔය අමු අඹයක් නෙවද?''

''නෑ, ගන්න.''

''ඇයි එහෙනම් කපලා දෙන්න බැරි?''යි අසමින් නන්ද සිනාසුණා ය.

''පුංචි නෝනා හැබෑ අමාරුකාරියක් තමා''යි කියමින් බලදස අඹය ඉවත තබා ඉදුණු අඹයක් ගෙන කපා නන්දට දුන්නේ ය.

''බලදස හිතාගෙන උන්නේ මමත් ලෙහෙසියෙන් රවටන්න ඇහැකිය කියා''යි තෙපලූ නන්ද සිනාසෙමින් අඹය අතට ගත්තා ය.

පියල් සැලකුවේ එය තමාට එල්ල කළ ඇනුම් පදයක් ලෙසිනි.

''රැවටුණේ ජිනදාස මහත්තයාට'' යයි බලදස එකවෙක කී ය.

''බලදස මම එක්ක ඔය ඕනෑ නැති කවටකම්වලට එන්න එපා.''

"බලදස මහත්තයා පුංචි නෝනා කේන්ති නොකර නිකම් ඉන්න"යි පියල්ගේ මව කීවා ය.

"පහු උණොත් අද නා මල් ලැබෙන්නේ නැහැ. මේ නා මල් පූජා කරන්න යන සේනාව නෙව"යි කියමින් ගැල්කාරයා, සුදු ඇඳුමින් සැරහී ගම්සබා පාර ඔස්සේ එන ගැනුන් ද පිරිමින් ද පෙන්නුවේ ය.

"ඔව් ඔව්, ඒත් පරගොඩ යන වන්දනාකාරයෝ තමා"යි පියල්ගේ මව කීවා ය.

"විගහට දක්කාපන්"යි විජය ගැල්කාරයාට කී ය.

ගැල පරගොඩ විහාරයට ළඟා වූයේ අටට පමණය. විහාරයට පිවිසෙන පාර, කොළින් මලින් බර වූ නා ගස් දෙපේළියකින් සෙවණ වූවකි. පාර දෙපැත්තේ එක උසට නැඟුණු නා ගස්, කතුරෙන් කප්පාදු කරමින් වවන ලද කස ගස් සේ එකම ස්වරූපයෙන් පෙනිණ. තුරුමෙන් බැබළෙන නා මලින් නික්මෙන මිහිරි සුවඳ නිසා මාතර හාමිනේගෙත් පියල්ගෙත් මවගෙත් නා මල් පිදීමෙහි ආශාව දැඩි වී ය; තියුණු වී ය, උණු කැවුම් උයනු ලබන විට කෝපි කඩයට ළඟා වන ගැමියාගේ නැහැයට උණු කැවුම් සුවඳ දැනුණු වහාම කටට කෙළ උනන්නාක් සේ නා මල් සුවඳ නැහැයට දැනුණු මාතර හාමිනේගේ ද පියල්ගේ මවගේ ද සිතට නැඟුණේ ශ්‍රද්ධාව ය; බුදුන් පිදීමෙහි ආශාව ය. එහෙත් නා මල් සුවඳ ඇසූ අනුලාගේත් නන්දගේත් විජයගේ නෝනාගේත් සිත්වලට නැංගේ ඊට වෙනස් හැඟීම් ය. අනුලාට සිහි වූයේ කලකට පෙර තම සුළු පියාගේ පුතකුගේ මඟුලෙහිදී, එහි රැස් වුණු තරුණයන් හා කතා-බහ කිරීමෙන් ලත් ප්‍රීතිය ය; සුවඳ දියෙන් තෙමන ලද තමාගේ ලේන්සු කොනින් ද ඇතැම් තරුණයකුගේ, සුවඳ දියෙන් තෙමන ලද හිසින් ද පැතුරුණු සුවඳ ය. නන්දට සිහිවූයේ ජිනදාස හා විවාහ වුණු දින රැයෙහි සුවඳ දියෙන් තෙමුණු තම හිසින් ද වත්සුණු තැවරුණු බෙල්ලෙන් හා මුහුණින් ද ජිනදාස ගේ හිසින් ද නැඟුණු සුවඳ ය. එහෙයින් නා මල් සුවඳ ඇසූ නන්දගේ සිතෙහි පහළ වූයේ ශෝකාකුල ප්‍රීතියකි. තමාට ළං ව සිටි පියල්ගෙන් ඈත්-වීමට තුඩු දුන් බියකි. විජය ගේ නෝනා විජයට වඩාත් ළං වූයේ නන්ද තුළ හටගත් හැඟීමට අසමාන හැඟීමකින් නොවේ.

දෝත් පුරා නා මල් ගෙන ගිය ගැහැනුන් ගාථා කියමින් බුදු රුව ඉදිරියෙහි වූ මලසුනෙහි එකිනෙක ගෙන පුදත් ම බලදස, පියල්, විජය, යන තිදෙනා නා මල් දෙක තුන බැගින් ගෙන ගොස් පුද තෙවර බැගින් 'සාධු' කියා වැඳ පිළිම ගෙයින් පිට වූහ.

Scanned by CamScanner

"ඉලන්දරි ඔය බුදුන් වැඳලා ඉවර කරා ද?" යි මාතර හාමිනේ විචාළා ය. මලසුන මතුයෙහි නා මල් එකිනෙක ගෙන පුද අවසාන කළ ඈ දණ ගසා ඉණෙන් ගත් ලේන්සුව බිම අතුළා ය.

"ඇවිල්ලා බුදුන් වඳින්න"යි ඉලන්දරි තිදෙනාට අණ කළ පියල්ගේ මව ද මාතර හාමිනේ ළඟින් ම දණ ගසා 'ඉතිපිසෝ' ගාථාව කියන්ට වූයේ මුදුනට නඟාගත් දෝත ඇතිව ය. පිටු පස බලා කට කොනට සිනා නඟමින් උන් අනුලා මහලු උපාසිකාවන් දෙදෙනා අනුකරණය කළා ය. අනික් ගෑහැනු තිදෙනා ද සිනා මැඩගෙන අනුලා අනුකරණය කළහ. ඉලන්දරි තිදෙනා ද ගැහැනුන් පිටිපසට වී ඇන තියාගෙන මන්තරයක් මතුරනවාට වැඩි ඉක්මණින් ගාථාවක් මතුරා බුදුන් වැඳ පිළිම ගෙයින් පිට වූහ. ගාථාවක් දෙකක් කියූ පමණින් තරුණ කතුන්ගේ බුදුන් වැඳීම කෙළවර වී ය. මහලු උපාසිකාවන් දෙදෙනාගේ කටින් ලලිත ගීත සේ ගිලිහෙන ගීතාවලිය එතරම් ඉක්මනින් කෙළවර වන්නක් නොවී ය. එහෙයින් තරුණ කාන්තාවෝ වැඳගත් වනම හිඳගෙන ඉඳ–හිට, යටැසින් මහලු ස්ත්‍රීන් දෙදෙනා දෙස බලති.

මාතර හාමිනේ තම ගාථාවලිය කෙළවර කළ වහාම දෝත ද හිස ද බිම ඔබා 'ස්–සා–දු, ස්–සා–දු,–යි, බැති පෙමින් සැලෙන සරින් කියමින් වැන්ද ය. පියල්ගේ මව ද වහාම මාතර හාමිනේ අනුගමනය කළා ය. ඔවුන් දෙදෙනා නැඟී, තරුණ කතුන් දෙසට නොව බිමට හැරවුණු නෙත් ඇතිව පිළිම ගෙයින් පිට වූහ.

බෝ රුකට ද සෑය ට ද මල් පුද අවසාන කළ මාතර හාමිනේ හා පියල්ගේ මව ද පිළිම ගෙයි මුල්ලකට වී දෙවියන්ටත් මියගිය නෑයන්ටත් පින්පෙත් දුන්හ. නෑයන්ට පින් දෙන අවස්ථාවෙහි මාතර හාමිනේගේ දෙනෙතට කඳුළු උනනු අනික් ගැහැනු නුදුටහ. ඇගේ දෙනෙතට කඳුළු නැංගේ මිය ගිය සැමියා ද ඔහු හා කත්තිරිනා හා අතර පැවති හාද කම ද සිහි වුණු හෙයිනි. ඈ මියගිය නෑයන්ට පින්පෙත් දී සැමියාට සුගතිය පැතුවේ හද පිරුණු සැදැහැ බැති පෙම් ඇතිව ය.

දවල් එකට පමණ වන්දනා මානනය කෙළවර කළ ඔවුහු, ගැල නවත්වන ලද තැනට නුදුරින් වූ තණ බිස්සෙහි එලන ලද පැදුරක් වටකොට හිඳ ගෙන කෑම කෑහ. පියල් විසින් ලියන ලද රතු ලූනු සහ අමුමිරිස් ද ඇති පිඟානට බලදස ලොකු සාඩින් ටින් දෙකක් හිස් කෙළේ ය. පෝය දවසෙහි මස් නොකනා මාතර හාමිනේ ද පියල්ගේ මව ද සාඩින් සමඟ පාන් කෑවේ වැඩි කැමැත්තකින් නොවේ. නා මල් පිදීමෙන් අත් කරගත් කුසල් රැසින් පිරුණු සිත් ඇති මහලු උපාසිකාවන්ට තමන්ගේ උදරයන්ගේ හිස් බව නොදැනිණ. පයින් ගමන් කිරීමෙන් වෙහෙසුණු කය ද

පිරිසිදු වාතය ආශ්වාසයෙන් පිබිදුණු සිත් ද ඇති පිරිමිහු සාඩින් පමණක් නොව මස්ද සමඟ පාන් කපුටන් සේ ගිල දැමූහ.

"අපි ආවේ වඳින්න නෙවි කන්න"යයි කියමින් බලදස පිඟානෙහි ඉතිරිව තිබුණු කට්ලිස් තුනම තම කොළපතෙහි දමාගත්තේ ය.

"පුංචි නෝනලාට දැන් පාන් විතරයි කන්න වෙන්නේ"යි පවසමින් පියල් සිනාසුණේ ය.

"තව සාඩින් ටින් එකක් කඩන්න"යයි විජය යෝජනා කෙළේ ය.

"අපට ඇති"යි නන්ද කීවා ය.

"මදි මදි කඩන්න"යි බලදස කී ය.

පියල් සාඩින් ටින් එකක් කඩා පිඟානෙහි ඉතිරිව තිබුණු ලූනු-මිරිස් කෑලි උඩ හැළි ය. බලදස පිඟාන ගෙන තරුණ ගැහැනුන් තිදෙනාගේ කොළපත්වලට මාළු බෙදුවේ ය.

"පියල්ටත් බෙදන්න ද?"

"ටිකක් ඇති—"

"විජයට"

"මට නම් ඇති, අන්න, පුංචි නෝනාට තව ටිකක් බෙදන්න."

"මට එපා."

"ඉල්ලුවත් තවත් දෙන්නේ නැහැ"යි කියමින් බලදස ඉතිරි මාළු තම කොළපතෙහි හළාගෙන තරුණ ගැහැනුන් සිනස්සමින් පානුත් සමඟ ගිල දැම්මේ ය.

"මේ ගොල්ලත් ඉලන්දරිකම්වලට උදව් දෙනවා"යි කියමින් මාතර හාමිනේ, සිනාසෙන තරුණ කතුන්ට දෙස් නැඟුවා ය.

"පන්සලට ආවා ය කියා අපට හිනා නොවී ඉන්න ඇහැක"යි කීයූ අනුලා, බලදස දෙස බලා ඉඟි මැරුවා ය.

"හිනා වෙන එක පව් ද?"

"ඒකට උත්තර ලබා ගන්න ඕනෑ ඔය ඉලන්දරි ගෑනුන්ගෙන්-මයි"යි පියල්ගේ මව උත්තර දුන්නා ය.

"හිනා වෙන්න පන්සලට එන්න ඕනෑය?"යි මාතර හාමිනේ පැවසුවේ මඳක් අසන්තෝෂයෙනි.

"පන්සලේ ඉන්න හාමුදුරුවරු හිනා වෙන්නේ නැද්ද?"

බලදසගේ මේ ප්‍රශ්නය ඇසූ තරුණ ගැහැනුන් සිනා මැඩගත්තේ අමාරුවෙනි.

Scanned by CamScanner

පියල් රට අන්නාසි ටින් දෙකක් කඩා එකක් මහලු උපාසිකාවන් දෙදෙනා ඉදිරියෙහි තබා අනික අනුලා අතට දුන්නේ ය.

''ගැනු පින් දෙන්න ඕනෑ දෙවියන්ට නෙවි අපට!''

''හරි ඇත්ත මහත්තයා!''යි කියමින් ගැල්කාරයා තමා කන අන්නාසි පෙත්ත පෙන්නුවේ ය. ''මෙච්චර හොඳ කෑම කාලා පින් නොදෙනවා නම් පව්.''

''ඉතින් පින් දීපන්කො!''යි අනුලා කීවා ය.

''කාලා ඉවර උණා ම අපි කට පුරාම පින් දෙනවා.''

''බලදසට තවත් කාගෙන්වත් පින් මොට ද?''

''පින් දෙන්න ඕනෑ උපාසකම්මලා.''

''උපාසකම්මලා ඇයි පින් දෙන්නේ කාටවත්?''

''ඇයි ද අහනවා? මෙච්චර හොඳට දනේ දුන්නාම කාලා උපාසකම්මලා පින් දෙන්න ඕනෑ අපිටයි.''

''බලදස එහෙනම් මගදී කිව්වේ නරකාදියේ ඉන්නේ යාළුවෙක් නිසා පින්කරන්න මහන්සි වෙන්න ඕනෑ නැත කියා''යි නන්ද විචාළා ය.

''පින් කරන්න බැරි උණ නිසා.''

''ඒකට අපි මොනවා කරනවා ද?''

''ඒක නොවෙන්නම් පින් දෙන්න කිව්වේ.''

කවුරුත් උන් උන් තැන්වලින් නැඟී පිඟන් කෝප්ප සෝද ගැලෙහි පෙට්ටියෙහි තැබූහ. ගැල්කාරයා පැදුර ගසා දමා හකුළා ගැලෙහි තැබී ය.

Scanned by CamScanner

# 13 වන පරිච්ඡේදය

පරගොඩ විහාර ස්ථානයෙන් පිටත් වුණු වන්දනාකාරයෝ යටගම පුරාණ විහාරය ද වැඳ-පුද නමන්ගේ ගෙවලට ළඟා වූයේ රෑ හතට පමණ ය. අනුලා හා විජය ගේ නෝනා ද පියල්, බලදස විජය, යන තිදෙනා වන්දනා ගමනින් ලැබුවේ සෙල්ලම් ගමනකින් ලබන ප්‍රීතියකි. අනුලා කුඩා වියෙහිදී ගිනිවැල්ලේ විහාරය වැඳීමට බත්තලෙන් ගිය පළමු වන වාරයෙහි ලැබූ ප්‍රීතියට නොදෙවන ප්‍රීතියක් පරගොඩ වන්දනා ගමනින් ලැබුවා ය. තම ප්‍රීතියට බාධා කරන අතීතය හෝ අනාගතය හෝ පිළිබඳ සිතුමක් පැතුමක් අනුලාගේ සිතට නොනැංගේ ය. එහෙයින් ඈ වන්දනා ගමනින් ලැබුවේ එකම ප්‍රිති රසාස්වාදයකි. නන්දට එවැනි එකම ප්‍රීති රසාස්වාදයක් ලැබිය හැකි නොවි ය. නොහැකි වූයේ, තම අතීතයද වර්තමානය ද මතක් වීම, ඒ වේලාවේ වන්දනා ගමනින් ලැබිය හැකි ප්‍රීතියට බාධාවක් වූ බැවිනි. එහෙත් විහාර ස්ථානයට ළඟා වී මල් පුද ආහාර අනුභව කළ අවස්ථාවෙහි නන්ද,අනුලා හා විජයගේ නෝනා ද මෙන් ශෝකාකුල හැඟීමෙන් තොර වූ ප්‍රීති රසාස්වාදයක් ලැබුවා ය.

පරගොඩ යද්දි හතර මං හන්දියෙහි ගැල නවත්වන ලද අවස්ථාවෙහි කඩ පළත් හේනත් දැකීමෙන් සිතට නැඟුණු තමාගේ අතීතය ද ජිනදස ද පිළිබඳ තොරතුරු රැයෙහි නින්දට ගිය නන්දගේ සිතට යළිත් නැංගේ ය. මේ වර පියල්ගේ ස්වරූපය ඇගේ සිතට නැංගේ මෙතෙක් ඇගේ සිතට නොනැඟුණු සිතුවිලි ද ඇදගෙන ය. යටි සිතෙහි සැඟවී තුබුණු අවලම්-හැඟීම්, ඇගේ ජාගර චිත්තයට පිවිසීමට, කාමරයෙහි වූ දැඩි අඳුර ද අනුබලයක් නොවී යයි කිව හැකි නොවේ. දහවල් කාලයෙහි අපේ සිතට නැඟීමට එබිකන් පාන ඇතැම් අවලම් හැඟීමක්, තම නග්න වේෂය නිසා විලි බිය ඇත්තේ පසු බසියි. දැඩි අඳුරෙහිදී ඇස අඳුරුවන කල සිත ද මඳක් අඳුරු වෙයි. අපේ උපවිඥානයෙහි සැඟවුණු, අඳුර ප්‍රිය කරන, අවලම් හැඟීම රැයෙහි හුදකලාව ඉන්නා විට අපගේ සිතට පිවිසෙන්නේ එහෙයිනි.

ජිනදස සිහි වන විට පියල්ගේ ස්වරූපය තමාගේ සිතට නැඟෙන්නේ කුමක් නිසාදැයි නන්දට වැටහෙයි. පෙර ඈ බිය ගත්තේ තමාගේ සිතට පියල්ගේ ස්වරූපය නැඟීමට හේතු වුණු අවලම් හැඟීම ගුප්ත එකක්ව තුබුණු බැවිනි. ඒ අවලම් හැඟීම කුමක්දැයි දැන් නියැකව දුටු නන්ද පෙර සේ බිය නොවූයේ, ලජ්ජා නොවූයේ, චංචල නොවූයේ, කුමක් නිසා ද? තමාගේ යටි සිතෙහි නලියමින්



Scanned by CamScanner

උන්නේ පියල් පිළිබඳ අවලම් හැඟීම බව දුටු නන්දගේ කුල ගර්වය වඩාත් දැඩි වූ හෙයිනි.

පරගොඩ විහාරස්ථානයෙහිදී දවල් කෑම කා අනතුරුව එළිමහනෙහි තනිව සක්මන් කළ තමා වෙතට පැමිණි පියල් වටින්-පිටින් කළ කතාබහක් නිසා, ඔහුගේ එක්තරා අදහසක් නන්දට වැටහිණ. ඒවේලේම කුල ගර්වය හිසට නැඟුණු නන්ද ඔහුට පළමුව දුන් පිළිතුර රැවුමක් පමණි.

ගමෙහි පරිසරය වූ කලි එහි කුල ගෙවල් කිහිපයෙහි පමණක් නොව, පොදුවේ දිළිඳු ගැමි ගෙවල ද කතුන්ට තමන්ගේ කුල සිරිත් බිඳීමට නොව, දැඩිව රැකීමට අනුබල දෙන්නකි. කුල සිරිත් නොතැකීමට යන්තම් අනුබල දෙන අලුත් සිරිත් විරිත් දක්නා ලැබෙන්නේ ගමෙහි ඉහළ පවුල් කිහිපයක පමණ ය. එහෙත් සිහියට නැඟිය හැකි කාලයක පටන් දැඩිව රකින ලද කුල සිරිත් ඇති ඒ කුල ගෙවල ඇතිදැඩි වන කාන්තාවෝ, සහජයෙන් ම කුල සිරිත් රැකීමට පුරුදු වූවෝ ය. ඉද-හිට නැඟෙන අවලම් හැඟීමකට අනුබල දෙන සිතුමක් ඔවුන්ගෙන් එකියකගේවත් සිතට නොනඟියි. තම හැඟීමකට වහල්ව කුල සිරිත නො සලකා ක්‍රියා කළ එකම ගැහැනියක තම කුල පරපුරෙහි නොවූ නිසා ය, එවැනි සිතුමක් මහගෙදර ගැහැනියකගේ සිතට නොනගින්නේ. අනික් කුල ගෙවලින් ද එසේ කළ එකියක සොයාගත හැකි නොවේ. පොදු ගැමි ගැහැනුන්ගෙන් කුල සිරිත් බිඳින ලද එකියක ගැන ඉහළ පවුලක තරුණියකට අසන්ට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. ගමෙහි අහරදහර කාරියක පිළිබඳ කතා-බහ පවා කුල ගෙයක තරුණියකගේ කනට වැදෙනු වැළැක්වීම වැඩි හිටියන්ගේ සිරිත ය.

සිත කය පිනවීම උදෙසා ලැබිය හැකි දේ ගම්වල හිඟ ය. ඒ නිසා ලද දෙයින් තුටුව වෙසෙන ගැමියන්ගේ දිළිඳුකම නුවරුන්ගේ දිළිඳුකම මෙන් හැම විට ම කුල සිරිත් බිඳීමට අනුබල දෙන්නක් නොවේ. කුල සිරිත් කඩ කළ එකියකට මුළුගැන්වීමට තරම් නගරය විශාල ය; ජනාකීර්ණ ය. කුල සිරිත් බිඳින ලද එකියකට අනුකම්පා කිරීමට තරම් පැසුණු බුද්ධිය ද නිර්මල අදහස් ද ඇති, මනුෂ්‍ය ස්වභාව දන්නෝ නගරවල හිඟ නොවෙති. ගමෙහි පරිසරය මීට වෙනස් ය. කුලසිරිත් කඩ කළ එකියකට මුළු ගැන්වීමට ඉඩකඩ නැති තරම් ගම කුඩා ය; ජනගහනයෙන් අඩු ය. කුල සිරිත් බිඳින ලද එකියකට නිර්දය ලෙස පීඩා කිරීමට, වධ දීමට, නින්ද කිරීමට තරම් කිපෙන නූගත් අවිනීතයෝ, අවිචාර මත නිසා දැඩි සිත් ලැබූවෝ, ගමෙහි බහුල වෙති. එහෙයින් ගමෙහි පරිසරය නිතැතින්ම කුල සිරිත් රැකීමට කතුන්ට අනුබල දෙන්නක් වීම පුදුමයක් ද?

Scanned by CamScanner

ගමෙහි දිළිඳු පවුලක ගැමි ගැහැනියක, බොහෝ විට කුල සිරිත් බිඳින්නේ සාහසික කම් කරන්නවුන්ට ගොදුරු වීමෙනි; දිළිඳුකම නිසාම නොවේ. ගම්හි කුල ගෙයක ගැහැනියක් එවැනි සාහසික-යන්ගෙන් කිසි විටක පීඩා නොලබයි. කුල ගෙයක ගැහැනියකට එහි පරිසරය වඩ වඩාත් අනුබල දෙන්නේ කුල සිරිත් බිඳීමට නොව රැකීමට ය. කුල සිරිත් රැකීමට ඔවුන්ට රුකුල් දෙන ඒ පරිසරය සැදෙන්නේ ගමෙහි කුඩා බව, අඩු ජනගහනය, කුල ගර්වය, ගැමියන්ගේ නුගත්කම, අවිනීතභාවය, අවිචාර බුද්ධිය, ග්‍රාමීය විශ්වාසයන්ට වහල් වූ ඔවුන්ගේ දැඩි සිත, ඉන්ද්‍රියන් පිනා වීමට තුඩු දෙන දේ බහුල නො වීම, යන ආදියෙහි සංකලනයෙන් මිස ගැමියන්ගේ අපූර්ව ආධ්‍යාත්මික ශක්තියකින් නො වේ. කුල සිරිත් රැකීමට තුඩු දෙන්නේ මිනිසුන් ගේ හොඳ ගති ද හොඳ සිරිත් ද පමණක් ය යනු බණ දෙසන ඇතැමුන්ගේ අවිචාර මතයකි. කුල සිරිත් රැකීමට ගැහැනුන්ට අනුබල දෙන පරිසරය ඇති වන්නේ මිනිසුන්ගේ හොඳ ගති මෙන් ඇතැම් නරක දුබල ගති ද ඉස්මතු වීමට ඉඩ ඇති තැනකම ය.

තමාගෙන් වෙන් වියයි සිතිය යුතු පිනාදස මතක් වන විට පියල්ගේ ස්වරූපය තම සිතට නඟින්නේ, ඔහු පිළිබඳ හැඟීමක් මෙතෙක් තම තුළ සැඟවී තිබුණ හෙයිනියි නිසැකව දුටු නන්ද වඩාත් බිය නොවීම, ලජ්ජා නොවීම, එහෙයින් පුදුමයක් ද? පියල් පිළිබඳ ඒ හැඟීම මැඩ ගැනීමට තමාගේ දැඩි කුල ගර්වයම පිටුවහල් වන බව නන්ද දනියි. එහෙයින් බිය වන්නේ කුමට ද?

'කුඩා කල පියල් පිළිබඳ ආලයක් තමා තුළ වී ද?' යන ප්‍රශ්නය මේ අවස්ථාවෙහි නන්ද යළිත් නැඟුවා ය. තම මව පියල් හා විවාහ වීය යුතුයයි යෝජනා කළා නම් නන්ද ඊට අවනත වන්නේ පිනාදස පිළිබඳ යෝජනාවට අවනත වූණාක් මෙනි; එහෙත් වැඩි කැමැත්-තෙනි. වැඩි කැමැත්තට හේතුව, ඈ තුළ ඔහුට ආලයක් වූ නිසා ද? 'නැයි' නන්ද සිතුවා ය. උගත්කමෙන් හා රූපයෙන් හා ධනයෙන් ද පියල් පිනාදසට වැඩි තරුණයකු හෙයිනි.

වන්දනා ගමනින් සති තුනකට පමණ පසු නන්දට වියළුණු කැස්සක් සමඟ උණක් වැළඳිණ. තුන්වන දවසෙහි එක සිය තුන ඉක්මවා උණ නැඟ නිසා වහාම විරසිරි වෙදමහත්තයා කැඳවන ලදී. වෙද නන්දගේ රෝගය 'නිවමෝනියාව' ලෙස හැඳිනගෙන වෙදකම් කෙළේ ය. පස් වන දවසෙහි උණ එකසිය හතර අතක් නැඟ නිසා මාතර හාමිනේත් අනුලාත් බියගෙන දොස්තරකු කැඳ-වීමට සිතූහ. එහෙත් දොස්තරකු ගෙන්වීම, අගහිඟවලින් මිරිකෙන ඔවුන්ගේ වත්කම ඉක්මවන වියදමකි. උකස් කොට මුදල් ගත හැකි රන් අබරණ ද අනුලා වෙත හෝ නන්ද වෙත හෝ නොවී ය. ඔවුන්ගේ රන් අබරණ වරින් වර පොට්ටි කඩයට ගියේ මීට කලකට

පෙර ය. ඔවුන් දෙදෙනා ගමනක් යන විට පළඳින්නේ බලදසගේ හෝ විජයගේ හෝ සහෝදරියන්ගේ රන් අබරණ ය.

හවන දවසෙහි නන්දගේ උණ එකසිය තුනට වඩා නොනැංග නිසා දෙස්තර මහතා කැඳවීමේ අදහස පළමු දවසෙහි තරම් වේග යෙන් මාතර හාමිනේගේ හිතට නොනැංග නමුදු අනුලාගේ සිත නම් එම අදහසින් තවමත් පළමු දවසෙහි මෙන් මැඩෙන්නකි. හත්වන දවසෙහි උණ එකසිය දෙක ඉක්මවා නොනැංග බැවින් ලෙඩා දෙපෙරට වඩා සැනසීමක් ඇතිව කථා කළා ය; වට–පිට බැලුවා ය. වෙද 'දැන් බයවෙන්න කාරණයක් නැහැ''යි කියමින් මාතර හාමිනේගේත් අනුලාගේත් බිය දුරු කෙළේ ය.

'නිව්මෝනියාව' සුව වුණු නමුත් නන්දට ගැනුණු උණ සම්පූර්ණයෙන් නොබැස්සේ ය. අනූනවයටත් සියයටත් අතරෙහි වන නොබසින උණයකින් මේ වර නන්ද පෙළෙන්ට වූවා ය. සති හතරක් ගෙවුණු නමුදු මේ සුළු උණ නන්දගේ ඇඟෙහි නවාතැන් ගැනීමට හේතුව වෙදට පවා තේරුම්ගත නොහැකි අවුලක් වී ය. මෙතෙක් කැඳ වතුර බීමෙන් දුර්වල වූ නන්දට මෝල්ටඩ් මිල්ක් දිය යුතු යයි වෙද යෝජනා කෙළේ ය. අග–හිඟ වලින් මිරිකෙන අනුලා මෝල්ටඩ් මිල්ක් බෝතලයක් ගෙන්වීමට මුදල් සපයා ගත්තේ ඉතා අමාරුවෙනි. මෝල්ටඩ් මිල්ක් බෝතලය අවසාන වූ නමුත් නන්දගේ උණ අනූනවයට වඩා අඩු නොවී ය. තවත් මෝල්ටඩ් මිල්ක් බෝතලයක් ගෙන්විය හැකි මඟක් සොයමින් අනුලා තම හිසට වධ දෙන්ට වූවා ය. නන්ද බත් ටිකක් කෑමට යෝජනා කළ නමුත් මාතර හාමිනේ ඊට විරුද්ධ වූවා ය.

''නන්ද හිතුවක්කාර කම් කරන්න හිතන්න එපා. උණ පොඩ්ඩක් වත් තියෙද්දී බත් දෙන්න එපා යයි වෙද මහත්තයා කීප වරක් කිව්වා; තව හතර පස් දවසක් ඉවසා ගෙන ඉඳින්''යි මාතර හාමිනේ කීවා ය.

''මොන වෙදෙක් ද අනූ මෙයා''යි තම මව ඉවත්ව ගිය පසු නන්ද කීවා ය. ''එයාගේ වෙදකම ලෙඩා හාමත් කරලාම ලෙඩ හොඳ කිරීම විතරයි. ඔය වෙදකම කාට ද බැරි කරන්න? මට කැඳ බොන්න බැහැ; අනූ බත් ටිකක් උයා දෙන්න, අනූ තිසාට එන්න කියා ලියුමක් දාන්න.''

''තිසාට ලියුමක් දැම්මා ඊයේ; නාවාට කමක් නැත, සල්ලි ටිකක් එවන්නය කියා; දෙතුන් දවසකින් සල්ලි ටිකක් ලැබේවි.''

''අනේ මොකට ද අනූ තිසාට කරදර කරන්නේ? එයාගෙන් දැන් කී වතාවක් සල්ලි ගෙන්නා ගත්තා ද? අවුරුද්දට ගෙදර ඔක්කොටම රෙදි අරගෙන එන්න එයාට හුඟක් වියදම් යන්න ඇති එයාට හම්බ වෙන්නේ සුළු පඩියක්.''

Scanned by CamScanner

"තිසාට පස්සෙ දෙනවා – ඒ සල්ලි."

"කොහොමද අනූ අපි ගෙවන්නේ?"

"කොහොම හරි ගෙවනවා. නන්ද ඕවා ගැන හිතන්නේ නැතිව ඉන්න."

හවස පියල්ගෙන් මෝල්ටඩ් මිල්ක් බෝතල දෙකක් ලැබීම අනුලාගේ සිතට සැනසිල්ලක් වී ය. නන්ද ලෙඩ වූ ද සිට සතියකට වරක් ගමට ආ පියල් මෙදින මෝල්ටඩ් මිල්ක් බෝතල් දෙකක් එවූයේ තමන්ගේ අග-හිඟ දැන ගෙනයයි අනුලා සිහිනෙනුදු නොසිතුවා ය. අග-හිඟ සඟවාගෙන අගහිඟ නැත්තවුන්ගේ වේශය ලොවට පෑමට මහගෙදර ගැහැනු හුරුබුහුටියෝ ය. දැන් තමන්ගේ දිළිඳුකම වසාගැනීමට ඔවුන් ඇතැම් විට වහල් කොට ගන්නා උපායක්, පිරිමින්ගේ කූට බුද්ධිය පවා ඉක්ම වන්නකි. බලදසගේ සහෝදරියගේ රන් ආබරණ ගෙන්වා ගෙන, ඒ අබරණ සාද අත හෙට්ටි කඩයට යවා තමාගේ රන් අබරණ දවසකට ගෙන්වා පැළඳ ගෙන අනුලා ලොකු උත්සවයකට ගියේ වරක් පමණක් නොවේ. පසු ද ඒ අබරණ හෙට්ටිකඩයට යවා බලදසගේ සහෝදරියගේ අබරණ ආපසු ගෙන්වා ගනියි. නන්ද දැන් බෙල්ලෙහි පළඳින්නේ රත්රන් ගාවන ලද රිදී ඇටපටකි. එහෙත් මහගෙදර ගෑනුන් ළංව ආශ්‍රය කරන අතික් ගැහැනියක් පවා නන්ද පළඳින්නේ රත්රන් ගාන ලද රිදී ඇට පටකියි සිහිනෙනුදු නොසිතයි.

නගරයෙහි දිළිඳු ගැහැනියක තඹා මැද පන්තියේ ගැහැනියක පවා නියම බෙර්ලියන්තු මාලයක් පැළැන්දත් එය දෙබරාදු මාලය-කියි කවුරුත් සැක කරති. එහෙත් ඉහල පවුලක ගැහැනියක දෙබරාදු බෙර්ලියන්තු මාලයක් පැළැන්දත් ඔවුහු එය නියම බෙර්ලි-යන්තු මාලයක් ලෙස ගනිති. මෙවැනි රැවටිලිවලට මුවහ වී තමන්ගේ ධනවත් කම්, ලොකුකම් රැකගන්නෝ නගරවල හිඟ නොවෙති. මහගෙදර ගැහැනුන් දැන් දිළිඳු වුව ද පෙර තමන් සතුව පැවැති ලොකුකම් රැකගැනීමට එවැනි රැවටිලි වහල් කොට ගැනීම පුදුමයක් ද?

අනුලා රෑ හතට පමණ මෝල්ටඩ් මිල්ක් කෝප්පයක් උයාගෙන ගොස් නන්ද අතට දුන්නා ය. තවමත් දුම් නඟන ඒ කිරි වතුර කෝප්පය අතට ගත් නන්ද, "මෝල්ටඩ් මිල්ක් කොයින් ද?" යි ඇසුවා ය.

"නංගි බොන්න; කොහෙන් උණාම මොකා ද?" යි පවසමින් අනුලා කට කොනට හිනාවක් නැඟුවා ය.

"කොයින් ද අනූ?"

"කොහෙන් උණාම මොකද? නංගි බොන්න."

Scanned by CamScanner

''මම බොන්නම්; කියන්න, කොයින් ද කියා''යි තෙපළ නන්ද කිරි වතුර උගුරක් බීවා ය.

''පියල් එවා තිළුණා බෝතල දෙකක්.''

නන්දගේ හිතට නැඟුණු කෝපයත් ලජ්ජාවත් නිසා මුහුණ සැණකින් අඳුරු වී ය. මෝල්ටඩ් මිල්ක් කෝප්පය, බිත්තිය පළිත් පළ ද නෙමන බින්දු වගුරුවමින් ගොස් බිත්ති මුල්ලෙහි වැටී කුඩු වී ය.

අනුලාගේ හිසට ද නැංගේ තද කෝපයකි.

''ඔක්කොම කරන්නේ බොරු! පියල් ගැන හිත හිතා ඉඳලමයි ලෙඩ උණේ. දැනුත් හිතන්නේ පියල් ගැනමයි. බොරුවට පෙන්නන්න හදනවා පියල්ට අකමැති බව; පියල් එක්ක තරහ බව!'

අනුලාගේ කටින් මේ දරුණු වදන් එක පිට එක විදෙන ගී වැස්සක් සේ විදුණේ ඇගේ සිතට දැඩි කෝපයක් පමණක් නොව, ඊර්ෂ්‍යාවක්ද නැඟුණු හෙයිනි. විවාහ නොවන්ට තීරණය කර ගන්නා ලද නමුත් අනුලාගේ හද තුළ ද පියල් පිළිබඳ හැඟීමක් මැතදී මතු වී ය. දැඩි ආත්ම ගර්වය ද කුල ගර්වය ද සහෝදර කැක්කුම ද ඇති අනුලා, යකඩ සපත්තු ලාගත්තකු සරුපයකු පාගා මිරිකන්නාක් මෙන්, පියල් පිළිබඳ හැඟිමත් ඒ නිසා හටගත් ඊර්ෂ්‍යාවත් මිරිකා මැඩ ගත්තා ය. යකඩ සපත්තුවෙන් පාගනු ලැබීමෙන් මරු තුවාල ලත් සර්පයකු සේ අනුලාගේ ඒ හැඟීම් යළිත් නොනැඟෙන සේ පණ අදින්නට වී ය. නන්ද කිරි වතුර කෝප්පය වීසි කිරීම නිසා පණ අදින ඒ හැඟිම් යළිත් පණ ලැබී ය. ඇ වහා කිපුණේ එහෙයිනි.

නන්දට හැඩුණේ දිය පිරුණු රබර් බෝලයක් හදිසියේ පිපිරුණාක් මෙනි. තමා හඬනු කාමරයෙන් පිට සිටින්නන්ට ඇසෙතියි බිය ගත් නන්ද වහාම තම මුහුණ කොට්ටයෙහි ඔබාගත්තා ය. කොට්ටයෙහි මුහුණ ඔබාගත් නන්දගේ කටින් පිටවන්නේ සුසුමක් වැනි හඬක් පමණි. එහෙත් ඇගේ හද තුළ හටගත් කම්පනය හා දෙදරුම කොතෙක්දැයි ඇගේ උඩු කය සැලෙන සැටියෙන් අනුලාට වැටහිණ. කෝපය සන්සිඳීමෙන් හටගත් බිය ඇතිව වට–පිට බැලූ අනුලාගේ සිතට නැංගේ දයානුකම්පාවකි.

''නංගි, නංගි! අඬන්න එපා''යි කියමින් අනුලා නන්දගේ සයනයෙහි වාඩි වූවා ය.

''නංගි තරහ වෙන්න එපා''යි කියමින් ඇ නන්දගේ හිස අත ගෑවා ය.

නන්ද හිස ඔසවා බැලුවා ය. ඇගේ කඳුළු ගැලෙන දෙනෙත දුටු අනුලාගේ දෙනෙතින් වැහි බින්දු තරම් ලොකු කඳුළු බිඳු දෙකක් කඩා වැටිණ.

Scanned by CamScanner

"නන්ද අඬන්න එපා."

"අනූ, මම මෙතෙක් කල් හිට විඳින දුකත් වේදනාවත් අනූ දන්නේ නැහැ. දන්නවා නම් අනූ මට ඔහොම කියන්නේ නැහැ."

"නංගී, මම කිව වචන හිතට ගන්න එපා. තරහ ගිය නිසා මට කියවුණා."

"මම දන්නවා, අනූ මම විඳින දුක නොදන්නා වග. මට කියන්න විදියක් තිබුණේ නැහැ. මම කියන්නේ කොහොම ද?"

"හිතේ තියෙන එකක් කියන්න නංගී. මම දන්නේ නැහැ. හිතේ තියාගෙන හිටියාම අපි දැනගන්නේ කොහොම ද?"

"අනූ—මැතක සිට මගේ හිතේ පියල්ට ඇල්මක් ඇති උණ එක ඇත්ත. මම ඒකට ඉඩ දෙන්නේ කොහොමද? ජිනදාස එක්ක මම කසාද බැඳලා ඉන්නේ. ඒ නිසා පියල් පිළිබඳ හැඟීම යටපත් කරගැනීමට මම මෙතෙක් දවස් කෙරේ යමයුද්දයක්. ඒත් ඒ මිනිහා මෙහාට එනවා; මම එක්කත් කතාවට එනවා; මට හොඳටම සලකනවා; අම්මත් අනූත් ඒ මිනිහට නිතර මෙහාට එන්න අනුබල දෙනවා. මම කතාවට ගෙන්නාගන්න සමහර විට අනූත් ඒ මිනිහට අනුබල දෙනවා."

"අපි දන්නේ නැහැ නංගී, දන්නවා නම් එයා එක්ක කතාවට යන්නේ නැහැ. දැන් නම් පියල් ගැන අම්මා අකැමැති වෙන එකක් නැහැ."

"අනූට තේරෙන්නේ නැද්ද? අම්මා කැමැති උණත් මට පියල් එක්ක කසාද බඳින්න ඇහැක. එයා එක්ක කතාවට යාමෙන් වෙන්නේ අපේ නම්බුව නැති වෙන එක. එයාගේ කැමැත්ත තියෙන්නේ වෙන එකක් ගැන."

"වෙන එකක්?"

"ඔව් අනූ"

"ඒ මොකක්ද?" යි අනුලා ඇසුවේ මහත් වූ කුහුලකිනි.

"රුපියල් විසිපන් දහක දේපල ලියා දෙනවාය කියා එයාගේ ගෙදර ඇවිත් නවතින්න යයි පියල් මට යෝජනා කරා. ඒ යෝජනාව කෙරේ පරගොඩ ගොහින් ඇවිත් හතර පස් දවසකට පස්සේ."

"හ්ම්! එහෙම ද? ඌට බැණලා එලෙව්වේ නැත්තේ ඇයි?"යි අනුලා ඇසුවේ හිසට නැඟුණු කුල ගර්වයත් බලවත් කෝපයෙන් දිලියෙන දෙනෙතත් ඇතිව ය.

"මම හොඳටම බැන්නා අනූ; මිනිහට හොඳටම ලජ්ජා හිතිලා බිම බලාගත්තා. මූණ රතු උණා."

"නංගී ඉන්න; මම එයාගේ රෙද්ද ලිහා වැටෙන්න දෙකක් කියන්නම්"යි තවමත් හිසට නැඟුණු කෝපය ඇති අනුලා, ළඟ නැති පියල්ට තර්ජනය කළා ය.

"එපා අනු; ඒ මිනිහා තරහ කරගන්නේ මොකට ද? මිනිහා එහෙම යෝජනා කෙරේ දෙවනු මම කසාද බැඳ ගන්නකල් බව කිව්වා. ජිනදස ඉන්නවා ද නැද්ද යි හරියට සොයාගන්නා තුරු කසාද බඳින්න බැරි නිසා."

"ඒ උණත් ඌට එහෙම යෝජනාවක් අපට කරන්න වටිනවා ය? ඌට සල්ලි තියෙන හින්ද ආඩම්බරේට වෙන්න ඇති ඔහොම යෝජනා කෙරේ."

"මම හිතන්නෙ නැහැ අනු එහෙම. පියල් ඒ යෝජනාව කෙරේ ඉවසුම් නැතිව."

"අම්මා දැන් නම් පියල්ට අකමැති වෙන එකක් නැහැ. මට ඇහැකි අම්මගෙන් අහන්න."

"එපා අනු; ජිනදස ඉන්දෙද්දී මම කොහොම ද තවත් එක්-කෙනෙක් එක්ක කසාද බඳින්නේ?"

"දික්කසාද වෙන්න නඩු දනවා නෙව. අම්ම කැමැති නම්".

"අපොයි අනු එහෙම කරන්න ඇහැක? මගේ මහත්තය මට කර වරද මොකක් ද?"

"නංගී අත් ඇරලා ගොහින් ඉන්න මිනිහෙකුට කරන්න පුළුවන් තවත් වරදකුත් තියෙනවද? දැන් අවුරුදු හයකින් විතර එයාගෙන් ලියුමක් ලැබුණේ නැහැ. එයා කොයි ලෝකේ ඉන්නවාද දන්-නෙත් නැහැ."

"එයා මෙහේ ඉන්දෙද්දී මට හොඳට සැලකුවා. ඉඩමකුත් උකස් තියා සල්ලි අරගෙන මගේ ලෙඩේට වියදම් කරා. මට අඳින්න පළඳින්න ඕනෑ දේ අරන් දුන්නා. බිබිලේදී උණ හැදුණු එක තමයි නුවරට ගියේ. එයාගේ අතේ තිඋණු සල්ලිත් නැති උණා. ලෙඩත් උණා. 'සල්ලි නැතිවට කමක් නැත, ගමට එන්න ය'යයි මම ඇරිය ලියුමට එයා උත්තර එවා තිඋණේ 'ආයිත් සල්ලි ටිකක් හම්බ කරගත්තොත් එනවා ය, නැති නම් එන්නේ නැත' කියා. උණ හැදිලා හොඳටම කෙට්ටු උණ නිසා එයා ගමට එන්න වැඩියත් අකැමැති වෙලා තියෙන්නේ"යි කියමින් නන්ද තම දෙනෙතට කඳුළු නැඟුවා ය.

"එයාගේ සැලකිල්ල මම දන්නවා නන්ද. එයා මෙහේ සිටිද්දී ගෙදරට මොන වියදමක් කරා ද? අපි තමයි අමාරුවෙන් ගෙදරට වියදම් කෙරේ. එයා ඉඩම උගස් තියා ගත් සල්ලි හංගගෙන උන්නා."

Scanned by CamScanner

අනුලා මෙසේ කියන්නේ නොදන්නාකම ද තරහ ද නිසා බව නන්ද දනියි.

“මහත්තයාත් හුඟක් වියදම් කරා; මම හොඳින් දන්නවා. හංගාගෙන හිටියේ පස්සේ උගස් තිබ ඉඩමට ලැබුණු සල්ලි විතරයි. වෙළඳාමක් කරන්න හිතාගෙන උන් නිසා මමයි කිව්වේ ඒ සල්ලි වියදම් කරන්න එපයි කියා.”

“එයා දන්නා වෙළඳාමක් නැහැ”යි අනුලා කීවේ තරහයෙනි.

“ඒකට මොකද අනු ලෝකයා කියන්නේ එයා අපේ ඉස්ටයිල් එකට වියදම් කරලා නැති උණා ය කියා. අපි එයාට කියා බොහොම වියදම් කෙරෙව්වා යයි එයාගේ අක්කා කියා තිඋණා.”

“ඒ කටහැකර ගැනි ඕනෑ එකක් කිව්වාම අපට මොකො ද? මම ඇත්ත කියනවා නන්ද; මම නම මුල හිටම ජිනදාසට වැඩි කැමැත්තක් නැහැ.”

“එහෙම කියන්න එපා අනු. මම එයා ගැන දන්නවා. එයා අපි කාටත් හිතයි; ආදරෙයි. එයාට තිඋණේ අපට වගේම සල්ලි අමාරුවයි. එයාට අගහිඟත් ඇති වෙලා උණත් හැදුණු නිසා මිසක් නැතිනම් කවදාවත් එයා අපි මතක නැති කරන්නේ නැහැ. අපට ඒ තරම් ආදරයක් හිතවත්කමක් තිඋණා එයාගේ හිතේ.”

“ආදරේ ඇති කෙනෙක් නම් බින්නැන්නට වෙලා ලියුමක්වත් නෝවා ඉන්නවා ය?”යි කියමින් අනුලා කනප්පුව උඩ වූ පිත්තල පහනෙහි වැටිය දබරඇඟිල්ලෙන් මදක් දික් කළා ය. දික් කොට තිය පිටින් ගැසීමෙන් ඇඟිල්ලෙහි රැඳුණු තෙල්, ගිනි දළුවට ඉස්සා ය. ගිනි දළුව පෙරට වඩා නැඟුණෙන් කාමරය වඩාත් එළිය වී ය.

වැහි වලාවෙන් තොර වූ අහසෙහි බැබළෙන තාරකා කවුළුවෙහි ගරාදි අතරින් පෙනෙයි. තරු එළියෙන් තුනී වුණු අඳුර අතරින් ලාවි ගස ද ගල්වැටින් ඔබ්බෙහි වූ ඉඩමෙහි පඳුරු ද ඒ පඳුරු අතරෙහි වූ පොල් පැළ ද අනුලාට පෙනෙන්නේ අඳුරු පඳුරු සේ ය. වත්තෙහි කුරුමිණි සතුන් නගන වීණා—හොරණෑ—කයිතාලම් හඬ, කාමරයෙහි උන් දෙදෙන රැයක් පාසා අසන්නාහ. ‘ඊ-ඊ-රූ’ යි හඬ නගමින් කවුළුවෙන් ඇතුළු වුණු ගොම කුරුමිණියෙක් ගිනිකන වැටීමෙන් පහනට ඇදී ගොස් එහි හැපී බිම වැටිණ. අනුලා කුරුමිනියා අවුලා පිත්තල පඩික්කමේ අඩිය යට දමා වසා අත සෝදාගත්තා ය. ගැමියන් ‘කොට යකා’ නමින් හඳුන්වන කුරුමිනියා කාමරයට ඇතුළුව පහනෙහි හැපී බිම වැටීම අනුලා සැලකුවේ අසුබ ලකුණක් ලෙසිනි. සුළං වැදීමෙන් පහන නිවෙතියි සිතූ නිසාදෝ කවුළුව වැසීමට ගිය අනුලා ගල් වැට අසල

Scanned by CamScanner

වූ කජු ගසින් නික්මෙන සොල්මනක් අසා බිය ගත්තා ය. එය කජු පුහුලන් කෑමට පැමිණි වවුලන්ගේ සොල්මන බව වැටහුණු පසුය ඇගේ බිය අතුරුදහන් වූයේ.

"උඹ මහ පව්කාරයෙක්"යි කියමින් මාතර හාමිනේ සාදට බණිනු අනුලාටද නන්දට ද ඇසිණ. මව සාදට එසේ බනින්නේ බිත්තියෙහි එල්ලුණු මදුරුවෙකු තලනු දුටු විට බව, අනුලා ද නන්ද ද දනිති. පහන් එළියෙන් එළිය වුණු බිත්තියට වැහුණු මදුරුවකු දුටහොත් අත්ලෙන් ගසා මරා ඇතිල්ලීම සාදගේ ඇබ්බැහි කමකි. මාතර හාමිනේ කොතෙක් බැන්නත් ගැහුවත් සාද ඒ ඇබ්බැහි කම නොහරියි. බිත්තියෙහි එල්ලුණු මදුරුවකු දුටු කෙණෙහි සාදගේ අත දිවෙන්නේ ගින්නට ළං වුණු අත ඉවතට ඇදෙන්නාක් සේ නිතැතිනි.

"පාන පත්තු වෙන කොට උඹ බිච්චිය අහලකට එන්න එපා. කාලකණ්ණියා, කොච්චර කිව්වත් උඹට ඔය පව්කාරකම නොකර ඉන්න බැහැ."

මාතර හාමිනේ සාදට කළ තරවටුව ඇසූ අනුලා සිනාසුණා ය.

"ඒ යෝදයා මදුරුවා තළා බිච්චිය කැත කරාම උදේට ලේ පැල්ලම් මකන්න වෙන්නේ මටයි!"

"සාදට මදුරුවො තළන්න පුරුදු උණු එක නෙව පුදුමෙ"යි නන්ද කීවා ය.

"මුලදි ඌ ඇගේ මදුරුවෙක් වැහුවොත් තළනවා; ඒකෙන් තමයි මදුරුවෙක් දුටු තැන තළන්න ඌට පුරුදු වෙළා තියෙන්නේ" යි කියමින් අනුලා කාමරයෙන් පිට වන අදහසින් යන්ට හැරුණා ය.

"අනු!"

"ඇයි නංගි?"යි තෙපලමින් අනුලා නන්දගේ ශයනය ළඟ වූ කුඩා පුටුවෙහි වාඩි ගත්තා ය.

"අනුට දැන් තේරුණා නෙවද? පියල් එච් මෝල්ටඩ් මිල්ක් මම නොබිව්වෙ මන්ද කියා? එයා කර යෝජනාව නිසා මම එයාට හොඳටම බැන්නා. දැන් එයාගේ මෝල්ටඩ් මිල්ක් බීම අපට මදිකමක්."

"ඔව් නන්ද, මට තේරෙනවා. නොබිව් එක හොඳ'යි අපි කිව්වත් නංගි බොන්න ඕනැ නැහැ. මම හිතාගෙන ඉන්නේ මෝල්ටඩ් මිල්ක් බෝතල දෙක ආපහු යවන්න."

එපා අනු; පියල්ට හොඳටම ලජ්ජා හිතේවි. අපි එක්ක හොඳටම තරහ වෙන්න ඇහැකි. අපි ඕනෑවට වැඩිය ආඩම්බරයයි කේන්ති වේවි. මොකට ද අපිට සලකන මිනිහෙක් නිකම් තරහ කරගන්නේ?"

"මම සාද එක්ක කතා කරලා එන්නම්"යි කියමින් අනුලා කාමරයෙන් පිට වූවා ය.

කාමරයෙන් පිට වී මිදුලට බැස්ස අනුලා කුස්සියේ ඉස්තෝප්පුවේ කණුවට හාන්සි වී සිටි සාද දුටුවා ය.

"අම්මාගෙන් බැණුම් ඇහුවේ මදුරුවො තළලා නොවෙද?"

සාද සිනාසුණු නමුත් උත්තර නුදුන්නේ ය.

"පුංචි නෝනාට තාමත් සනීප නැහැ නොව. තව මෝල්ටඩ මිල්ක් බෝතලයක් ගේන්න ඕනෑ."

"කෝ සල්ලි දෙන්න. මං ගිහින් ගේන්නං"

"සල්ලි නැති එක තමයි උඹට කියන්න ආවේ."

"මට කිව්වට මොනව කරන්න ද?"

"උඹේ ළඟ තියෙන සල්ලිවලින් වත් බෝතලයක් අරන් වරෙන්කො."

"මම ළඟ ඇති සල්ලියක් නැහැ"යි සාද තරහයෙන් කී ය.

"එහෙම කිව්වම කොහොම ද? බලාලා තියෙන තරමක්වත් ගනින්. අද පුංචි නෝනට කොහොම හරි මෝල්ටඩ මිල්ක් දෙන්න ඕනෑ. උඹේ සල්ලි ආපහු දෙනවා."

"මම සල්ලි ගස්වලින් කඩනවාය කියලා හිතාගෙන ද ඉන්නේ? මට සල්ලි හම්බවෙන්නෙ කොහෙන් ද?"

"සල්ලි ගස්වලින් නොකඩන බව අපි දන්නවා. උඹ අපේ රේන්දුවලින් ලාබ ගන්නා සල්ලිවලට මොනවා කරනවා ද?"

"මම ගන්න ලාබයක් නැහැ"යි සාද සැර කෙළේ ය.

"රේන්දු විකුණා ගන්නා සල්ලි මම එහෙමම ලොකු නෝනට ගෙනැත් දෙනවා. මම සතයක් ලාබ ගන්නේ නැහැ."

"අපි දන්නවා ඒ හරිය! ලාබ ගන්නට කමක් නැහැ ණයට අපටත් දීපං. සිලිං පහක් මෝල්ටඩ මිල්ක් බෝතලයක් ගෙන්වන්න."

"මේ ආයිත් කියනවා; මම ළඟ දෙයිතුට්ටුවක්වත් නැහැ"

"ළඟ නැති නම් කාගෙන්වත් ණයටවත් ඉල්ලා ගනින්."

"කොහෙන් ද?"

"අපි දන්නේ කොහොම ද?"

"ඇනැක් උරණෙත් බෝතලයක් අරගෙන එන්නං"යි කියමින් සාද මිදුලට බැස ගමන් කෙළේ ය.

සාද තමා විසින් සඟවා ගන්නා ලද මුදල් ගෙවා මෝල්ටඩ මිල්ක් බෝතලයක් ගෙනැවිත් දී 'ණයට ගෙනා වෙමි' යි කියමින් දිවුරන බව අනුලා නිසැකව දනියි. අනුලා සාද ලවා යම් කිසිවක් ගෙන්වා ගත් පළමු වන වාරය මෙය නොවේ.

# 14 වන පරිච්ඡේදය

**මාස** එකහමාරක් ගත වුණු නමුත් නන්දගේ සුළු උණ නොබැස්සේය. කළහැකි තවත් වෙදකමක් නැති හෙයින් වෙද ද නන්දගේ සුළු උණ නොබසින්නේ ඇගේ සිත කය දුබලවීම නිසායයි අනුමාන කෙළේ ය. 'දවාලට පමණක් පුංචි නෝනට මිරිස් හොදින් සමග බත් දෙන්න'යයි ඔහු නියම කෙළේ එහෙයිනි. අනුලා මිරිස් හොදි වෙනුවට එළවළු දෙකකුත් සමග නන්දට බත් දුන්නා ය. අනුලා වෙදගේ නියමය ඉක්මවා රැට ද නන්දට බත් දුන්නා ය. තමාට සුපුරුදු ආහාර ලැබීම නිසා නන්දගේ සිතටත් කයටත් අමුතු පණක් ලැබිණ. යම්තම් උණ ගැනෙන නමුදු නන්ද ගෙතුළට වී නොඉඳ මිදුලට බැස දහවල් කාලය ගෙවයි. කසාය බීම නිසා නොව පුරුදු ආහාර ගැනීමත් ඉර අව්ව හා පිරිසිදු වාතය ලැබීමත් නිසා සතියකට පසු නන්ද උණෙන් සම්පූර්ණයෙන් නිදහස් වූවා ය.

තම අසනීපය සුව වී තුන් මසකට පමණ පසු දවසක කරෝලිස්ගෙන් ලැබුණු ලියුමක් නිසා නන්ද තම කාමරයට වී ඇඳෙහි වැටී හඬන්නට වූවා ය. කඳුළු රැඳුණු දෙනෙත් ඇති අනුලා ද කාමරයෙහි කවුළුව අසලට වී පිටත බලාගත් වනම උන්නා ය.

ඇඳිරි වැටෙන්නට ළං වූ අවස්ථාවෙහි මහගෙදර වත්තෙහි ගස්කොළන් අනුලාට පෙනුණේ දිරාපත් වීමෙන් මැළවුණු විලාසයකිනි. කොළ හැළුණු ලාවි ගසෙහි එක ම ගෙඩියකුදු නොවී ය. පොල්ගස්වල පල හිඟ වූයේ කණාටු වීම නිසා නොව තමන්ගේ බහින කලාව නිසා ය යනු අනුලාගේ හැඟීම ය. තද කොළ පැහැ කොළයෙන් හෙවුණු දූවැන්ත අඹගස ඈත අතීතයෙහි පටන් මහ ගෙදර දෙස බලා සිටින පිණිස ගසක වේෂය ගත්, කයිසාරු වත්තේ කුලයෙහි ආදි පුරුෂයකු වැන්න. මහ ගෙදර වත්තෙහි එක් මුල්ලක් වසාගත් වනයක් වැනි ඒ අඹ ගසෙහි අතු–ඉති හා දිම් ගොටු පිළල යන ආදිය කැපීමෙන් එළි–පහළි නොකරන්නේ ඒ ගසට අරක් ගත් දේවතාවකු ඇතැයි මාතර හාමිනේ අදහන බැවිනි. වත්ත ද පෙදෙස ද වසාගත් පාලුවක් දුටු අනුලා අහසෙහි ද ඇතැයි දුටුවේ තම ශෝකාකූල හැඟීමට තුඩු දෙන සලකුණු ය.

''ක්–කුවෝ-ක්–කුවෝ''යි නියන් කොබෙයියකු නහන හඬ ද උගේ හඬ අනුකරණයට වෑයම් කරන ගැමි කොලුවන් නහන හඬ ද අනුලාට ඇසෙයි. කපුටු හඬ නිතර ඇසෙන්නක් වුව ද මේ වේලාවේ කපුටුවකු ඉඳ-හිට නැඟූ හඬ පවා අනුලාට ඇසුණේ අනාගත විපත් සිහි කරවන දෛවඥයකුගේ දෙඩවිල්ලක් ලෙසිනි. කවුළුවෙන් පිටත බලා සිට, හැරී ඉකි බිඳිමින් නන්ද දෙස



Scanned by CamScanner

බැලූ අනුලා කාමරය තුළ ද දුටුවේ පාලුවකි. නූගත් ගැමියකු තුළ වුවද ලෝකයෙහි විශාලත්වය හා තමාගේ අල්ප භාවය ද පිළිබඳ හැඟීමක් පහළ වන්නේ මෙවැනි අවස්ථාවල දී ය.

මාතර හාමිනේ කඳුළු පිරුණු දෙනෙත් ඇතිව කාමරයට පැමිණ නන්දා සැනසුවා ය.

"අඬන්න එපා නන්ද; අඬාලා මොනවා කරන්නද? එයාගේ කරුමෙට අපි මොනවා කරන්නද?"

ජිනදාස බදුල්ලේ ඉස්පිරිතාලයෙහි මීට තුන් මසකට පමණ උඩදී මියගිය බව කරෝලිස් විසින් එවන ලද ලියුමක සඳහන් වී ය. නන්ද අඬන්ට වූයේ ඒ පුවත ඇසීමෙනි. ජිනදාස මියගිය බව කරෝලිස් දැනගත්තේ තුන් මසකට පසු ය. ඔහු ඒ වග මාතර හාමිනේට ලියා එවූයේ බදුල්ලට ගොස් ඉස්පිරිතාලයේ ලිපි කරුවකුට අත්ලසක් දී තොරතුරු දැනගැනීමෙනි. උණ ගෙඩියක් සහිත අමාරු ලෙඩෙක් ඇකිරියන් කුඹුරේ සිට ඉතා අමාරුවෙන් බදුල්ලේ ඉස්පිරිතාලයට පැමිණියේ ය. එහි ඇතුළු වී දෙසතියකින් ඔහු මිය ගියේ ය. ඔහුගේ නම ජිනදාස බවත් ගම අහංගම බවත් කරෝලිස් දැනගත්තේ ඉස්පිරිතාලයෙහි ලිපිකරුවාගෙනි. නන්දගේ සැමියා වන ජිනදාසගේ ගම අහංගම නොව පියදිගම ය. පියදිගම, කවරකුට වුව ද එවෙන ලියුම්වල පිට නම් ලියවෙන්නේ 'පියදිගම අහංගම', කියා ය. එහෙයින් ජිනදාසගේ ගම අහංගමයයි ඉස්පිරිතාලයෙහි පොතෙහි ලියවෙන්නට ඇත්තේ මේ කරුණ නිසා යයි අනුමාන නොකිරීමට තරම් කරෝලිස් මෝඩයෙක් නොවී ය.

"මට හිතට අමාරු එයා ඉස්පිරිතාලේ මැරුණ එක ගැනයි. එයා දුක් වින්දේ මම නිසා. සනීප නැත් නම් වෙළඳාම හැරදමා ගමට එන්නයයි මම එයා බිබිලේ ඉන්දෙද්දී ලියා ඇරියා; ඒක සලකා ගමට ආවා නම් මේ මොකුත් වෙන්නේ නැහැ"යි නන්ද කඳුළු සලමින් කීවා ය. "අනේ අම්මා, එයා දුක් විඳලා මැරුණ එක මට උහුලන්න බැහැ. මතක් වෙන කොට මට ඉවසන්න බැහැ. මට එයාට සලකන්න ලැබුණේ නැහැ; එයාට එක බෙහෙත් හැන්දක් පොවන්න බැරි උණා."

"එයාගේ කරුමෙට උණ වැඩක්. ගමට එන්න නිහිතුණේ ඒක හින්ද. එයා ඉස්පිරිතාලේ මැරෙන්න ගියේ අපේ නොසැලකිල්ලෙන් නොවි නෙව. ඉතින් අපි මොනවා කරන්නද? අපේ එක්කෙනෙක් කවදවත් ඔහොම ඉස්පිරිතාලෙක මැරුණේ නැහැ. ගමට ආවා නම් කොච්චර හිඟ පාඩු තිඋණත් අපි එයා වෙනුවෙන් කරන්න තියෙන හැම එකක් ම කරනවා"යි මාතර හාමිනේ කීවා ය.

"ජිනදාසගේ මරණය කනගාටු දයක එකක් තමයි. එයාට ඔහොම ඉස්පිරිතාලේ මැරෙන්න අපෙන් වැරැද්දක් වෙලා නැහැ.

Scanned by CamScanner

නමුත් එයා නිසා අපි වින්දේ අවනම්බුමයි. එයා කොයිබක වත් ඉස්පිරිතාලෙකට ගොහින් මැරුණොත් අපට අවනම්බු කරන්න මයි''යි අනුලා කීවා ය.

''අනු එහෙම කියන්න එපා. මාගේ හිතට වේදනායි. එයාගේ අතේ තිළුණ සල්ලිත් නැති උණා; ලෙඩෙක් උණා. ඒ ඔක්කොම උණේ මම හින්ද; එයා රක්සාවට ගියේ මම හින්ද.''

''දැන් ඉතින් ඕවා ගැන කතා කරන්න ඕනෑ නැහැ''යි මාතර හාමිනේ කීවා ය.

ජිනදාසගේ මරණය අසා සතියකට පසු තිස්ස ගමට පැමිණියේ ය. රක්සාව පිණිස කොළඹ ගොස් හතර අවුරුද්දකට වැඩි කාලයක් ඉකුත් වූ නමුත් තිස්ස මීට පෙර ගමට පැමිණියේ දෙවරකි. උදේ පටන් හවස් වන තුරු සාප්පුවෙහි වැඩ කරන තිස්ස හා ඔහුගේ යහළුවන් ද, නිවාඩු ලබන්නේ සතියකට වරක් ඉරිද පමණි. දෙළොස් මසකට වරක් සිංහල අවුරුද්ද නිමිත්තෙන් ඔවුහු දෙදවසක් හෝ තෙදවසක් හෝ නිවාඩු ලබති. තිස්ස කලාතුරකින් ගමට පැමිණෙන්නේ මේ හෙයිනි.

ජිනදාසගේ මරණය නිමිති කොට භික්ෂූන් අට නමක් ගෙදරට වැඩමවා මාතර හාමිනේ සාංඝික දානයක් දුන්නා ය. සාංඝික දානයට වියදම් කෙළේ තිස්ස ය; ඔහු ගමට පැමිණියේ ද ඒ සඳහා ය. දානය උදෙසා නන්දගේ බාප්පාගේ පවුලේ ගෑනු ද බලදාස හා ඔහුගේ නඟා ද ජිනදාසගේ සහෝදරිය ද පැමිණියෝ ය.

ගමේ කොතරම් දිළිඳු පවුලක වුව ද මිනිසුන් සාංඝික දානයක් දෙන්නේ සුළු මඟුලකට කරන වියදමකිනි. සාංඝික දානය සඳහා නෑයන් ද අසල ගෙදරවල ගැහැනුන් ද කැඳවීම ගමේ ලොකු කුඩා කා අතරත් පවතින සිරිත ය.

මඟුල් කෑමක් උදෙසා උයන තරම් එළවළු හා මස් මාළු වර්ගද දානය උදෙසා උයනු ලැබේ. කිරි පැණි ද සපයාගත හැකි තාක් පලතුරු වර්ගද ඊට වුවමනා ය. පෙරාගත් වතුරෙන් දානය උයන පිණිස හැම ගැහැනුන්ම ඉතා ආසාවෙන් උදව් කරන්නේ එයින් ලැබෙන පින් සලකාගෙන ය. ගමේ ගෙදරක සාංඝික දානය ඉවෙන බව සමහරුන් ඉව ඇල්ලීමෙන් මෙන් දැනගන්නේ සාංඝික දානය උදෙසා උයනු ලබන මාළු-පිනි ආදියෙන් නඟින සුවඳ ඇසීමෙනි. සාංඝික දානය උදෙසා උයනු ලබන මස්-මාළු ව්‍යංජන යන ආදියෙන් නඟින සුවඳ වැනි සුවඳක් මඟුලක් උදෙසා මස්–මාළු හා ව්‍යංජන ද උයනු ලබන විට පවා නොනඟියි. ගෑනුන් තමන්ගේ ඉවුම් පිහුම් පිළිබඳ දැනුම ද අත්දැකීම ද යොදා මහත් වූ සැලකිල්ලෙන් කෑම උයන්නේ සාංඝික දානය උදෙසා ය. මේ දන්නා ගැමියකු, තම බිරිඳට මෙසේ සරදම් කරන ලදැයි කියනු ඇතැම් විට

අසන්ට ලැබේ. 'මගේ ගෑනි මට උයන කෑම කටට රස ඇතුව උයන්නේ එහෙමත් දවසකයි. හාමුදුරුවන්ට කෑම උයන කොට නම් හැකැක්මක් ඇත යන කෙනෙකුට උණත් පුස්ඹ ගහන තරම් හොඳින් උයනවා. මට කරන්න තියෙන්නේ මේ ගෑනි පන්සලේ ඉන්දවන එකයි!'

ජනප්‍රවාදයක් සේ ගමේ පැතුරුණු මේ නර්මාලාපය ගැමියකු විසින් කියන ලද්දක් නොව භික්ෂූන් නිසා හටගත් ඊෂ්‍යාව ඇති යම් කිසි නරුමයකු විසින් ගොතන ලද්දක් විය යුතු ය.

පෙරන ලද වතුර පිරුණු කොරහ ළඟ ඇන තියාගත් ගැමියෙක්, දනයට වැඩමවන ලද භික්ෂූන්ගේ පා සේදුවේ ය. සාලය දෙරටු-වෙහි එළිපත ළඟ වාඩි වුණු සෝමදස තුවායකින් ඔවුන්ගේ පා පිසදමා තෙත-මාත්තු කෙළේ ය.

සෝද තෙතමාත්තු කරන ලද පාද ඇති භික්ෂූහු, සාලයට ඇතුළුව බිම වැතිරගත් මහලු ස්ත්‍රීන්ගේ ද දරුවන්ගේ ද වැඳුම් 'සුපත් නිවන් සම්පත්'යි කියමින් පිළිගෙන අසුන්වල හිඳ ගත්හ. බිත්තියට ළං කොට එලන ලද පැදුරු මතුයෙහි වූ ඇතිරිලි උඩ කොට්ට තැබ්-මෙනි ගැමියන් භික්ෂූන්ට ආසන පනවන්නේ. භික්ෂුවකගේ පිට පිළිගැනීම පිණිස ගැමියන් බිත්තියෙහි පහළ කොටස වසා තිර ඇද තවත් කොට්ටය බැගින් තබන්නේ ඔවුන්ගේ සිවුරුවල හුනු තැවරෙනු වළක්වන අදහසින් පමණක් නොව, වැඩි සුව පහසුකම් සලසනු ද සඳහා ය. උන් වහන්සේට මෙලොව සුව පහසුකම් සපයන සැටියටම තමන් ද පරලොව සුව පහසුකම් ලබන බව ගැමියෝ දනිති.

නායක භික්ෂූන්වහන්සේ මාතර හාමිනේ ලවා පාලි පාඨ කියවී-මෙන් දනය සාංඝික කොට ඒ දනයෙහි අනුසස් වර්ණනා කෙළේ ය. උන්වහන්සේ ජිනදස මතක් කළ විට නන්දගේ දෙනෙතට කඳුළු ඉනුවේය.

මාලු-පිනි සහිත බත වැළඳීමෙන් පසු භික්ෂූහු කිරි පැණි වැළඳූහ. තේ හෝ කෝපි හෝ බී දැහැත් වැළඳීමෙන් පසු බණ දෙසීමෙහි සමත් එක භික්ෂුවකු හැර අන්‍යයෝ නැඟී, බිම වැටී වඳින ගැහැනුන්-ගේත් ළමයින්ගේත් වැඳුම් ලබමින් පිට වී ගියෝ ය. නැවතුණ භික්ෂුව පැ බාගයක් පමණ දහම් දෙසා ලොකු තුවායක් දහම් පඬුරු වශයෙන් ලබාගෙන නික්ම ගියේ ය. දුම්රියෙන් තිස්ස කොළඹ බලා ගියේ එදිනම සවස ය.

තිස්ස දූන් රූපයෙන් ද ගතිගුණයෙන් ද හොඳ බව දුටු මාතර හාමිනේ පමණක් නොව, අනුලා ද නන්ද ද සන්තෝෂ වූහ. කොළඹ ගිය පසු තිස්ස පොත පත කියවීමෙහි ආශා ඇත්තකු වීම විශේෂයෙන් මාතර හාමිනේගේ ප්‍රීතියට හේතුවකි. එහෙත්

Scanned by CamScanner

පොත-පත කියවීම නිසා තිස්ස වඩාත් වෙනස්වුණු අදහස් ඇත්තකු වූ බව දන්නවා නම් ඇ ශෝක වනු නිසැක ය. ගමේදී ද වැඩි ආගම භක්තිය ඇත්තෙක් නොවූ තිස්ස දැන් වඩාත් පිරිහුණු ආගම භක්තිය ඇත්තෙකි. කොළඹ දී ඔහු පොත-පත කියවීමට පුරුදුවූයේ යහළු-වන්ගේ ආශ්‍රය නැතිවුණු බැවිනි. ගමේදී යහළුවන්ගෙන් ලැබූ සැනසිමත් ප්‍රීතියත් ඔහු කොළඹදී ලැබුවේ පොත පත කියවීමෙනි. පොත-පතට යහළුවන්ගේ තැන දීම නිසා තිස්ස බුද්ධියෙන් දියුණු වී ය; ව්‍යායාමයට හා කෙළිසෙල්ලමට තුබුණු ආශාවෙන් පිරිහිණ.

ගමේදී ද පොත-පත කියවීමෙහි ආශාවක් තිස්සගේ සිතෙහි වී ය තම යහළුවන් සමග ඇවිදීම හා කෙළි සෙල්ලම ද වැඩි ප්‍රීතියක් වූයෙන්, ඔහු පොත-පත කියවීමෙහි ආශාව මැඩගත්තේ ය. එහෙයින් ගමේදී ඔහු පොත-පත කියවූයේ කලාතුරකිනි. කොළඹ ගොස් ටික කලකට පසු, තිස්සගේ පොත-පත කියවීමේ ආශාව අළු ඉවත් වුණු කල ඇවිලෙන ගිනි අඟුරක් සේ මතු වී ය. මුලදී ඔහු ඉංගිරිසි පොත් කියවූ නමුත් නොතාරිස් විභාගය ගැනීමේ ආශාව නිසා පසුව සිංහල පොත් උගැන්මට පටන් ගත්තේ ය. බොරැල්ලේ ආවාසයක විසූ භික්ෂුවක් වෙතින් සිදත් සහරාව උගත් ඔහු අනතුරුව කාව්‍යශේඛරය ද සැළලිහිණි අස්න ද උගත්තේ ය. ඔහු ගණිතය උගැන්මට වෑයම් කෙළේ, නොතාරිස් විභාගය ගන්න වුන් උදෙසා සම්පාදනය කරනු ලබන ගණිත ප්‍රශ්න පත්‍රය ඉතා දුෂ්කර එකක් බැවිනි. පොත-පත උගැන්මට ඇති වැඩි ආශාව නිසා තිස්ස, ගණිතය උගැන්මට වෑයම් කෙළේ වැඩි කැමැත්තකින් නොවේ; ගණන් උගැන්ම අතපසු කළ නිසා තිස්ස නොතාරිස් විභාගය නොගත්තේ ය. වැඩි ආශාවකින් ගණන් උගත හැකි නොවීම නිසාම නොතාරිස් විභාගය ගැනීමේ ආශාව ද ටිකින් ටික තිස්සගේ සිතින් ඉවත් වී ය. එහෙත් ඔහු ඉංගිරිසි සිංහල පොත් පත් වඩාත් දැඩි ආශාවෙන් උගත්තේ ය.

ඔහු නොතාරිස් විභාගය සඳහා සිංහල උගැන්මට පටන්ගත්තේ ඉතා අමාරුවෙනි. වැඩක් නැතත්, උදේ සිට රෑ හත අට වන තුරු සාප්පුවෙහි සේවය සඳහා ලේවී සිටිය යුතු තිස්ස පොත-පත කියවීමට නිවාඩුවක් ලබන්නේ රෑ කෑමෙන් පසු ය. උගැන්මේ ආශාවෙන් මඩනා ලද ඔහු අධෛර්යයට ඉඩ නොදී සිදත් සහරාව උගැන්මට පටන් ගත්තේ ය. රෑ කෑමෙන් පසු පාඩම් කෙළේ, නිදිමත එනු වැළැක්වීමට දෙඇස තෙමමිනි; යළිත් ඔහු උදේ හතරට හෝ පහට හෝ අවදිව පාඩම් කෙළේ ය. ඔහු සිදත් සහරාව උගත්තේ මෙතරම් අමාරුවෙනි. සිතටත් කයටත් මෙතරම් වධ දෙමින් තරුණයකුට වුව ද වැඩි කලක් උගත නොහැකි ය. සිදත් සහරාව උගැන්මෙන් පසු තිස්ස එළිය වැටෙන්ට පෙර නැඟීමට වෑයම් නොකෙළේ ය. නොතාරිස් විභාගය පිළිබඳ ආශාව

ක්‍රමයෙන් අඩු වන විට තිස්සගේ සිතට, ප්‍රවෘත්ති පත්‍රවලට හෝ සඟරාවලට හෝ ලියුම් සම්පාදනය කිරීමට ආශාවක් නැංගේ ය. පොත-පත උගැන්මට ඔහුගේ ආශාව අඩුනොවූයේ මේ හෙයිනි.

තිස්ස පොත-පත කියවීමෙන් පමණක් නොව, සිනමා සිතුවම් බැලීමෙන් ද සර්කස් ආදී සෙල්ලම් බැලීමෙන් ද මහත් ආස්වාදයක් ලබයි. ඔහු සතියකට වරක් සිනමා බැලීමට යන්නේ, එයින් ප්‍රීතියක් පමණක් නොව උගැන්මක් ද ලබන හෙයිනි. කොළඹ ගිය අලුතම පිට පිට සර්කස් තුනක් ඔහුට බලන්ට ලැබිණ.

ළමා විය යම්තම් ඉක්මවූ තැන් සිට තිස්සගේ සිතට ගැහැනුන් නිසා නඟින්ට වූයේ අද්භූත, විචිත්‍ර, බොළඳ හැඟීම් බව මීට පෙර කියන ලදි. ගැහැනුන් නිසා තිස්සගේ සිතෙහි අහේතුක බියකුත් සමඟ ගෞරවයක්, ආදරයක් හටගත්තේ ඔවුන් නිසා තමා තුළ පහළ වූ හැඟීම් අධික ලජ්ජාවෙන් මැඩගත් බැවිනි. සර්කස් එකෙහි රඟ මඬලට පිවිසුණු ගැහැනුන් වයසින් මෙන් බුද්ධියෙන් ද පැසුණවුන් තුළ හට ගැන්වූයේ ගෞරවාදරයක් නොවේ. සායම් 'තවරා ගැනීමෙන් නඟාගත් රූ සපුව ද බොළඳ ගුණ ද ඇති ඔවුන් වෙසඟනන් හෝ දූෂිත චරිත ඇත්තියන් හෝ ලෙසය, වයසින් පැසුණවුන් සැලකුවේ. එහෙයින් සර්කස් රඟමඬලට පිවිසි නළඟනන් පළමු දවසෙහි තිස්සගේ සිතට නඟන ලද විචිත්‍ර හැඟීම් ද ගෞරවාදරය ද අනික් පැසුණු තරුණයකු විසින් අසන ලද නම් තිස්ස නිසැකවම ඉලක්කය වන්නේ ඔහුගේ සිනහවට ය. තිස්ස සිනහවට ඉලක්කය නොවූයේ, ගැනුන් නිසා තම සිතෙහි හටගත් හැඟීම් කිසි විටක කටින් පිට නොකළ හෙයිනි.

සර්කස් එකෙහි රඟමඬලට පිවිසි නළඟනන්ගේ රැඟුම් ද රූ සපුව ද දැකීමෙන් ඔවුන් කෙරෙහි සිත් ඇදී ගිය තිස්ස සිතුවේ ඔවුන් පතිදම් රකින සීතාවන් ලෙසිනි. ඔවුන් එක පිරිමියකු නොව, කිහිප දෙනකු පතනු ඇතැයි යන හැඟීම නිසා, ඔහුගේ සිතට නඟින්නේ වේදනාවකි; කලකිරීමකි. එහෙයින් ඔහු, ඒ හැඟීම් ඇතැම් විට මතු වුව ද මැඩගෙන ස්ත්‍රීන් පිළිබඳව තමා තුළ මුල දී හටගත්, අද්භූත බොළඳ මතයෙහි එල්බගනියි. සර්කස් පළෙහි රඟ දැක්වූ නළඟනක සිය කැමැත්තෙන් ඇගේ අතක් සිප ගැනීමට දුණහොත් එයින් ජීවිතාන්තය දක්වා ප්‍රීති විය හැකි ය යනු තිස්සගේ හැඟීම විය. ජීවනයට වුවමනා දේ සපයාගනු උදෙසා මේ ගැහැනුන් රඟ මඬලට පැමිණ බාදිය නහමින් වෙහෙසෙනු දුටු ඔහුගේ සිතෙහි එක්තරා කලකිරීමක් ද හටගත්තේ ය. ඒ කලකිරීම හටගත්තේ ද නළඟනන් සීතාවන් ලෙස සලකාගැනීම නිසා ය. අධික ලජ්ජාවත් උගැන්මත් නිසා නොවේ නම් තිස්ස, පිරිමින්ගේ පමණක් නොව ගැහැනුන්ගේ ද සිනාවට ඉලක්ක වන්නෙකි.

Scanned by CamScanner

අධික ලජ්ජාවත් බුද්ධියත් නිසා ඔහු ඇතැම් විට තරුණියන් තුළ-බිය සැක හටගන්වන උපාසකයකු වැන්න. එහෙත් තිස්ස සිතින් නම් උපාසකයෙක් නොවේ; ගැහැනුන්ට ඔහු උපාසකයකු සේ පෙනෙන්නේ ඔහුගේ අධික ලජ්ජාවත් ඔහුගේ සිතෙහි ඔවුන්ට ඇති අවිචාර ගෞරවයත් නිසා ය.

සතිපතා පළ වන සිංහල පත්‍රයකටත් මසකට වරක් පළ වන සඟරාවකටත් තිස්ස ඇතැම් විට ලියුම් ලී වේ ය. ගතානුගතික මතයන්ට පටහැණි තර්කයන්ගෙන් යුතු ඔහුගේ ලියුමක් ඒ පත්‍ර කර්තෘන් ප්‍රතික්ෂේප කෙළේ කලාතුරකිනි. වරක් තිස්ස හා කතා-බහ කළ විවාහ ලේකම් මහතෙක් තම අත්දැකීම් කිහිපයක් ද හෙළි කෙළේ ය. තිස්ස විවාහ ලේකම්ගේ අත්දැකීමක් ඇසුරු කොට සම්පාදනය කෙළේ අගනා ලිපියකි. කෙටි කතාවකට හුරු ඒ ලියුමට සතිපතා පතෙහි කර්තෘ පළමු වන තැන දුන්නේ ය. පාඨකයන් ඉතා ආශාවෙන් ඒ ලියුම කියවනු ඇතැයි වැටහුණු පත්‍රකාරයා නැවතත් එවැනි ලියුමක් සපයනු සඳහා අනුබල දෙනු පිණිස රුපියල් දහයක් තිස්සට යැව්වේ ය.

තිස්ස ඉරිදා සවසෙහි ඇවිදීමට ගොස්, හවස් වරුවේ මරදානේ දුම්රිය පළ එක් පසෙක නෘත්‍ය ශාලාව අසල වූ බෙහෙත් සාප්පු-වකට ගොස් එහි මඳ වේලාවක් කාලය ගත කරයි. ඒ බෙහෙත් සාප්පුව හිමි වෙද මහතා ලෙඩුන් බැලීමට එහි එන්නේ සතියකට වරකි. අනික් දවස්වල ඒ බෙහෙත් සාප්පුව බාරව ඉන්නා තරුණයා තිස්සගේ යහළුවෙකි. තිස්ස ඉරිදා දවස්වල බෙහෙත් සාප්පුවට ගොස් නෘත්‍ය බැලීමට යන ගැහැනුන් ද පිරිමින් ද බලමින්, බෙහෙත් සාප්පුවේ තරුණයා සමඟ කරන කෙළි-කවට බසින් සන්තෝෂ වෙයි. නෘත්‍ය බැලීමට යන ගෑනුහු ද පිරිමිහු ද බොහෝ විට තිස්සගේ සරදමට ඉලක්ක වෙති. තිස්ස ඔවුන් අරබයා සරදම් බස් තෙපලන්නේ ඔවුන්ට ඇසෙන සේ නොව බෙහෙත් සාප්පුවේ තරුණයාට ඇසෙන සේ ය. සිනමා සිතුවම් බැලීමට පුරුදු වූණු තිස්ස, සිංහල නාට්‍යයෙහි නළුවන්ට 'සරුංගල් කාරයෝ'යි සරදම් කෙළේ ය. නාට්‍ය බලන්ට යන්නවුන් ද ඔහුගේ සරදමට භාජන වූයේ එහෙයිනි.

දුම්රිය පළටත් බෙහෙත් සාප්පුවටත් අතර වූ හන්දියට හවස් කාලයෙහි තරුණ ගැහැනු දෙතුන් දෙනෙක් පැමිණෙති. දුටුවන් නෙත් සිත් පැහැර ගන්නා ඇඳුම් පැළඳුම්වලින් සැරසී සුවඳ සුනු තවරා ගෙන හවස්වරුවෙහි මෙතැන සරණ ගැහැනු, ගණිකා වෘත්ති-යෙන් ජීවත් වන්නෝ ය. මොවුන් අතර වූ රුවැති එකියක් තිස්සගේ සිත් ගත්තා ය. තිස්ස බෙහෙත් සාප්පුවට එන්නේ ඈ බැලීමට නොවන නමුත් ඈ දැකීම ඔහුගේ සන්තෝෂයට හේතුවකි. දුරින් සිටගෙන සතියකට වරක් ඈ බලා සන්තෝෂ වූ තිස්ස ඈ

සමඟ කිසි විටක කතා නොකෙළේ ය. ඔහු ඈ සමඟ කතා නොකෙළේ අධික ලජ්ජාව නිසා ය. ලජ්ජාව දුර හැර ඈ සමඟ කතා කිරීමට මේ වර තිස්සට සිතිණ; සිතුණේ ඈ හා කතාබහ කිරීමෙන් ඈ පිළිබඳ තොරතුරු දැනගත් විට පත්‍රයට කදිම ලිපියක් සම්පාදනය කළ හැකි යයි ඔහුට හැඟුණු හෙයිනි. එහෙත් ඈ හා කතා කරන අදහසින් ඉපිද තුනක් ම බෙහෙත් සාප්පුවට ගිය තිස්සට, තම ලජ්ජාව ජය ගත හැකි නොවී ය. ඈට හඬ ගෑ විට ඈ බැණවැදුණොත් කොතරම් ලජ්ජාවක්දැයි තිස්ස සිතුවේ ය. මේ හැඟීම බෙහෙත් සාප්පුවෙහි උන් තරුණයාට හෙළි කෙළේ නම් තිස්ස ඔහුගේ පවා සිනහවට ඉලක්ක වන්නේ ය. ඇසින් ඉඟි කළ පමණින් ඒ තරුණ ගණිකාව බෙහෙත් සාප්පුවට ගෙන්වාගත හැකි බව තිස්සට වඩා හොඳින් ගැහැනුන් හඳුනන, වැඩි උගත්කමක් නැති, ඒ තරුණයා දනියි.

දවසක, තිස්ස බෙහෙත් සාප්පුවේ දොරටුව ළඟ බොහෝ වේලාවක් බලා සිට, අහළ පහළ කිසිවකු නැති අවස්ථාවක, අර තරුණ වෙසඟනට හඬ ගෑවේ ය. ඈ සැණකින් බෙහෙත් සාප්පුව කරා ගියා ය.

"ඇතුළට එන්න"යි කියමින් තිස්ස බෙහෙත් සාප්පුව තුළ මේසය ඉදිරියෙහි වූ පුටුවක හිඳගත්තේ ය.

බෙහෙත් සාප්පුවෙහි උන් තරුණයාගේ කට කොනට සිනාවක් නැංගේ තිස්ස, 'ඇතුළට එන්න' යයි මේ වෙසඟනට අමතනු ඇසීමෙනි.

"මොකට ද මහත්තයා"? යි අසමින් තරුණිය දොරටුවෙන් එබුණා ය. කදිම නැහැයකින් ද කුඩා කටකින් ද නිල්වන් ඇසින් ද හෙබුණ ඇගේ මුහුණ වඩාත් හොඳින් දුටු තිස්සගේ සිතෙහි ගුප්ත ආශාවක් ද හටගත්තේ ය.

"එන්න: ඕනෑ කමක්"

"මොකට ද? අපට බැහැ. පාරේ මිනිස්සු යනවා! ඕනෑ නම් අපි ඉන්න දිහාවට එන්න."

"එහෙම එකකට නෙවි!" කියමින් තිස්ස සිනාසුණේ ය.

"එහෙනම් කොහොම එහෙකට ද?"

"මෙයාගේ තොරතුරු ටිකක් අහගන්නයි කතා කෙළේ."

"මොකට ද මගේ තොරතුරු?" අසමින් තරුණිය සාප්පුව තුළට ගියා ය.

"නිකම්."

"අපි දන්නවා——පොලිසියට දෙන්න"යි කියමින් තරුණිය යන්ට හැරුණා ය.

"නෑ——නෑ——"යි කියමින් තිස්ස රුපියලක් තරුණිය අතට දුන්නේ ය.

තිස්ස තමාගේ නිවෙස කරා එන අදහස ඇතත් එය සඟවාගෙන තොරතුරු දැනගැනීමට තැත් කරන්නේ යයි තරුණිය සිතුවා ය.

"මොකට ද මගේ තොරතුරු?"

"පොතක් ලියන්න."

"ඒ බොරු!"

"බොරු නෙවි" යි කියමින් තිස්ස කඩදාසියක් සාක්කුවෙන් ගෙන පැන්සලය ද අතට ගත්තේ ය.

"මොන තොරතුරු ද දැනගන්න ඕනෑ?"යි අසමින් තරුණිය සිනාසුණා ය.

"මීට ඉස්සර මොනවද කෙරේ?"

"ගම උන්නා"

"නම."

"මැගිලින්".

"ගම කොහේ ද? තාත්තා මොකද කෙරේ."

උඩ රට තරුණියක වන ඇගේ පියා ඇතරුවෙකි. පියා මළ පසු කොළඹින් ගිය මහලු ස්ත්‍රියක් ඇගේ මවට රුපියල් දහයක් දී ඇ කොළඹට ගෙනාවා ය. තරුණිය තමා පිළිබඳ මේ තොරතුරු කියන අතර ගරාවැටුණු අම්බලම සිහි කරවන මුහුණද කය ද ඇති මහලු ස්ත්‍රියක් පැමිණ තරුණියට සැර කළා ය.

"වරෙන්; වරෙන්" යි කියමින් මැහැල්ල තරුණිය දෙස රවා බලා අනතුරුව බැලුවේ තිස්ස දෙස ය. "ඔය පොලිසියෙන් එවාපු එක්කෙනෙක්."

"මහත්තයා අපේ දිහාවට එන්න" යි කියමින් තරුණිය බෙහෙත් සාප්පුවෙන් එළියට බැස්සා ය.

"මොකට ද?"යි මදක් දුර ගිය මැහැල්ල සැර කළා ය. "ඇයි යෝදියේ පේන්නෙ නැද්ද, රහස් පොලිසියේ මහත්තයෙක් බව?"

"අපට කවුරු උණාම මොකද?"

"පොලිසිවල ඇවිදින්න බැහැ."

"මහත්තයාගේ රුපියලට තට්ටු උණා!"යි කියමින් බෙහෙත් සාප්පුවේ තරුණයා සිනාසුණේ ය.

"අර නාකි ගෑනි නෙව ඒකට ඉඩ නුදුන්නේ."

"ඒ ගෑනිට රුපියල දුන්නා නම් වැඩේ කරගන්න තිඋණා!"

Scanned by CamScanner

''ඒ ගැනි මහ මූසල ගැනියෙක් විදියයි.''

ආපසු වෙළෙඳ සැලට ගිය තිස්සට තරුණ ගණිකාවගේ ස්වරූපය සිතින් ඉවත් කළ හැකි නොවී ය. එදින රෑ නින්දට ගිය විට ද ඔහුට මතක් වූයේ තරුණ ගණිකාව ය. ඇගේ මුකුළු සිනාවත් යටැසින් බැලූ බැල්මත් කදිම මුහුණත් උස්වූ ළයත් තිස්සට සිහි වෙයි. ඇගේ ජීවිත කථාව අරබයා දැනගත් බින්දු මාත්‍ර තොරතුරු ද ඔහුගේ සිතට නැගියි. ගණිකාවගේ නිවෙසට යාමට ඔහුට සිතිණ. ඒ සිතිවිල්ල පහළවත් ම ඔහුගේ සිතට ලජ්ජාවත් බියත් නැංගේ ය. එහෙයින් ඔහු සිතුවේ කිසිවකුට නොදත හැකි සේ එහි යන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ගැන ය.

ඔහු බෙහෙත් සාප්පුවෙහිදී ගණිකාවට හඬ ගෑවේ ඇය පිළිබඳ තොරතුරු අසා ගෙන පත්‍රයට ලිපියක් ලියන අදහසිනි. දැන් නම් ගණිකාවගේ නිවෙසට යාමට සිතෙන්නේ ඒ අදහසින්ම නොව ඇ දැකීමේ ආශාවෙන් ද බව තිස්සට දැනිණ. ''ඇ බලා ඇගේ ජීවිතය පිළිබඳ තොරතුරු දැනගැනීමේ වරද කුමක් ද? එහි දී අඳුනන කවුරුන් මා දුටුවොත්? ඇ සිප වැළඳ ගැනීමේ ආශාවක් මා තුළ නැතිය: එහෙයින් එහි ගොස් ඇ සමඟ කතාබහ කිරීමෙන් මට වුව-මනා තොරතුරු දත හැකි ය. ඕනෑ කෙනෙකු කුමක් සිතුවත් කිවත් මා එහි යන්නේ නරක අදහසකින් නොවන වග මා දන්නවා නොවේ ද? එහි ගිය විට මා වරදකට වැටුණොත්? නරක ආශාවක් මගේ යටි හිතේ නැහැයි කිව හැකි ද?''

විදුලිය කෙටෙන්නා සේ තිස්සගේ සිතෙහි මේ සිතිවිලි පහළ වී ය. ලජ්ජාව නිසා ගැනුන් ගෙන් ඈත්ව, උන් ගැන සිතමින් සන්තෝෂ වීමට පුරුදු වුණ, තිස්සගේ සිතට නැඟුණු මේ සිතිවිලි ද ආශාව ද පීඩාකර නොවූයෙන් ඔහු ඇඳෙහි වැටී මඳ වේලාවකින් නිදන්ට වූයේ ය.

ඊ ළඟ ඉරුදින රෑ හතට පමණ සාප්පුවෙන් පිට වුණු තිස්ස ගියේ තරුණ ගණිකාව වෙසෙන මුඩුක්කුව දෙසට ය. මේ මුඩුක්කුවට හවස පිවිසියකු දුරදී නම් අනිකකුට හඳුනා ගත නොහැකි තරම් ඒ පෙදෙස අඳුරු ය. ඇතැම් කුඩා ගෙයක ඉවත් කරන ලද ලැල්ලක් ඇති දොරටුවෙන් ද තවත් කුඩා ගෙයක වසන ලද දොරෙහි යතුරු කඩුල්ලෙන් ද නොවසන ලද කවුළුවෙන් ද නික්මෙන පහන් එළි-යෙන් පාර තැනින් තැන එළිය වෙයි. මුඩුක්කුවට පිවිස මදක් තැන් ගිය විගස තිස්සට දැනුණේ, පරණ ගෝනි පුරවන ලද ගෙය-කට ඇතුළු වුණු කළ දැනෙන නැහැය කෙළවර කස්වන පුසුඹකි. ඇතැම් කුඩා ගෙයකින් නික්මෙන්නේ සර්පිනා නාදයයි. තවත් ගෙයකින් තරුණයන් සිනාසෙන හඬ ඇසෙන කල අනිකෙන් ඇසෙන්නේ කුඩා දරුවකු හඬන හඬ ය. මුඩුක්කුව මැද තෙක්

Scanned by CamScanner

ගමන් කළ තිස්සට යම්කිසිවකු තවත් එකකුට නිර්දය ලෙස ගුටි-බැට අනින හඬ ද ඒ එක්කම ගැහැණියකගේ ළතෝනිය ද ඇසෙයි. ගුටි-බැට හඬ ද ගැහැනිය නඟන ළතෝනිය ද ඇසූ තිස්සගේ සිතට නැඟුණේ බියකි. බියෙන් ඇවිසුණු කල්පනාව විසින් නඟනු ලබන නා නා සිතිවිලි නිසා ඔහුගේ සිත අවුල් වී ය. 'ගැහැනියට ගුටි-බැට අනින්නේ ඇගේ සොර සැමියා ගෙයි සිටිනු දැකීමෙන් කිපුණු පුරුෂයා විසින් ය' යන හැඟීම ද තිස්සගේ අවුල්වුණු හිසට නැංගේ ය. එහෙයින් ඒ කලහය කෙළවර විය හැක්කේ මිනීමැරුමකිනියි සිතූ තිස්සට තැති ගැනිණ. අනික් ගෙවල ඉන්නා ජනයා පාර දිව නොඑන්නේ කුමක් නිසා ද? බියෙන් තැතිගත් තිස්ස පාර දෙපැත්තෙහි වූ කුඩා ගෙවල දොරටු දෙස බලමින්, පෙරට වැඩි ඉක්මනකින් ගමන් කෙළේ ය.

ඇතැම් ගෙයකින් මස් බැදෙන හඬ ඇසෙයි. මුඩුක්කුවෙහි කාණුවලින් නඟින ගඳට එක්වුණු පුළුටු ගඳ තිස්සගේ නැහැය හැකිල වී ය. මෙහි ගෙවල් ද කිලුටු ය; ගෙවල වෙසෙන්නෝ ද කිලුටු ය; ඔවුන්ගේ රෙදි-පිළි ද කිලුටු ය; බඩු ද කිලිටු ය. මේ කිලුටුව වඩාත් තිස්සට ඉව වැටෙන්ට වූයේ මස් බැදෙන තැනින් නැඟ කාණුවල ගඳ ද ඇදගෙන ආ දුම ආඝ්‍රාණයෙනි.

තරුණ වෙසඟන ඉන්නා මුඩුක්කුවෙහි නම මිස ඇගේ ගෙයි නොම්මරය අසා නොගත් තිස්සට තම මෝඩකම වැටහෙන්නේ දැන්ය. රැයෙහි ඈ ඉන්නා තැනක් සොයාගත හැක්කේ අනායයන්ගෙන් විමසීමෙනි. නො එසේ නම් ගෙවල් තුළ ඉන්නා ස්ත්‍රීන්ගේ මුහුණු බලමින් ගමන් කිරීමෙනි. සමහර ගෙවල දොරවල් වසා ඇති බැවින් ඈ දකින්ට ලැබෙතියි සිතීම දුෂ්කර ය. තිස්ස ගමන් කෙළේ මුඩුක්කුවේ අනික් කෙළවරට ගොස් එතැනින් විදියට බැස සාප්පුව බලා යන අදහසිනි. මුඩුක්කුවෙහි අනික් කෙළවරට ළඟාවූ ඔහුගේ තැති ගැන්ම අඩු වී ය. නැවතී ආ පසු බැලූ තිස්සට පෙනුණේ තමා එහි පිවිසුණු අවස්ථාවෙහි දුටු පාලුවම ය. ගැහැනියගේ විලාපය මුඩුක්කුවෙහි නිසන්සල බවට වැඩි බාධාවක් නොවී ය.

තිස්ස සාප්පුව බලා යනු වෙනුවට යළිත් මුඩුක්කුව ඔස්සේ ම ආ පසු ගමන් කෙළේ ය. ඔහු එසේ කෙළේ තරුණ වෙසඟන දකිණ ආශාව යළිත් හිසට නැඟුණු බැවිනි. මඳ තැනක් ගිය ඔහු දකුණු පැත්තේ අඳුරු තැනක වූ කුඩා ගෙයක දොර ඇරෙනු දුටුවේ ය. දොරටුවෙන් නිකුත් පහන් එළිය නිසා, ගෙයින් එළියට බැස ගමන් කළ තරුණයන් දෙදෙනාගෙන් එකකු තිස්ස හැඳින ගත්තේ ය. ඔහු ඒ තරුණයන් දෙදෙනා නොපෙනී යන තුරු නැවතුණේ එහෙයිනි. ඔවුන් දෙදෙනාගෙන් එකෙක් බෙහෙත් සාප්පුව බාරව ඉන්නා තම යහළුවා ය. නිසැකව ම මේ ගෙය

තමා සොයන ඒ වෙසඟන ඉන්නා තැන විය යුතුයයි තිස්ස සිතුවේ ය. එහෙත් ඔහු ඒ කුඩා ගෙය දෙසට දෙපා නැගුවේ ගැහෙනා හද ද තරුණ වෙසඟන දකින ආශාව ද ඇතිව ය. දොරටුවට ළඟා වූ ඔහු දුටුවේ පියකරු මුහුණකි. ඒ පියකරු මුහුණ ඇත්තිය මැද වියෙහි වූ කාන්තාවක බව වැටහුණේ වඩාත් දොරටුවට ළං වූ පසු ය.

"මරදානේ බෙහෙත් සාප්පුවේ වීරසේන මෙහේ ආවා ද?" යන වචන අන්දුන්කුන්දුන් වූ තිස්සගෙ කටින් පිට වී ය. අවස්ථාවට උචිත මේ වචන ඔහුගේ කටින් පිට නොවී නම් ඔහු දොරටුවෙහි සිටි ගැහැනියගේ සැකයට භාජන වන්නේ ය.

පළමුව ඈ තිස්ස දෙස බැලුවේ සැකයෙනි. දොරටුවෙන් නික්මෙන පහන් එළියෙන් එළිය වුණු තිස්සගේ අහිංසක මුහුණ දුටු ඇගේ සැකය දුරුවී ය. මීට පෙර තමා විසින් මේ මුදුක්කුවෙහිදී නොදක්නා ලද තිස්ස, අතරමං වූවකු ලෙස ය ඈට පෙනුණේ.

"දැන් ඔන්න එයා මගේ පුතාත් එක්ක නුරුති බලංඩය කියා ගියා"යි කියමින් ස්ත්‍රිය දොරටුවෙන් මඳක් ඈත් වූවා ය. දොරටුවෙන් මඳක් ඈත් වීම, ගෙට ඇතුළුවීමට තමාට කළ ආරාධනයක් වැන්නැයි තිස්ස සිතුවා ය. ගෙට ඇතුළු වී මැගිලින් ඉන්නා තැන සෙවීමට සිත් වූ නමුත් තිස්ස යළිත් ඒ සිතිවිල්ල මැඩගත්තේ ය.

මැදවියෙහි වූ ස්ත්‍රිය දොරටුවෙන් මඳක් ඈත් වූයේ තිස්ස ගෙතුළට කැඳවා වීරසේන පිළිබඳ තොරතුරු අසන අටියෙනි. ඈ වීරසේන පිළිබඳ තොරතුරු සොයන්නේ ඔහු ඇගේ දුව විවාහ කර ගැනීමට පොරොන්දුව එහි එන්නකු හෙයිනි.

"මේ ළමයා මීට ඉස්සර මෙ පැත්තට ඇවිදින් නැතුවා වගෙයි"යි දොරකඩ උන් ගැහැනිය කීවා ය.

"නැහැ".

"මේ අවේලාවේ මොකට ද මේ පුරුදු නැති විදියක ඇවිදිංඩ ආවේ?"

"ඇවිදින්න නොවෙයි ආවේ"

"මම යන්නම් දක්කා ටිකකට ඉස්සර වෙලා මේ ළමයා අර පැත්තට යනවා!"

ඇත්ත හෙළි කොට මැගෙන් මැගිලින් ඉන්නා තැන සෙවිය යුතු ද? මේ ප්‍රශ්නය විසඳා ගැනීම තිස්සට අමාරු කාරියක් වී ය. කුඩා කල සිට ම තිස්ස සිතීමට මිස ක්‍රියාවට ශූරයෙක් නොවේ. සෙල්ලමත් පොත-පත කියවීමත් හැර අනික් හැම එකක් ගැන සිතන විට ඊට පටහැණි සිතිවිල්ලක් ද තිස්සගේ සිතට නඟියි.

Scanned by CamScanner

මේ සිතිවිලි දෙක අතර වන හටනෙහි ප්‍රතිඵලයක් වශයෙන් තිස්ස තමා අදහස් කළ කාරිය කල් තබයි. මැගිලින් ඉන්නා තැන මැගෙන් සෙවුවොත් මැ නිසැකවම වීරසේනට කියයි. වීරසේන තම සාප්පුවෙහි අනික් එකකුට කියයි. ඔහු ඔහුගේ යහළුවන්ට ද කියයි.

''මම ගියේ වීරසේන සොයන අදහසින්. බෙහෙත් සාප්පුවෙ දෙර වසා තිළුණා. සාප්පුව ළඟ සිටි ගැටයෙක් කිව්වා එයා මේ පැත්තෙ එන්න ඇත කියා.''

''එහෙනම් මේ ළමයා ඒ දෙන්නා යනවා දැකලා නැවතී බලා-ගෙන උන්නේ!''යි අසමින් මැද වියෙහි වූ ගැහැනිය සාට කොනට සිනාවක් නැඟුවා ය.

තිස්ස අන්දුන්කුන්දුන් වී ය.

''මම නැවතිලා උන්නා!''යි, අවස්ථාවට උචිත උත්තරයක් සිතට නඟාගත නොහැකි වූ තිස්ස තෙපලේ ය.

''ඔව්—මම දැක්කා!''

''මට වීරසේන එකපාරට අඳුනාගන්ට බැරි උණා නිසා.''

''මට විශ්වාස නෑ'' යි කියමින් ඇ සිනාසුණා ය. ''මෙ වාගේ ළමයිංඩ අවේලාවේ ඇවිදිංඩ හොඳ තැනක් නෙවි අර පැත්ත''යි කියමින් ඈ වීදිය උඩු පැත්තට අත දික් කළා ය.

නිසැකවම මැගිලින් වාසය කරන්නේ වීදියෙහි ඒ පැත්තෙහි ගෙයක යයි තිස්ස සිතුවේ ය. එහෙත් මේ ගැහැනිය බලා සිටියදී යළිත් ආ පසු හැරී ඒ දෙසට ගිය හැකි නො වේ.

''වීරසේන හම්බ වෙන්නත් එක්කයි මෙ පැත්තෙ ආවේ''යි තිස්ස කී ය.

''මෙ ළමයාගේ නම කොහොම ද?''යි මේ වර ඇ ඇසුවේ මුහුණ පුරා පැතුරුණු සිනාවක් ඇතිව ය.

''තිස්ස''

''තිස්ස! වීරසේන මේ ළමයා ගැන සමහර දවස්වල කතා කර-නවා. එයා නම් මේ ළමයා ගැන කතා කෙරේ රෑ මෙහෙම ගමන් එන ළමයෙක් විදියට නෙවි''යි කියමින් ඈ තිස්සගේ හිසේ සිට දෙපතුල දක්වා බැලුවා ය. ඈ එසේ බැලුවේ තිස්ස කලිසන් අඳින තරුණයකු ලෙස සිතා ගැනීමට තුඩු දෙන සේ වීරසේන ඔහු පිළිබඳ තොරතුරු කී බැවිනි.

''මේ ළමයා අද සරමකුත් කෝට් එකකුත් ඇඳගෙන ආවේ ඇයි?''

''මම රෑට අඳින්නේ මේ ඇඳුම තමයි.''

Scanned by CamScanner

"ගෙදරදී"

"සමහර දවස්වලට රට සෙල්ලමේ යන කොට සරෝම ඇඳ-ගෙනයි යන්නේ."

"එහෙනම් අද මෙහේ ඇවිදින් තියෙන්නේ සෙල්ලම් ගම-නකට ?"

"නැහැ, වීරසේන සොයන්නත් එක්ක."

"එහෙනම් වීරසේන සොයංඩ විතරක් නෙවියි" කියමින් ඈ සිනාසුණා ය. "මේ ළමයා යංඩ සාප්පුවට; රෑ මෙහේ ඇවිදිංඩ එපා. පුරුදු නැතිව තනියම රෑ ඇවිදිංඩ හොඳ තැනක් නෙවි."

"අපි කෙළින් ම සාප්පුවට යනවා"යි කියමින් තිස්ස, පළමුව මුඩුක්කුවට පිවිසි මග ඔස්සේ ගමන් කෙළේ ය.

වෙළඳ සැලට ළඟා වූ තිස්ස තම මව විසින් එවන ලද ලියුමක් කියවූයේ ය. වහාම පිළිතුරු ලබන ආශාවෙන් ලියන ලද ඒ ලියුම කියවූ තිස්සගේ සිතට තමා එදින හවස ගිය ගමන ගැන ලජ්ජාවක්ද බියක් ද නැංගේ ය. ඔහුගේ සිතෙහි ඒ ලජ්ජාවත් බියත් පහළ වූයේ මවගේ ලියුම කියවීමෙන් ගෙදර ද සොහොයුරියන් ද මතක් වූ බැවිනි. මුඩුක්කුවෙහි දී ඇසූ දුටු දේ පිළිබඳ සිතිවිලි තම සිතින් බැහැර කළ ඔහු රෑ කෑම කා නින්දට ගියේ මවගේ ලියුමට පිළිතුරු ලියා අවසන් කිරීමෙන් පසු ය.

Scanned by CamScanner

# 15 වන පරිච්ඡේදය

**මාතර** හාමිනේ ලියුමක් යැවූයේ පියල් හා ඔහුගේ වෙළෙඳාම ද ගැන තොරතුරු දැනගනු පිණිස නොව පියල් ද නන්ද ද පිළිබඳ විවාහ යෝජනාව ගැන තිස්සගේ අදහස් දැනගනු පිණිස ය. අනුලා තිස්ස විසින් එවන ලද ලියුම කියවන්නට පටන් ගත්තේ වටපිට බැලීමෙන් පසු ය. ඇගේ ඒ වටපිට බැලීමෙන් ම එය තමා හා පියල් ද පිළිබඳ ලියුමකැයි වටහාගත් නන්ද එතැනින් ඉවත්ව කුස්සිය දෙසට ගියා ය.

තිස්සගේ ලියුම දික් වූයේ පියල්ගේ වෙළඳාම පිළිබඳ තොරතුරු ද එහි ඇතුළත් කරන ලද බැවිනි. එයින් ඇතැම් තොරතුරු මව විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි; අනික් තොරතුරු ලියන ලද්දේ ඒ තොරතුරු මවගේත් සහෝදරියන්ගෙත් සන්-තෝෂයට හේතු වන බැවිනි.

''ලොකු වෙළඳාමක් කරන පියල්ට ලැබෙන ආදායම සුළු නොවේ'' ය යි තිස්ස ලිවේ ය. 'පියල්ගේ වෙළඳ සැලෙහි සේවකයන් විසි තිස් දෙනාගෙන් එකෙක් ලොකු පඩි ලබන ලන්සි මිනිහෙකි. පියල් කරන්නේ විශාල මුදලක් හිර කළ යුතු වෙළඳාමක් වුව ද හෙට්ටින්ට ණය ගැති බවක් දැනගන්ට නොලැබිණ.

තමාගේ කන්තෝරුවෙහි කටයුතු කරන වේලාවෙහි නම් පියල් අහංකාර මිනිහෙකි. අහංකාර ය යි කියන්නේ කන්තෝරුවෙහි දී හිතවත් මිතුරකුට වුව ද ඔහු වැඩි සැලකිල්ලක් නොදක්වන බැවිනි. මා ගිය විටක වුව ද ඔහු අතට ගත් කාරිය අවසාන කරන තුරු මා සමඟ කථාවට නොඑයි. ඇත්ත වශයෙන් එය අහංකාර කමක් නොව වෙළඳාම පිළිබඳ කටයුතුවලදී ආරූඪ කරගන්නා දැඩි ගුණයකි. වෙළඳ කාරියට වුවමනා හික්මීමකි.'

'පියල් මෑතදී රබර් ඉඩමක් දෙකක් මිලට ගත්තේ යයි අසන්ට ලැබුණ නමුත් එහි ඇත්ත නැත්ත නිශ්චය වශයෙන් මට දැනගන්ට නොලැබිණැ'යි තිස්ස තම සන්දේශය අවසානයෙහි ලිවේ ය. 'පියල්ගේ වෙළඳාම නම ක්‍රමයෙන් ඉහළ නගින්නකි. දැනුදු ඔහු ධනවතකු ලෙස ය, ඔහු යට රක්ෂාව කරන්නන් සලකන්නේ. පියල්ගේ ධනවත්කම පෙනෙන්නේ මෙහිදී මීස ගමදී නොවේ.'

''තිස්ස හොඳටම කැමැතිවා වගෙයි'' අනුලා ලියුම කියවනු අසාගෙන උන් මාතර හාමිනේ සන්තෝෂයෙන් කීවා ය.

''ඔව්; තිස්ස හොඳට ම කැමැති නිසා තමයි මෙහෙම ලියා තියෙන්නේ.''



Scanned by CamScanner

''තිස්සගේ කැමැත්ත අකැමැත්ත අහළා යැව්වේ පියල්ගේ
වෙළඳාම ගැන දැනගන්න නෙවි. පියල්ගේ තාත්තා ගැන එහෙම
අහළා ඇති නිසා එයා මොනවා කියා එවනවාද කියා බලන්නයි.
තාත්තා ඉන්දෙද්දී පියල්ට අපි කවුරුත් අකමැති උණ එක තිසා
දන්නවා නෙව ? මුලදී අකැමැති උණේ පියල්ගේ තාත්තල අම්මලා
උන්න හැටි හොඳ නැති නිසා වග තිසාත් දන්නවා.''

''තිසා ඒ කාලේත් ඕව ගැන සැලකුවේ නැහැ. මුත්තලයි
තාත්තලයි ලොකු කම් හිතට ගන්නවායයි තිසා ඒ දවස්වල අපටත්
කවට කම් කරා.''

''අනිත් මිනිස්සුන්ට හිතන්න ඒ වගේ මුත්තල තාත්තල නැහැ.
බොලාට හිටි නිසා නෙව හිතන්නේ.''

''එහෙම කිව්වට තිසා බාරගන්නේ නැහැ''යි කියමින් අනුලා
සිනාසුණා ය.

''තාත්තලයි නම ආරක්ෂා කරන්න ඉන්නේ එයැයි විතරයි.
එයැයිත් ඔහොම හිතන්න ගියාම කොහොමද?''

''ඕව තිසාගේ හිතේ නැහැ. එයා ඕවට කවටකම් කරනවා.''

''බොලා නොහිතුවත් තිස්ස ඕවා ගැන හිතන්න ඕනෑ.''

''තිසා කොළඹට ගියාට පස්සේ ඕවාට ඉස්සරටත් වඩා විරුද්ධයි
ගමේ ලොකු පවුල් දෙක තුනක මිනිස්සුන් නම්බුව කබල් ගාන්න
වැයම් කරන හැටි මතක් වෙන කොට එයාට සිහි වෙන්නේ පියදස
සිරිසේන මහත්තයා ගේ පොතක තිඋණු කදිම කතාවක්යයි තිසා
ඉස්සර මට එවූ ලියුමකුත් ලියා තිඋණා. ගමේ ලොකු මිනිස්සුන්
පොහොසත් වෙන්නේ දුප්පත් මිනිස්සුන්ගේ ඉඩම් කොල්ලකා
ගෙන යයි තිසා පත්‍රයක පළකළ ලියුමකුත් ලියා තිඋණා.''

''අපේ කවුරුවත් දුප්පත් මිනිසුන්ගේ ඉඩම් කොල්ලකාගෙන
පොහොසත් උණේ නැහැ. එයා හිතාගෙන ඉන්නේ අලුත
පොහොසත් උණු මිනිහෙක් දෙන්නෙක් කළ නිසා අනික් පවුලුත්
පොහොසත් උණේ එහෙම ය කියා වෙන්න ඇති. අපේ කවුරුවත්
එහෙම පොහොසත් වෙලා නැහැ. බලදසලයි තාත්තා පොහො-
සත් උණෙත් අනුන්ගේ දේ කොල්ලකාගෙන නෙවි.''

නන්දගේ ද පියල්ගේ ද විවාහය නිමිත්තෙන් විශාල උත්සවයක්
නොපවත්වන ලද නමුදු ඔවුන්ගේ විවාහය සිදුකරන ලද්දේ
ගමෙහි මෑත කලක සිදු වුණු මඟුලක් උදෙසා නොකළ තරම් වියදම-
කිනි. නන්දගේ පමණක් නොව, අනුලාගේ ද ඇඳුම් පැළඳුම් සපයන
ලද්දේ පියල් විසිනි. ගමෙහි එකල මුල් බැසගත් සිරිතට අනුව
විවාහ දවසෙහි නන්ද සැරසුණේ ගවුමකිනි. තමාගේ ලන්සි
ලිපිකරුවාගේ බිරිඳගේ ද උපකාරයෙන් මස්වන ලද ඒ ගවුමට ද

Scanned by CamScanner

ඒ ගවුමට කැපෙන සපත්තු, විජිනිපත, අත් මේස් යන ආදියට ද පියල් විශාල මුදලක් වියදම් කෙළේ ය. පියල්ගේ ලිපිකරුවා වන ලන්සි මිනිහාත් ඔහුගේ භාර්‍යාවත් දූවරුත් මඟුල් දවසෙහි පැමිණ, ඇඳ පැළඳ ගැනීමට නන්දට උපකාර කළහ. නුපුරුදු ගවුමකින් ද ඊට කැපෙන අනික් පළඳනාවන්ගෙන් ද සැරසුණු ගැමි තරුණියක් වුව ද නන්ද, නගරයක රැවැති ලන්සි තරුණියක පරාජය කළා ය. ඇගේ සිහින් ඉහ ද උස් වූ දේහය ද කඳිම මුහුණ ද වකුටු කළු කෙසින් හෙබුණු හිස ද ඉංගිරිසි ඇඳුම නිසා වඩාත් සුන්දර වී ය. නුපුරුදු ඇඳුමින් සැරසුණු නමුදු තම ඉරියව්වෙන් හා කතාවෙන් ද පෙනුමින් ද ගැමි තරුණියකගේ ලකුණු හෙළි නොකළ නන්ද ලන්සි ගැහැනුන්ගේ පවා පැසසුමට ඉලක්කය වීම පුදුමයක් ද?

නන්දගේත් පියල්ගේත් විවාහය ලියා සහතික කරන ලද්දේ මහගෙදරදී ය. මංගලෝත්සවය සඳහා කැඳවන ලද්දේ නෑ මිතුරන් ටික දෙනකු වුව ද, ඔවුහු මීට පෙර ගමෙහි මඟුල් ගෙදරකදී නොකෑ විරූ රස කැවිලියෙන් සංග්‍රහ ලැබූහ.

බලදසත් විජයත් පියල් ඉදිරියෙහි නන්දට සරදම් කළහ. පෙර ඔවුන්ගේ සරදම් අසා කිපුණු නන්ද මෙදින සිනාසෙමින් එක-වෙක කීමෙන් අන්‍යයන් ද සිනැස්සුවා ය.

එදින හවස පියල්ගේ ගෙදරට ළඟා වූ නන්ද, තම කාමරයට පිවිසුණු පසු, පියල් විසින් තමාගේ සුව පහසුව සලකා කරන ලද වියදම් කොතෙක්දැයි නිසැකව වටහා ගත්තා ය. ගමෙහි පරණ ධන-වතකුගේ ගෙයකට පවා නොපිවිසුණු විසාල සුදු ජග්ගුවක් ද බේසමක් ද දත් බුරුසු සහිත කුඩා සුදු බරණියක් ද ගත් කුඩා මෙස-යක් ඇගේ කාමරයෙහි එක් මුල්ලක වී ය. ඒ මේසය අසල වූ පියන් පතක් සහිත සුදු බාල්දිය කුණු වතුර ගැනීම පිණිස ය. කන්-නාඩි මේසය මීට පෙර ගැමියකු විසින් නොදක්නා ලද විධියේ එකකි. පෙර නුදුටු විරූ සුවඳ විලවුන් වර්ගයන්ගෙන් හා සුවඳ පැනින් ද නිකුත් මුදු සුවඳ ඇසූ නන්දට සිහිවූයේ පරගොඩ විහාරයට ගිය ගමන ය. එහිදී කළ කතාබහ ය. ඈ ගෙයි හැම තැනම දුටුවේ අලුත් විධියේ වටිනා ඇඳ පුටු මේසය; කලාල පැදුරු ය. නාන-කාමරයෙහි වූ සුදු පිඟන් නාන ඔරුව දුටු නන්ද තුළ සන්තෝෂය නොව බියක් හටගත්තේ මේ අනවශ්‍ය වියදම් නිසා පියල්, ජිනදාස මෙන් අමාරුවෙහි වැටෙතියි හැඟුණු බැවිනි.

විවාහයෙන් දෙදවසකට පසු පියල්ගේ ගෙදරට ළඟා වූ අලුත් මොටෝ රථය දුටු නන්දගේ බිය තවත් වැඩි වී ය. තමා තුළ හටගත් බිය සැක යට කරගත නොහැකි වූයෙන් නන්ද තම කාමරයට පැමිණි පියල්ගෙන් මෙසේ විචාළා ය:

''කාර් එහෙකට සල්ලි වියදම් කෙරේ මොකට ද? අපි කාර් එකකින් කොහේ යන්නද?''

Scanned by CamScanner

"නැයන්ගේ මිත්‍රයන්ගේ ගෙදරවලට යන්න බැරිය"

"ඒකට කාර් එකක් මොකට ද? මට පයින් යන්න ඇහැකි. දුර ගමනක් නම් අශ්ව කරත්තෙකින් යනවා."

"අශ්ව කරත්තෙන් යන්නේ කාර්වලට වියදම් කරන්න බැරි නම්"යි පියල් සිනාසෙමින් කී ය.

"ඕනෑ නැතුව වියදම් කරලා අපට අමාරු උණා ම? මම නිසා මෙච්චර වියදම් කරන්න එපා. මම කැමැති නැහැ."

නන්ද මොටෝ රථයක් නුවුවමනා යයි කියන්නේ කුමක් නිසාදැයි පියල්ට වැටහුණේ දැන් ය.

"නන්ද හිතනවද කාර් එකක් තියාගත්තම මට අමාරු වේය කියා? එකක් නෙවි දෙකක් උණත් තියා ගන්න මට ආදයම තියෙනවා. කොළඹ වැඩට මට කාර් එකක් තියෙනවා. ලන්සි මහත්තයත් නෝනාත් දූලත් මඟුල් දවසෙ ආවෙ ඒ කාර් එකෙන්. මේ අලුත් කාර් එක ගෙනාවේ නන්දට ගමන් යන්න."

"අපි කවදද දුර ගමනක් යන්නේ? කිට්ටු ගමනක් අශ්වකරත්තෙන් යන්න ඇහැකි. මොකටද ඕනෑ නැතුව වියදම් කරන්නේ?"

නන්ද ජිනදාස ලවා වියදම් කරවීම නිසා ඔහු දිළින්දෙක් වී විනාශ වූහයි ජිනදාසගේ සහෝදරිය විසින් නඟන ලද චෝදනා පියල්ට ද පෙර අසන්ට ලැබිණ.

"බය වෙන්න එපා නන්ද"යි කියමින් පියල් පුරසාරම් දෙඩන්ට සිතුවේ එහෙයිනි. "මගේ වෙළඳාම ගැන තිස්ස කිව්වේ නැද්ද?"

"කිව්වා——ලොකු වෙළඳාමක් ය කියා."

"ලොකු වෙළඳාමක් නෙවි නන්ද; හුඟක් ලාබ ලැබෙන වෙළඳාමක්; රබර් වලිනුත් මට ආදයම ලැබෙනවා."

"හැම දම එක වාගේ ලාබ ලැබෙනවාය වෙළඳාම් වලින්?"

"ලාබ නොලැබෙන්න උණොත් ඒ කාලෙටත් මට ආදයම් ලැබෙන්න තැන් තියෙනවා. ලාබ ලැබෙන වෙළඳාමකින් හැමදම ලාබ ගන්ට බැරි වෙන්නේ මෝඩයන්ට."

"උඩ රට වෙළඳාම් කර මුදලාලිලා දූන් කී දෙනෙක් අමාරුවේ වැටිලා ඉන්නවා ද?"

"ඔවුන්ගේ නුගත් කම නිසා. ටිකක් ඉගෙනගෙන වෙළඳාමට බැස්සා නම් එහෙම වෙන්නේ නැහැ."

"වැඩි වියදම් කරනවාට අම්මා කැමැති වෙන එකකුත් නැහැ."

"අපේ අම්මා?"

"නෑ" යි පියල් පිළිතුරු දුන්නේ සිනාසෙමිනි. "නන්ද එක්ක කාර් එකෙන් යන්න අම්මා හොඳටම කැමැති යි."

Scanned by CamScanner

මාතර හාමිනෙත් අනුලාත් තිස්සත් සතියක් තුළ තුන් වරක් පියල්ගේ ගෙදරට පැමිණියහ. තිස්ස කොළඹට ගොස් හත් අට-දවසකට පසු මාතර හාමිනේත් අනුලාත් නන්ද හා පියල් ද බැලීමට ගියාහ. එදිනම ඔවුන් දෙදෙනාට ආ පසු මහගෙදරට යන්ට හැරීම ගැන පියල් නන්දට දෙස් නැඟී ය.

"මේ ගෙදර තව හත්-අට දෙනෙකුට උණත් ඉන්න ඉඩ තියෙනවා. අම්මටත් අනුලාටත් මෙහි නවතින්න බැරිය?"

"මම නවතින්න කිව්වා. දෙන්නම ගෙදර ඇරලා කොහේවත් ඉන්න කැමැති නැහැ. කොච්චර කිව්වත් ඒ අදහස් වෙනස් කරන්නේ නැහැ."

"අනුලාත් එහෙම ද?"

"ඔව්"

"ඔය ජරාවාස වෙගෙන යන ගේ අත්හැරලා ඔක්කොටම මෙන්න මෙහේ ඇවිල්ලා ඉන්න කියන්න."

"කිව්වට අහන්නේ නැහැ. ගේ පාළු වෙනවාය කියා යන්නමයි ආසාව."

"දැනුත් ඒක මට නම් පාළු ගෙයක් වගෙයි. පාළු ගෙයි ආයිත් පාළු වෙන්න තියෙන්නේ මොනවා ද?"

නන්ද සිනාසුණා ය.

"අනුට ඇහෙන්න ඔහොම කිව්වොත් රංඩු වෙයි."

මම කිව්වේ ඇත්ත. වහල දිරාලා; බිව්ව් ගරා වැටිලා; හොඳ කොස් ලී නිසා උළුවහු යට ලී දිරලා නැහැ."

දිරුවත්, අත්තලා මුත්තලා හිටපු ගෙවල්. අම්මා ගෙයි පැත්තක් කඩා වැටුණත් ගේ අත අරින්නේ නැහැ."

'දූලා අම්මට අනුබල දෙන්නේ මොකොට ද?"

"අනුත් අම්මා වගේමයි; මෙහෙ නවතින්න අම්මා කැමැති කරගන්නත් අනු කැමැති කරගන්න බැහැ."

"මම අනු එක්ක කතා කරන්නද?"

"කතා කරන්න. නමුත් එයා එක්ක කතා කරන්න ගියොත් ඔය ගැන රංඩු වෙන්න සිදුවෙනවා."

"රංඩු උණත් මට ගහන්න එන එකක් නැහැ නෙව ද?"යි කියමින් පියල් සිනාසුණේ ය.

මංගලෝත්සවයෙන් සති තුනකට පමණ පසු කොළඹ ගිය පියල් ඇතැම් විට ගමට එන්නේ සතියකට වරකි; ඇතැම් විට දෙසතිය-කට වරකි; ක්‍රමයෙන් දියුණු වන වෙළඳාම උදෙසා තම කාලය

වඩාත් යෙදිය යුතු වූයෙන් පියල් කොළඹ පදිංචියට යාමට සිතුවේ ය. කලකට පෙර ඔහු කොළඹ මෝදර තනවන්ට ආරම්භ කළ ගෙයි වැඩ නිම කරන ලද්දේ විවාහයට දෙමසකට පමණ පෙරය. ඔහු ඒ ගෙය තනවන්ට පටන්ගත්තේ කුලියට දෙන පිණිස මිස තමන්ගේ පදිංචිය සඳහා ගන්නා අදහසින් නොවේ. දැන් නම් තමා සෑදවූ ඒ ගෙයින් ගත යුතු ප්‍රයෝජනය පියල්ට වැටහෙයි. නන්ද කැමැති වුව ද මව කොළඹ පදිංචියට යාමට කැමැති නොවන බව පියල් දනියි. එහෙත් නන්ද කැමැති වුව හොත් මව කෙසේ හරි කැමැති කරවා ගත හැකි ය.

තම මවත් අනුලාත් හැරදමා කොළඹ නැවතීම සඳහා යාමට නන්ද වඩාත් බිය වූයේ, පියල්ගේ මව ද ගම හැර නොයන බව දන්නා හෙයිනි. කොළඹ පදිංචියට යාමට අකැමැති වුව ද එහි ඇති විසිතුරු දේ, ඉංගිරිසින් මෙන් ජීවත්වන සිංහලයන්, විදුලි රිය, වරාය, දියකඩනය, කවුගෙය, යන ආදිය පිළිබඳ අපූරු තොරතුරු අසන ලද නන්දත් පියල්ගේ මවත් ආපසු ගමට එන අදහසින් ටික දවසක් කොළඹ නැවතීම සඳහා යාමට නම් ඉතා කැමැත්තෝය. ඔවුන් දෙනුන් සතියක් කොළඹ නවත්තාගෙන එහි විසිතුරු දේ පෙන්නීමෙන් ද එක් ඇනයක් උස්-පාත් කිරීමෙන් දල්වන්ටත් නිවන්ටත් පුළුවන් පහන් ඇති ගෙයක, සියලු සුව පහසුකම් ඇතිව වෙසෙන්ට සැලැස්වීමෙන් ද කොළඹ වාසයට ආශාවක් ඔවුන් තුළ හටගැන්විය හැකියයි පියල් සිතුවේ ය.

ඇඳුම් පැළඳුම් සඳහා නොමසුරුව වියදම් කරන ලද නමුදු මහගෙදර ගැහැනු අරපිරිමසා ගැනීමට නිතැතින්ම ලැබූ පුහුණුව ඇත්තෝ ය. මුහන්දිරම්ගේ මරණයෙන් පසු අගහිඟ වැඩිවීම නිසා අනුලා ද නන්ද ද මසුරු මල ඇත්තෝ වූහ. අගහිඟවලින් මිරිකෙමින් දුක සේ ජීවත් වුණු නන්ද සත පහක් සලකන්ට වූයේ රුපියල් පහ ලෙසිනි. අනුලාත් නන්දත් මවත් තමන්ගේ පණ නල රැක ගැනීමට ද කුස ගිනි නිවාගැනීමට ද වුවමනා ආහාර හැර අන් කිසි රස කැවිලි කෑමට ද පුරුදු නො වූහ. අගහිඟ වලින් තොර වූ පියල්ගේ ගෙදරට පැමිණි පසුත් නන්ද, තම ගෙදරදී මෑත කාලයෙහි පුරුදු කර ගත් ඇතැම් ඇබ්බැහිකම් නොහැරියා ය. මහගෙදර ගැහැනුන් ගෙදරදී හොඳින් ද ගමනක්-බිමනක් යන විට ඉතා විසිතුරු ලෙසින් ද අඳිනු පළඳිනු පමණක් දුටු පුරුදු පියල්ගේ මව වුව ද නන්ද මසුරු ගැහැනියක මෙන් අරපිරිමසන්ට පුරුදු වූ එකියකැයි සිහිනෙනුදු නොසිතුවා ය. මුහන්දිරම්ගේ මරණයෙන් පසු හිඟමනට බැසිය යුතු තරම් දිළිඳු වූ මහ ගෙදර ගැහැනුන් අරපිරිමසාගෙන ජීවත් වුණු හැටි ගෙදර මෙහෙකාරයෝ පවා හොඳින් නොදත්හ. එකල ද ඔවුන් ගෙයින් එළියට බැස්සේ පිල් විදහාගත් මොනරුන් ලෙසිනි. ගමේ අලුත් ධනවතුන්ගේ දූරියන්ටත් වඩා

Scanned by CamScanner

විසිතුරු ලෙස ඇඳ පැළඳගෙන ගෙයින් එළියට බසින ලද මහගෙදර ගැහැනුන් දක පුරුදු පියල්ගේ මව නන්දගේ මසුරුකම දැන පුදුම වූවා ය.

අල්පෙන්ති කටුවක් බිම තිබෙනු දුටුවොත් නන්ද එය අවුලා හැට්ට කරෙහි ගසා ගනියි; බිම වැටුණු ගිනිකූරක් දුටහොත් එය අවුලාගෙන බලයි; බලා, පත්තු නොකරන ලද එකක් නම් ගෙන ගොස් ගිනි පෙට්ටියෙහි දමයි. පියල් ගෙදර වියදමට දෙන මුදලින් තුනෙන් කොටසකුදු ඇ වියදම් නොකරයි. ඇ මාළු හෝ එළවළු හෝ වරකට ගන්නේ යන්තම් වේලට පිරිමැසෙන තරම් පමණි. හැම විට ම අඩුවෙන් පහන්වල තෙල් වත්කරන නන්ද, සාලයෙහි ලොකු ලාම්පුවෙහි පවා දෙදවසකට සරිලන තරම් භූමිතෙල් එකවර නුපුරවයි.

පෙර ඉතා විසිතුරු ලෙස ඇඳ-පැළඳගෙන ගමන් බිමන් ගිය නන්ද මසුරු ගැහැනියක සේ අරපරිස්සම් කරති යි පියල්ගේ මව කිසි විටක නොසිතුවා ය. නන්දගේ මේ ගතිගුණ වඩාත් හොඳින් දැනගත් පියල්ගේ මව වඩාත් සන්තෝෂ වූයේ තම පුතාගේ බිරිඳ තමා සිතුවාටත් වඩා දස ගුණයකින් හොඳ ගෘහිණියක බව ප්‍රත්‍යක්ෂ වූ හෙයිනි. නන්දගේ මේ ඇබ්බැහිකම් මසුරු සිතක ලකුණු නොවන බව පියල්ගේ මව නොදනියි. ඇට මේ අර පිරිමැසිල්ල පුරුදු වුණේ තම පියාගේ මරණයෙන් පසු නිතරම අගහිඟවලින් මිරිකෙමින් ජීවත් වුණු බැවිනි. ඇඳුමින් හා සිතින් ද නන්ද මහ ගෙදරදී ජීවත් වූයේ ධනවත් පවුලක කුල කතක ලෙස වුව ද ගේ දොර කටයුතු කෙළේ ඉතා ම දිළිඳු ගැහැනියක ලෙසිනි. ඔවුන් ක්‍රමයෙන් දිළිඳු වූයේ ආදායම අඩු වූ නිසා ම නොව අලුත් සිරිත්-විරිත් ගම්වල පැතිර යාමෙහි ප්‍රතිඵලයක් ද වශයෙනි. නගරයෙන් පැතිරෙන අලුත් සිරිත්-විරිත්වලටත් ඇඳුම්-පැළඳුම්වලටත් පළමුව ගොදුරු වන්නෝ ගම්වල ඉහළ පවුල්වල කුල කාන්තාවෝ ය. ඒ සිරිත්වලට ගොදුරු වීම නිසා ඔවුහු වැඩි වියදමට පුරුදු වෙති. වතුපිටිවලින් ලැබෙන ආදායම, චාම් ජීවිතයට ප්‍රමාණ වුවත් අලුත් සිරිත් නිසා කළ යුතු මේ වැඩි වියදමට ප්‍රමාණ නොවන හෙයින් ඔවුහු නොදැනම ටිකින් ටික දිළිඳු වෙති. පියල්ගේ මව තුළ නන්දට කලින් ඇති වුණු ආදරය ඇගේ පෙර නොදත් විරූ ගතිගුණ දැකීමෙන් දැඩි වී ය. එහෙත් ඒ ගතිගුණයෙනුත් කරුණාවෙනුත් වැසුණු නන්දගේ දැඩි සිත හා කුලමානය ද පියල්ගේ මව නොදත්තා ය.

ලයිසාගේ විවාහ මඟුලට එන ලෙස පුංචි අප්පු පියල්ගේ මවටත් පියල්ටත් නන්දටත් ආරාධනය කෙළේ ය. තම වෙළඳ කටයුතු හැර එදින නොපැමිණිය හැකි බව දුටු පියල්, නන්ද කැමැති නම් ඇත් සමඟ ලයිසාගේ මඟුල සඳහා යන ලෙස මවට ලියුවේ ය.

Scanned by CamScanner

මඟුල සඳහා තමා සමඟ යාමට යෝජනා කරන ලද්දේ පියල්ගේ මව විසින් යයි නන්ද සිතුවා ය.

"මට යන්න බැහැ"යි නන්ද කෙළින් ම තම නැන්දම්මාට කිවා ය

"පුංචිඅප්පු අපටත් නෑයො වෙනවා; අපේ හැම එකටම එනවා; නොගොහින් කොහොම ද?"

"එහෙනම් අම්මා යන්න. මට යන්න බැහැ ඕකුන් ගේ ගෙදරවලට—ලයිසයි ගෙදරට—අපි පුංචිකාලේවත් ගියේ නැහැ."

පියල්ගේ මව සිතාගෙන උන්නේ නන්දත් සමඟ මොටෝරි- යෙන් ලයිසාගේ මඟුලට යාමට ය. මහගෙදර සුන්දර කාන්තාවක වන නන්ද සමඟ මොටෝරියෙන් ගොස් ගමේ අනික් මිනිසුන්ට පෙනෙන සේ බැස මඟුල් ගෙදරට පිවිසීම ගැන පියල්ගේ මව සිතුවේ ගර්වයෙනි.

"පුංචි අප්පුලා 'උන් මුන්' නෙවි. දුප්පත් උණාට වැදගත් පරම්- පරාවක මිනිහෙක්"යි පියල්ගේ මව කීවේ මඳක් අසන්තෝෂයෙනි.

"පුංචිඅප්පු කවුරු උණත් ලයිසාගේ මංගල්ලෙට මම යන්නේ නැහැ."

"උන්ගෙ ගේ ලොකු මදි නිසා ද?"

"ලයිසාගෙ ගේ ලොකු උණත් පොඩි උණත් එකයි මට."

"මාතර හාමිනේ යන්නේ නැද්ද?"

"අම්මා යාවි සමහර විට."

"අම්මා යනවා නම් දූ නොයන්නේ ඇයි?" යි අසමින් පියල්ගේ මව සිනාසුණා ය.

"අම්මා යන හැම තැනටම දූලා යන්නේ නැති නිසා"යි නන්ද පිළිතුරු දුන්නේ සිනාසෙමිනි.

තම නැන්දම්මාට අලුත් ඇඳුම් පැළඳුම් ඇඳගැනීමට නන්ද උදව් කළා ය. නන්ද තම නැන්දම්මා මොටෝරථයෙහි නංවා "මම නාවාට අම්මා තරහ වෙන්න එපා"යි කියමින් ආ පසු ගෙට පිවිසියා ය.

පියල්ගේ මවත් මාතර හාමිනේත් තම මඟුලට පැමිණීම ගැන ලයිසා සන්තෝෂ වූවා ය. එහෙත් නන්දත් අනුලාත් නො- පැමිණීම ඇගේ ශෝකයට හේතුවූයේ ඔවුන් දෙදෙනා තම මඟුලට එති යි සිතාගෙන උන් බැවිනි.

"ලොකු නෝනා ආවේ නැද්ද?" යි ලයිසා මාතර හාමිනේගෙන් විචාළා ය.

Scanned by CamScanner

''ටිකක් සනීප නැති නිසා ආවේ නැහැ''යි මාතර හාමිනේ පිළිතුරු දුන්නා ය.

''පුංචි නෝනා එක්ක නාවේ මොකද''යි අනතුරුව ලයිසා පියල්ගේ මවගෙන් ඇසුවා ය.

''මහත්තයාට එන්න බැරි උණ නිසා වෙන්න ඇති නාවේ.''

''මම හිතාගෙන උන්නේ ඉස්කෝලේ මහත්තයා ඒවිය කියා.''

''සාප්පුවේ වැඩ නිසා එන්න විදියක් නැහැ යි ලියා එවා තිබුණා.''

අනුලාත් නන්දත් නාවේ කුල ගර්වය නිසායයි ලයිසා තොයිතුවා ය. ලයිසා අහර – දහර කාරියක වුව ද ඊර්ෂ්‍යා ක්‍රොධයෙන් තොර වූ ස්ත්‍රියකි. පෙර මෙන් මෙදින ද ඈ බලදස සමඟ කෙළි කවට තෙපුල් තෙපලා ය. බලදස සරදමක් කළ විට ඈ පෙරළා බලදසට සරදම් කොට සිනාසුණා ය.

''පුංචිනෝනා නාවේ ලයිසා එක්ක තරහ නිසා''යි බලදස කී ය.

''ඇයි! පුංචි නෝනාගේ මොනවා නොදී ගත්තාට ද මම එක්ක තරහ වෙන්නේ?''

බලදස වට පිට බලා කර බාගත්තේ නැසීගිය ජිනදසගේ සහෝදරිය අසල සිටි බැවිනි.

''තරහ නිසා නෙවි—ආඩම්බර කමට.''

ජිනදසගේ සහෝදරිය විසින් කියන ලද මේ වචන ඇසූ බලදස කිවේ ඇනුම් පදයකි.

''අපට වඩා හොඳින් නෑනා අඳුනන නිසා වෙන්න ඇති එහෙම කියන්නේ.''

''නෑනා අඳුනන නිසා තමයි එහෙම කිව්වේ.''

''අපට නම් ආඩම්බරයක් නැහැ.''

''ඒ ගොල්ල ආඩම්බර පෙන්නන්නේ පිරිමින්ට නෙවි, ගෑනුන්ට''යි කියමින් ජිනදසගේ සහෝදරිය සිනාසුණා ය.

''අපට දූනගන්ට නොලැබුණේ ඒක නිසා වෙන්න ඇති.

''පිරිමින්ට ආඩම්බර පෙන්නන්න ගියා නම් ඉස්කෝලේ මහත්තයා රවටගන්න පුළුවන?''

''ඉස්කෝලේ මහත්තයා රවටාගත්තා!''

''හිනා වෙලා කතා කරලා ඕනෑ ඉලන්දාරියෙක් රවටා ගන්න දන්නවා ඒ ගොල්ල''

''පුංචි නෝනා?''

''පුංචි දරිවි විතරක් නෙවි ලොකු දරිවිත් එහෙම තමයි.''

Scanned by CamScanner

"එහෙනම් ජිනදාස මහත්තයාත් අල්ලාගන්න ඇත්තේ එහෙම වෙන්න ඇති!"

"එයා නැති උණේ ඒ ගොල්ලයි ඉස්ටයිල් එක නිසා තමා".

"ඒකෙන් ජිනදාස මහත්තයා නැති උණේ කොහොමද?"

"එයාගේ ඉස්ටයිල්වලට වියදම් කෙරේ ජිනදාස. ඒ ගොල්ලන්න අහු උණ මිනිහෙක් ආයිත් බේරෙන්නේ නැහැ. කැමැති මිනිහෙක් වාලෙක් කරගන්න ඒ ගොල්ල සෙප්පඩි විජ්ජා දන්නවා."

බලදාසත් ලයිසාත් සිනාසුණාහ. ජිනදාසගේ සහෝදරිය නොනාවත්වා දෙවෙඩුවා ය.

"ජිනදාස ඒ ගොල්ලන්න විය කරලා දුක් විඳලා ඉස්පිරිතාලේ මැරුණා. මාස හයක් යන්නත් ඉස්සර සල්ලි තියෙන මිනිහෙක් අල්ලාගත්තා."

"වැරදි කාරයෝ අහුවෙන මිනිස්සු නෙවද?"

"මිනිස්සු මොනවා කරන්නද? ගෙදරට වත්පොහොසත්කම් ඇති ඉගෙනගත්තු ඉලන්දාරියෙක් ගියොත් ලජ්ජාවක් බයක් නැතිව අක්කයි නංගියි කතාවට යනවා. ඒ ඉලන්දාරියත් පිට ඔපේට රැවටෙනවා. ඒ ගොල්ලයි පිට ඔපේ නම් අඩු නැතිව තියෙනවා."

"පුංචි නෝනා ඉස්සෙල්ලා ඉස්කෝලේ මහත්තයාට කැමැති උණේ නැහැ නෙව ද?"

"ඒ බොරුවට: අගේ වැඩි කරගන්න. ඉස්සෙල්ලා කැමැති නොවී පස්සෙ කැමැති උණේ කොහොම ද? බොරු සෙප්පඩි විජ්ජා!"

"සෙප්පඩි විජ්ජාය කියන්නේ මොනවද?"

"බලදාස මහත්තයා නොතාරිස් ගෙදර නෝනාගේ කට අවුස්සන්නේ නැතුව නිකා ඉන්න. මාතර හාමිනේත් ඉස්කෝලේ මහත්තයාගේ අම්මාත් අන්න අරහෙ ඉන්නවා"යි කීවා ය.

"ඒ ගොල්ල හිටියට මට මොකොද? මම ඒ ගොල්ලන්න බය නම් ඕවා කියනවාය?"

"අපි එක්කත් තරහ වේවි."

"මම කියන ඒවාට තරහ වෙන්න ඕනෑ මම එක්කයි; වෙන කවුරුවත් එක්ක නෙවි. ඒ ගොල්ල තරහ වෙනවට බයේ ඇත්ත නොකියා ඇහැක. ඒ ගොල්ලන්න අහුවෙන මිනිහා නැති වෙනවා. ඒ ගොල්ලයි ඉස්ටයිල්වලට. ඉස්කෝලේ මහත්තයලයි ගෙදරට ගිය හැටියේ කාර් එක නැතිව ගමනක් යන්න බැරි උණා!"

"ගෙනැත් දෙන මිනිස්සු නෙවිද වැරදිකාරයෝ?"

Scanned by CamScanner

"ඕනෑ මිනිහෙක් රවටාගන්න ඒ ගොල්ල ඉගෙනගෙන තියෙනවා. ඒ ගොල්ල ඉගෙනගෙන තියෙන්නේ ඒවා තමයි. අම්මත් මහ ලොකුකම් හිතට අරගෙන දූලට අනුබල දෙනවා."

"මාතර හාමිනේට දෙස් කියන්නේ අපරාදේ!"යි ලයිසා කීවා ය.

"කොයි හාමිනේලත් මම අඳුනන නිසා තමයි දෙස් කියන්නේ. දූට ළමයා හම්බ වෙන්න හිටිද්දි ජිනදසට කියා කොයි තරම් වියදමක් කරා ද? දූලා කියන කියන විදියට නටන්න අම්මත් ලෑස්ති වෙලා ඉන්නවා. ළමයා ලැබෙන්න ඉස්සර වෙලා කොට්ට, ඇතිරිලි, පැනෙල් ඇඳුම්, ඉටි රෙදි, අලුත් කතුරු සහ තවත් කෙළවරක් නැති දේට වියදම් කෙරෙව්වා. ඒවා ලෑස්ති කර හින්ද තමයි ළමයා ඉපදිලා දවස් තුනෙන් හතරෙන් මැරුණේ! ළමයට පොඩ්ඩක් උණ ගත්තම ඕකට වෙදමහත්තයා ගෙන්නා සුළු වෙදකමක් කෙරෙව්වෙ නැතුව දොස්තර ගෙන්නුවා. දොස්තර එන්න කලින් ළමයා මැරුණා. ඒ ඔක්කොටම වියදම් කෙරේ ජිනදස"

"ගමේ ලොකු ගෙවල්වල දූන් කෙරෙන්නේ එහෙම නෙව"යි ලයිසා කීවා ය.

"ගමේ අනික් ගෙවල්වලට ඕවා පුරුදු කරන්නේත් ඔය ගොල්ල තමයි. ගාල්ලේ හරි මාතර හරි ඉන්න ඒ ගොල්ලයි නෑයෙකුගේ ගෙදරට ගොහින් දවස් කීපයක් නැවතිලා ඉඳලා ඔය අලුත් පන්න ඉගෙන ගන්නවා. ඉගෙනගෙන ඇවිත් මහ ලොකුවට ඒවා කරන්න යනවා. කනප්පයක් උඩ සුදු ඇතිරිල්ලක් එලා අලුත් කතුර ඒකේ උඩ තියා තිඋණා: මිනිස්සුන්ට පේන්න. වින්නඹු ගෑනිත් ඒක තියෙද්දි පරණ කතුර අරගෙන ළමයාගේ පෙකනිය කපා තියෙනවා. ඒ ගෑනි කර වැඩේ හොඳට හරි!"

"හරි වෙන්නේ කොහොමද? පරණ කතුරෙන් පෙකනිය කපන්ට ගොහින් පෙකනිය ඇදුණු නිසා ළමයාට උණ ගත්තායයි දොස්තර කියා තිඋණා නෙවෙද?"

"ලයිසාත් ඔය ගොල්ලන්ගේ බොරු විස්වාස කරනවා ද? ඕක ඒ ගොල්ලම දොස්තරගෙ කටට දීලා තියෙනවා. මීට ඉස්සර ළමයින්ගේ පෙකනිය කැපුවේ අලුත් කතුරුවලින් ද? වින්නඹු ගෑනිගෙන් ඇහුවම ඒ ගෑනි කියාවි. ඒ ගෑනිට ඔය ගොල්ලන්නෙ අලුත් පන්න පේන්න බැහැ."

"තරහ නොවී ඔය කතාව නවත්තන්න"යි කියමින් ලයිසා කාමරයෙන් පිට වී ගියා ය.

ලයිසාගේ පෙම්වතා උඩ රට වෙළඳ සැලක ලිපිකාරකම කරන කදිම තරුණයෙකි. ඔහු පළමු වර ලයිසාගේ ගෙදරට ගියේ පුංචිඅප්පු විසින් කලකට පෙර උකස් කරන ලද ඉඩම් කැබැල්ලක්

Scanned by CamScanner

සම්බන්ධයෙනි. ඇස්කොනින් බලන බැල්මත් කට කොනට නඟන සිනාවත් ලයිසා නිතැතින් ලැබූ අහරදහරවලින් දෙකකි. විපරැස් ඇත්තාගේ බැල්ම, අරමුණ හැර අනික් දෙසකට හැරෙන්නේ ඔහුගේ ඕනෑ කම නිසා නොවේ. ලයිසා හැම තරුණයකු දෙස ඇස් කොනින් බලන්නේ ඔහුගේ සිත් ගන්නා අදහසින් නොවේ. කවර තරුණයකුගේ වුව ද හද දූරු කරන ඒ බැල්ම ඈ නිතැතින් ලැබූවකි. කට කොනට නැඟෙන සිනාව ද නිතැතින්ම නැඟෙන්නකි. එසේ වුව ද නිතැතින් ලත් මේ දයාද දෙක නිසා ලයිසා අඳුනන්නන් ගෙන් සියේට අනූ දෙනෙක් පමණ ඈ නරක ගැහැනියක ලෙස සලකති. ඇගේ බැල්මට හසුවන තරුණයාද ඈ තමාට ඇල්ම කරතියි සිතා නැවත නැවත ඈ දැකීමට යන්නේ එහෙයිනි. මනමාලයා වන ලිපිකාර තරුණයාගේ සිත පළමුව ලයිසා කෙරෙහි ඇදුණේ ද මෙලෙසිනි. පළමු වර තම ගෙදරට පැමිණි විට ලයිසා ඔහු දෙස බැලුවේ අනික් කවර තරුණයකු දෙස වුව ද බලන්නාක් මෙනි. එහෙත් ඇගේ බැල්ම නිසා තරුණයා තුළ හටගත්තේ බලවත් හර්ෂයකි. ලයිසා වැනි රුවැති තරුණියක තමාට ආලය කරතියි යන අනුමානය නිසා ඔහුගේ හදවත මෙලෙක් වී ය. එතැන් පටන් උඩ රට සිට ගමට පැමිණි හැම විටම ඔහු ලයිසා බැලීමට ගියේ ය. ටික කලක් එසේ යාමෙන් පසු ඔවුනොවුන්ගේ හාදකම දියුණු වූයෙන්, ඔහු ලයිසාට ලියුම් ලියුවේ ය. දෙදෙන සුභ සරණ බන්ධනයට ඇතුළත් වන්නේ ක්‍රමයෙන් වැඩුණු ඒ හාදකමෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

ලයිසා මනමාලියකගේ වෙස් ගත්තේ, සුදු කබල් සැටින් ගවුමකින් සැරසී, කිලිටි සුදු මේස් දෙකකින් වසන ලද අත් දෙකින් එකකින් විජිනිපතක් ගැනීමෙනි. ඈ ඉතා අමාරුවෙන් දෙපා නහා ගමන් කෙළේ කුඩා සපත්තු දෙකක් තුළ වැර වැයමින් දෙපා ඔබා ගන්නා ලද බැවිනි. මනාලිය අස් රියවල නැඟී සහපිරිවරින් පිටත්ව ගොස් ටික වේලාවකින් මාතර හාමිනේ සහ පියල්ගේ මව ද මොටෝරියෙහි නැඟී විවාහ ලේකම්ගේ නිවෙස බලා ගියහ. ඔවුන් විවාහ ලේකම්ගේ නිවෙසට ළඟා වී මඳ වේලාවකින්, මනමාලියගේ ඉංගිරිසි වෙසට කැපෙන සේ වුවිධ රෙද්දකින් වැසුණු යටි කය ද කළු කබායකින් වැසුණු උඩු කය ද හිසින් ගත් කබල් තොප්පියක් ද ඇති මනමාලයා සහපිරිවරින් එහි ළඟා වී ය.

විවාහ ලේකම් විවාහය ලියා සහතික කළ පසු දෙගොල්ලම මනමාලයාගේ නිවෙස බලා ගමන් කළහ. එහි ළඟා වූ ඔවුන් අස්රියවලින් බැස්සේ, රතිඤ්ඤා පිපිරෙන හඬ අසමිනි. ගෙපිළට නැඟුණු මනමාලයා හා මනමාලිය ද පියවර මනින්නාක් මෙන් ගමන් කෙළේ කුඩා දූරියන් සිව් දෙනකුන් මියුරු සරින් ගයන ජය මඟුල් ගී අසමිනි. ඔවුන්ගේ ගී ගායනය අවසාන වන්ම

Scanned by CamScanner

මනමාලයා හා මනමාලියත් ඔවුන්ට හිමි කාමරය දෙරටුවට ළඟා වූහ. ඉක්බිති තලතුනා වියෙහි වූවෙක් ඔවුන් දෙදෙනාට සෙත් පතනු පිණිස හැල්ලක් කියන්ට වී ය. ගමේ පණ්ඩිතයකු මෙන් ප්‍රකට ඔහු ව්‍යක්ත ස්වරයෙන් ඒ හැල්ල කියා නිම කෙළේ 'පුරා' ය යි හඬ නගමිනි. කැත්තකින් පහර ලැබූ පොල් ගෙඩියක් 'පටස්' යන හඬ නගමින් දෙපළු වී ය. ඒ හඬ නික්මුණු දෙසට කර දික් කළ ස්ත්‍රීන්ගේත් පුරුෂයන්ගේත් සිනා එළියෙන් බැබළෙන මුහුණු දුටු කවුරුත්, පොල්පළු දෙක එකවර නැඟුණු දෙසඳ මඬලක් සේ, උඩුකුරුව සිටගත් බව දත්හ.

මනමාලයා ද මනමාලිය ද කාමරයට ඇතුළු වී මඳ වේලාවකින් යළිත් පිට වී සාලයෙහි වාඩි ගත්හ. ඔවුන් සාලයෙහි වාඩි ගත්තේ සැහැල්ල කී පණ්ඩිතයා, අසන්නවුන් සිත් මිරිකෙන මැඩෙන අවවාදයෙන් බර කොට කළ කථාව අසනු පිණිස ය. අඹුසැමියෝ මහත් බරක් කරට ගත්තන් දෙදෙනකු වැන්න. එකකු කර හැරියොත් දෙදෙනාටම එයින් වන්නේ මහ හානියකි. තලතුනා කපිකයා, රහල් හිමියන්ගේ කාව්‍යශෙඛරයෙහි කවි පෙළ ඇද බා ඒ අවවාද අකුරක් පාසා පිළිපැදිය යුතු යයි කී ය. බිරිඳ මහල්ලන් හැර අනික් පිරිමින් හා කතාබහ නොකළ යුතු ය යන අවවාදය ඇතුළත් කවිය පණ්ඩිතයා කියනු අසා සිටි බලදස යටැසින් බැලුවේ මනමාලිය දෙස ය. 'සිනා නොමසෙන් දසන් දක්වා'යි යන පද්‍ය පාදය ඇසූ ලයිසා පවා යටි සිතින් සිනාසෙන්ට ඇති යි බලදස සිතුවේ ය. ලයිසාගේ කට කොනට නැගෙන සිනාව, ඇගේ මුතු වැනි දත් කොන් දැක්වෙන සේ මහත් වන්නේ නිතැතිනි. ලයිසා වෑයම් කළත් එය මැඩිය නොහැකි බව පණ්ඩිතයා නොදනියි; බලදස දනියි.

මාතර හාමිනේ සිරිත් පරිදි මගුල් ගෙදර සියලු දෙනා ගෙන්ම වැඩි ගරු බුහුමන් ලැබුවා ය. ඈ සමග පැමිණි නිසා පියල්ගේ මව ද වෙන දාට වඩා ගරු බුහුමන් ලැබුවා ය. මාතර හාමිනේ හා පියල්ගේ මව ද මනමාලිය ඇරලනු පිණිස පැමිණි ගෑනු සිව් දෙනාගෙන් දෙදෙනෙකි. එහෙත් ඔවුන් රෑ බතට නොනැවතී නික්ම ගියේ මගුල් ගෙදර සමහර ගැහැනුන් අසන්තෝෂ කිරීමෙනි.

“මහගෙදර මිනිස්සු ඔහොම තමයි. සුළු තැන්වලින් කෑම කන්න වෙනවාට බොරුවක් කියා කලින් යනවා අර පරණ අහංකාරකම තාම තියෙනවා”යි මනමාලයාගේ කුඩම්මා කීවා ය.

“අපි කන්නේ එයාලයි කටින්ය! අර බොරු නෙව මාතර හාමිනේ කිව්වෙ. දූට අසනීපයක් නැහැ”යි කියමින් තවත් ගැහැනියක් මනමාලයාගේ කුඩම්මාට අනුබල දුන්නා ය.

Scanned by CamScanner

හොඳ හිතක් ඇති ලයිසා නම් වෙනද මෙන් සන්තෝෂයෙන් කතා කරමින් මාතර හාමිනේ ඊ ආහාර අනුභවයට නවත්වා ගැනීමට වෑයම් කළා ය.

"ලොකු නෝනත් එක්ක ආයිත් එන්න"යි ලයිසා මොටෝ-රියෙහි නැඟීමට ගිය මාතර හාමිනේට කීවා ය.

"පුංචි නෝනා ආවා නම් ලයිසා තවත් සන්තෝෂ වෙවි"යි මොටෝරියෙන් ගෙදර බලා නික්මුණු පියල්ගේ මව කීවා ය.

මාතර හාමිනේ කිසිවක් නොකී බැවිනි පියල්ගේ මව යළිත් මෙසේ කීයේ.

"මම අඬගැහුවා; පුංචිනෝනා බැරිය කිව්වා."

"එයාලා පුංචි කාලෙවත් කත්තිරිනාලාගේ ගෙදරට ගිහිල්ලා නැහැ"යි මාතර හාමිනේ කීවා ය.

"අනුලා මම මහුලේ යනවාටත් කැමැති නැහැ. නාන්දු නා එක හොඳයි. පුංචිඅප්පු කිව් කතාව ඇහුණේ නැද්ද?"

"නෑ, මට ඇහුණේ නැහැ."

"කරෝලිස්, පුංචිඅප්පුටත් ලයිසාටත් බැණලා පහස කියා ලියුම් එවා තියෙනවාය කිව්වා."

"ඇයි ඒ"

මාතර හාමිනේ, කලකට පෙර කරෝලිස් හා ලයිසා ද අතර ඇති විය යි කියන හාදකම පිළිබඳ තොරතුරු කීවා ය.

"එහෙනම් කරෝලිස් සිංහලේ ගියේ ඒ පටලැවිල්ල නිසා?"

"ඔව්; ගම උන්නොත් නරක් වෙන නිසා මුහන්දිරම් මහත්තයා කරෝලිස් බදුල්ලට පිටත් කරා."

"ලයිසා මේ මනමාලයා එක්කත් ලියුම් ගනු දෙනු කරාය කියා මඟුල් ගෙදරදී අද ගෑනු වගයක් කතා කරා."

"ලයිසා එහෙම තමා."

"බලදස මහත්තයා එක්කත් යාළුය කියා ගෑනු වගයක් කසුකුසු ගානවා මට ඇහුණා."

"බලදස ලයිසාගේ ගෙදරට නිකම් සෙල්ලමට යන්න එන්න ඇති. ලයිසා නෙවි වැරදිකාරි, ඇගේ අම්මා. ඒ ගෑනි ඉන්දෙද්දී ඉලන්දරි ආවා ම වාඩි කරවාගෙන කතා කරනවා. ලයිසාට පුරුදු උණෙත් ඒකෙන්."

"දවසක් ඊ බලදස මහත්තයා තනියම ජනේලේ ළඟ ලයිසා එක්ක කතා කර කර ඉන්නවා නන්දියෙස් ඔපිසර මහත්තයා දැකලා තියෙනවා."

"කවදාද කිව්වේ?"

"අද මඟුල් ගෙදරදී කසුකුසු ගෑ ගෑනු දෙන්නාගෙන් එක්කෙනෙක් වටපිට බලා ඒක කියනවා මට ඇහුණා."

මෙසේ කී පියල්ගේ මව මාතර හාමිනේගේ කට කණට ළං කළා ය.

"තිස්ස මහත්තයාගේ නමත් ඒ ගෑනු කියනවා මට ඇහුණා."

"බලදස එක්ක තිස්ස දෙතුන් දවසක් ලයිසාගේ ගෙදරට ගිහිල්ලා තියෙනවා. මම බැන්නට පස්සේ එයා ගියේ නැහැ."

"නන්දියෙස් ඔපිසරට අහුවෙලා තියෙන්නේ හදිසියේ."

"මඟුල් ගෙදර ගෑනු අද කර කථාවක් ද ඔය?"

"ඔව්"

"සමහර විට බොරු කතාවක් වෙන්න ඇති. අහළ පහළ ගෑනු ලයිසා එක්ක තරහයි. බොරු කතා හදා උන් පළ කරනවා. ඔය කියන දවසේ රෑ තිස්ස බලදස එන කල් පාරේ බරකරත්තයක් ඇතුළට වෙලා හිටියා නම් නන්දියෙස් ඔපිසර මට දැනුම් නොදී අරින්නේ නැහැ. මට එහෙම එකක් ඔපිසර කිව්වේ නැහැ. ලයිසාගේ වැරදි කියා මනමාලයාටත් බොරු ලියුම් ගණනාවක් ඇරලා තියෙනවා යයි පුංචි අප්පු දවසක් මා එක්ක කිව්වා."

මාතර හාමිනේ පියල්ගේ ගෙදරින් රෑ ආහාර අනුභව කොට මොටෝරියෙන් ම මහගෙදර බලා ගියා ය.

Scanned by CamScanner

# 16 වන පරිච්ඡේදය

ඔක්තෝබර් මාසයෙහි හටගත් වැසි සහිත මහ සුළඟින් ඉදිරුණු දෙල් ගස වැටීමෙන් මහ ගෙයි වම් පැත්තේ වහළ ද බිත්තියක් ද කඩා වැටිණ. කැඩුණු වහළ යන්තම් තනවා පොල් අතුවලින් වැස්වීමෙන් වැස්සෙන් ගෙයි ඇතුළත තෙමීම වළක්වන ලදී. මාතර හාමිනේත් අනුලාත් ගෙයි දකුණු පැත්තේ කාමරවල වාසය කරන්ට වූහ. එහෙත් සුළඟින් ගත් පොද වැස්ස, කැඩුණු බිත්තියෙහි මහ විවරයෙන් ඇතුළු වීමෙන් ගෙපිළ තෙමෙයි; බිත්තිය ද ටිකින් ටික සේදෙයි. කැඩුම් බිඳුම් හා වහළත් ප්‍රකෘතිමත් කරවීමට රුපියල් දෙතුන් දහසක් පමණ වියදම් කළ යුත්තේ දිරාගිය ඒ වහල අමුතුවෙන් නොතනවා ප්‍රකෘතිමත් කළ නොහැකි බැවිනි. රුපියල් පනහක් හැටක් පවා වියදම් නොකළ හැකි මාතර හාමිනේ, පියල්ගෙන් උදව් ඉල්ලීමට මැලි වූයේ කුල ගර්වය නිසා ය.

මේ වර මසකට පමණ පසු ගමට ආ පියල් පැත්තක් කඩා වැටුණු මහ ගෙය දැක පුදුම වූයේ තවමත් ප්‍රකෘතිමත් නොකරන ලද බැවිනි. අවුරුදු දෙසියක් පමණ පරණයයි කිව යුතු ඒ ගෙය ප්‍රකෘතිමත් කළ යුත්තේ විශාල වියදමකිනි. කැඩුණු බිත්තිය බන්දවා අලුත් වහළක් තනාවීමෙන් මහ ගෙය ප්‍රකෘතිමත් කරවීම රුපියල් දෙතුන් දහසකිනුදු නොකළ හැකි කාරියක් බව නුවණැති පියල් දනියි.

''නන්ද, ඇයි අම්මාටත් අනුලාටත් මෙහේ ඇවිත් ඉන්න නොකිව්වේ?''යි පියල් තම බිරිඳගෙන් ඇසුවේ ගෙය ප්‍රකෘතිමත් කරවීමට යන වියදම දන්නා බැවිනි.

''ඒ ගොල්ලන් එන්නේ නැහැ. ටිකක් දවස් මෙහේ ඇවිල්ලා ඉන්න යයි මම කිව්වා. දෙන්නම ඒකට ඇහුම් කන් දුන්නේ නැහැ.''

''ඇයි ටික දවසක්? හැම දම මෙහෙ ඉන්න බැරිය.''

''ටික දවසක් නවතින්නේ නැති මිනිස්සු හැමදම නවතින්න එවිය?''

''ගෙයි එක පැත්තක් කඩා වැටෙන්නත් පුළුවනි.''

''පැත්තක් කඩා වැටුණත් අම්මලා, ගේ ඇරලා වෙන කොහාටවත් යන එකක් නැහැ. අපිවත් වියදම් කරලා ගේ හදවලා දෙන්න ඕනෑ.''

''අම්මා කිව්වද එහෙම?''යි අසමින් පියල් සිනාසුණේ ය.

''අම්මා එහෙම කිව්වෙ නැහැ. කවදවත් එහෙම කියන එකකුත් නැහැ.''

"ගෙයි වහල සම්පූර්ණයෙන් හදවන්න ඕනෑ. රුපියල් දෙතුන් දහක් වියදම් නොකර ඒ වැඩේ කරවන්න පුළුවන් වෙන එකක් නැහැ."

'එච්චර වියදම් කරන්න ඕනෑ නෑ. ටිකක් වියදම් කරලා යන්තම් හැදෙව්වාම ඇති.

"එහෙම පිළියම් කරාම අවුරුද්දක් තියෙන්නේ නැහැ." කමක් නැහැ.පස්සේ ඒ ගොල්ලන්න ඕන විදියකට හදවා ගනීවි;දැනට යන්තම් හදවලා දෙන්න."

"මට නම් ඔය බොරු පිළියම කරවන්න බැහැ. හදනවානම් කලක් පවතින්න හදවන්න ඕනෑ."

"මට සල්ලි එවන්න; එතකොට මම හදවන්නම්."

පියල් කොළඹ ගොස් සතියකින් පමණ නන්දට රුපියල් පන්සීයක් එව්වේ ය. නන්ද මහ ගෙයි කඩා වැටුණු බිත්තිය බන්දවා, යන්තම් වහලට ද පිළියම් කරවා උළු සෙවිලි කෙරෙවුවා ය.

ප්‍රකෘතිමත් කරවන ලද නමුත් මහ ගෙය ක්‍රමයෙන් දිරාපත් වීම නොනැවතුණ බැවින් වැහි කාලයෙහි ඒ ගෙයි නොතෙමෙන තැනක් සොයා ගැනීම දුෂ්කර ය. කලින් අඩුවෙන් තෙමුණු පැත්ත දැන් වඩාත් තෙමෙයි. වැසි සුළං සහිත රැයක අවදි වුණු අනුලාත් මාතර හාමිනේත් ගෙපිළෙහි වඩාත් තෙමෙන තුන් තැනක පනිට්ටුවක් ද කොරහක් ද ලොකු හැලියක් ද තැබූහ. වහලෙහි එක් තැනක උළු අතරින් නොකැඩී වැටෙන වැසිදිය ගැනීමට තබන ලද පනිට්ටුව ටික වේලාවකින් පිරුණු විට, එය හිස් කොට යළිත් තැබිය යුතු ය. මහ වැස්ස නවතින තුරු අනුලාත් මාතර හාමිනේත්, වැඩකාරයෝත්, ගෙපිල නදියක්වනු වැළැක්වීම සඳහා බඳුන්වල පිරෙන වැහි වතුර හිස් කළහ. වැස්ස නැවතුණේ එළිය වැටෙන යාමය ළං වන්ට පෙර බැවින් මාතර හාමිනේත් අනුලාත් යළිත් නින්දට ගියහ. ඇඳන් දෙකෙහි වැතුරුණ නමුත් දෙදෙනාම උන්නේ අවදියෙනි. ගෙපිළෙහිත් අල්මාරි උඩත් ඉඳහිට වැටෙන දිය බිඳු නඟන හඬ අනුලාට ඇසෙයි. ඇඳෙහි වැතිර නොනිද උන් අනුලාට සිහි වූයේ අතීතය ය. මහ ගෙය මෙසේ දිරතියි තමන්ට මෙවැනි බහින කලාවක් ලබතියි අනුලා සිතුවේ ජිනදාසගේ මරණය ගැන ඇසූ දින සවස් කාලයෙහි ය. එදින ඇගේ සිතට නැඟුණු ශෝකාකූල හැඟීමත් සිතිවිලිත් යළිත් නැඟෙන්ට වී ය. තමන්ගේ බහින කලාව, මිය ගිය තම පියා දන්නේ ද? පියා දේවතාවකුව උපදින්ට ඇතැයි කියනු අනුලා අසා තිබේ. මාතර හාමිනේ ඇතැම් විටක එසේ කීවේ මුහන්දිරම් කයිසාරුවත්තේ දේවතාවකුව ඉපිද සිටිනු කත්තිරිනා විසින් අංජනම් එළියකදී දක්නා ලදැයි ඇ ජීවත්ව

Scanned by CamScanner

සිටියදී කී බැවිනි. පියා දේවතාවෙක් නම්, තමාටත් මටත් උපකාර නොකරන්නේ ද? ගෙය මෙසේ තෙමෙන්නට හැරියොත් තව අවුරුදු තුන හතරකින් කඩා වැටෙනු නිසැක ය.

සිතිවිලි දමෙහි පැටලී උන් අනුලාට නින්ද ගියේ ය. උදයේ කපුටුවන්ගේ හඬ අසා ඇඳෙන් නැඟී මිදුලට බැස්ස අනුලා දුටුවේ පෙර දිගින් නැඟෙන තරුණ රිවි මඬල ය; ඇසුවේ කපුටුවන්ගේ හඬ ය; කුරුල්ලන්ගේ මිහිරි නාදය රැයෙහි අනුලාගේ සිතට නැඟුණු ශොකාකුල සිතිවිලි ළහිරු රැසින් දුරු වුණු අඳුර මෙන් අතුරුදහන් වී ය. උදය ගේ දොර කටයුතු කළ අනුලාට රැයෙහි කළ කී කිසිවක් සිහි නොවූයෙන් ශොකාකුල සිතිවිලි ද ඇගේ සිතට නොනැංගේ ය.

උදය නවයට පමණ නන්දගේ නමින් මහගෙදරට ලැබුණු විදුලි පුවතක් නිසා අනුලා අන්දුන්–කුන්දුන් වූවා ය. 'නුඹේ ස්වාමියාට අමාරුයි'යි යනුවෙනි, අනුලා ඒ විදුලි පුවත මාතර හාමිනේට ඇසෙනසේ සිංහලයට නැඟුවේ. ඒ විදුලි පුවත රත්නපුරේ ඉස්පිරිතාලයෙහි දොස්තර මහතා විසින් එවන ලද්දක් බැවිනි අනුලාගේ හිස වඩාත් අවුල් වූයේ.

"පියල් දියතලාවට යන බවත් එහි කොන්තරාත්තුවක් ගැන වැඩ කරන්න තියෙන නිසා සුමාන තුන හතරක් නවතින්න විය හැකි බවත් පස්සේ ලැබුණු ලියුමේ ලියා තිඋණා ය යි නන්ද කිව්වා මතක නැද්ද?"යි මාතර හාමිනේ මතක් කළා ය.

"දියතලාව තියෙන්නේ වෙන පැත්තක අම්මා. රත්නපුරේ අනික් පැත්තේ."

"දියතලාවේ ඉඳලා පියල් රත්නපුරේට ගියා ද දන්නවා ය."

මොටෝරියක් ඇති පියල්ට දියතලාවෙන් රත්නපුරයට යාම අමාරු කාරියක් නොවන බව අනුලාට වැටහිණ.

මාතර හාමිනේ විදුලි පුවත රැගෙන සාදත් කැටුව පියල්ගේ ගෙදරට ගියා ය. විදුලි පුවත කියවූ නන්ද ඒ වේලේම රත්නපුරය බලා යාමට සිතුවා ය. වාතාබාධයකින් පෙළෙමින් ඇඳෙහි වැතිර කෙඳිරිගාමින් උන් පියල්ගේ මව ද නන්ද සමඟ යාමට තිරණය කරගත්තා ය.

"පියල් මීට ඉස්සරත් දෙසැරයක් පමණ රත්නපුරේට ගොහින් තියෙනවා. එක පාරක් ගියේ ඉංගිරිසි නෝනා කෙනෙකුට මැණික් ගල් වගයක් සොයන්න"යි ඇඳ පැළඳගෙන කොර ගසමින් එළියට පැමිණි පියල්ගේ මව කීවා ය.

"මට ලියා එවා තිඋණේ දියතලාවට යනවා ය කියා."

''පස්සෙ ඒ අදහස වෙනස් කරගෙන රත්නපුරේට ගියාද දන්නෙ කොහොම ද? මෙන්න මේක පරෙස්සමෙන් තියාගන්න''යි කියමින් පියල්ගේ මව රුපියල් දහයේ පහේ නෝට්ටු කොළ මිටි දෙකක් නන්දට දුන්නා ය.

''මම සල්ලි ගත්තා අම්මා. මොකට ද මෙච්චර සල්ලි ගෙනියන්නෙ?''

''ඔනෑකමක් උණොත් ආයිත් කාගෙන් ඉල්ල ගන්න ද? අම්මෙ!—අම්මෙ–උෘයි–''යි කියමින් පියල්ගේ මව තම කකුල බදගෙන පුටුවක වාඩි වූවා ය.

''අම්මාට අමාරු නම් නවතින්න. මම තනියම යන්නම්''යි කියමින් නන්ද නැන්දම්මාගේ කකුල අත ගෑවා ය.

නන්ද, බෑගයේ මුදල් දමාගෙන පියල්ගේ මවත් සමඟ ගොස් දොරටුව අසල නවත්වන ලද මෝටෝරියෙහි නැඟුණා ය.

''රත්නපුරේට ළඟා උණ හැටියේ ලෙඩාගේ සැප සනීප කියා වැලිගරම් එකක් එවාපන්''යි මාතර හාමිනේ නන්දට කීවා ය.

''හොඳයි අම්මා.''

කෙළින් ම පානදුරයට ගිය මෝටෝරිය එහිදි අතුරු පාරක් ඔස්සේ රත්නපුරය බලා ගමන් ගත්තේ ය. පානදුරෙන් නික්ම දෙපැයක් ගිය තැන මෝටෝරිය ගමන් කෙළේ උෂ්ණ කලාපයෙහි රටවලම වැවෙතියි කියන නියම වනයක් ද රබර් වතු ද මැදින් වැටුණු මාවතක ය. නදින් හා ඇළවල් ද වැස්ස ද නිසාම නොව ඇස්වටය තෙක් කකුල් එරවන තරම් පරණලින් ගහන රුප්පා ද නිසා ඒ පෙදෙස හැම දවසෙහි ම තෙතමනයෙන් යුක්ත වෙයි. දිරාපත් වන පරණලා නිසා රුප්පාවල පස කළු ය. කුඩා ගස් වසා හෙවුණු වැල්, ඒ ගස් මුදුන් ඉක්මවා වැඩී, යළිත් කිතුල් රැහැන් මෙන් විසිර එල්ලි වැටෙයි. ක්ෂිතිජය තෙක් පැතුරුණු මහ වනයෙන් වැසුණු කුඩා කඳු, චෛත්‍යයන්ගේ හැඩහුරුකම් දක්වෙන සේ කප්පාදු කරමින් වවන ලද මහ පඳුරු ලෙසිනි නන්දට පෙනුණේ.

රැහැයියන්ගේ නාදය, නියඟින් පීඩිත වනය නහන විලාපයක් සේ මෝටෝරියෙහි උන්නවුන්ට ඇසෙයි. ඒ විලාපය මැඩගෙන නැඟුණු හඬක් ඔවුන්ට ඇසුණේ කඳු දෙකක් අතරින් ගලා ඇවිත් බෝක්කුවක් යටින් ගොස් පල්ලමෙහි ගල් ගොඩක වැටෙන දිය දහරක් පසු කළ විට පමණි. හිරු රැස් කොතරම් දැඩි වුව ද පල්ලමෙහි වූ රුප්පා ද ලිය ගොමු ද තුළ වූ දැඩි අඳුර එතරම් තුනී නොවී ය. කැලයෙහි විශාල බකිනි ගසක අත්තක සිටි පුළුන්හොරකු මෝටෝරියෙහි නුපුරුදු හඬින් නැතිගෙන ඉගිළී, නගින බසින මාරියාවක් සේ ලෙලෙන සුදු පට රෙදි පටි වැනි පෙඳ පිහාටු දක්වමින් පියාඹා

Scanned by CamScanner

යනු දුටු පියල්ගේ මව 'පුංචි නෝනා අර බලන්න පුළුන්හොරාගෙ ලස්සණ'යි කියමින් අනික් පැත්ත බලාගෙන උන් නන්දට ද පෙන්නුවා ය. 'පුළුන්හොරා' 'ගිනිහොරා' යන නම් වලින් හැඳින් වෙන දික් වූ පෙඳ පිහාටු ඇති සුන්දර පක්ෂීහු, ගැමියන්ට කර්ම වාදයෙහි සත්‍ය ප්‍රත්‍යක්ෂ කර වන ජීවිහු ය. ඒ පක්ෂීන්ට ගැමියන් ඒ නම් ආරූඪ කෙළේ ද කර්ම වාදය විසින් මෙහෙයනු ලැබීමෙනි. පුළුන්හොරා පෙර–ජාතියෙහි රෙදිපිළි සොරකම් කළ මනුෂ්‍යයෙකි. ගිනිහොරා ගින්දර සොරකම් කළ මනුෂ්‍යයෙකි.

මේ වනය මැදින් ගමන් කළ මොටෝරියෙහි උන් නන්දගේ සිතට පමණක් නොව, පියල්ගේ මවගේ සිතට ද නඟින්ට වූයේ ශොකාකූල සිතිවිලි ය. හදිසියේ ජිනදාස මතක් වූයේ කුමක් නිසා දැ යි නන්දට නොවැටහෙයි.

"අපි පිටත්වෙද්දී ඉස්සරහට හම්බ උණේ හිස් කළයක් අරගෙන වතුර ගේන්න යන ගැහැනියෙක්" "අම්මේ! —ඌ!"යි කියමින් පියල්ගේ මව කෙඳිරි ගෑවා ය.

"අම්මගෙ කකුල අමාරු ද? ඒ ගැනි අපට හම්බ වෙන්න ඉස්සෙල්ලා හන්දියෙන් හැරිලා ගියා. අපට ඉස්සරහට හම්බ උනේ නන්දියස් ඔපිසර මහත්තයා"යි නන්ද කීවා ය.

"ඔපිසර හම්බ උන එකත් හොඳ නැහැ නෙව? මේ කකුලේ වේදනාව එන්න එන්න වැඩි වෙනවා; මොන කරුමයක් ද මං දන්නේ නැහැ. ස් ස්——"

"මොන බොරු ද අම්මා. නන්දියස් ඔපිසර හොඳ වාසනාවන්ත මිනිහා, කකුලෙ අමාරුවට ඉස්පිරිතාලේ දොස්තරගෙන් වත් බෙහෙත් ගන්නවා. වෙන මොනවා කරන්නද?"

නන්ද මෙසේ කතා කළ නමුත් ටිකින් ටික ඇගේ සිතට ද නැගෙන්නේ ශොකාකූල හැඟීම් ය. අසනීප වී නම් පියල් ගමට නැවිත් ඉස්පිරිතාලයට ඇතුළු විය යුත්තේ හදිසි අන්තරායකට භාජන වුව හොතිනි. පියල්ගේ මොටෝරථය පෙරළිණි ද? නොඑසේ නම් ඔහු කෝලාහලයකට හසුවී ද? ඔහු ඉස්පිරිතාලයට ඇතුළු වූයේ සතුරකු විසින් කරන ලද තුවාල නිසා ද? හවස හයට පමණ රථය රත්නපුරයට ළඟා වත් ම නන්දගේ සිතට මේ සිතිවිලි ද නැඟෙන්ට වී ය. රථය ඉස්පිරිතාලයෙහි දොරටුවට නුදුරින් තැනක නැවැත්වූයෙන් නන්ද දොර ඇරගෙන එළියට බැස්සා ය.

"අම්මාට ඇවිදින්න බැරි නිසා කාර් එකේ ම ඉන්න මම ඩ්‍රයිවර් එක්ක ගොහින් දොස්තර මහත්තයාගෙන් අහලා තොරතුරුත් ලෙඩා ඉන්න වාට්ටුවත් දැනගෙන එන්නම්"යි රියෙන් එළියට බැස්ස නන්ද කීවා ය.

"ඇවිදින්න අමාරු උණත් මම එනවා."

"එපා අම්මා, අම්මාගේ කකුලේ අමාරුවත් වේදනාවත් තවත් වැඩි වේවි. දෙස්තරගෙන් ලෙඩා ගැන තොරතුරුත් ලෙඩා ඉන්න වාට්ටුවත් සොයාගෙන මම එන්නම්."

"එහෙනම් ඉක්මනට එන්න ඕනෑ; සුනංගු වෙන්න එපා. ස්-ස්——අම්මේ! ඌයි——"

"ගිනි වතුරෙනුත් ඇතැම් බෙහෙත් කුඩුවලිනුත් නගින ගඳට ගැමියන් 'ඉස්පිරිතාල ගඳ ය'යි කියන්නේ කුමක් නිසාද යි ඉස්පිරිතාලයට ඇතුළු වුණු නන්දට වැටහිණ. ඉස්පිරිතාලයෙහි ගෙපිළෙන් හා අගුවෙන් ද නගින්නේ ගැමියන් 'ගිනිවතුර' නමින් හඳුන්වන ජෙයිස් වතුරෙන් නගින සුවඳ ය. ඉස්පිරිතාලය ඇතුළට ගිය නන්දට ගිනිවතුර ගඳ මැඩගෙන නගින බෙහෙත් ගඳ දැනෙයි. නගරයක කානුවලත් පාරවලත් කුණු වන ඉඳුලෙන් නගින දුගඳින් ද දූවිල්ලෙන් ද තොර වූ ගමෙහි ගස් කොළන් පිසගෙන හමන අලුත් වාතය අසා පුරුදු නන්දට, ඉස්පිරිතාල ගඳ රුචි නොවී ය. ඇ අත් බෑගය හැර සුවඳ කවන ලද ලේන්සුව ගෙන ගුළි කොට දෙතුන් වරක් නැහැයට ළං කොට උරා යළිත් බෑගය තුළ දැමුවා ය. ඉස්පිරිතාලයෙහි වාට්ටුවක ලෙඩකු නගන කෙඳිරිය ඇසූ නන්දගේ ගමන ඉක්මන් වී ය. සුදු රෙදි කඩින් වැසුණු ඇඟත් හිසත් ඇති සාත්තුකාරියක දුටු නන්ද ගමන සීන් කොට තමා ආ කාරිය ඇට දැන්නුවා ය. ඇ විසින් මෙහෙයන ලද සේවකයකු පෙන්වූ කන්තෝරු කාමරයට පිවිසි නන්ද දුටුවේ මේසය අසල පුටුවක, රබර් නලාවක් කරින් ගෙන වාඩි වී උන් කදිම තරුණයෙකි. 'දෙවැනි දෙස්තර මහත්මයා'යි හඳුන්වන ලද ඔහු, නන්ද දුටු කෙණෙහි පුටුවෙන් නැගී ඇට ආචාර කළේ ය. කදිම රූ සපුවක් ද කුල මානයෙන් තොර නොවූ බැල්මකින් එළිය වුණු දෙනෙතින් බැබළෙන මුහුණක් ද ඇති නන්ද දුටු කෙණෙහි ඔහු ආචාර කෙළේ නිතැතිනි. දෙස්තර පෙන්නූ අසුනෙහි වාඩිවුණු නන්ද, විදුලි පුවත ඔහු අතට දුන්නා ය. විදුලි පුවත කියවූ දෙස්තර විස්මයෙන් මෙන් දෙවරක් නන්දගේ මුහුණත් දෙවරක් විදුලි පුවතත් බැලී ය."

"මේ ලෙඩා නම් අද එකට විතර මැරුණා!"යි දෙස්තර කී ය. 'මේ ලෙඩා නම්'යි ඔහුට කියවුණේ ඔහු තුළ සැකයක් පහළ වූ බැවිනි.

"මැරුණා!"

මේ වචන කටින් පිට වන්ටත් පෙර නන්දට හැඩිණි. ඇ ඇලවීගෙන ගියෙන් දෙස්තර ද රියකරු ද වහා ළංව ඇ අල්ලා ගත්හ. දෙස්තර දැඩි ආශාවෙන් ඇගේ අත අල්ලා නාඩි බලා අනතුරුව රියකරුට මෙසේ කී ය.

Scanned by CamScanner

"මැරුණ ළෙඩා මේ නෝනා වාගේ කෙනෙකුගේ මහත්තයා වෙන්න බැහැ; හිඟන්නෙක් වගේ මිනිහෙක් මේ ටැලිග්රෑම් එක වැරදිලා ඇරපු එකක් වෙන්නත් බැරි නැහැ."

දොස්තරගේ කටින් පිට වුණු මේ වචන, ශොකයෙන් මුසපත්ව උන් නන්දට හොඳින් තේරුම් ගත නොහැකි වුව ද අඳුරු ගුහාවක් වැනි ඇගේ සිත එළිය කළ හැඟීමක් ඒ වචන නිසා පහළ ව සැණකින් අතුරුදහන් වී ය.

"මිනිය බලන්න ඕනෑ"යි කඳුළු පිසදමමින් පුටුවෙන් නැඟුණු නන්ද කිවා ය.

"ඩයිවර් ගොහින් බලලා එන කල් ඔබ වාඩි වෙලා ඉන්න. ක්ලාන්ත ගතිය මග ඇරුණාම ගොහින් බලන්න පුළුවනි."

"නෑ, දූන් මට අමාරුවක් නෑ—යන්න ඇහැකි."

ඉස්පිරිතාලයෙහි සේවකයකු සමඟ නන්ද ද රියකරු ද මිනීකාමරය බලා ගමන් කළහ.

"මම දුවලා හාමිනේත් එක්ක එන්නද?"යි රියකරු ඇසී ය.

"එපා"යි නන්ද සැර කළා ය. කවුදැයි හරියට බලාලා පස්සේ ගොහින් හාමිනේ එක්ක එනවා."

සේවකයා මිනී කාමරයෙහි දොර හැර ඉවතට වී තමා අතෙහි වූ පහන, කාමරයෙහි උස් කොට තනන ලද පිල් කඩ උඩ තිබුණු මළකඳන් දෙක දෙසට හැරෙවුවේ ය. ගෝනි දෙකක් තුළ දමන ලද කෙසෙල් කැන් දෙකක් සේ දළ රෙදි කඩ දෙකක ඔතන ලද මළකඳන් දෙකෙහි මුහුණු ද හිස් ද පහන් එළිය නිසා නන්දට පෙනිණ. එයින් එක මළකඳක, බුරුසුවක කළු අස්ව කෙඳි සිහි කරවන දළ රවුළකින් වැසුණු මුහුණ නන්ද වහා හැඳින ගත්තා ය. ඒ මළකඳ හැඳිනගත් ඇගේ දෙනෙතින් කඳුළු ගැලූ නමුත් ඈ තම හද තුළ වූ තියුණු වේදනාව හා කම්පනය ද දක්වෙන අනික් පිටත්තර ලකුණකුදු පහළ නොකොට බිත්තියට අත ගසා ගත්තා ය.

"දොස්තරට වැරදිලා—අපේ මහත්තයා කොළඹ නැති නම් දියතලාවේ සනීපෙන් ඇති"යි රියකරු සිනා සෙමින් කීවේ ය.

"ඔව් — අපි යං."

නන්ද තවත් වරක් මළ කඳෙහි මුහුණ බලා කරබා ගෙන දෙනෙනට නැඟුණ කඳුළු පිස දැමුවා ය. කඳුළු රැඳි දෙනෙත් ඇතිව එන නන්දගෙන් පියල්ගේ මව නොඉවසුම්ව මෙසේ විචාළා ය.

"ඇයි නන්ද අඬන්නේ? පියල්ට අමාරු ද?"

"නෑ අම්මා පියල් නෙවි—"

"එහෙනම් කවුද?"

"ජිනදස!"

"ජිනදස?"

"ඔව්—ජිනදස අද එකට මැරිලා තියෙනවා!"

"මොන ඇන්නෑවක්! ජිනදස මෙහේ කොයින් ද—මැරෙන්න?"

එදින රැය තානායමෙහි ගත කළ නන්දත් පියල්ගේ මවත් පසු ද උදය වරුවේ රියකරු යවා හොඳ මිනී පෙට්ටියක් ගෙන්වා ඉස්පිරිතාලයට යැවූහ. භික්ෂූන් හතර නමක් සොහොන් බිමට වඩම්මා මතක වස්ත්‍ර පුද ජිනදසගේ මළ කඳ වළ දැම්මීමෙන් පසු ඔවුහු කෙළින් ම ගම බලා පිටත් වූහ.

"පියල් ට මේ ගැන මොකුත් ලියන්න එපා"යි කෙඳිරි ගාමින් මොටෝරියෙහි අසුනෙහි වැතිරගත් පියල්ගේ මව කිවා ය.

"මමත් හිතාගත්තේ මොකුත් නොලියන්නයි; ආ දවසක කියනවා."

"ඔව්; එයා ආ දවසක කියන්න ඇහැකි. මට නම් මේ ඔක්කොම හීනයක් වගෙයි. ජිනදස බදුල්ලේ, ඉස්පිරිතාලේ මැරුණාය යි කරෝලිස් ලියා එව්වා නෙව ද?"

"ඔව් අම්මා; ඒ මිනිහා මහ මෝඩයෙක් වෙන්න ඕනෑ."

"කරෝලිස් ලියා තියෙන්නේ බොරු. ඒ මිනිහා ජිනදස මැරුණාය යි ලියා තියෙන්නේ බොරුවට."

"කවුදෝ කියාපු බොරුවක් ඒ යෝදයා අපට ලියා එවන්න ඇති."

"ඒ මිනිහාම ගොහින් ඉස්පිරිතාලෙන් දැනගත්තාය කියා නෙවද ලියා තිඋණේ?"

"ඔව්—කරෝලිස් හිතින් හදන්න ඇති ඒ ටික. කරෝලිස් ටිකක් මෝඩයි."

"ඉතින් ජිනදස රත්නපුරේ ඉස්පිරිතාලෙට ආවේ කොහොම ද? බිබිලේදී අසනීප උණා නම් එයා රත්නපුරේට ආවේ මොකට ද?"

"ජිනදස ඉස්පිරිතාලෙට ඇවිල්ලා තියෙන්නේ බිබිලේ ඉඳලා නෙවි. බිබිලේ වෙළඳාම ඇරලා එයා අතන මෙතන ඇවිදින්න ඇති. පස්සේ රස්සාවක් සොයාගෙන රත්නපුරේ පැත්තට ඇවිල්ලා තියෙනවා. අසනීප වෙන්න ඇත්තේ රත්නපුරේදී වෙන්න ඕනෑ."

"දෙස්තර මහත්තයා ටැලිගරාම් එවන්න පුංචිනෝනාගේ නම දන්නේ කොහොම ද?"

"ජිනදස කියන්න ඇති."

Scanned by CamScanner

''කාර්එක ඔච්චර හයියෙන් එලවන්න එපා''යි පියල්ගේ මව රියකරුට කීවා ය. ඔහු ගමන් වේගය ටිකක් අඩු කෙළේ ය.

''මේ කොහේද?''යි නන්ද ඇසුවා ය.

''තාම රත්නපුරේ පහු උණේ නැහැ.''

රත්නපුරය පසු කළ මොටෝරිය ගමන් කෙළේ දකුණු පැත්තේ රබර් වතු ද වනය ද වම් පැත්තේ නො පැසුණු ගොයම් අතරින් ගලා යන ගඟක් ද ඇති පාරක ය. ඇතැම් රබර් වත්තක ඉතා සරුව වැවුණු ගොටු කොළවලින් වැසුණු රූප්පා, සුන්දර දැක්මක් වී ය. වනයෙන් හෙවුණු කුඩා කඳු දෙකක් එක්වන තැනින් ගලන දිය දහරක් මහ පාර අයිනේ වළක වැටී බෝක්කුවෙන් ගලා ගොස් අනික් පැත්තේ ගඟට එක්වෙයි. උඩ රට රමණීය දිය ඇල්ලක් නුදුටු විරූ නන්දත් පියල්ගේ මවත් ඇතැම් දිය දහරක් අසල රථය නවත්වා මඳ වේලාවක් ඒ දෙස බලා සිටීමෙන් පසුය යළිත් රථය පැදවීමට අණ කෙළේ.

ඇතැම් වංගුවකදී රථය ගමන්කළේ පාර අද්දරින්ම අඩි-දෙළහක් පමණ නැඟී පැතුරුණු ලොකු ගලක් අසලිනි. ගල කෙළවර වුණු තැනින් නැඟුණේ වනයෙන් හෙවුණු මුදුන් ඇති වඩා විශාල නොවූ කන්දකි. වම් පැත්තේ නිම්නයෙහි හෙමින් බසින නදියට වමෙහි කුඹුරු අද්දරින් නැඟුණු කඳු ගැට වසාගෙන ක්ෂිතිජය තෙක් පැතුරුණු වනය සුදු පැල්ලම් සහිත මහ නිල් වියනක් වැනි අහස් තලයෙන් ලැබූ සෙවණ නිසා නිලට හුරු කොළ පැහැයකින් පෙනිණ. නදියෙහි ඇතැම් තැනක බොක්කක ගල් තුප වටා එක් වුණු කුඩා ගල් ගොඩවල් දකින්නට ලැබේ. ගල් ගොඩවල සමහර කැට, බිජු වටෙහි හැඩහුරුකම් ඇත්තේ ය. සමහරක් පන්දු ද සමහරක් බට්ටන් ද වැන්න. ඔප මට්ටම් කිරීමෙන් තොරසැඩි ගල් පතුරු වලට මේ හැඩහුරුකම් දෙන ලද්දේ කවුරුන් විසින් ද? කුඩා දරුවන්ගේ කල්පනාවට හුරු කල්පනාව ඇති ගැමියන්, නිතර ගලා බසින ගං ඉවුරුවල සුලභ මෙවැනි කැට බලා නිපදවූ අපූරු කතා සුලභ ය. ඇතැම් කැට දෙවියන්ගෙන් වර ලැබූ පැරණි රජකු විසින් දියෙහි දමන ලද අග්ගලා ය. ඔප මට්ටම් ඇති ඇතැම් කැට ඔහුගේ බිසෝවරුන් ඇඟ උලන්ට ගත් ගල් පතුරු ය. කදුරු ගෙඩියෙහි හැඩහුරුකම ඇති ගල්, පෙර යක් දරුවන් කෙළියට ගත් පන්දු ය.

මොටෝරියෙහි සිටියවුන් හොරණට ලඟා වන තෙක් ගම්මාන-යක් පසු කෙළේ කලාතුරකිනි. පැල් පතක් ඉදිරියෙහි වූ මිදුලක කෙළිසෙල්ලම් කළ සෙළු ගැමි දරුවන් දුටු නන්ද ද පියල්ගේ මව ද පුදුම නොවූහ. තමන්ගේ ගමෙහි දිළිඳු ගැමි පවුල්වල හත් අට හැවිරිදි වයස් වන දරුවන් පවා විළි වසාගැනීමට කමිස

Scanned by CamScanner

හෝ රෙදි කඩ හෝ අඳින්නේ ගෙවලින් පිටව මහට බසින විට පමණකි යි ඔවුන් දන්නා බැවිනි. පාණදුරයට ළඟා වූ විට ඔවුන් දුටුවේ අලුත් පන්නයේ විසාල ගෙවලින් යුතු වැඩි ජනගහනයක් ඇති නගරයකි. පාණදුරයෙහිදී ඇතැම් ගෙයක් දුටු නන්දට මතක් වූයේ පියල් විසින් තනවන ලද ගෙය ය. එය පාණදුරයෙහි දී දුටු ඇතැම් අලුත් ගෙයකට, වහල, කවුළු කැටයම් ලෑලි යනාදීන් විසින් සමාන ය.

"පාණදුරය පසු කොට කළුතරට ළඟා වූ නන්දගේත් ඇගේ නැන්දම්මාගේත් සිත් ගත්තේ ගඟත් පාලමත් යන දෙක ය. මුහුද හා නදිය ද ඔවුන්ට පුරුදු දකුම් වුවත් විශාල පාලම හා ගඟ ද නුපුරුදු දකුම් ය. කළුතර දී දුටු ඇතැම් පැරණි ගෙයක් නන්දට සිහිකෙළේ තම මවුපියන්ගේ පැරණි ගේය. ඇතැම් විශාල පැරණි ගෙයක්, හැඩහුරුකම් විසින් ද හැඩිදැඩි බිත්ති, කණු, උළුවහු, කවුළු යනාදිය විසින්ද කයිසාරුවත්තේ පරම්පරාවට හිමි ගෙයට සමාන ය."

අලුත්ගම පසු කොට ඔවුන් ගාල්ලට ළඟා වූයේ හවස්වරුවේ ය. ගාල්ලෙන් පිටත් වූ තැන් පටන් නන්දගේ නැන්දම්මා කෙඳිරි ගාන්ට වූවා ය. කකුලේ වේදනාව ඇට වඩාත් දැනෙන්ට වූයේ ගෙදර ගැන සිතන්ට වූ බැවිනි. ගමනින් වෙහෙසව උන් ඇ ගෙදරට ළඟාවත්ම සිතන්ට වූයේ ඇඳක වැටී කකුලේ තෙල් ගාවාගෙන විඩා හැරීම ගැන ය.

"අනේ පුංචිනෝනා, මගේ කකුලේ අමාරුව වැඩියි උහුලන්න බැහැ——ස් ස් ——!" කියමින් රියෙන් බැස්ස පියල්ගේ මව ගෙට ඇතුළු වූවා ය.

"මේ ගමන නිසා අම්මාගේ ලෙඩේත් අමාරු උණා"යි කියමින් නන්ද තම නැන්දම්මාගේ ඇඟට අත ගසා ගෙන කාමරයට ගියා ය.

"අම්මාට අමාරු නම් දොස්තරවත් ගෙන්නන්නද?"

"එපා; වීරසිරි වෙද මහත්තයාට පණිවිඩයක් යවා එන කල් මගේ කකුලේ තෙල් ටිකක් ගාලා අතගාන්න."

නන්ද තම මව ද අනුලා ද කැඳවාගෙන ඒමට රියකරු මහගෙදරට යවා 'වාත විද්‍රංගය' නමැති ලේබලය සහිත තෙල් බෝතලයක් ගෙනැවිත් එයින් ටිකක් ගෙන තම නැන්දම්මාගේ කකුලෙහි ගා අතගෑවා ය.

"දැන් ඉතින් රත්නපුරේදී කළ කී ඒවා මතක නැති කරන්න ඕනෑ. පියල්ට මොකුත් ලියන්න එපා; ආ දවසක කියන්න පුළුවනි. දැන් අම්මලා අක්කලා ආවමත් කියන්න හොඳයි, පිට කාටවත් ජිනදාසගේ මරණය ගැන මොකුත් කියන්න එපයි කියා."

Scanned by CamScanner

''ඔව් අම්මා; මාත් එහෙම තමයි හිතාගත්තේ; මට මතක නැති කරන්න බැරි එකම එක කාරණය''යි නන්ද කනගාටුවෙන් කීවා ය.

''ඒ මොකක් ද?''

''මිනිකාමරේදි දුටු ජිනදාසගේ මළ කඳ රැවුල වැඩිලා ඇස් යට ගිහිල්ලා තිබුණා. මුහුණ දුටු හැටියේ මට කලන්තෙ හැදුණා. යන්තම් බිච්චියට අත ගහගෙන නොවැටී බේරුණා. තවත් මළකඳක් අද්දර ජිනදාසගේ මළකඳ තිබුණේ ගොරෝසු බැලැන්-කෝට්ටුවක දවටලා. රෑ තානායමේ නිදාගන්න ගිය විටත් මට මතක් උණේ ජිනදාසගේ මළ කඳයි. එද්දිත් ඒකයි මට මතක් උණේ; දැනුත් ඒක මතක් වෙනවා.''

''ඒක මතක් කරන්න එපා. හිතින් ඉවත් කරන්න. පුංචි නෝනා මොනව කරන්නද එයාගේ කාලකණ්ණි කමට? ඉස්පිරි-තාලේ මැරෙන්න ගියාම කාට උණත් ඔහොම තමයි.''

රත්නපුරයට ගිය ගමනත් ජිනදාසගේ මරණයත් නන්දට නම් සිහිනයක් සේ සලකා අමතක කළ නොහැකි අත්දැකීම ය. පියල් සමග විවාහ වූයේ තම පරණ සැමියා වන ජිනදාස ජීවත්ව සිටිය දී ය. තම සැමියා ජීවත්ව සිටියදී තවත් එකකුගේ බිරිඳ වීම කුල සිරිත් දූෂණයකි. නන්දගේ සිතට වධයක් වූයේ නීතිය පිළිබඳ පැනය නොව කුල සිරිත් දූෂණය පිළිබඳ පැනය වේ. තම මවු–පියන් ගැන සිතන විට දුන් ඇගේ සිතට නැඟෙන්නේ කෝපයකි. පියල් ගැන සිතන විට ද ඇගේ සිතට නැඟෙන්නේ කෝපයකි. නන්ද කුල සිරිත් සැලකුවේ බොරු උඩඟුකමකින් නොවේ. ගම්බද ඉහළ පවුල්වල දූරියන් නිතැතින් ලබන ශික්ෂණයක් වූ කුල ගර්වය ඇතැම් විට අහංකාර කමක් වන්නේ, ධනවත් කමින් දියුණු වුණු පරණ පවුලක කතුන් අතර පමණකි. එහෙත් පුදුමය නම්, ධනවත් කමට එක්වුණු කුල ගර්වය ද අහංකාර කම ද ඇති පරණ ඉහළ පවුලක කාන්තාවන්ට දෙස් නඟන්නන් ගමෙහි දුර්ලභ වීමයි. බොහෝ විට මැද පන්තියේ ගැමියන්ගේ ඇනුම්පදවලට ඉලක්ක වන්නෝ කුල ගර්වයට එක් වුණ දිළිඳුකම ඇති කාන්තාවෝ ය. එසේ වුව ද එවැන්නෝ නම් දිළිඳු ගැමියන්ගේ ගරු බුහුමනට වඩාත් පාත්‍ර වෙති. මැද පන්තියෙහි ගැමියන් කුල ගර්වය නොහ-රින දිළිඳු පවුල්වල කතුන්ට ඇනුම්පද කියන්නේ කුමක් නිසාදැයි වටහා ගැනීම දුෂ්කර නොවේ. ගමෙහි මැද පන්තියෙහි වූ උගත් තරුණයකු බිරිඳක් පැතිය යුත්තේ ධනයෙන් පිරිහුණු උසස් කුල ගෙයකින් පමණි. ධනයෙන් ද කුලයෙන් ද යන දෙකින් එකසේ උසස් පවුලකින් නොවේ. ධනයෙන් පිරිහුණු කුල ගෙවල තරුණි-යන් කුල ගර්වය නිසා මැද පන්තියේ ගැමියන් නොතකන කල ඒ ගැමියන් තුළ ඊෂ්‍යාවක් හටගැනීම පුදුමයක් ද?

Scanned by CamScanner

ජිනදාස තමාට දැක්වූ ආදරයත් සැලකිල්ලත්, ගෞරවයත් නන්දට සිහි වී ය. එතරම් ආදරයක් සැලකිල්ලක් දක්වන ලද ජිනදාසට පෙරළා සැලකිල්ලක් දැක්වීමට නොහැකිවීම නිසා ඇගේ හද තුළ හටගත්තේ බලවත් වේදනාවකි. තමාට වුවමනා රෙදිපිළි සැපයීමට අතමිට හිඟ වූ ඇතැම් අවස්ථාවක, ජිනදාස ඒ වග සැල කෙළේ කඳුළෙන් තෙත් වුණු දෙනෙත් ඇතිව ය. එතරම් ආදරය-කින් තමාට සැලකූ ජිනදාසට බෙහෙත් හැන්දක් පොවා, මුදු මොළොක් බසින් ඔහු සැනසිය නොහැකි වූ නන්ද වඩාත් ශෝක වූවා ය.

ජිනදාසගේ මරණය ගැන නන්දත් පියල්ගේ මවත් කී පුවත් අසාගෙන උන් මාතර හාමිනේගේ දෙනෙතට කඳුළු නැංගේ ය. අනුලා තුළ හටගත්තේ ශොකයට වැඩි කෝපයකි. වෙළඳාමෙන් අලාභ වී නම් ජිනදාස තැනින් තැන නොඇවිද ගමට නොපැමිණියේ කුමක් නිසා ද? ජිනදාස එසේ කෙළේ මහගෙදර පවුලට නින්ද කරන අදහසින් නොවේ ද? ජිනදාසගේ සහෝදරිය ද සමහර විට ඔහුට අනුබල දෙන්ට ඇත. ඔහුගේ සහෝදරිය, නන්ද ද, තමා ද කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් මඬනා ලද සිත් ඇත්තියකියි අනුලා සිතුවා ය. ජිනදාසගේ මරණය පිළිබඳ මේ පුවත දැනගත් විට ඔහුගේ සහෝ-දරිය මහගෙදර පවුලට නින්ද කරනු පිණිස බොරු ගොතා පළ කරයි. 'කලින් ජිනදාස මළේ යයි පහළ කෙළේ පියල්ට නන්ද විවාහ කරදෙන අටියෙනි. කරෝලිස් විසින් ලියා එවන ලද්දක් නොව, ඒ පුවත මහගෙදර ගෑනුන් විසින්ම පතළ කරන ලද බොරු-වකි.' අනුලාගේ සිතට ශෝකය නොව කෝපය නැංගේ ඇ මෙසේ සිතන්ට වූ බැවිනි.

කිසිවකු සැක නොකරම මාතර හාමිනේ නම් ජිනදාසගේ මරණය ඇසූ විගස ශොක වූවා ය. ඔහු දුක් විඳ ඉස්පිරිතාලයෙහි මියයාම ගැන තමාත් නන්දත් දෙස් ලැබිය යුතු ය යන හැඟීම මාතර හාමිනේගේ සිතට නැංගේ ය. 'ගමට එන්න' යයි තම බෑනාට මාතර හාමිනේ කිසි විටක නොලිවා ය. තමා එසේ ලිවා නම් ජිනදාස ගමට එන්නේ ය. ජිනදාස ගමට නාවේ තමාගෙන් එවැනි ලියුමක් නොලැබුණු නිසා නොවිය හැකි ද? මේ සිතිවිලි වලින් පීඩා කරනු ලැබූ මාතර හාමිනේට තම සිත සනසා ගැනීමට වහල් වූයේ කර්ම වාදයයි. කවර ආපදාවකදී වුව ද ශෝක වන ගැමියකුගේ හෝ ගැමි ගැහැනියකගේ හෝ සිතට නඟින 'ඒ ආප-දාවට හේතුව පෙර කළ කර්මයක්ය' යන හැඟීම ද නැඟෙයි. ජින-දාස ඉස්පිරිතාලයෙහි මළේ ඔහු පෙර කළ කර්මයක් නිසා යයි සිතීමෙනි, මාතර හාමිනේ තම සිත සනසාගත්තේ.

Scanned by CamScanner

''එයාගේ කරුමෙට අපි මොනවා කරන්නද?''යි මාතර හාමිනේ කීවේ, පියල්ගේ මවත් නන්දත් ජිනදාසගේ මරණය අරබයා කී තොරතුරු ඇසීමෙන් පසු ය.

''කරුමෙ නෙවි—මම කියන්නේ කාලකණ්ණි කමය කියා''යි පියල්ගේ මව කීවා ය. එසේ කියනු ඇසීම නන්දගේ සන්තෝෂයට හේතු නොවී ය.

''කරුමෙත් නෙවි, කාලකණ්ණි කමත් නෙවි, මෝඩකම''යි අනුලා කීවේ පියල්ගේ මවට ඇනුම්පද නොකිය හැකි බැවිනි.

''අපි ළඟ වැඩ කරන්න හිටි මිනිහෙකුට වත් ලෙඩකදී දුකකදී නොසලකා හැරියේ නැහැ. ජිනදාසට ගමට එන්න නොහිතුණේ කරුමෙටම'' යි මාතර හාමිනේ කීවා ය.

පියල්ගේ මව ජිනදාටස 'කාලකණ්ණියා' ය කීවේ සිතාමතා නොවේ. තමාගේ කටින් පිට වූ ඒ වචන නන්දගේ හෝ මාතර හාමිනේගේ හෝ සන්තෝෂයට හේතු විය නොහැකි බව පියල්ගේ මවට වැටහිණ. ඈ යළිත් මෙසේ කීවා ය.

''මාතර හාමිනේගේ කීම ඇත්ත. එයාට මාතර හාමිනේලයි ගෙදරට එන්ට නොහිතුණේ කරුමෙට. ආවා නම් කදිමට ලෙඩේත් හොඳ කරගෙන ආයිත් වෙළඳාමක් කරන්න තිබුණා. ජිනදාස පැල්මඩුල්ලෙන් ඈත ගමක තේ වතුර කඩේක පඩියට තේවතුර ගහන්ට ඉඳලා තියෙනවා. එයා තැනින් තැන ඇවිදලා තියෙන්නේ සූදුවට පුරුදු උණ නිසා. පුංචිනෝනාත් මමත් රත්නපුරේදි සොයන කොට ඔය තොරතුරු දැනගන්න ලැබුණා. පුංචි නෝනා නම් තොරතුරු සොයන්න කැමැති උණේ නැහැ.''

''සූදුවට වැටුණු බව නම් කලින් අපටත් දැනගන්න ලැබුණා. බිබිලේ මිනිහෙකුගෙන්.''

''කරෝලිස්ගෙන් ද?''

''නැහැ, ඒ යෝදයාගෙන් නෙවි. ඒ යෝදයා ජිනදාස මැරුණාය කියා දන්වන්නත් ඉස්සරයි ඒක අහන්න ලැබුණේ.''

''සිංහලේ ගිහිල්ලා සූදුවට වැටුණු මිනිහෙක් කොහේ ද ආයිත් ගම – රටට එන්නේ.''

''ජිනදාස කසාද බඳින්න ඉස්සරත් කිසිම රක්ෂාවක් කරන්නේ නැතිව උන්නා. ඒ කාලෙත් එයා සූදුවට ගියා. නමුත් අපට හරියට දැනගන්න බැරිවුණා!''යි අනුලා කීවා ය.

''ඔව්'' යි මාතර හාමිනේ අනුලාට අනුබල දුන්නා ය. ''ජේමිස් ගෙන් ඇහුවාම ''මොන බොරුද හාමිනේ–අවුරුද්ද දවස් දෙක

Scanned by CamScanner

තුනේ ජිනදාස මහත්තයා කඩදාසි කුට්ටමේ සෙල්ලම් කරනවා. ඕක සුදුවක් ද? කවද අවුරුද්ද දවස්වල සෙල්ලම් නොකරන්නේ, කියා කිව්වා.''

හද තුළ පහළ වන ආත්මාලෝකය නිසා පැනෙන තමාගේ දෙස්, නිදෙස් කරනු සඳහා ආගම පිළිබඳ උගැන්ම වහල් කොට ගැනීම නන්දට නුහුරු ය. එහෙයින් ජිනදාස දුක් විඳ ඉස්පිරිතාල-යෙහි හිඟන්නකු ලෙස මැරුණේ ඔහුගේ පෙර කරුමයකින්ය යන හැඟුමක් නන්දගේ සිතට නොනැංගේ ය. ජිනදාස දුක් පීඩා වින්දේ ඔහුගේත් සමාජයේත් නන්දගේත් වැරදි නිසා ය. අන් හැම දෙනාටම වඩා වැරදි කාරයෝ නන්දගේ මවුපියෝ නොවෙත් ද? පියල් පළමුව කළ යෝජනාව නන්ද නොසැලකුවේ, ඇගේ මවු-පියන් නිසා ය. මවු-පියන් ඒ යෝජනාව නොසැලකුවේ පියල්ගේ සීයා එලවළු කද කරින් ගෙන වෙළඳාම් කිරීමෙන් ජීවත් වූවකු බැවිනි. කුල සිරිත් හා කුල මානය ද දැඩිව ගත් මවු-පියන් නිසා නොවේ නම් නන්ද පළමු විවාහ වන්නේ පියල් සමඟ ය. එවිට ජිනදාස විපතට පත් නොවෙයි; නන්ද ද සැමියකු සිටියදී තවත් එකකු සැමියා කොටගත් කුල ධර්ම දූෂිකාවක් නොවන්නී ය.

නන්ද මවු-පියන්ගේ මතය පිළිගැනීමෙන් කර නොබා පියල් ම පතන ලද්දේ නම් යට කියන ලද විපත් නූපන් දරුවන් වැන්නෝ ය. එහෙයින් නන්ද වැරදි කාරියක් නොවන්නී ද? නන්ද මවු-පියන්ට අකීකරු වී නම් එය කෙළවර වන්නේ කුමන ආපදාවන්ගෙන් ද? එසේ නම් වැරදි පැටවිය යුත්තේ කවුරුන් පිට ද? කර්මය පිට ද? සමාජය පිට ද? මනුෂ්‍ය ස්වභාවය පිට ද? මේ සියලු අනයව්‍ය-සනයෝ ලෝක ධර්මය නොතකා මනුෂ්‍යයන් විසින් නඟාගන්නා ලද ධර්ම සූත්‍ර තුළ ලෝකය දමන්ට වෑයම් කිරීමෙහි ප්‍රතිඵල ද?

තර්කය නමැති වලාහක අශ්වයා පිට නැඟීමට වෑයම් නොකළ නන්ද, දෙස් නැගුවේ තම මවු-පියන්ට ය; තමාට ය.

නන්ද, රත්නපුරයට ගොස් ආපසු පැමිණ දෙදවසකින් පියල් ද ගමට පැමිණියේ ය. අවුල් වුණු හිසක් ඇතිව ගමට පැමිණි පියල්ගේ සිත ජිනදාස පිළිබඳ පුවත නන්දගෙන් හා මවගෙන් ද ඇසීමෙන් සැහැල්ලු වී ය. ජිනදාස රත්නපුරයෙන් මයිල දහහතරක් පමණ ඈත පිහිටි නියම්ගමක තේවතුර කඩයක, සුළු වැටුපක් ලබමින්, තේ ගසන්නකු ලෙස රක්සාවක් කරන්නේ ය යන හෝඩු-වාව මීට සතියකට පමණ පෙර පියල්ට දැනගන්ට ලැබිණ. සංවේගයෙන් සැලකිය යුතු ඒ පුවත ඇසූ පියල් දියතලාවට නො-ගොස් කෙළින්ම ගියේ බිබිලේට ය. බිබිලෙන් ඔහු බදුල්ලට ගොස්, එහි ඉස්පිරිතාලයෙහි මියගියේ ය යි කියන ලද ජිනදාස ගැන විපරම් කෙළේ ය. බදුල්ලේ ඉස්පිරිතාලයෙහි මියගිය

Scanned by CamScanner

ජිනදාස නන්දගේ සැමියා නොව අහංගම උපන් ජිනදාස නැමැත්තෙකි. අනතුරුව ඇකිරියන් කුඹුරට ගොස් තොරතුරු සෙවීමෙන් පසු පියල්ට, බදුල්ලේ ඉස්පිරිතාලයෙහි මියගිය ජිනදාස අනිකකු බව නිසැකවම සිතාගත හැකි වී ය.

මේ තොරතුරු දැනගත් පියල් රහස් පරීක්ෂකයකු සේ ජිනදාස ආ ගිය තැන් සොයන්ට වී ය. ඔහු පළමුව ගියේ මඩකලපුවට ය. ජිනදාස යන නම් ඇත්තකු පිළිබඳ නිසැක තොරතුරු එහි වෙළඳුන්ගෙන් දැනගත හැකි නොවී ය. බිබිලේ සිට පැමිණියකු කල්මුනේ සිංහල වෙළෙන්දකුගේ වෙළඳ සැලෙහි කඩ මැස්සෙහි බඩු කිරන්නකු මෙන් සේවය කරතියි යනු පියල් මඩකලපුවෙහිදී ඇසූ පුවතකි. ඔහු මොනරාගලට ගියේ කල්මුනේ වෙළඳ සැලෙහි කඩ මැස්සෙහි බඩු කිරන්නා ජිනදාස නොවන බව ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් පසු ය. ජිනදාස නැමැත්තකු මොනරාගල තේවතුර කඩයක මාස කිහිපයක් නැවතී සිට බලංගොඩ පළාතට ගිය බව පියල් එහි වෙළෙන්දකුගෙන් දැනගත්තේ ය. ඔහු කොස්ලන්ද, වැල්ලවාය, බලංගොඩ යන පෙදෙස්වල ඇවිද අනතුරුව ගියේ හම්බන්තොටට ය. හම්බන්තොටින් පිටත් වූ පියල් දික්වැල්ල, මාතර, ගන්දර, යන පෙදෙස්වල ඇවිද ජිනදාස ගැන නිසැක තොරතුරක් දත නොහැකිවූයේ ගමට පැමිණියේ ය. ඔහු නන්දට ලියුමක් නෝව්වේ ජිනදාස සොයනු පිණිස ඇවිද්ද බැවිනි.

නන්දත් තම මවත් ජිනදාස අරබයා කී තොරතුරු ඇසීමෙන් පසු ය පියල්ගේ සිත සැහැල්ලු වූයේ. ජිනදාසගෙ අවමඟුල පිළිබඳ කටයුතු නන්ද විසින් කරනු ලැබීම නිසා පියල්ගේ සිතට නැඟුණේ ඊෂ්‍යාවකි; කෝපයකි. නන්දගේ මවු-පියෝ, තමා පළමුව නන්ද ගැන කළ යෝජනාව ප්‍රතික්ෂේප කළහ. ප්‍රතික්ෂේප කොට නන්ද ජිනදාසට පාවා දුන්හ. නන්ද ද තමා සිහි නොකොට ජිනදාස පැතුවා ය. ඔවුන් මේ වර පියල්ට කැමැති වූයේ ජිනදාස දිළින්දෙක් ව මළේයයි අසන්ට ලැබුණු පසු ය. ජිනදාස මළේ යයි සැළ නොවී නම් නන්ද තමා නොපතයි. මෙසේ සිතූ පියල් කෝප වීම, ජිනදාසත් නන්දත් නිසා ඔහු තුළ ඊෂ්‍යාවක් හටගැනුම පුදුමයක්ද?

''එහෙනම් පාංසකූලේ දී ජිනදාස බූමදන කොට අවසාන ගෞරවය දක්කුවේ මගේ සල්ලිවලින්!''යි හිසට නැඟුණු ඊෂ්‍යාවත් කෝපයත් ඇති පියල් කී ය. ඔහු මේ දරුණු වදන් කටින් පිට කෙළේ නන්ද කඳුළු රැඳුණු දෙනෙත් ඇති ව කී සියලු තොරතුරු කරබාගෙන ඇසීමෙන් පසු ය.

පියල්ගේ දරුණු ඇනුම් පදය ඇසූ නන්ද කස පහරක් ලැබූ ස්ත්‍රියක සේ ඇඹරුණා ය. කුල ගර්වය ඇගේ හිසට නැංගේ ය;

Scanned by CamScanner

දෙනෙතින් පිට වූ කෝපාග්නිය නිසා පිනැදස සිහි වීමෙන් උත්පන්න ලද කඳුළු සිඳිගියේ ය. පුටුවෙන් නැඟුණු නන්ද වචනයකුදු නොතෙපලා තම කාමරයට ගොස් ඇඳෙහි හාන්සි වි කල්පනා කළා ය. ඈ කල්පනා කෙළේ මහත් වූ කෝපයකිනි. කෝපය නිසා ඈට සිතුණේ එවේලේම මහගෙදර බලා යාමට ය.

දෙවන වර පියල් සමඟ විවාහ වුණු නමුදු ඔහු පෙළපතින් ද සිරිත් විරිත් පැවතුම් යන ආදියෙන් ද තමාට වඩා හීනයෙකැයි යන හැඟීම නන්දගේ සිතින් සම්පූර්ණයෙන් ඉවත් නොවී ය. පියල්ගේ ඇතැම් පදය ඇසීමෙන් නන්දගේ කුල ගර්වය දැඩි වී ය. පියල්ගේ පියා ජීවත්ව සිටියදී තම ගෙදරට පැමිණි නමුත් පුටුවක හිඳගත්තේ කලාතුරකිනි. ඔහු මුදල් සපයාගත්තේ වැරවැයමින් පමණක් නොව නිවටකම කිරීමෙන් ද බව නන්ද දනියි. මුදල් ලැබුණු පසු ද පරණ පුරුදු කාර්‍යයන් කළ පියල්ගේ මව ඒ කාර්‍ය-යන් අත්හැරියේ නන්ද නිසා ය. පියල්ගේ මව දැන් ගරු බුහුමන් ලබන්නේ මහගෙදර පවුලේ කාන්තාවක සමඟ පියල් විවාහ වුණු බැවිනි. ගැමි ගැහැනුන් පෙර 'බබුන් හාමි' යන නමින් හැඳින්වූ පියල්ගේ මව දැන් හඳුන් වන්නේ 'වැලිගම හාමිනේ'' යන නමිනි. ගැමියන් ඒ ගරු නමින් පියල්ගේ මව දැන් හඳුන්වන්නේ පියල් මහ ගෙදරට බැඳුණ නිසායයි නන්ද සිතුවා ය. පියල්ගේ නෑයන්ගෙන් එකකු දෙන්නකු හැර අන්‍යයෝ දනුදු මහ ගෙදරට පැමිණි විට පුටුවක හිඳ නොගනිති.

පියල්ගේ මව කෙරෙහි ද පහළ පෙළන්තියේ ගෙදරක ඉපිද වැඩුණු ස්ත්‍රියක කෙරෙහි දක්නා ලැබෙන හීනදීන කම්වලින් එකක් දෙකක් තවමත් දක්ක හැකි ය. බලදස සමඟ තමා කතා කරනු දුටු ඇතැම් අවස්ථාවක පියල්ගේ මව එතැනට එන්නේ නො එසේ නම් ඒ කතාව ඇසෙන තෙක් මානයක නැවති ඉන්නේ එවැනි හීනදීන ගතියක් නිසායයි නන්ද සිතුවා ය. දවසක එලවළු කත්තාරයකු සමඟ වාදයට ගිය පියල්ගේ මව ඔහුගෙන් බැණුම් ඇසුවා ය. නන්ද තර්ජනය කළ පසු ය, එලවළු කත්තාරයා ඒ බැණුම නැවැත්තුවේ.

කුල ගර්වයත් සමග නැඟුණු මේ සිතිවිලි නිසා නන්දගේ කෝපය දැඩි වී ය. එහෙත් අනුන්ට නින්ද කිරීම නුහුරු කාරියක් වූයෙන් ඈ තම කෝපයත් කුල ගර්වයත් පිට කෙළේ දෙනෙතින් මිස කටින් නොවේ.

තමා කියේ දරුණු නොසරුප් බසකැයි පියල්ට වැටහුණේ නන්ද හුනස්නෙන් නැඟී කෝපයෙන් තමා දෙස බලා නික්ම ගිය පසු ය. ඒ වේලාවේ සිතට නැඟුණු ඊර්ෂ්‍යාවත් කෝපයත් නොමැඩගැනීම නිසා පියල් තුළ හට ගත්තේ බලවත් ලජ්ජාවකි. පියල් පුටුවෙන් නැඟී නන්දගේ කාමරයට ගියේ ය.

Scanned by CamScanner

"නන්ද තරහ වෙන්න එපා"යි පියල් කී ය.

ඇඳෙහි වැතිර උන් නන්ද අනික් අතට හැරුණා ය.

"නන්ද මට සමා වෙන්න"යි කියමින් පියල් ඈ ළඟින් වාඩි වූයේය. "ඒ වේලාවේ මට තරහ ගිය නිසා මට ඒ වචන කියවුණා."

"තරහ ගියා!"

"ඔව් නන්ද; තරහ ගියේ මම නන්දට හොඳටම ආලය කරන නිසා. නන්දට ඉංග්‍රීසි ඉගැන්නූ කාලේ මගේ සිතේ ඇති වුණු ආලය ඒ පරිද්දෙන්ම දැනුත් තියෙනවා. මට තරහ ගියේ එයාගේ මරණෙට වියදම් කර නිසා නෙවි–"

කෝපයෙන් විදහාගත් දෙනෙත් ඇතිව උන් නන්ද තම දෙනෙත් අඩවන් කරගත්තා ය.

"තරහ වෙන්න එපා නන්ද. ඒ වචන මම අදහස් කරලා කිව්වේ නැහැ. තරහ ගිය නිසා මට කියවුණා—"

---

හුදි ජන ප්‍රසාදය උදෙසා කොග්ගල — මලලගම මාර්ටින් වික්‍රමසිංහ විසින් වර්තමාන සිංහල මහාජන වංශයෙන් බිංදු මාත්‍රයක් කියනු පිණිස ලියන ලද ගම් පෙරළිය මෙයින් නිම වි ය.

Scanned by CamScanner

# ගම් පෙරළිය ගැටපදය

## ප්‍රස්ථාවනාව

පිටු තලය, පසු බිම, background

පිටත්තර ලකුණු වලින්, පිටින් පෙනෙන සැටියෙන්

ඉත සිතින්, හැබෑ අදහසින් ඇසුරු කරමින්,

ආශ්‍රය කරමින් ආර්ථික තතු, වස්තුව පිළිබඳ තතු, economic conditions

මඩින, පාත ඔබන

ආරූඪව, නැඟී, ඇතුළු වී

කල්පනා ශක්තිය, සිතීමෙහි ශක්තිය

අඹන ලද, තනන ලද

දිදුලය, thimble

පිළිබිඹුවන්නේ, reflect

සිරිත් විරිත්, හැසිරිය යුතු නොහැසිරිය යුතු ධර්ම.

පරිසරය, වටපිටාව, environment

ගම් දෙටුවන්, ගම් ප්‍රධානයන් පරපුරට,පරම්පරාවට

කුල සිරිත්, කුලයට (පවුලට) අයිති සිරිත්

බැලයන්, කුලීකාරයන්

චාම් ලෙස ජීවත්වීමට, to lead a plain life

මාළුපිනි, ව්‍යංජන, curries

ආචාර සමාචාරවිධි, (සමාජයේ) හැසිරීමේදී අනුගමනය කළ යුතු නීති රීති

විනීත ලකුණු, refined features

උග්‍ර, දැඩි; තියුණු

අනර්ථ පරම්පරාවක්, අවැඩ පත්තියක්

දුෂ්ට ප්‍රතිපත්ති, නරක පිළිවෙත් bad princ-ples

අසංකීර්ණ, අමිශ්‍ර simple

ජීවන මිනුම, standard of living

නාගරික සභ්‍යත්වය, urban civilisation

විනෝදස්වාදයක්, ප්‍රීතිය විඳීමක්

තොවිල්-පවිල්, devil dancing ceremonies

ගොයම් කයියක්, සමුපකාර ක්‍රමයෙහි පිහිටා කුඹුරෙහි වැඩ කරන කංඩායම

අතුරු දහන්වී යෑම, නැති වී යෑම – disapp-earance

දහම් සොඳුන්ගේ, ධර්මයෙහි ඇලුණවුන්ගේ

පංචි කෙළිය, කවඩි හදෙනකු හෝ හත් දෙනකු හෝ ගෙන එයින් කෙරෙන සෙල්ලමක්

වැඩවසම් ක්‍රමය, පෙර ලක්දිව ඇතැම් වකවානුවලදී රට ආණ්ඩු කිරීමට යොදා ගත් එක්තරා ක්‍රමයක්; ආණ්ඩුව සතු ඉඩම්වල පදිංචි වී ඒ වෙනුවට ආණ්ඩුවට සේවය කිරීම; (මෙ සිරිත උඩ රට ඇතැම් පළාත්-වල දැනුදු බල පවත්වයි) feudalism

දූෂ්ට අංග, evil features

හීන දීනකම, පහත් නිවටකම

ධනපති ක්‍රමය, capitalism

අනුකරණයෙන්, අනුව කිරීමෙන්, imita-ting

රදල ක්‍රමය, feudalism; aristrocacy

සජාතීය අංග, සමාන ජාතික අවයව

ගිලිහිණ, වැටිණ

අර්ථ ශාස්ත්‍රඥයන්, economists

සම්භාවිත, ගෞරවයෙන් සලකන ලද

අතලොස්සක්, ටික දෙනෙක්

ගුණමකු කමින්, අනුන් හෙළා දැකීමෙන්; අනුන්ට අපහාස කිරීමෙන්

අවලම්, පාදඩ

සදය, දයාව සහිත

පරිහාසය, සිනහව, ridicule

ඉලක්ක කිරීමට, make a target of

උචිත, සුදුසු

ගතානුගතික, අනුන් අනුව යන

වඳ වීම, extinction

දෙටු පරපුරක්, ජ්‍යෙෂ්ඨයන්ගේ පරම්පරාවක

සංක්‍රමණය, තැනකින් තැනකට මාරු වීම migration

මිරිඟුව, mirage

නිරූපණය වන්නේ, දැක්වෙන්නේ, විහා වන්නේ

කුප්පන, කෝප කරන

හැකිළුණු කල්පනා ශක්තිය, shrivelle imagination

දුර්මතයන්, වැරදි, නරක අදහස් wron views or opinions

අත්දැකීම, experience

ශිෂ්ට රචනාවක්, a piece of good writin

අසංස්කෘත රචනාවක්, a peace of crud writing



Scanned by CamScanner

විවේක බුද්ධිය, දුරදක්නා බුද්ධිය, discriminative intellect

අපූර්ව රචනයක්, original writing

ආපද, කරදර විපත් ආදිය

මරණ මඤ්චකයෙහි, මර ඇඳෙහි

කටකතා, gossip

ගර්වයෙන්, උඩඟු කමින්

පාංශුකූලය, මෙය, පාවිච්චි කොට ඉවත දමූ රෙදි කෑලි ආදි රෙද්ද හැඳින්වීමට පෙර යෙදුණු වචනයකි: පාංශුකූල යනු වැලි තැවරුණු යන අදහස දෙන්නකි. මළමිනී ආදිය ඔතා දමූ රෙදි කැබලි ප්‍රධාන වශයෙන් අදහස් කරනු ලැබේ. එහෙත් දැන් අවමංගල චාරිත්‍රයක් වශයෙන් භික්ෂූන්ට පූදන රෙදි ආදිය සඳහා ව්‍යවහාර කරනු ලැබේ.

චිත්ත, චෛතසික ධර්මයන්ට, සිත හා සිත පිළිබඳ ධර්මයන්ට

## 1 වන පරිච්ඡේදය

ජගත් ශක්තිය, ප්‍රකෘති ශක්තිය, ස්වභාව ධර්මයාගේ බලය, power of nature

පාත් පැල. ගොක්කොළින් වියන ලද පිළිවැස්සක් ගත් රිටි හතර පාත් පැල යන නමින් ගැමියෝ හඳුන්වති. ඔවුහු ඒ පිළිවැස්ස තුළ දෙවියන් උදෙසා මැටි පහනක් දල්වති.

සුන්දර, ලක්ෂණ, beautiful

ආලින්දය, ඉස්තෝප්පුව

තෝවන ලද, බාවන ලද

සොම්නස්, සතුටු

දොම්නස්, දුක්

සිත්-පිත් ඇති, animate සප්‍රාණික

චීවරයන්, සිවුරු: පැළඳුණු නැත්

සුභ අසුභ, auspicious and inauspicious

ඉෂ්ට අනිෂ්ට, good and evil

දෛව බලය, වාසනාවන්ත හෝ අවාසනාවන්ත කර්ම බලය, fate

අරක්ගත්, haunted; guarded ආරක්ෂා කරන ලද

ආදි යුගය, primitive age

හිරිගල, limestone

අනුමානය, inference

ප්‍රත්‍යක්ෂය, fact

යදින පුදන, praying and offering

කන්නලව්, යාච්ඤා

අභාවකා, නැති නාස්තිකොට ඇඹරී ගොම-හැවී. විනාශ වී යන අරුත් දෙන ගැමි වහරකි annihilate

වාසල මැදුරක, මුදලිතුමකුගේ නිවස හැඳින්වෙන ගැමි වහරකි.

අචේතනික, සිත් පිත් නැති ජරා ජීර්ණ බව, පැරණි වීමෙන් දිරුණු බව

නව ජීවිතය, new life

ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියා කිරීම; සකස් කිරීම

වගතුග, තොරතුරු

පිටස්තරයා, පවුලට අයත් නැති එකා- outsider

කුඹල් කාරයන්, potters

අඩුක්කුව, set

ආචීර්ණ කල්පික, කලක සිට පුරුදු කරගෙන ආ: traditional

අරම්ණිය ගොතාගෙන, cross legged

දෙපිලකට, in two camps or teams

අය, පංචි කෙළියෙහි දී ලබන ලකුණු

කූට බුද්ධිය, තක්කඩි නුවණ දනමුත්තෝ,

දනුම ඇත්තෝ සිතා මතා, කල්පනාකොට;

ඒකාර්ථවත් වචන දෙකකි.

මේ ගොල්ලන්, මොවුන්

සුදු මතය, සුදුව නිසා ඇතිවන මත් වීම

ඒ හින්ද, ඒ නිසා

විත්තියක්, තොරතුරක්

සුවඳ විතක්, සුවඳ වියනක්, scented canopy

ආස්වාදයක්, රස විඳීමක්

සැරවැර, scolding

ජේව නූල, fuse

මන වඩන්ට, සිත් සතුටුකරන්ට

ගෘහිණීහු, housewives

අවියෙන්, අදහසින්

දපුණු, වඩිය නැගුණු

උදාසීනත්වය, උකටලී බව, indifference

පැනයක්, ප්‍රශ්නයක්

පෙළපතින්, පරම්පරාවෙන්

නිසග, ස්වාභාවික—inborn, natural

ඉදිබුවකු, ඉබ්බකු

කබොල්ල, පොත්ත, shell

අන්දුන්කුන්දුන් විය, අන්දමන්ද විය.

## 2 වන පරිච්ඡේදය

අවදියෙන්, නොනිදා

යෝදයෝ, මිනිහෝ: කිපුණකු විසින් ව්‍යවහාර කරන ඇමතුම් පදයකි.

Scanned by CamScanner

කනිපින්දම් කියා, pleading and appealing නිහමන් ඉල්ලන්නාක් මෙන් කියා (ගැමි වහරකි)

සිල්ලර, curry stuff

එද මෙදහුර, එදත් මෙදත් අතර

අනාථයන්ට, පිහිටක් නැතියන්ට

පැළ දෙර, පස්සා පැත්තේ දෙර

නාකු පොල් කටුව, නාක්කන්ට බත් දමනු පිණිස විටක අවුණන ලද පොල්කටුව

උඩුකුරු, උඩු අතට හැරවූ

මසැස, ඇස; natural eye

මනැස, සිත නමැති ඇස, minds eye

ව්‍යසනයක්, විපතක්

ශෝකාකුල, ශෝකයෙන් අවුල් වූ

ස්වරයෙන්, හඬින්

කුකුස, සැකය

සැතින්, ආයුධයෙන්

පිළිකාවක්, cancer

ලියන පෙට්ටිය, ලියන මේසය උඩ තබනු ලබන දිග පෙට්ටිය big stationery case on the writing table

සුබ මොහොත, හොඳ වෙලාව

නාන් රෙදිපිළි, අලුත් රෙදි

සෘජු, කෙළින්, sincere

පෝෂණය, nourishment

ආපත්තියක්; විපතක්; (ආපත්තියක්- අපථ්‍යයක්; අගුණයක්)

විනිශ්චයකට බැසීමෙන්, තීන්දුවකට යෑමෙන්

කුහුලක්, යමක් දනගැනීමට ඇති ආසාව, curiosity, inquisiveness

පිරිහීම, පහත වැටීම, decline

සියුම් බුද්ධියෙන්, සියුම් නුවණින්

ඇලිමැලිකම්, ගැමි වහරකි; තමාට කියන ලද කාරිය නොකරන අදහසින් එයින් ගැලවෙන්ට තැත් කිරීම

විස්මය, පුදුමය

තරවටු කිරීම, තර්ජන කිරීම

## 3 වන පරිච්ඡේදය

විපරම්, පරීක්ෂා

උළෙල, උත්සවය, festival

අතපත ගා, අතින් අත ගා

කුන්සිරි පත් පැදුරු mats made of variety of reeds

බිරාන්ත වූ, තැති ගැනුණු frightened

වරිගෙ, වර්ගය, පරපුර

පෙළන්තියේ, පවුලේ; පරපුරේ

ප්‍රියංකර ගතියක්, පියකරු බවක්

සිතූ පැතූ, thought and hoped

මතයක්, අදහසක්, opinion, idea

ගුප්ත සන්තෝෂයක්, සැඟවුණු සතුටක්; රහස් ප්‍රීතියක්

බුමමාගත්තාය, මුහුණ ඇඹුල් කරගත්තා ය; මුහුණ හකුලා ගත්තා ය.

සංවේගයෙනි, බලවත් හැඟීමෙනි

කුල ගෙයක, කුල වතුන්ගේ ගෙයක, in a noble family

බෝඹු ලී දෙක, two waggon shafts

හබල, oar

සිංහලේ, පරණ මිනිසුන් 'සිංහලේ' යන නමින් හැඳින් වූයේ උඩ රටයි.

සැදලය, saddle

කොන්ද, backbone

කොල්ලරය, අශ්වයාගේ බෙල්ලෙහි බැදෙන හම් පටිය, collar

දැවැන්ත, විශාල

වැරෙයි, කෙටවු වෙයි.

හෙවටු කරන, අඩු මිලට ඉල්ලන, bargaining

පාළු; deserted

කොරහැඩි, rough

## 4 වන පරිච්ඡේදය

කුකුස, සැකය: doubt

ඉබේ, උත්සාහයක් නැතිව; නිතැතින්

ආශ්වාස, උඩට හුස්ම ඇදීම, inhale

ප්‍රශ්වාස, හුස්ම පාත හෙළීම, exhale

ඇනුම් හරිනවා, yawns

යකැදුරකු, exorcist

යකැදුරුකම්, exorcism

සංකාවෙන්, (ගැමි වහරකි) වියෝ දුකින්

උදහස්ව, කෝපව

වල්බූත, nonsense

විලම්බිත අදහස්, විසුළු අදහස්, irrational thoughts

සාස්තරකාරයා, දෛවය කියන්නා, fortune teller

අංජනම් එලිකාරයකු, a crystal gazer

කුළුපග, නිතර ගෙදරට යන එන නිතර ඇසුරු කරන

Scanned by CamScanner

අඳුනක්, සිත ගන්ට දෙන බෙහෙතක්, love philtre

යන්තරය, talisman

මන්තර charms

ගුරුකම්, spells

ඉඟියකින් සැරසූ ඇස, eye adorned with a coquettish glance

ප්‍රත්‍යක්ෂ, තමාගේ ඇසින් දකින ලද

මූර්ඡාරෝග විශේෂයක්, භූතෝන්මාදයක්, a kind of hysteria

තොවිලය, devil dancing ceremony, exorcism

සුදු පිරිවට, සුදු රෙද්ද

පිළිකුල, නොකැමැත්ත

විලක්කු, යකුන් නැටීමේදී දල්වීමට ගනු පිණිස ලී කැලි වටා රෙදි පාන්කඩ ඔතා තනාගන්නා හින් පන්දම

ගොප් අතු, tender leaves of coconut palm

වනමල්, කැලේ වැවෙන මල්, wild flowers

උප විඥානය, subconscious

ඇබ්බැහිකමට, පුරුද්දට

වැලඳුණු, බෝවුණු, contracted

අගහිඟය, අඩුපාඩුව, poverty, want

•විධවාවක, ස්වාමියා මළ ස්ත්‍රියක, a widow

## 5 වන පරිච්ඡේදය

සාර්ථක, හරිගිය, successful

සුලමුල, වගතුග

බඩගිනි කලාව, පිරිහෙන දසාව

උපහාරයක්, offering

## 6 වන පරිච්ඡේදය

පළිගන්නා, revengeful

අවචා තබා, මානා

සරදමක්, විහිලු කිරීමක්, කවටකමක්

වන්දි, compensation

තුරු බුහුටි, ශූර, දක්ෂ.

විනීතාචාර, හික්මුණු හැසිරීම refined manners

කලතුනා, වයසින් පැසුණු

අත්දැකීමෙන් ලත් උගැන්ම knowledge gained from experience

තරුමයකු, මෙය දකුණුපළාතේ ගැමිවහරකි; කිසිවකු විශ්වාස නොකරන, අනුන්ට ද්වේෂ කරන ගුණමකුවකු හැඳින්වෙන්නකි. මීට සමාන ඉංග්‍රීසි වචනය 'cynic' යනුයි.

## 7 වන පරිච්ඡේදය

සුසිරිත, හොඳ සිරිත

දුසිරිත, නරක සිරිත

ආම වාතයක්, නොදිරවන ලද ආහාර නිසා හටගන්නා වාතය, අජීර්ණ වාතය – flatulence caused by indigestion

ගිනි පෙළපතක, පහත් පවුලක

සාහසික, දරුණු; දමරික

හෘදයාබාධය, heart-attack

හෘදය ඇණහිටීම, heart-failure

ආයාසයක්, උත්සාහයක්

හපය, රොඩ්ඩ pulp

පංකාදුය, ගැමි වහරකි: මේ වචනය 'හොඳය' 'හැඩය' සියල්ල 'සම්පූර්ණය, යන අදහස් දෙන්නකි.

කාංඩවලට, gangs, parties

මෙරෙන්දය, සෙල්ලම් පිණිස කාංඩයක් එක්ව කන කෑම

කොලොප්පමක්, කවටකමක්

අහර, දහර coquetry

විහිලුතහලු, කවටකම්– jokes

සීතාවන්, සීතාව වැනි ස්ත්‍රීන්

තේරවිලි, riddles

සුකුමාර මතික, මොළොක් අදහස් ඇති, කාරුණික හැඟීම් ඇති

සේදි, තොරතුරු

කොඩිවිනය, evil magic

හුදෙකලාව, තනියම

අසංකීර්ණ, අමිශ්‍ර simple

රාග' චේතනාවක්, passionate desire or thought

## 8 වන පරිච්ඡේදය

අගුල්පත් තැබීම, කියන දේ පිළිගත් බවට හෝ ඊට ඇහුම් කම් දුන් බවට හෝ ප්‍රතිවචන දීම.

නබිලා, මුස්ලිම් ඍෂිවරයෝ Muslim sages

අම්ලකර වායුව, oxygen

## 9 වන පරිච්ඡේදය

වලිප්පුව, convulsive fit

පෙකනිය, navel

දෙවැනි මනමාලයා, bestman

වාචාල කථා, කටට ආ ආ දේ කියන්නාගේ කථා, jabber

තොටිපල, ගං ඉවුරක ඔරුනවත්වන තැන

මාරියාව, කැලඹුණු ජලාශයකින් හමින රළ මාරියාව නමින් හැඳින්වේ

අතංගුව hand net

තනපට බැඳගෙන, ළය වැසෙන සේ රෙද්ද ඇඳගෙන

අකුල්වැටිය, මසුන්මරන්නෝ නදියෙහි එක් තැනක කොළ අතු සිටුවති; මාළුවෝ මෙහි රැස්වෙති. කොළ අතු සිටුවන ලද නදි ප්‍රදෙස අකුල් වැටියයි. මාළු කොටු නමින් හැඳින්වෙන්නේ මීට හුරු වූවකි.

ඉදල්, කොළ හැළුණු අතු

## 10 වන පරිච්ඡේදය

ලැවිගාගෙන කනවා, to gnaw

ඇසෙන තෙක් මානයක, ශබ්දය ඇසෙන තරම් දුරක

ප්‍රචණ්ඩ, බලවත්; සාහසික

යක්ෂ දිස්ටියක්, යකුන්ගේ බැල්මක්,

භාවමය ඉන්ද්‍රිය, හැඟීම් හඟින සිත, emotional organ or nature

බුද්ධීන්ද්‍රිය, organ of intellect

ආත්ම වධයක්, self mortification

## 11 වන පරිච්ඡේදය

අඩවන් කොට, අඩක් වසා

ප්‍රාණනල, life breath

කරක් ගැහිමට තැනින් තැන ඇවිදීමට; කරක් ගෙඩිය දියෙහි ඔබ ඔබා මසුන් ඇල්ලීමට

රූ සපුව, beauty, රූප සම්පත්තිය

සංකලනයෙන්, මිශ්‍රණයෙන් සංයෝගයෙන්

වියෝ දුක, වෙන්වීමෙන් ඇති වන දුක

පිරිපුන්, පිරුණු; perfect

හාරාපාරා බලන අටියෙන්, අවුස්සා සොයා බලන අදහසින්

## 12 වන පරිච්ඡේදය

අඹරාව, hood of the bullock cart

ඊරිය කඳ, pole of the double bullock cart to which the yoke is fastened

පොල් රුප්පාව, පොල්ගස් මුල වූ පිටිය

බුරුත්ත, පොකුර– bunch

ඉඳුල් කරන ලද, tasted

කැටක්, pebble

කටු ඉඹුල් ගහ, a thorny tree used for punishing of adulterers in hell

රුප්පා, පිටවනි

ඉණ ඉහ, belongings, මයියකු ඉණෙහි හා හිසෙහි තබා ගෙන යන දේ

අත ගාගනු පිණිස, සොරා ගනු පිණිස

තිප්පල, 'වවුලුපළ' යන ගැමි වහරද මෙ අරුත දෙයි

සහජයෙන්, උත්පත්තියෙන්

මූකළාන්, වනය virgin forest

ක්ෂිතිජය, අහසත් මුහුදත් එකට ඇතෙන්නා සේ පෙනෙන තැන. horizon

බුන් වත්, කුහක වත්

සක්වල, ලෝකය

සහජ හැඟීමෙන් intuition

අවලමකු, පාදඩයකු

ජාගර චින්තය, පිබිදි සිටින සිත; අවදි වූණු සිත

ලලිත ගීතයේ, රසවත් සින්දුවේ

පින්පෙත්, පින් කළ එකකු දෙන පින්

## 13 වන පරිච්ඡේදය

බත්තල, යාත්‍රා විශේෂයක්

එබිකම් පාන, එබී බලන

නලියමින්, wriggling

ජනාකීර්ණ, ජනයාගෙන් ගැවසුණු

අහරදහර කාරියක්, coquette, විලාසවතියක්

අවිචාර මත, uncritical views

ග්‍රාම්‍ය විශ්වාස, childish beli fs, superstitions

අධ්‍යාත්මික, inner, සිත පිළිබඳවූ

හුරුබුහුටියෝ, දක්ෂයෝ, clever and smart fellows

දෙබරාදූ, බොරු, imitation

ආත්ම ගර්වය, තමාගේ ගෞරවය self respect

දෙදරුම, quake, shiver

මූණ රතු උණ, blushed

කටහැකර, talkative

## 14 වන පරිච්ඡේදය

කොරහ, an earthen vessel

අනුසස්, ආනිසංස effects, power

පාඨකයන්, readers

සුවඳ සුනු, scented powder

ගණිකා වෘත්තිය, වේසාකම, prostitution

ගුප්ත, secret mysterious රහස්

Scanned by CamScanner

ඇතරුවා, elephant driver, mahout
මුසල, unlucky, අසුභ කාලකණ්ණි
ළතෝණිය, wailing

## 15 වන පරිච්ඡේදය

විජිනිපත, අවාන, fan
කලාල පැදුර, matting
දිය කඩනය, breakwater
මසුරු මල, stinginess මසුරුකම නමැති කුණු
කුල කත, woman of a good family
දරිවි, දැරිය; ගැනු ළමයා; lassie
සෙප්පඩි විජ්ජා, තක්කඩිකම් tricks
විය කරලා, වැඩ කරලා
අරමුණ, object
හර්ෂය, සන්තෝෂය, තියුණු ප්‍රීතිය
අලුත් පන්න, new fashions අලුත් මෝස්තර
මියුරු සරින්, in sweet voice මියුරු හඬින්
තලතුනා වියෙහි, at mature age
හැල්ලක්, දෙඩවිල්ලක්
ව්‍යක්ත ස්වරයෙන්, උගත් හඬින්

## 16 වන පරිච්ඡේදය

ඉදුරුණු, uprooted
ශොකාකුල, ශොකයෙන් අවුල් වුණු
අතුරු පාරක්, a branch road
උෂ්ණ කලාපයෙහි, in the dry zone, in the tropics

ඇස්වටය තෙක් to the ankle
හෙවුණු overgrown
ලිය ගොමු, වැල් පැටලීමෙන් —
සැදුණු මඩු, groves
මාරියාවක් සේ, as a ripple
පෙදය, tail feathers
මුසපත්ව, ක්ලාන්තව, fainated
සිහිසන් නැතිව
මිනී කාමරය, mortuary
ඇන්නෑවක්, අනඩුවක්, විපතක්
බොක්ක, bay
කොරසැඩි, ගොරෝසු, rough
වරය, boon
ගම්මානයක්, village
පැල් පතක්, hut
ශික්ෂණය, education, discipline
කුල ගර්වය, family pride
ආපදාවකදී, විපතකදී
ආත්මාලෝකය, inner light of the soul
අනය ව්‍යසනයෝ, විපත් calamities
ලෝක ධර්මය, law of the world, natural law
ධර්ම සුත්‍ර, law books, ධර්ම නීති
වලාහක අශ්වයා, දේව කථා වලින් හැඳින්වෙන අස්වයෙක් a mythical horse
හෝඩුවාව, a clue, සලකුණ, ආරංචිය

# ගම් පෙරළියට පිටදුන් ගැමි ජීවිතය

§ 1

ගම් පෙරළියේ කතාවට පසුබිම වූයේ මාතරටත් ගාල්ලටත් අතර වූ මුහුදු තීරයේ පිහිටි ගමකි. මාතර සිට වැලිගම තෙක් ද වැලිගම හැර එතැන් සිට ගාල්ල තෙක් ද ගාල්ල හැර ගින්තොට සිට අලුත්ගම තෙක් ද වන මුහුදු තීරයේ ගම්; වෘක්ෂ--ලතා, ඇළ දොළ, නදී ගල්කුළු යන ආදිය විසින් බෙහෙවින් සමාන වෙයි. එහෙයින්, ගම් පෙරළියෙහි ලා වර්ණනය කරන ලද ගමේ විසිතුරු සිත්තමක් සිතට නගාගැනීම, කොළඹ නගරයෙහි ඉපිද වැඩුණුවුන්ට හැර අන්‍යයන්ට අමාරු කාරියක් වෙතියි නොසිතමි.

ගම් පෙරළියෙහි කතාවස්තුවෙන් දක්වෙන ගැහැනුන් හා පිරිමින් ද ළමයින් ද ඔවුන්ගේ පිටත්තර ලකුණුවලින් හඳුනාගැනීම පහසු ය; එසේ හඳුනාගැනීම වූ කලී බඩු ගැනීමට කඩ පළකට යන්නකු එහි රැස්ව සිටියවුන් දෙස බලා උන්ගෙන් ටික දෙනකුන් හඳුනා ගැනීම වැන්න. ඔවුන් නියම වශයෙන් දැන හැඳිනගත හැක්කේ ඉත සිතින් ඔවුන් ඇසුරු කරමින් ඔවුන් හා එක්ව විසීමෙනි. උපන්ගෙයි ගති, ඇබ්බැහි වුණු ගති, සමාජමය පැරණි සිරිත් විරිත්, නූගත්කම, ආර්ථික තතු යන ආදිය විසින් පෙළන, සනසන, මඩින, හඩවන, දෙඩවන, සිනස්සන ඔවුන් තුළට ආරූඪව, ඔවුන් දත හැකි ශක්තිය ලැබෙන්නේ එවිට ය.

ගම් පෙරළියෙහි පිළිබිඹුවන්නේ නියම ගැමියන්ගේ චරිත බව සැලකිය යුතු ය. ඒ චරිත වටහා ගැනීමට ගමෙහි සිරිත් විරිත්, ගැමියන්ගේ ආගම හා විශ්වාස, ගමෙහි ආර්ථික තතු, සමාජ තතු යන ආදිය දත යුතු ය. සිතිමටත් ගැමියන්ට තුඩු දෙන ලද්දේ ඔවුන්ගේ පරිසරයෙහි ඇතුළු වූ ඒ කරුණු බැවිනි.

§ 2

එකල ගමෙහි නායකයෝ නොහොත් දෙටුවෝ ඉඩම් හිමියෝ වූහ. එහෙත් ඔවුන් සුළු ධනපතියන් ලෙස වුව ද හැඳින්වීම ඔවුන්ට අභිමි වේෂයකින් ඔවුන් හැඳින්වීමක් වෙයි. ඔවුන් ගම් දෙටුවන් වූයේ ධනය නිසා නොව තමන්ගේ පරපුරට හිමි කුල සිරිත් රකින්නන් වූ බැවිනි. අනික් ගැමියෝ, කුඩා බිම් කැබැල්ලක් බැගින් ඇත්තෝ හෝ නැත්තෝ හෝ වූහ. ඔවුන් ගෙන් සමහරු ඉඩම් හිමියන්ගේ ඉඩම් වගාකරන්නන් ලෙස ද වඩුවන්, රන්කරුවන්, පෙදරේරුවන් සුළු වෙළෙඳුන්, ගැල්කාරයන්, රිය පදවන්නන් ලෙස ද අන්‍යයෝ බැලයන් ලෙස ද, ජිවත් වූහ. ගමෙහි ධනවතුන් ලෙස හැඳින් විය යුතු ගම් දෙටුවන්ගෙන් එකකු ළඟවත්, මෙකල නගරයේ ඉහළ පන්තියේ ලියන්නකුගේ අවුරුද්දක පඩියට සරිලන මුදලක් වූහයි කිව හැකි නොවේ. ඔවුන් ගමේ ධනවතුන් හෝ දෙටුවන් හෝ ලෙස සලකන ලද්දේ චාම් ලෙස ජීවත්වීමට තරම් ආදායමක් ලැබිය හැකි ඉඩම් කැබැලි කිහිපයකට හිමිකාරයන් වීමත් පැරණි කුල සිරිත් දැඩිව රකින්නන් වීමත් නිසා ය; මුදල් නිසා නොවේ.

ගම් දෙටුවන්ගේත් ඔවුන්ගේ දරුවන්ගේ හා දූරියන්ගේත් ඇඳුම්-පැළඳුම් පොදු ගැමියන්ගේ ඇඳුම්-පැළඳුම් වලට මඳක් වෙනස් වූයේ වටිනාකමින් හා පිරිසිදුකමින් ද පමණි. එලවළු, මාලුපිනි, සහිත බත ඔවුන්ගේ පොදු ආහාරය වී ය. ඔවුන්ගේ ආචාර සමාචාර විධි වෙනස් වූයේ අඩුවැඩි විනීත ලක්ෂණ වලින් පමණි. දෙටුවන් සහිත සියලුම ගැමියෝ,බසින් එකම පන්තියක්ද වූහ. එහෙයින් නගරවල දක්නා ලැබෙන උග්‍ර පන්ති භෙදයත් ඒ නිසා ඇති වන අනර්ථ පරම්පරාවත් ගැමියන් අතර නොවී ය. නගරයෙහි පන්ති භෙදයෙහි දුෂ්ට ප්‍රතිපත්ති වලට බෙහෙවින් හේතු වූයේ ආර්ථික කරුණු ය. චාම් ලෙස ජීවත්වීමට වුවමනා දේ හැර වැඩි-මනත් සැප විඳීමට වුවමනා දෙයින් තොර වූ ගමෙහි ආර්ථික ක්‍රමය අසංකීර්ණ එකක් වී ය. ලොකු ගැමියන්ගේ වුව ද ජීවන මිනුම එතරම් උසස් එකක් නොවී ය. එහෙත් එය නිරෝගව නොපිරිහුණු කායික ශක්තියෙන් ජීවත්වීමට තරම් වූ මිනුමක් වී ය. නාගරික සභ්‍යත්වය පැතිරීමෙන් දූෂණයවුණු මෙකල ඇතැම් ගම්වල ජනයාට වඩා විනෝදස්වාදයක් එකල ගැමියෝ නොමිලයේ ලැබූහ. තොවිල්-පවිල්, කෝලම් නැටුම්, ගරා නැටුම්, අංකෙළිය හා පොල් කෙළිය, පෙරහැර, බණමඩු පින්කම්, පෝය දවසෙහි පන්සලට යෑම, නාඩගම්, යනු එකල ගැමියන්ට විනෝදස්වාදය සැපයූ තැන්වලින් සමහරකි. නාඩගම හැර අනික් හැම තැනින් ඔවුන් විනෝදස්වාදය ලැබුවේ මුදල් ගෙවීමෙන් නොවේ. නාඩගම පළෙන් විනෝදස්වාදය ලැබීමට දිළිඳු ගැමියන් ගෙවූයේ සත පහ බැගිනි. ගම් දෙටුවන් ගෙවූයේ සත තිහටත් පනහටත් අතර ගණනකි.

මත්පැන් බීමෙන් හා සූදුවෙන් විනෝදය ලබන ගැමියන් මෙකල ගම්වල බහුල විගෙන යන්නේ යට කියන ලද විනෝදස්ථාන බෙහෙවින් අතුරුදහන් වූ බැවිනි. 'ඈත පිටිසර පන්සලක පින්කමකට සම්බන්ධ වූ පෙරහැරක් හෝ ගොයම් කයියක් හෝ හැර ප්‍රීති වීමේ



Scanned by CamScanner

අවස්ථාවක් නොවැතිව සිටි සිංහල ජනයාට නිති උසාවි විනෝදස්ථාන විය' යනු ඩී. ආර්. ජයවර්ධන මහතාගේ ලංකාවේ 'ක්‍රිතානා සමය' නැමති පොතෙහි දක්නා ලැබෙන කියුමකි. ඔවුන් මත්පැන් බීමෙන්ද සූදුවෙන් හා උසාවියෙන්ද විනෝදය ලැබීමට දුවනු වැළැක්වීමට පළමුව කළ යුත්තේ අලුත් විනෝදස්ථාන සුලභ කිරීම ය. නොඑසේ නම්, තොවිල්–පවිල් ,කෝලම් නැටුම්, කෙළිසෙල්ලම් සහිත පෙරහැර පැවැත්වීම යන ආදිය නැගීම ය. එහෙත් දහම් සොඬුන්ගේ මතය අනිකක් වී ය. මත්පැන් අලුත් පණක් දීමෙන් හා සූදුවෙන් විනෝදස්වාදයක් ලබන පිණිස දුවන ගැමියන් එයින් වැළැක්විය හැකි එකම මාර්ගය බණ දෙසීමයයි ඔවුහු කිහ. අප රට උගතුන්ගෙන් සියේට අනූ දෙනකුන් පමණ පොතින් පතින් හා කටින් ද බණ දෙසන්නන් වීම එහි ප්‍රතිඵලය වී ය. ගිහියන් බණ දෙසන්ට වීම නිසා භික්ෂූන් බණ දෙසනු ඇසීමට යන්නෝ වඩාත් අඩු වූහ.

§ 3

ගමෙහි ඉතා දිළිඳු ගැමියන්ගේ දරුවෝ, දෙටු ගැමියන්ගේ දරුවන් සමඟ එක පිටියෙහි උරෙන් උර ගැසී කෙළි–සෙල්ලම් කළෝ ය. දිළිඳු ගැමියන්ගේ දූරියෝ කතා–බහ කළහ; අවුරුදු උළෙල දවසෙහි අතුරන ලද පැදුරුවල එක්ව හිඳගෙන පංචි කෙළියෝ ය; වැඩ–වසම් ක්‍රමය අනුව සකස් වුණු ඒ ගැමි සමාජයෙහි බොහෝ අඩු පාඩු, අගතිහ, නුගත්කම වැනි නොමනා තැන් ද වූ නමුදු යුරෝපීය ධනපති ක්‍රමය අනුකරණයෙන් ඇතිවුණු සමාජ ක්‍රමයෙහි දක්නා ලැබෙන දුෂ්ට ලක්ෂණයෙන් එය තොර වී ය. ඒ පැරණි ක්‍රමය, යුරෝපීය රදළ ක්‍රමයත් ධනපති ක්‍රමයත් ආග්‍රයෙන් සංකර එකක් වී ය. සංකර වූ තැන් සිට අලුත් සමාජයෙන් පැරණි වැඩවසම් ක්‍රමයෙහි වූ උසස් සජාතිය අංග ක්‍රමයෙන් ගිළිහිණ. යුරෝපීය රදළ ක්‍රමයෙහි ඇතැම් උසස් අංග පවා එහි නොපිවිසියේ ය. යුරෝපීය ධනපති ක්‍රමයෙහි දුෂ්ට අංග වඩාත් දරුණු වේගයෙන් එහි ඇතුළුව මුල් බැසගත්තේය. යුරෝපීය ඇඳුම්–පැළඳුම් හා ඉංගිරිසි බස ද, අප එකිනෙකා පඹයන් කරන මේ දූෂිත සමාජ ක්‍රමය වටා බඳින ලද මහා පවුරක් වී ය.

'අසමාන ලෙස දේපල බෙදී යාම බටහිර සමාජයෙහි දක්නා ලැබෙන බොහෝ උවදුරුවලට හේතු වී ය' යනු අර්ථ ශාස්ත්‍රඥයන් අතර සම්භාවිත මතයකි. ඔවුන්, එකිනෙකාට පටහැනිව විරුද්ධ මත පහළ කරන්නේ ඒ හේතුව ඉවත් කරනු සඳහා යෝජනා කරන පිළියම් සම්බන්ධයෙනි. දේපළ සාධාරණ ලෙස බෙද හැරිය හැකි විධි සම්පාදනය කළ යුතුයයි සමහරු කියති. දේපල පිළිබඳ පෞද්ගලික අයිතිවාසිකම් සම්පූර්ණයෙන් නැති කළ යුතුයයි අනායෝ යෝජනා කරති. මෑත කාලයෙහි ගම්බද සමාජ ක්‍රමය අනුව පවා දේපල බෙදුණේ එතරම් අසමාන ලෙසයයි කිව හැකි නොවේ. ගම්දෙටුවා අන්තර සිය ගණනක ඉඩම් හිමියෙක් නොවී ය. අක්කරයේ පටන් හත අට තරම් වන ඉඩම් කැබැලි කිහිපයකට හිමිකාරයා විය. අනික් ගැමියෝ, අක්කර දෙක තුන හෝ බාගය කාල හෝ බැගින් හිමියෝ වූහ. මෙදක් සාධාරණයයි කිවයුතු මේ දේපළ විභාගය, අසාධාරණ විභාගයකට හැරුණේ දරු–මුනුපුරන් අතර දේපළ බෙදීයාම නිසා ය. රැකී රක්ෂා හිහ ගමෙහි ඉතා සුළු ඉඩම් කොටස් ලැබූ ගැමි දරුවන්ගේ ඒ ඉඩම් කොටස් ගම්දෙටුවෝත් පොලිකාරයෝත් උකසට හෝ සින්නක්කරයේ හෝ ගන්ට වූහ. ඉඩම් අහිමි හිඟන ගැමියන්ගේ පරපුරත් සුළු ධනපතියන් ගේ ගණයෙහි ගැනෙන ඉඩම් හිමි පර පුරත් ගම්වල පහළ වූයේ මෙලෙසිනි. අක්කර දහස් ගණන් හිමි කරගත් ධනපති පරපුර ඇති වූයේ පොදු ජනයාට හිමි විය යුතු කැලෑ ඉඩම් ආණ්ඩුව තමන් සතු කරගෙන යුරෝපීය ධනවතුන්ටත් ලාංකික ධනවතුන්ටත් විකුණන්නට වූ බැවිනි.

§ 4

නගරයෙහි ඉංගිරිසි උගත් ධනවතාගේ පමණක් නොව මැද පන්තියේ එකාගේ වුව ද දරුවන්ගේ බස ඉංගිරිසිය පමණි. කෑම බීම ඇඳුම් පැළඳුම් විසින් ඔවුහු ඉංගිරිසිහුය. එහෙයින් සිංහල ගැමියකුට තබා නගරයෙහි පහළ මැද පන්තියේ සිංහලයකුට පවා ඔවුන් ඇසුරු කළ නොහැකි වී ය. පොදු සිංහලජනකායත් ඉංගිරිසි උගත් අතලොස්සත් දෙලොවක වෙසෙන්නන් ලෙස ඔවුනොවුන්ගෙන්. ඈත් වූයේ මෙලෙසිනි. පොදුජනයා ඊෂ්‍යාවෙන් හා ගුණමකුකමින් වඩ වඩාත් දූෂණය වූයේ ජාතික දුබල කමක් නිසා නොවේ. අර අවලම් සමාජ ක්‍රමයෙහි වරද නිසාය. කුල භෙදය හා වෙනත් පන්ති භෙද ගම්වල පැවැත්තේ ය. එයින් කුල භෙදය හැර අනික් භෙද සාදය පරිහාසයට ඉලක්ක කිරීමට උචිත මෝඩ කම් ලෙස සැලකිය යුතු ගතානුගතික පැවතුම් වී ය. පරිසරය වෙනස්වන කල ඒ ගතානුගතික අහිංසක පැවතුම් ගම්දෙටුවන්ගේම පිරිහීමටත් ඔවුන්ගේ පරපුර ක්‍රමයෙන් වඳවීමටත් හේතු වී ය. එහෙයින් සමහර නුවණැති ගම් දෙටුවෝ වෙනස් වන පරිසරයට අනුරූප වනු සඳහා ඒ ගතානුගතික සිරිත් බැහැර කරන්ට වූහ. පිට පළාත්වලට ගොස් වෙළහෙළඳාම් කිරීමෙන් ධනවත් වූ දිළිඳු ගැමියන් ගේ දරුවන් හා දූරියන් ද කුල මානයෙන් පිරිහෙන්නට වූ දෙටු ගැමියන්ගේ දූන් හා දරුවන් ද ආවාහ විවාහ විසින් එක්වන්ට වීම නිසා ගම්වල අලුත් දෙටු පරපුරක් පහළ වූහ. ඔවුන් පහළ වීමත් සමඟ නගරයෙහි වූ යුරෝපීය ධනපති සමාජයෙහි සමහර අංග ගම්වලට ද සංක්‍රමණය වී ය.

කයිසාරුවත්තේ මුහන්දිරම් හා ඔහුගේ බිරිඳ ද දූරියෝ ද වෙනස් වන පරිසරය නොසලකා ඇතැම් ගතානුගතික කුල සිරිත් දැඩිව රැකීමට තැත් කළ ගම් දෙටු පවුලකි. ඔවුන් නිවටයන්ගේ කැනට වැටෙන නෙක් ගතානුගතික සිරිත් රැකීමට කළ ශෝක ජනක ප්‍රයත්නයත්, පරිසරයට අනුරූප වීමෙන් අවසානයෙහි ඔවුන් තමන්ගේ පරපුර වඳවිය නොදී රැකගත් සැටිත් මේ ගම් පෙරළියෙන් දත හැකි ය. මෙහි නිරූපණය වන්නේ අපගේ සිත් ගන්නා හොඳ ගති මෙන් අප කුප්පන දුබල කම් ද, නුවරුන්ගේ මිනුමෙන් මනින කල අශිෂ්ට පැවතුම් ලෙස හැඳින්විය යුතු පැවතුම් ද සහිත ගැමියන්ගේත් ගැමි ගැහැනුන්ගේත් චරිතයන් බව සැලකිය යුතු ය.

§ 5

නාගරික තරුණියකගේ වෙස් ගත් ගැමි තරුණියකට වීරකම් කිරීමට ඉඩකඩ ඇති තැනක් නොවේ ගම්බද පරිසරය. ඉඩකඩ ඇති පරිසරයක තැබිය යුතු එකියක ඉඩකඩ නැති පරිසරයක තබන්ට සිතන ග්‍රන්ථකාරයා උසින් යාරයකට වැඩි නොවූ රෙදි පටෙහි දෙයාරයක පිළිරුවක් ඇඳීමට සිතන සිත්තරකු වැන්න.

කුල සිරිත් රකිමින් ආපදවන්ට මුහුණපා දුක් පීඩා නොකොඳුරා විඳ දරාගෙන ජීවත් වන ගැහැනිය හෝ මිනිහා, චරිතයක් නැති බින්දුවක් ලෙසත් එක ගැහැනියක කසාද බැඳ තවත් ගැහැනුන් හත් අට දෙනෙකුන් හා අනාචාරයෙහි හැසිරෙමින්, සමාජයට පුදමින් හෝ සමාජය සටනට කැඳවමින් හෝ ජීවත්වන මිනිහාත්, එකකුගේ බිරිඳ වී තවත් හත අට දෙනකු ඇසුරු කරමින් තම සැමියා ගේ කම්මුලට ගසා ඔහු පිටු දැක මරණ මංචකයෙහිදී උපාසිකාවක වන ගැහැණියත් පමණක් මහා චරිත ඇතියන් ලෙසත් සමහර උගතුන් සලකන්නේ කුමක් නිසාදැයි වටහාගැනීම දුෂ්කර ය.

වෙස්සන්තර රජුගේ බිසොව වූ මද්‍රී දේවිය චරිතය විසින් බින්දුවකි. අනුලා බිසොව වීරකම් කළ මහා චරිත ඇත්තියකි. තම යැමියාගේ ඇනුම් බැනුම් ඉවසමින් ඔහුගෙන් පහර කමින් [illegible]තිකකු පස්සේ නුදුවා ඔහුම පතන ගැහැනියත් තම සැමියාගේ අණ ඉක්මවා තමා පතන මිනිසුන් ඇසුරු කරමින් ද ඒ නිසා අනික් ගැහැනුන් පතුරුවන ඕපාදූප කතා ගර්වයෙන් සලකා සන්තෝෂ වෙමින් ද සිට දික්කසාද නඩුව සඳහා උසාවියට යන ගැහැනියත් යන දෙදෙනාම එක සමාන වීර ගැහැනුන් ලෙස නොසැලකිය යුත්තේ කුමක් නිසා ද? එක ගැහැනියක වීරකම් කරන්නේ විලිබිය වැඩි කමිනි. අනික් එකිය වීරකම් කරන්නේ විලිබිය අඩු කමිනි.

නන්ද තමාගේ පළමු සැමියා වන ජිනදාසගේ මළකඳ භූමදානය කොට ආ බව අසන ඇයගේ දෙවැනි සැමියා වන පියල්ගේ සිතට නඟින්නේ ඊර්ෂ්‍යාවකි.

''එහෙනම් පාංසුකූලේ දී ජිනදාස භූමදාන කොට අවසාන ගෞරවය දක්කුවේ මගේ සල්ලි වලින්!''යි පියල් කියයි.

මෙය ගම් පෙරළිය කියවූ බොහෝ දෙනෙකුන්ගේ දෝෂාරෝපණයට භාජන වූ තැනකි. එහෙත් ඒ දෝෂාරෝපණය සාධාරණයයි මට නොවැටහේ. ඒ ප්‍රශ්නය ඇසීම නිසා පියල් දීනයකු වන බව සැබෑ ය. එහෙත් විචාරකයා විසින් නැඟිය යුතු ප්‍රශ්නය 'ඔහු දීනයෙක් වන්නේ ද නැද්ද, යනු නොවේ. පියල් ඒ අවස්ථාවෙහි එසේ කීමත් ක්‍රියා කිරීමත් ඔහුගේ පරම්පරාවේ ඇබ්බැහිකම්වලටත් මිනිස් ගතියටත් චිත්ත චෛතසික ධර්මයටත් ගැලපෙන්නේ ද යන්නයි.

නිමි.

Scanned by CamScanner